ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් 2024



# මූල්‍ය ප්‍රකාශ හා මෙහෙයුම්
# ශ්‍රී ලංකා මහ බැංකුව
# 2024

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 99(2) වගන්තියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව, 2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සකස් කරන ලද, පාලක මණ්ඩලය විසින් අනුමත කර විගණකාධිපති විසින් විගණනය කරනු ලැබූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා මහ බැංකුව මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙත මෙසේ ඉදිරිපත් කරයි. 2024 වර්ෂයේ මහ බැංකුවේ මෙහෙයුම් පිළිබඳ යාවත්කාලීන වාර්තාවක් ද මෙහි අන්තර්ගත ය.

**ශ්‍රී ලංකා මහ බැංකුව**

## අපගේ දැක්ම

ශ්‍රී ලාංකේය ජනතාවගේ සෞභාග්‍යය උදෙසා දායක වන විශ්වසනීය සහ ගතික මහ බැංකුවක්

## අපගේ මෙහෙවර

සර්වජන අන්තර්ගතභාවය සහ තිරසාර වර්ධනයට සහය වීම උදෙසා දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සුරක්ෂිත කිරීම

## අපගේ සාරාර්ථ

**සුපිළිපන්බව:**

- සදාචාර පැවැත්ම
- විශ්වසනීයත්වය
- අඛණ්ඩතාව
- නායකත්වය
- වෘත්තීයභාවය
- තාක්ෂණික විශිෂ්ටත්වය
- ස්වාධීන දැක්ම

**වගවීම සහ විනිවිදභාවය:**

- වගකීම
- හිමිකාරිත්වය
- කැපවීම
- විනිවිදභාවය
- පාලනය

**අන්තර්ගතභාවය:**

- ප්‍රගමනශීලිත්වය
- සමායෝජනය
- සාමූහිකත්වය





# පරිශීලක සටහන

"ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් 2024" වාර්තාව 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ දක්වා ඇති ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුව ප්‍රකාශයට පත් කෙරේ. 2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ 2024 වසරේ දී සිදු කළ බැංකුවේ මෙහෙයුම් කටයුතුවල යාවත්කාලීන තොරතුරු මෙහි ඇතුළත් ය.

මහ බැංකු පනතේ 99(2) සහ 99(3) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි මෙහි ඇතුළත් මූල්‍ය ප්‍රකාශ බැංකුවේ පාලක මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර, අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් අත්සන් කර විගණකාධිපති විසින් විගණනය කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ එක් එක් මූල්‍ය වර්ෂය අවසාන වී මාස හතරක් ඇතුළත මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු බවත්, ඉන් පසුව අමාත්‍යතුමා වෙත ලැබී දින 14ක් තුළ පාර්ලිමේන්තු සැසියක දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවත් පනතේ දක්වා ඇත. පාර්ලිමේන්තු සැසි වාරයක් නොපැවැත්වේ නම්, ඊළඟ පාර්ලිමේන්තු සැසිය ආරම්භයේ දී මෙම ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 7(1)(ඕ) වගන්තිය ප්‍රකාරව, මහ බැංකුවේ ප්‍රතිපත්ති සහ මෙහෙයුම් පිළිබඳ ව පාර්ලිමේන්තුවට, රජයට සහ ජනතාවට දැනුම් දිය යුතු අතර මෙම සවිස්තරාත්මක වාර්තාව ඉදිරිපත් කිරීම තුළින් ශ්‍රී ලංකා මහ බැංකුව එම කර්තව්‍ය සපුරාලයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් 2024 වාර්තාවෙන් ආයතනික මූල්‍ය කාර්යසාධනය, මෙහෙයුම් කටයුතු සහ උපායමාර්ගික මූලාරම්භයන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කරයි.

එයට ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා සම්බන්ධ විස්තරාත්මක විශ්ලේෂණයක් මෙන්ම මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, මූල්‍ය පද්ධති අධීක්ෂණය, සහ වසර පුරා සිදු කළ මෙහෙයුම් විස්තර ඇතුළත්ය. ඊට අමතරව මෙම වාර්තාවෙන් බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා ද ඉස්මතු කොට දක්වයි.

ශ්‍රී ලංකා මහ බැංකුව සිය මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු හා සම්බන්ධ සියලුම අංශයන්හි දී විනිවිදභාවය, වගවීම සහ ස්වාධීනත්වය පවත්වා ගැනීමට බැඳී සිටී. ප්‍රතිපත්ති සම්පාදකයින්, පර්යේෂකයින්, මූල්‍ය විශ්ලේෂකයින් සහ මහජනතාව ඇතුළු සියලුම පාර්ශ්වකරුවන්ට ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යසාධනය සහ මූල පිරීම් සම්බන්ධ නිවැරදි හා කාලීන තොරතුරු කරා ප්‍රවේශ වීමට මෙතුළින් ඉඩ සලසා ඇත. ඒ අනුව සුපිළිපන්ව, අපක්ෂපාතීව, අවංකව සහ විශ්වසනීයත්වයෙන් යුතුව සිය කාර්යභාරය ඉටු කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි.

පහත සැබැඳිය තුළින් මෙහි මංගත ප්‍රකාශනයට පිවිසිය හැකිය: https://www.cbsl.gov.lk/en/publications/economic-and-financial-reports/financial-statements-operations

ආර්ථිකයේ තත්ත්වය, මහ බැංකු ප්‍රතිපත්ති පිළිබඳ ඇගයුමක් සහ මූල්‍ය පද්ධතියේ තත්ත්වයන් පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු ලබා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 80(3) වගන්තිය ප්‍රකාරව ප්‍රකාශයට පත් කරන වාර්ෂික ආර්ථික විවරණය පරිශීලනය කළ හැකිය. එහි මංගත ප්‍රකාශනයට පිවිසිය හැකි සැබැඳිය වනුයේ: https://www.cbsl.gov.lk/en/publications/economic-and-financial-reports/annual-economic-review

මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් 2024 පිළිබඳ ඔබ දැක් වූ උනන්දුව කෙරෙහි අපි ස්තුතිවන්ත වන අතර මහ බැංකුවේ ඉදිරි ප්‍රකාශන සමඟ ද ඔබ සිටිනු ඇතැයි අපි අපේක්ෂා කරමු.



# අධිපතිතුමාගේ පණිවිඩය



**2024 වසරේ ජයග්‍රහණ, ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සහ මූල්‍ය ආයතනවල සිට ව්‍යාපාර සහ මහජනතාව දක්වා සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික කැපවීම සහ නොපසුබට උත්සාහය පැහැදිලිව පෙන්වන සාක්ෂියකි**

2022 අර්බුදයේ කැළඹිලිකාරී තත්ත්වයන් බොහෝ දුරට සමනය වී ඇති හෙයින් සහ නිවැරැදි ප්‍රතිපත්ති අනුගමනය කරමින් සාමූහිකව කටයුතු කිරීම තුළින් ලබා ගත් සැලකිය යුතු ප්‍රගතිය සමඟ අප රට නැවතත් යථා තත්ත්වයට පත් වෙමින් තිබේ. තවදුරටත් කළ යුතු බොහෝ කටයුතු තිබුණ ද ශ්‍රී ලංකා මහ බැංකුව මෙම කැපී පෙනෙන වර්ධන ගමන් මග සඳහා මෙතෙක් දෙන ලද දායකත්වය පිළිබඳව අපට ආඩම්බර විය හැකිය. ස්වාධීන ව ක්‍රියාත්මක වන රටේ මුදල් අධිකාරිය ලෙස ජාතියේ සෞභාග්‍ය කරා යන ගමනට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත මුදල් හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල පූර්ණ වගකීම අපි භාර ගනිමු. අනපේක්ෂිත තත්ත්වයන් උද්ගත නොවන්නේ නම් හා දැනට සිදු කරන ප්‍රතිසංස්කරණ අඛණ්ඩව පවත්වා ගෙන යන්නේ නම් සියලු දෙනාගේ සහභාගිත්වය සහිත සාධාරණ වූ තිරසාර සංවර්ධනය ඉතා දුර නොවනු ඇත. ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීමෙන් පසු දෙවන වරට පිළියෙල කරන ලද අපගේ මෙම මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් වාර්තාව ඔබට ඉදිරිපත් කරන්නේ මෙවන් වූ ශුභවාදී පසුබිමක ය.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කරන ලද විගණකාධිපති විසින් විගණිත 2024 වර්ෂයට අදාළ මහ බැංකුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ ප්‍රකාශයට පත් කිරීමේ කාර්යය මෙම වාර්තාව මඟින් සම්පූර්ණ වේ. මෙම වාර්තාව හුදෙක් මූල්‍ය දත්තවලින් ඔබ්බට ගොස් ආර්ථිකය, මූල්‍ය පද්ධතිය සහ සමස්තයක් වශයෙන් සමාජය ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් සඳහා මහ බැංකුව විසින් තිරසාර වටිනාකමක් නිර්මාණය කරන ලද ආකාරය පිළිබඳ ව පැහැදිලි කරයි. පාරිසරික, සමාජයීය සහ පාලන කරුණු තීරණ ගැනීමේ ක්‍රියාවලිය සමඟ සහසම්බන්ධ කිරීමෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වගකිවයුතු සහ ඉදිරිගාමී පාලනයක් සඳහා වන සිය කැපවීම මැනවින් පෙන්නුම් කරයි.

මෑත වසරවල දී ශ්‍රී ලංකාව පරිවර්තනීය කාල පරිච්ඡේදයකට මුහුණ දී සිටින බව අතිශයෝක්තියක් නොවේ. රට මුහුණ දුන් තත්ත්වයන් හමුවේ සාපේක්ෂව පෙර නොවූ විරූ මට්ටමේ ස්වයංපරිවර්තනයක් අවශ්‍ය වූ අතර එහි ප්‍රතිඵල වර්තමානයේ දී දැක ගත හැකිය. 2024 වසර දෙස ආපසු හැරී බලන විට මෙම වසර අතිශය දුෂ්කර, සංකීර්ණ ආර්ථික තත්ත්වයක සිට තීරණාත්මක අයුරින් අප රට ශක්තිමත් වූ වසරක් විය. එසේම, ජාතියක් ලෙස වේදනාකාරී ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ විඳ දරාගැනීමට අවශ්‍ය ධෛර්යය අප සතු බව පෙන්නුම් කර ඇති අතර අපගේ ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ හැකියාව ගැන අපට ආඩම්බර විය හැකිය. මූල්‍ය ක්ෂේත්‍රයේ ඉහළම නියාමන අධිකාරිය ලෙස මූල්‍ය පද්ධතිය ස්ථාවර කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා අප සතු නොසැලෙන කැපවීම ද ඒ හා සමානව වැදගත් වේ. දිගු කාලීන ප්‍රතිසංස්කරණ, මුදල් ප්‍රතිපත්ති පියවර සහ ක්ෂුද්‍ර හා සාර්ව විචක්ෂණශීලී උත්සාහයන් තුළින් සාර්ව ආර්ථික ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග ආර්ථික අර්බුදයේ මුල් අවස්ථාවේ දී අපට කළ හැකි වේ යැයි සිතූ ප්‍රමාණයට වඩා බොහෝ ඉදිරියෙන් පවතී.

දේශීය හා බාහිර අංශ දෙකෙහිම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව නිම කිරීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ විස්තීර්ණ අරමුදල් පහසුකම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම මෑත අතීතයේ දී ණයහිමියන් සමඟ පැවති දුර්වල සබඳතා සාමාන්‍යකරණය කිරීමට සහ ආයෝජක විශ්වාසය යථා තත්ත්වයට පත් කිරීමට බෙහෙවින් ඉවහල් විය. මෙම ප්‍රයත්න තුළින් 2024 දී ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම ඉහළ යාම රටේ අවදානම් වාරිකය අඩු කිරීමට උපකාරී වී ඇති අතර එය යහපත් ආර්ථික පාලනයක් සඳහා වන අපගේ කැපවීම ද වර්ධනය වන ජාත්‍යන්තර පිළිගැනීම ද පෙන්නුම් කරයි.

2022 අප්‍රේල් මාසයේ සිට ගන්නා ලද තීරණාත්මක මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, වසර දෙකක කාලයක් ජාතික ආර්ථිකයට හානිකර ලෙස බලපා තිබූ උද්ධමනය 2024 වසරේ දී ක්‍රමයෙන් අඩු විය. මෙම ප්‍රශංසනීය වර්ධනය, පොලී අනුපාත තවදුරටත් අඩු කිරීම, ආර්ථික ප්‍රසාරණයට සහාය වීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය ඇතුළු පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට අත්‍යවශ්‍ය සහන සැලසීම මගින් වඩාත් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ප්‍රවේශයක් අනුගමනය කිරීමට මහ බැංකුවට ඉඩ සැලසීය. ශ්‍රී ලංකාවේ විදේශ අංශය 2024 දී සුවිශේෂී ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළ අතර, රට අඛණ්ඩව දෙවන වසරටත් ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කළේය. එමෙන්ම වසර තුළ නිල ජාත්‍යන්තර සංචිත සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර එය 2024 අවසානය වන විට දළ වශයෙන් එ.ජ.ඩො.බි. 6.1ක් ලෙස වාර්තා විය.

මෙම ජයග්‍රහණ අපගේ ආර්ථිකයේ ස්ථාවරත්වයට හේතු වූ අතර පසුගිය කාල සීමාව පුරාවට ම එය අඛණ්ඩව ශක්තිමත්ව පැවතුණි. තව ද වැඩිදියුණු වූ සාර්ව ආර්ථික පරිසරය, ක්‍රියාකාරී නියාමන ප්‍රතිසංස්කරණ සහ වැඩිදියුණු කළ අවදානම් කළමනාකරණ රාමු යනාදිය අක්‍රීය ණය අඩුවීමට හේතු වූ අතර, වැඩිදියුණු වූ සාර්ව ආර්ථික තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන් වෙළඳපොළ පොලී අනුපාතික වෙනස් වීමත් සමඟ පෞද්ගලික අංශයට ලබා දුන් ණය ප්‍රසාරණය විය.



සාර්ව ආර්ථික ස්ථායීකරණය අපගේ ප්‍රතිපත්ති රාමුවේ කේන්ද්‍රය බව නැවත නැවතත් අවධාරණය කළ යුතුය. කෙසේ වෙතත් ඉදිරියේ දී දිගුකාලීන ආර්ථික පරිවර්තනයක් කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතුය. බැංකු අංශය මූල්‍ය පද්ධතියේ ප්‍රධාන අංශයක් ලෙස ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සඳහා සහාය වීම සහ ඩිජිටල් මූල්‍ය විසඳුම් වර්ධනය කිරීම යන අවශ්‍යතා ඉටු කිරීමට සුදුසු පරිදි වඩාත් පුළුල් මූල්‍ය සේවාවන් සමඟ මූල්‍ය අතරමැදිකරණය ද වැඩි දියුණු කළ යුතුය. 2024 දී මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය පුළුල් කිරීම අරමුණු කරගත් ඩිජිටල් ගෙවීම් යටිතල පහසුකම් සංවර්ධනයට සහ භෞතිකව මුදල් භාවිතය අඩු ආර්ථිකයක් කරා සංක්‍රමණය වීමට ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩව කටයුතු කළේය.

තිරසාරභාවය අපගේ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයේ අත්‍යවශ්‍ය අංගයක් බව ද මා අවධාරණය කළ යුතුයි. ශ්‍රී ලංකාව හරිත මූල්‍ය මුලපිරීම් හා එක්ව ඇති බැවින් මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති ද ගෝලීය තිරසාර ප්‍රමිතීන් සමඟ සමගාමී විය යුතුය. ඒ අනුව පුනර්ජනනීය බලශක්තිය, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ පාරිසරික තිරසාරභාවය සඳහා ආයෝජන මෙහෙයවීමේ දී පූර්වගාමී කාර්යභාරයක් ඉටු කිරීමේ වගකීම වාණිජ බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන වෙත පැවරේ.

ඉදිරියේදීත්, ශ්‍රී ලංකා මහ බැංකුව මිල ස්ථායීතාව පවත්වා ගැනීම සහ තිරසාර ආර්ථික ප්‍රසාරණය සඳහා අවශ්‍ය පරිසරය සැකසීමට එහි නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව, උද්ධමනය 5%ක ඉලක්කයක් වටා පවත්වා ගැනීමට කැපවනු ඇත. දත්ත මත පදනම් වන සහ ඉදිරි දැක්මක් සහිත අපගේ මුදල් ප්‍රතිපත්තිය, අඩු උද්ධමන පරිසරයක් තුළ ආර්ථික වර්ධනය සඳහා දායක වනු ඇත.

2025 නව වසර, තවත් වැදගත් මුලපිරීම් ගණනාවක ප්‍රගතිය වේගවත් කිරීමේ අවශ්‍යතාව මතු කර තිබේ. මෙම මුල පිරීම් අතර වැඩිදියුණු කළ දත්ත රැස් කර ගනිමින් නවීන ක්‍රම භාවිතා කරමින් සාර්ව ආර්ථික දැක්ම පුරෝකථන කිරීමේ හැකියාව වර්ධනය කිරීම, නවීන තාක්ෂණය හරහා දත්ත බෙදා හැරීම, විවට වෙළඳපොළ කටයුතු වැඩිදියුණු කිරීම හා ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා තුළින් මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සහ විදේශ විනිමය වෙළඳපොළ තුළ විනිවිදභාවය මෙන්ම පුරෝකථන හැකියාව වැඩිදියුණු කිරීම වේ. මූල්‍ය අංශයේ වර්ධනය සහතික කිරීම සඳහා වගකීමක් සහිත ණය දීමේ පරිචයන් සහතික කිරීම තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම සහ සාර්ව විචක්ෂණශීලී රෙගුලාසි වැඩිදියුණු කිරීම සිදු කරන අතර, සාධාරණ පොලී අනුපාතික යටතේ ණය ලබා දීම ඉහළ නැංවීමට පහසුකම් සැලසීම ද ඉහළ ප්‍රමුඛතා අතර වේ. තවද, විශේෂයෙන් අවදානමට ලක් විය හැකි ප්‍රජාවන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මූල්‍ය අන්තර්ගතභාවය හා සම්බන්ධ මුලපිරීම් හඳුන්වා දීමට සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී. සයිබර් ආරක්ෂණ රාමු ශක්තිමත් කරන අතරතුර ඩිජිටල් මූල්‍ය පරිවර්තනය දියුණු කිරීම ද ප්‍රමුඛතාවකි.

**ශ්‍රී ලංකා මහ බැංකුව සිය අභිමානවත් 75 වන සංවත්සරය සැමරීමට සූදානම් වන මේ අවස්ථාවේ දී, සෞභාග්‍යය සඳහා පදනමක් ලෙස තිරසර බව සහතික කිරීම කෙරෙහි අපගේ අවධානය යොමු වනු ඇත**

2024 වසරේ ජයග්‍රහණ, ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සහ මූල්‍ය ආයතනවල සිට ව්‍යාපාර සහ මහජනතාව දක්වා සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික කැපවීම සහ නොපසුබට උත්සාහය පැහැදිලිව පෙන්වන සාක්ෂියකි. ශ්‍රී ලංකා මහ බැංකුව සිය අභිමානවත් 75 වන සංවත්සරය සැමරීමට සූදානම් වන මේ අවස්ථාවේ දී, සෞභාග්‍යය සඳහා පදනමක් ලෙස තිරසර බව සහතික කිරීම කෙරෙහි අපගේ අවධානය යොමු වනු ඇත. එමෙන්ම මූල්‍ය විනය නැවත ස්ථාපිත කිරීම, ආර්ථික පාලනය ශක්තිමත් කිරීම මෙන්ම ලබා ඇති ප්‍රගතිය ආරක්ෂා කරගනිමින් තවදුරටත් ශක්තිමත්ව කටයුතු කරනු ඇත. ඉදිරි වසරවල දී, ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාවෙන් වාසි සලසා ගැනීමට සහ එහි සම්පූර්ණ විභව වර්ධනය ළඟා කරගැනීමට අවස්ථාව ඇති අතර, එමඟින් සමාජයේ සියලුම කොටස් සඳහා ආර්ථික වශයෙන් සහනශීලීත්වයක් ලැබෙනු ඇත.

මහ බැංකුවේ මෙහෙවර කෙරෙහි දක්වන අමිල සහයෝගය සහ විශ්වාසය වෙනුවෙන් රජය, රජයේ ආයතන, දේශීය හා ජාත්‍යන්තර මූල්‍ය ආයතන, ව්‍යාපාර සහ විශේෂයෙන් අප රටේ සමස්ත ජනතාව ඇතුළු සියලුම පාර්ශ්වකරුවන්ට මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. අපගේ පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වෙහෙස මහන්සි වී ඉමහත් කැපවීමෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයට ද මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

සැමට දීප්තිමත්, තිරසාර සහ සෞභාග්‍යමත් අනාගතයක් ගොඩනැගීම සඳහා අපි එක්ව කටයුතු කරමු.

**නන්දලාල් වීරසිංහ**
අධිපති

# ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳව

## පිහිටුවීම හා නෛතිකභාවය

1949 අංක 58 දරන මුදල් නීති පනත වෙනුවට 2023 වසරේ සැප්තැම්බර් මාසයේ 15 සිට බලාත්මක වූ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මඟින් අඛණ්ඩව පවත්නා සංස්ථාපිත ආයතනයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යවස්ථාපිතව ස්ථාපනය කර ඇති අතර ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා වගකිව යුතු අධිකාරිය ලෙස කටයුතු කරයි. සිය කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී බාහිර බලපෑම්වලින් තොර පරිපාලන සහ මූල්‍ය ස්වාධීනත්වයක් සහිත ආයතනයක් ලෙස මහ බැංකුව කටයුතු කරයි.

## අරමුණු

දේශීය මිල ස්ථායීතාව එනම් අඩු හා ස්ථාවර අගයක උද්ධමනය පවත්වා ගැනීම මහ බැංකුවේ මූලික අරමුණයි.

සුමට හා කාර්යක්ෂම ලෙස මූල්‍ය පද්ධතිය ක්‍රියාත්මක වන බව තහවුරු කරමින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම එහි අනෙක් අරමුණ වේ.

## මෙහෙයුම් හා බලතල

ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, රටේ ජාත්‍යන්තර සංචිත කළමනාකරණය, ව්‍යවහාර මුදල් නිකුත් කිරීම සහ ගෙවීම් නිෂ්කාශන හා පියවීම් පද්ධතිය නියාමනය හා අධීක්ෂණය කරයි.

එමෙන්ම, එය මූල්‍ය ආයතන සුරක්ෂිත ව හා ශක්තිමත්ව සිය මෙහෙයුම් කටයුතු සිදු කරන බව තහවුරු කරමින් ඒවා අධීක්ෂණය හා නියාමනය කරයි. මහ බැංකුව වෙත පැවරී ඇති අනෙකුත් වගකීම් වනුයේ රාජ්‍ය ණය කළමනාකරණය, භාරකරු ලෙස කටයුතු කරමින් සේවක අර්ථසාධක අරමුදල් කළමනාකරණය සහ විදේශ විනිමය නියාමනය කිරීමයි.

ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලේ විශ්වසනීයත්වය සහ ස්ථායීතාව තහවුරු කරමින් ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පරම අයිතිය ද ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇත.

## පාලන ව්‍යුහය

ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රධාන මණ්ඩල දෙකකින් පාලනය වේ. ඒවා නම්, පරිපාලනය හා කළමනාකරණය අධීක්ෂණය කරන පාලක මණ්ඩලය හා මුදල් ප්‍රතිපත්තිය සම්පාදනය කරන මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයයි.

මහ බැංකුවේ අධිපති එහි ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරයි. අධිපතිවරයා හැර අනෙකුත් මණ්ඩල සාමාජිකයන් විධායක නොවන සාමාජිකයින් වේ. මුදල් අමාත්‍යවරයා විසින් නිර්දේශ කරන ලදුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41"අ" වගන්තිය යටතේ ස්ථාපිත කර ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය සහිතව ජනාධිපතිවරයා විසින් මණ්ඩල සාමාජිකයන් පත් කරනු ලැබේ.

අධිපතිවරයාට අමතරව, නියෝජ්‍ය අධිපතිවරු, සහකාර අධිපතිවරු හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමන්විත වෙයි.

## වගවීම හා විනිවිදභාවය

ශ්‍රී ලංකා මහ බැංකුව පාර්ලිමේන්තුවට හා මහජනතාවට වගවන ආයතනයකි. විගණකාධිපතිවරයා විසින් සිදු කරන අංග සම්පූර්ණ විගණනයන් මගින් මෙම වගවීම සහතික කෙරේ.

මහ බැංකුව එහි ප්‍රතිපත්ති සහ මෙහෙයුම් පිළිබඳව නිරන්තරයෙන් මහජනතාව දැනුම්වත් කරන අතර පාර්ලිමේන්තුවට සහ පාර්ලිමේන්තු කමිටුවලට ද වාර්තා ඉදිරිපත් කරයි. එමෙන්ම බැංකුව එහි ශේෂ පත්‍රය මාසිකව ද, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ වාර්ෂිකව ද ප්‍රකාශයට පත් කරයි.

## ජාත්‍යන්තර සහයෝගීතා හා සේවා

කුසලතා වර්ධනය, ආර්ථික පර්යේෂණ, ප්‍රතිපත්ති සම්පාදනය සහ මූල්‍ය ස්ථායීතා වැඩසටහන් යනාදිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) ලෝක බැංකුව (WB), ආසියානු සංවර්ධන බැංකුව (ADB) හා අන්තර්ජාතික පියවීම් බැංකුව (BIS) වැනි ආයතන සමඟ සහයෝගීව කටයුතු කරයි. එමෙන්ම, මහ බැංකුව, ආර්ථික සම්බන්ධීකරණ ප්‍රවර්ධනය, මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සහ නියාමනයන්ට අනුකූලවන බව තහවුරු කිරීම සඳහා අනෙකුත් මහ බැංකු, කලාපීය මූල්‍ය ආයතන සහ ජාත්‍යන්තර නියාමන ආයතන සමග ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික ගිවිසුම්වලට එළැඹෙයි. ජාත්‍යන්තර ආර්ථික සමුළුවල දී මහ බැංකුව දක්වන ක්‍රියාකාරී සහභාගිත්වය, ආර්ථිකමය අභියෝග උද්ගත වන විට ඒවාට පහසුවෙන් අනුගත වීමටත් ජාත්‍යන්තර මූල්‍ය පද්ධතිය සමඟ ශ්‍රී ලංකාව සම්බන්ධ කිරීමටත් උපකාරි වෙයි.

## මහජන සහභාගිත්වය හා සේවා

මාධ්‍ය නිවේදන, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය, සමාජ මාධ්‍ය හා ප්‍රකාශන හරහා ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාව සමග සක්‍රියව සම්බන්ධ වෙයි. ආර්ථිකමය හා මූල්‍යමය කරුණු සම්බන්ධ ව මහජනතාවගේ අවබෝධය ඉහළ නැංවීම සඳහා මහ බැංකුව මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්, මහජනතාව වෙත ප්‍රවේශ වීමේ වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ අධ්‍යාපනික වැඩසටහන් පවත්වනු ලැබේ. තවද, මහ බැංකුව අනෙකුත් බැංකුවලට අදාළ රෙගුලාසි හා සම්බන්ධ මාර්ගෝපදේශ, මූල්‍ය වංචා වැළැක්වීම සහ මුදල් ප්‍රතිපත්තිය යනාදිය පිළිබඳ ව සිදු කෙරෙන මහජන විමසීම්වලට අදාළ ව විවෘත සන්නිවේදන ක්‍රමවේදයක් පවත්වා ගෙන යයි. මීට අමතරව, බැංකු සේවා සඳහා ප්‍රමිති පිහිටුවීම සහ මූල්‍ය ගනුදෙනු සම්බන්ධ ගැටලු විසඳීම මගින් පාරිභෝගික ආරක්ෂාව සහතික කරයි.

## මූලස්ථානය

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රධාන මූලස්ථානය කොළඹ 01හි පිහිටා ඇති අතර, අනුරාධපුර, මාතර, මාතලේ, නුවරඑළිය, කිළිනොච්චිය සහ ත්‍රිකුණාමලය නගරවල ප්‍රාදේශීය කාර්යාල හයක් පිහිටුවා ඇත.





ව්‍යවස්ථාපිත අවශ්‍යතාව I
දැක්ම, මෙහෙවර සහ සාරාර්ථ II
පරිශීලක සටහන III
අධිපතිතුමාගේ පණිවිඩය IV
ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳව VI

# අන්තර්ගතය

## මෙහෙයුම් තොරතුරු

අපගේ උපායමාර්ගය 02
අභියෝග ජය ගත් ආකාරය 06

බැංකුවේ කාර්යභාරය

දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම 08
මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම 16
ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය 26
ව්‍යවහාර මුදල් නිකුතුව සහ කළමනාකරණය 30
උපායමාර්ගික සන්නිවේදනය 34
අන්තර්ජාතික කටයුතු 38
වෙනත් පවරන ලද වගකීම් 40

බැංකුව කළමනාකරණය කිරීම 47

පාලනය සහ අවදානම් කළමනාකරණය

පාලනය 52
පාලක මණ්ඩල හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින් 58
ප්‍රධාන නිලධාරීන් 62
විගණන කමිටු වාර්තාව 67
අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව 69
අභ්‍යන්තර විගණනය 71

## මූල්‍ය ප්‍රකාශ

මූල්‍ය සමාලෝචනය 74
විගණකාධිපති වාර්තාව 77
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 81
ආදායම් ප්‍රකාශය 83
අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය 84
ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය 85
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය 86
මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් 88

## අතිරේක තොරතුරු

ප්‍රාදේශීය කාර්යාල 206
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන ආයතන 207
ආයතනික තොරතුරු 214

මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් වාර්තාව සෑම මූල්‍ය වර්ෂයක්ම අවසාන වී මාස හතරක් ඇතුළත ප්‍රකාශයට පත් කරයි. එසේ ම, මෙම වාර්තාවේ සම්පූර්ණ PDF වාර්තාවක් ද ප්‍රකාශයට පත් කරයි.

මෙම PDF ප්‍රකාශනයෙහි ඇතුළත් සක්‍රීය විශේෂාංග සමඟ සැරිසරන්න.

https://www.cbsl.gov.lk/en/publications/economic-and-financial-reports/financial-statements-operations

අන්තර්ගතය ඊළඟ පිටුව පෙර පිටුව
පෙර දැක්ම මුල් පිටුව මුද්‍රණය

# 01.

# මෙහෙයුම් තොරතුරු


02 අපගේ උපායමාර්ගය

06 අභියෝග ජය ගත් ආකාරය

08 බැංකුවේ කාර්යභාරය

47 බැංකුව කළමනාකරණය කිරීම

52 පාලනය සහ අවදානම් කළමනාකරණය

# අපගේ උපායමාර්ගය

මහ බැංකුව එහි අරමුණු, මෙහෙවර සහ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා, ඉහළ කළමනාකාරීත්වයෙහි දිශානතීන් මෙන්ම මෙහෙයුම් මට්ටමේ සිටින නිලධාරීන්ගේ අදහස් ද ඒකාබද්ධ කරගත්, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලියන් අතීතයේ සිටම ක්‍රියාත්මක කරයි. පසුගිය වසරවල පෙන් වූ සාර්ථකත්වයන් තව දුරටත් පවත්වා ගනිමින්, අලුතින් පැන නගින සහ වෙනස් වන අභියෝගයන්ට මුහුණ දීම සඳහා 2024-2026 සඳහා වන සිය උපායමාර්ගික සැලසුම් චක්‍රය මෙම වසරේ දී ආරම්භ කරන ලදි. ඒ අනුව ආර්ථික අර්බුදයෙන් පසුව මහ බැංකුව ගොඩ නඟන ලද ශක්තිමත් පදනම මත තව දුරටත් රැඳෙමින් මහ බැංකුවේ මූලික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අභ්‍යන්තර පාර්ශ්වකරුවන්ගේ අදහස් ද ඇතුළත් නව්‍ය සහ විද්‍යාත්මක ක්‍රමවේදයක් යටතේ ශක්තිමත් සහ පහසුවෙන් අනුවර්තනය විය හැකි උපායමාර්ගික ක්‍රමෝපායක් අනුගමනය කළේය.

කොවිඩ් වසංගතය හා ඉන් පසු ඇති වූ ආර්ථික අර්බුදයන් ද ඇතුළත්ව විශේෂයෙන්ම ශ්‍රී ලංකාව මෑත කාලීනව මුහුණ දුන් දැවැන්ත අභියෝගයන්ට සුදුසු විසඳුම් සෙවීමේ දී ගෝලීය යහ පරිචයන්ට අනුගත වෙමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික සැලසුම සම්පාදනය කර ඇත. මෙම ක්‍රමවේදය ආරම්භ වන්නේ මිල ස්ථායීතාව, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව, අවදානම් කළමනාකරණය, පාර්ශ්වකරුවන් මහ බැංකුව පිළිබඳ ව දරන අදහස් හා මානව සම්පත් හා තාක්ෂණය ඇතුළු අභ්‍යන්තර හැකියාවන් යනාදිය පිළිබඳ සිදු කරන ගැඹුරු විශ්ලේෂණයක් තුළින් උපායමාර්ගික ගැටලු හඳුනාගැනීමත් සමඟිනි. එම ගැටලු පදනම් කර ගනිමින් මැදි කාලීන උපායමාර්ගික ප්‍රමුඛතා හඳුනා ගනියි. එක් එක් ප්‍රමුඛතා සඳහා පිළියෙල කරන ලද සැලසුම් ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික හැකියාව, අවදානම් පිළිබඳ ඇගයීම, දිගු කාලීන බලපෑම සහ සැලසුම් කර ඇති ක්‍රියාවන් ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවක් ඇත්ද යන්න සැලකිල්ලට ගනිමින් සමාන කළමනාකරණ කණ්ඩායම් මගින් සමාලෝචනය කරයි. ඉන් අනතුරු ව ඒවා වාර්ෂික උපායමාර්ගික කතිකාවතෙහි දී කළමනාකාරිත්වය හා පාලක මණ්ඩල හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින් සමඟ ද සාකච්ඡා කරයි.

> සමාලෝචිත වර්ෂයේ දී මහ බැංකුවේ මූලික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අභ්‍යන්තර පාර්ශ්වකරුවන්ගේ අදහස් ද ඇතුලත් කරගත් නව්‍ය සහ විද්‍යාත්මක ක්‍රමවේදයක් යටතේ ශක්තිමත් සහ පහසුවෙන් අනුවර්තනය විය හැකි උපායමාර්ගික ක්‍රමෝපායක් අනුගමනය කරන ලදි

## උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලිය

රූප සටහන 01








වර්තමාන මහ බැංකු උපායමාර්ගික සැලසුම එහි අරමුණු වන දේශීය මිල ස්ථායීතාව සහ මුල්‍ය පද්ධති ස්ථායීතාව හා සම්බන්ධිත ප්‍රධාන ප්‍රමුඛතා දෙකක් මත කේන්ද්‍රගත ව ඇත. මීට අමතරව, තවත් වැඩි දියුණු කිරිමේ උපායමාර්ග තුනකි. ඒවා නම්, ඉහළ විනිවිදභාවයක්, වගවීමක් සහ විශ්වසනීයත්වයක් සඳහා අභ්‍යන්තර සහ බාහිර සන්නිවේදනය ශක්තිමත් කිරිම, නවීන මහ බැංකුවක් සදහා වර්තමානයේ දී මෙන් ම අනාගතයේදීත් අවශ්‍ය වන මානව සම්පත් කුසලතා වැඩිදියුණු කිරිම, සහ මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ ධාරිතාවයන් ඉහළ නැංවීමයි.

මහජනතාවගේ ක්‍රය ශක්තිය සහ ආර්ථික සුබසාධනය තහවුරු කිරීම සඳහා මහ බැංකුව අඛණ්ඩ ව කටයුතු කරන අතර මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වන මිල ස්ථායීතාව අත් කර ගැනීම හා සම්බන්ධිත සැලසුම 2024-2026 කාලපරිච්ඡේදයට අදාළ පළමු ප්‍රධාන උපායමාර්ගික ප්‍රමුඛතාව වේ. ශක්තිමත් මූල්‍ය පද්ධතියක් නොමැති විට සමස්ත ආර්ථිකයටම සැලකිය යුතු අර්බුදකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදු විය හැකිය. මහ බැංකු පනත අනුව මූල්‍ය පද්ධතියේ ව්‍යුහාත්මක පැවැත්ම සහ ශක්තිමත්භාවය සුරක්ෂිත කිරීම මහ බැංකුවේ ප්‍රධාන වගකීමකි. ඒ අනුව මහ බැංකුවේ දෙවන ප්‍රධාන උපායමාර්ගික ප්‍රමුඛතාව වන මුල්‍ය අංශයේ ස්ථායීතාව තහවුරු කිරීම ද ඉතාමත් වැදගත් වේ.

උපායමාර්ගික න්‍යාය පත්‍රය තව දුරටත් ශක්තිමත් කිරීම සඳහා ආයතනයක් ලෙස මහ බැංකුවේ සජීවී බව ඉතා වැදගත් වේ. කාර්යක්ෂමතාව හා වගවීම ඉහළ නංවමින් සිය මෙහෙයුම් ආකෘතිය සහ පාලන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව නිරන්තරයෙන් අත්‍යාවශ්‍ය නව්‍යකරණ ප්‍රයත්නයන් ගනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විනිවිද පෙනෙන සන්නිවේදනය සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය තුළින් මහ බැංකුවේ ප්‍රතිපත්ති සහ කටයුතු කෙරෙහි මහජන අවබෝධය සහ විශ්වාසය ඉහළ නංවයි. මහ බැංකු පනත මගින් ව්‍යවස්ථාපිත ස්වාධීනත්වයක් මහ බැංකුවට ලබා දී ඇති අතර එහි ප්‍රතිඵයක් ලෙස අත්‍යාවශ්‍යම වන ප්‍රතිපත්තිමය සුපිළිපන්බව පිළිබිඹු වේ. ඒ අනුව, මානව ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමේ උපායමාර්ගික ප්‍රමුඛතාව මහ බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා අතර ඉතා වැදගත් එකකි.

මහ බැංකුකරණ කාර්ය තුළ දී තාක්ෂණික වශයෙන් සන්නද්ධ වීමේ වැදගත්කම සැලකිල්ලට ගෙන, 2024 අවසානයේ දී මහ බැංකුව නව උපායමාර්ගික ප්‍රමුඛතාවක් ලෙස මහ බැංකුවෙහි තාක්ෂණික ධාරිතාවය වැඩි දියුණු කිරීම හඳුන්වා දුන් අතර, එය 2025 සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය. දත්ත මත පදනම් වූ තීරණ ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම් නිරන්තර අවශ්‍යතාවක් වන අතර, ශක්තිමත් කරන ලද සයිබර් ආරක්ෂණ පියවරයන් මහ බැංකුවේ ඩිජිටල් ක්‍රමෝපායන් හඳුන්වා දීමේ කටයුතු වේගවත් කිරීමට දිරියක් ලබා දෙයි. සිය තාක්ෂණික හැකියාව හා ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීම තුළින් දිනෙන් දින ප්‍රසාරණය වන ඩිජිටල් මූල්‍ය ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව, සුරක්ෂිතබව සහ අනුගත වීමේ හැකියාව ඉහළ නැංවීම මහ බැංකුවේ අරමුණයි.

2024-2026 උපාය මාර්ගික සැලසුම් චක්‍රයේ පළමු වසර වන 2024 දී, ශ්‍රී ලංකා මහ බැංකුව සැලසුම් කරන ලද ඉලක්කවලින් අතිමහත් බහුතරයක් සාර්ථකව සාක්ෂාත් කර ගන්නා ලදි. උපායමාර්ගික ප්‍රමුඛතා පිළිබඳ ප්‍රගතිය අර්ධ වාර්ෂිකව නිරීක්ෂණය කරන ලද අතර, ඒ අනුව 2024 මැයි සහ ඔක්තෝබර් මාසවල දී පළමු වසරේ සමාලෝචන රැස්වීම් පවත්වන ලදි. මෙම සමාලෝචන මඟින් ප්‍රමුඛතා සැලසුම්වල සාර්ථකත්වය ඇගයීම මෙන්ම සැලසුම් සඳහා සිදු කළ යුතු සංශෝධන පිළිබඳව අවධානය යොමු කිරීමට ද කළමනාකාරිත්වයට ඉඩ ප්‍රස්ථාව ලබා දෙයි.

## උපායමාර්ගික ප්‍රමුඛතා 2024-2026

රූප සටහන 02



මෙහෙයුම් තොරතුරු | මූල්‍ය ප්‍රකාශ | අතිරේක තොරතුරු

# උපායමාර්ගික ප්‍රමුඛතා 2024-2026

## මූලික ප්‍රමුඛතා

### සාර්ව ආර්ථික ප්‍රතිව්‍යුහගතකරණය වැඩසටහනට අනුව තිරසාර ආර්ථික වර්ධනයකට දායක වෙමින් මිල ස්ථායීතාව අත්කර ගැනීම

**අරමුණ**

දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම

**නිමැවුම්**

- වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති තීරණ
- රජයට දෙන ශුද්ධ ණය අඩු කිරීම
- මුදල් ප්‍රතිපත්ති මෙවලම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම
- ස්වාධීනත්වය, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය සහ මහ බැංකුව පිළිබඳ විශ්වසනීයත්වය තහවුරු කරමින් මහ බැංකුවෙහි ශේෂ පත්‍රය ශක්තිමත් කිරීම

**ප්‍රතිඵලය**

- ඉලක්කගත උද්ධමනය ළඟා කර ගැනීම
- උද්ධමන අපේක්ෂාව මනාව පාලනය කිරීම
- අඩු විචලනයක් සහිත විනිමය අනුපාතය
- ඉහළ විදේශ විනිමය සංචිත
- බැංකු පද්ධතියේ අවම ද්‍රවශීලතා ආතතිය

**අපේක්ෂිත බලපෑම**

තිරසාර ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම

### අවදානම අවම කරමින් සහ මූල්‍ය ආයතනවල ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කරමින් මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීම

**අරමුණ**

මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීම

**නිමැවුම්**

- කාර්යක්ෂම මූල්‍ය අතරමැදිකරණයට දායකවෙමින් මහජන තැන්පතු ලබා ගන්නා ආයතනවල ස්ථාවරත්වය ඇති කිරීම
- ඵලදායි සාර්ව විචක්ෂණශීලී රාමුවක් සහ ඊට අදාළ ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම
- අදාළ පනත් සහ රෙගුලාසි සඳහා සංශෝධන සිදු කිරීම
- නිරාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සහ ප්‍රමාණවත් ආරක්ෂණ ජාල යාන්ත්‍රණ ස්ථාපිත කිරීම
- තාක්ෂණය මත පදනම් වන අධීක්ෂණ මෙවලම් ක්‍රියාත්මක කිරීම

**ප්‍රතිඵලය**

- ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය කරන ලද මූල්‍ය ආයතන
- ක්‍රියාත්මක කරන ලද සාර්ව විචක්ෂණ අධිකාරිය
- වැඩිදියුණු කළ නීතිමය සහ නියාමන රාමු
- ආරක්ෂිත, ඵලදායී සහ කාර්යක්ෂම ගෙවීම් පද්ධතිය

**අපේක්ෂිත බලපෑම**

- ශක්තිමත් සහ කම්පනවලට ඔරොත්තු දෙන මූල්‍ය ආයතන
- මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහ විශ්වසනීයත්වය පිළිබඳ ඉහළ මහජන විශ්වාසය

## වැඩි දියුණු කිරීමේ ප්‍රමුඛතා

### ඉහළ විනිවිදභාවයක්, වගවීමක් සහ විශ්වසනීයත්වයක් සඳහා අභ්‍යන්තර හා බාහිර සන්නිවේදනය ශක්තිමත් කිරීම

**අරමුණ**

තේරුම් ගත හැකි මෙන්ම අන්තර්ගතභාවයක් සහ සහභාගීත්වයක් ඇති වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්තීන් ඵලදායි ලෙස සන්නිවේදනය කිරීම

**නිමැවුම්**

- ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා අර්බුදකාරී තත්ත්වයන් සන්නිවේදනය කිරීමේ රාමුවක් ස්ථාපිත කිරීම
- තාක්ෂණික නොවන සාරාංශ සහ අර්ධ මාසික තීරු ලිපි එළි දැක්වීම
- මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ මාධ්‍ය දැනුම්වත් කිරීම් සහ වැඩසටහන් පැවැත්වීම
- පාර්ශ්වකරුවන් සහ ප්‍රේක්ෂකයින් පිළිබඳ විශ්ලේෂණ වාර්තා පිළියෙල කිරීම

**ප්‍රතිඵලය**

- ශ්‍රී ලංකා මහා බැංකුවේ කාර්යභාර්ය සහ ප්‍රතිපත්ති පිළිබඳ පවතින මහජන අවබෝධය ඉහළ යාම
- මූල්‍ය සාක්ෂරතාව සහ අන්තර්ගතභාවය වැඩිදියුණු වීම
- අභ්‍යන්තර සන්නිවේදනය හා ඒ සඳහා වන සූදානම වැඩිදියුණු වීම

**අපේක්ෂිත බලපෑම**

විනිවිදභාවය සහ වගවීම තුළින් ඉහළ නංවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳ විශ්වසනීයත්වය

### නවීන මහ බැංකුවක් සඳහා වර්තමානයේ දී මෙන් ම අනාගතයේදීත් අවශ්‍ය වන මානව සම්පත් කුසලතා වැඩියුණු කිරිම

**අරමුණ**

පවත්නා මානව සම්පත් උපාය මාර්ගය වැඩිදියුණු කිරීම

**නිමැවුම්**

- රැකියා ව්‍යුහයන් සහ මානව ප්‍රාග්ධන මෙහෙයුම් ආකෘතිය සමාලෝචනය කිරීම
- මෙහෙයුම් කටයුතු හා සම්බන්ධ කණ්ඩායම් ස්ථාපිත කිරීම
- මිනිස් බලය පදනම් කර ගත් බඳවාගැනීම
- සංශෝධිත කාර්යසාධන ඇගයීම් යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම
- තාක්ෂණික හා නායකත්ව ප්‍රවීණතා ආකෘතිය වැඩිදියුණු කිරීම

**ප්‍රතිඵලය**

- තීරණාත්මක තනතුරු සඳහා ශක්තිමත් නායකත්ව ක්‍රමවේදයක්
- සියලුම සේවක මට්ටම් සඳහා කඩිනම් බඳවා ගැනීම්, සේවක ඉවත්ව යාම් අවම වීම සහ ප්‍රබෝධමත් වටාපිටාවක් නිර්මාණය වීම
- වඩා ඉහළ සේවක සහභාගිත්වය

**අපේක්ෂිත බලපෑම**

වැඩිදියුණු කරන ලද මානව සම්පත් උපායමාර්ගයක්

# අභියෝග ජය ගත් ආකාරය...

## අර්බුදයෙන් පසු ආර්ථිකය ප්‍රකෘතිමත් වීම

වසර ගණනාවක් පුරා, ශ්‍රී ලංකාව ආර්ථික අභියෝග රැසකට මුහුණ දී ඇතත් ඒ කිසිවක් 2022 අත්දකින ලද අර්බුදය තරම් බැරෑරුම් සහ ගැඹුරු නොවේ. එම අර්බුදයෙන් මිදී යථා තත්ත්වයට පත්වීම සඳහා සියලුම ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සාමූහික උත්සාහය අවශ්‍ය වූ අතර, මහ බැංකුව එහි දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. උද්ධමනය 70%ක් දක්වා ඉහළ යාමත් සමඟ ඉන්ධන සහ මූලික අවශ්‍යතා සඳහා ඇති වූ දිගු පෝලිම් මෙන්ම පැය ගණනක් රට අඳුරේ තබන ලද විදුලිය ඇනහිටීම්වලින් ද පිළිබිඹු කරන ලද පෙර නොවූ විරූ ආර්ථික පසුබෑම දේශපාලන අර්බුදයකට තුඩු දුන් අතර, විදේශ විනිමය සංචිත සියල්ලම පාහේ ක්ෂය වීමෙන් රට 2022 අප්‍රේල් මාසයේ දී, ගෙවුම් ශේෂ අර්බුදයක් අද්දරට ම පැමිණ තිබුණි. ව්‍යුහාත්මක අභියෝග සහ ප්‍රතිපත්තිමය සීමාවන්ගේ දිගුකාලීන බලපෑම පිළිබිඹු කරමින් රුපියල එහි අවම අගයට ළඟා වී තිබුණි. විදේශ ආයෝජකයන් මෙරටින් ඉවත් වීම ආරම්භ කළ අතර, විදේශීය ණයහිමියෝ ශ්‍රී ලංකාවට ලබා දිය නොහැකි ආකාරයේ ණය ගෙවීමේ සහතික ඉල්ලා සිටියහ. බිහිසුණු ආර්ථික ව්‍යසනයක් ඇති වීම වළක්වා ගැනීම සඳහා වසර ගණනාවක් පුරා සිදු වූ ප්‍රතිපත්තිමය වැරදි එක රැයකින් පාහේ නිවැරදි කිරීම අත්‍යවශ්‍ය විය.

මෙම අර්බුදය මහ බැංකුවට තනිව විසඳා ගත හැකි එකක් නොවූ අතර ඒ සඳහා සියලුම ප්‍රධාන පාර්ශ්වකරුවන් සහ සමස්ත රාජ්‍ය තන්ත්‍රය සමග එක්ව සාමූහිකව කටයුතු කිරීමට මහ බැංකුවට සිදු විය. ඒ අනුව, සාර්ව ආර්ථිකයේ ශීඝ්‍ර පසුබෑම සමඟ, ආර්ථික පරිසරය ඉක්මනින් ස්ථාවර කිරීමේ සහ විශ්වාසය යථා තත්ත්වයට පත් කිරීමේ අභියෝගයට මහ බැංකුව සහ රජය යන දෙපාර්ශ්වයම මුහුණ දුන්හ.

## ණය පියවීම

පොලී අනුපාතික ඉහළ නැංවීම් සහ ද්‍රවශීලතා කළමනාකරණයෙන් පමණක් ශ්‍රී ලංකාවේ අර්බුදයට හේතු වූ මූලික කරුණු විසඳිය නොහැකි වූ අතර තිරසාර නොවන ණය ඉතා වැදගත් සාධකයක් විය. 2022 දී, රජය සහ මහ බැංකුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ එ.ජ.ඩො.බි. 2.9ක මූල්‍ය පහසුකමක් ලබා ගැනීම සඳහා සාකච්ඡා ආරම්භ කළහ. මෙම ගනුදෙනුව මුදල් පමණක් නොව විශ්වසනීයත්වයට ද ඉතා වැදගත් විය. IMF විස්තීර්ණ අරමුදල් පහසුකම (EFF) ලබා ගැනීමේ දී එකඟ වූ ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙල රට නිවැරැදි ප්‍රතිපත්ති ගමන් මාර්ගයකට යොමු කිරීමට හේතු විය.

ශ්‍රී ලංකාවේ විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ දී මහ බැංකුව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. ඒ අනුව, රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමේ සහ දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වයට සහාය වන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම්වලට එළඹීම සඳහා ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික, සහ පෞද්ගලික ණයහිමියන් සමඟ සිදු කළ පුළුල් සාකච්ඡාවලට ශ්‍රී ලංකාව සහභාගී වූ අතර, එහි දී ණයහිමියන්ගේ අවශ්‍යතා ද සැලකිල්ලට ගත්තේය. 2024 අග භාගයේ දී මෙම සංකීර්ණ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් වීමට ආසන්න වීමත් සමඟම, ජාත්‍යන්තර වෙළෙඳපොළවල වැඩිදියුණු වූ අපේක්ෂා, ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවලින් ලැබුණු ධනාත්මක සංඥා සහ ශ්‍රී ලංකාවේ මූල්‍ය දැක්ම පිළිබඳ විශ්වාසය යථා තත්ත්වයට පත්වීමේ සලකුණු මගින් අප රටට සහනදායි බවක් ඇති විය.

## මහ බැංකුව මුහුණ දුන් අසීරුතම අභියෝගය

උද්ධමනය පාලනය කිරීමට සහ ආර්ථිකය ස්ථාවර කිරීමට මහ බැංකුවට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට සිදු විය. ඒ අනුව, බැංකුව ඉහළ අගයකින් පොලී අනුපාතික ඉහළ දැමූ අතර, මුල් අවස්ථාවේ දී ඒ පිළිබඳ ව විශේෂයෙන් ව්‍යාපාරික ප්‍රජාවේ විරෝධය එල්ල විය. කෙසේ වෙතත්, මෙම ක්‍රියාමාර්ගය මාස කිහිපයක් ඇතුළත උද්ධමනය පාලනය කිරීමට හේතු වූ අතර, දිගුකාලීන ස්ථාවරත්වය සඳහා කෙටි කාලීන කැපකිරීම්වල අත්‍යවශ්‍ය බව මහජනතාව හඳුනා ගත්හ. ආරම්භය දුෂ්කර වූ නමුත්, ස්ථාවරත්වයට ප්‍රමුඛත්වය දෙමින් මුදලේ වේගවත් අවප්‍රමාණය ක්‍රමානුකූල ව මැඩපවත්වන ලදි.

මෙම ප්‍රයත්නයන් සඳහා පෙර නොපැවති විනිවිදභාවයක් සහිත වීම අවශ්‍ය විය. මහ බැංකුව මහජනතාව, ව්‍යාපාර සහ බාහිර පාර්ශ්වකරුවන් සමඟ වඩාත් විවෘතව සන්නිවේදනය කිරීමට පටන් ගත් අතර, වැදගත් ප්‍රවණතා පිළිබඳ ව නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම් සිදු කළේය. කාලයත් සමඟ ඛාදනය වී ගිය විශ්වාසය නැවත ගොඩනගා ගැනීමට මෙම විනිවිදභාවය මහඟු පිටිවහලක් විය.

## මූල්‍ය ස්ථාවරත්වය ශක්තිමත් කිරීම

අර්බුදය අතරතුර, මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය පවත්වා ගැනීමේ අභියෝගයට ද මහ බැංකුව මුහුණ දුන්නේය. කම්පන හමුවේ මනාව මුහුණ දෙන බැංකු පද්ධතියක් නොමැතිව මූල්‍ය පද්ධතිය යථා තත්ත්වයට පත් කිරීම කළ නොහැකි බැවින්, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකබව ඉහළ නැංවීමට මෙන්ම බැංකුවලට ඔවුන්ගේ අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලිය හැකි බව තහවුරු කිරීමට ද මහ බැංකුව, බැංකු අංශය සඳහා ප්‍රතිප්‍රාග්ධනීකරණ උපාය මාර්ගයක් දියත් කළේය. මහ බැංකුව, සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ලෙස දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකු (DSIB) සඳහා අතිරේක ප්‍රාග්ධන ස්වාරක්ෂක පවත්වා ගැනීමට නියම කිරීම මගින් මූල්‍ය පද්ධති ස්ථායීතාව ශක්තිමත් කරන ලදි. බැංකු (විශේෂ විධිවිධාන) පනත (BSPA) අර්බුද කළමනාකරණය සඳහා නීතිමය පදනමක් සපයන ලද අතර මූල්‍ය අංශ ස්ථායීතා අරමුදල (FSF) ආරක්ෂණ දැලක් ලෙස ස්ථාපිත කරන ලදි. තාවකාලික ද්‍රවශීලතා අර්බුදයට විසඳුම් සෙවීම සඳහා, බැංකු පද්ධතිය මත පීඩනය පද්ධතිමය අවදානමක් දක්වා විහිදී යාම වැළැක්වීම සඳහා මහ බැංකුව හදිසි ද්‍රවශීලතා ආධාරක රාමුවක් ද හඳුන්වා දුන්නේය.



මෙහෙයුම් තොරතුරු   මූල්‍ය ප්‍රකාශ   අතිරේක තොරතුරු

අර්බුදය අතරතුර සහ ඉන් පසුව, මහ බැංකුව මූල්‍ය පද්ධතිය පිළිබඳව දැඩි නිරීක්ෂණයකින් පසු වූ අතර, ණය විරාම, කාරක ප්‍රාග්ධන සහාය සහ ප්‍රතිව්‍යුහගත කිරීම හරහා සහන ලබා දීම සඳහා රජය සහ අනෙකුත් ආයතන සමඟ එක්ව කටයුතු කළේය. 2022 ආර්ථික පසුබෑමට පෙර ගනු ලැබූ බැංකු හරහා ව්‍යාපාරවලට උපකාර කළ COVID-19 ආධාරක ඒකක සහ ව්‍යාපාර පුනර්ජීවන ඒකක (BRUs) වැනි ක්‍රියාමාර්ගවලින් ද ආර්ථිකයට ප්‍රතිලාභ හිමි විය. පසුගිය වසර දෙක තුළ, මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීම සහ තිරසාර වර්ධනයක් සඳහා අඩිතාලම දැමීම සඳහා ආයතනික පාලන ප්‍රතිසංස්කරණ, නීතිමය වෙනස්කම් සහ ක්‍රියාකාරී අධීක්ෂණය කෙරෙහි මහ බැංකුව වැඩි වශයෙන් අවධානය යොමු යොමු කරන ලදි.



## ශක්තිමත් මහ බැංකුවක්

කෙටිකාලීන නිවැරදි කිරීම්වලට අමතරව, මහ බැංකුව සමස්ත මුදල් ප්‍රතිපත්ති රාමුව තවදුරටත් ශක්තිමත් කරමින් සිටියි. පසුගිය වසර දෙක තුළ, මහ බැංකුව දිගුකාලීන මිල ස්ථායීතාව කෙරෙහි අවධානය යොමු කරමින් නම්‍යශීලී විනිමය අනුපාතයක් සහිත නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ (FIT) රාමුවක් අනුගමනය කරන ලද අතර මුදල් ප්‍රතිපත්ති තීරණ වඩාත් ක්‍රමානුකූල දත්ත මත පදනම් වූ සහ ඉදිරි දැක්මක් ඇති තීරණ බවට පත් කිරීම සඳහා සිය පුරෝකථන ආකෘති වැඩි දියුණු කළේය.

ශ්‍රී ලංකාව විසින් අත්දකින ලද ආර්ථික පසුබෑමේ සුවිශේෂි ප්‍රතිඵලයක් වූයේ මහ බැංකුවේ ස්වාධීනත්වය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට රජය ඇතුළු අදාළ පාර්ශ්ව විසින් කටයුතු කරනු ලැබීමයි. ඒ අනුව 2023 දී සම්මත කරන ලද මහ බැංකු පනත මගින් සාර්ව ආර්ථික මූලධර්ම මූලික කර ගත් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය නීතිමය පසුබිම මෙන්ම ස්වාධිනත්වය ද මහ බැංකුවට ලබා දී ඇත. ඒ අනුව, වසර 75ක ඉතිහාසයෙන් වැඩි කාලයක් රාජ්‍ය මූල්‍ය බලපෑම යටතේ ගත කිරීමෙන් පසු, ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට සහය වීමේ වගකීම මහ බැංකුවට ලබා දී ඇති අතර, උද්ධමනය පාලනය කිරීමේ සිට මූල්‍ය ස්ථායීතාව තහවුරු කිරීම සහ තිරසාර ආර්ථික වෘද්ධිය ප්‍රවර්ධනය කිරීම දක්වා, පසුගිය වසර දෙක තුළ මහ බැංකුවේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග තීරණාත්මක විය.

## යථා තත්ත්වයට පත්වීමේ සිට ආර්ථික වර්ධනය දක්වා

2024 වන විට, මහ බැංකුවේ, රජයේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ජාත්‍යන්තර හවුල්කරුවන්ගේ ඒකාබද්ධ උත්සාහයන් තුළින් සමස්ත ආර්ථිකයේ තත්ත්වය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. පාලනයෙන් තොරව වැඩි වූ උද්ධමනය පසුව 2% කට වඩා අඩු සාමාන්‍ය අගයකට ළඟා විය. ඉහළ මට්ටමක පැවති පොලී අනුපාතික ක්‍රමයෙන් ලිහිල් වීමත් සමග පෞද්ගලික අංශයේ ණය ලබා ගැනීම් යථා තත්ත්වයට පත් වූ අතර, මහ බැංකුව විසින් රාජ්‍ය මූල්‍ය හිඟයන් මූල්‍යනය කිරීම ද අවසන් විය. මහ බැංකුවේ කාර්යභාරය හදිසි අවස්ථාවල දී කඩිනමින් ප්‍රතිචාර දැක්වීමේ සිට සාර්ව ආර්ථික ස්ථායීතාව සඳහා දායක වීම දක්වා පරිණාමය විය. වෙළඳපොළ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය සරල කිරීම අරමුණු කරමින් 2024 නොවැම්බර් මාසයේ දී ද්විත්ව ප්‍රතිපත්ති අනුපාතික ක්‍රමය වෙනුවට තනි එක් දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයක් හඳුන්වා දීම මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තියේ සාධනීය පියවරකි.

මේ අතර, 2024 වන විට ශ්‍රී ලංකාවේ විදේශ සංචිත එ.ජ.ඩො.බි. 6 ඉක්මවා ගොස් තිබුණි. ආයෝජක විශ්වාසය නැවත ගොඩනැගෙමින් තිබූ අතර, එය සැබෑ දිගුකාලීන වර්ධනයක් සඳහා අපේක්ෂාවන් ඇති කළේය. අස්ථාවරව පැවති ශ්‍රී ලංකා රුපියල, විදේශ විනිමය වෙළෙඳපොළේ ඉල්ලුම සහ සැපයුම් තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමෙන් යළි ස්ථාවර විය. පසුගිය වසරවල පැවති අවිනිශ්චිතභාවය මැකී යමින් තිබූ අතර, ඒ වෙනුවට ශුභවාදී ආකල්පයක් ඇතිවිය.



## ඉදිරි මාවත

අර්බුදය මඟහරවා ගැනීම සඳහා මහ බැංකුව, රජය සහ මහජනතාවගේ සාමූහික උත්සාහයන් අතිශය තීරණාත්මක සාධකයකි. එකී සහයෝගය තුළින් කැපී පෙනෙන ප්‍රගතියක් මේ වන විටත් අත් කර ගෙන තිබුණ ද, ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වත්මන් ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය තව දුරටත් එලෙසින් ම ක්‍රියාත්මක නොකරන්නේ නම් නැවතත් බිඳ වැටීමකට ලක් විය හැකිය. මහජනතාව සහ ව්‍යාපාර තවදුරටත් 2022 දී පැවති ඉහළ උද්ධමනය නිසා වැඩි වූ ජීවන වියදම සහ නිෂ්පාදන වියදම්වල බලපෑම සමඟ කටයුතු කරයි. මූල්‍ය ආයතන ස්ථාවර වී තිබුණ ද, තවමත් සම්පූර්ණයෙන් යථා තත්ත්වයට පැමිණ නැත. එමෙන්ම ගෝලීය ආර්ථික අභියෝග සහ භූ දේශපාලනික අවිනිශ්චිතතාවන් නිසා ද අනාගත අවදානම් ඇති විය හැකිය.

2022 අර්බුදය, සාර්ව ආර්ථික මූලධර්ම නොසලකා හරින විට සිදුවන්නේ කුමක්ද යන්න මනාව විදහා දක්වන සියලු දෙනා අවදි කිරීමේ ඇමතුමක් ලෙස සැලකිය හැකි ය. එහි දී අර්බුදය කළමනාකරණයෙහි ලා ප්‍රතික්‍රියාශීලී ආර්ථික ප්‍රතිපත්තියේ සිට ක්‍රියාශීලී ආර්ථික ප්‍රතිපත්තියට විතැන් ව සිය කාර්යභාරය ඉටු කළ මහ බැංකුවේ ප්‍රතිචාරය තීරණාත්මක විය. මහ බැංකුව අර්බුදය කළමනාකරණය කොට විසඳීමට මඟ පෙන්වූවා පමණක් නොව, ශ්‍රී ලංකාවේ ආර්ථික අනාගතය තුළ මහ බැංකුවේ කාර්යභාරය නැවත සනිටුහන් කිරීමක් ද සිදු කළේය. රට තවමත් සම්පූර්ණයෙන් යථා තත්ත්වයට පත් වී නොමැති වුව ද, ලබා ඇති ප්‍රගතිය පැහැදිලි මෙන්ම දෘශ්‍යමාන එකකි. දැඩි ආර්ථික කඩාවැටීමක් අභිමුව සිටි රටක් නැවත ආපසු හැරවීමට ශක්තිමත් මුදල් අධිකාරියකට ඇති හැකියාව පිළිබිඹු කරමින් මහ බැංකුව අනෙකුත් පාර්ශ්වකරුවන් සමග එක්ව ඉටු කරන ලද කාර්ය භාරය දිනෙක මහජනතාවගේ ප්‍රශංසාවට ලක්වනු ඇත.

# දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම

මහජනතාවට ඉහළ ජීවන තත්ත්වයක් පවත්වාගෙන යාමට උපකාරවන පුරෝකථනය කළ හැකි මිල මට්ටම් පවත්වාගෙන යාම මගින්, පුරවැසියන්ගේ ආර්ථික යහපැවැත්ම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණ වන දේශීය මිල ස්ථායීතාව රැක ගැනීම අත්‍යවශ්‍ය වේ. මිල ස්ථායීතාව ආයෝජක විශ්වාසය ද ඉහළ නංවනු ලබන අතර එය දිගුකාලීන වර්ධනයට ද මඟ පාදයි.

## මුදල් ප්‍රතිපත්ති සම්පාදනය

මහ බැංකු පනත අනුව, මුදල් ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වගකිව යුතුය. ඒ අනුව, මිල ස්ථායීතාව අත් කර ගැනීම සහ පවත්වාගෙන යාම පිණිස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ (FIT) රාමුව සමඟ සමපාත වන නම්‍යශීලී විනිමය අනුපාත ක්‍රමයක් මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව සහ මුදල් අමාත්‍යවරයා අතර අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම (MPFA)[1] අනුව ශ්‍රී ලංකා මහ බැංකුව මතුපිට උද්ධමනය 5% මට්ටමක පවත්වා ගත යුතුය.

## උද්ධමන ඉලක්කය සපුරා ගැනීමේ වගකීම

රූප සටහන 03




## මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය

විශේෂයෙන් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ඇතුළු විවිධ ප්‍රතිපත්ති උපකරණ භාවිතා කරමින්, නියමිත උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට මහ බැංකුව කටයුතු කරන අතර, ඉතා හොඳින් ව්‍යුහගත කරන ලද තීරණ ගැනීමේ ක්‍රියාවලියක් මගින් මුදල් ප්‍රතිපත්ති රාමුව ක්‍රියාවට නංවයි. බැංකුවේ මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය, පුරෝකථනය සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය (FPAS) මත පදනම් වේ.

මෙම ක්‍රියාවලිය ආරම්භ වන්නේ කාර්ය මණ්ඩල මට්ටමේ රැස්වීම් සමඟින් වන අතර, එහි දී එක් එක් අංශයෙහි විශේෂ දැනුම ඇති නිලධාරීන් විසින් මූලික මට්ටමේ ආර්ථික දත්ත, සාර්ව ආර්ථික ප්‍රවණතා සහ උද්ධමනය හා වර්ධනයට බලපාන ප්‍රධාන විචල්‍යයන් සමාලෝචනය කරනු ලබයි.

ණය අනුපාතික, තැන්පතු අනුපාතික, අනෙකුත් සාර්ව ආර්ථික විචල්‍යයන් සහ ගෝලීය වර්ධනයන් වැනි දර්ශක මෙම රැස්වීම්වල දී ගැඹුරින් විශ්ලේෂණය කරනු ලබන අතර, එය බැංකුවේ සමස්ත මුදල් ප්‍රතිපත්ති දිශානතිය තීරණය කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකසයි.

ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් පුරෝකථන කරන කාර්තුමය පුරෝකථන ආකෘතිය (QPM) මහ බැංකුව භාවිතා කරන වඩාත් වැදගත් පුරෝකථන මෙවලමකි. මූලික පුරෝකථනයන් සමාලෝචනය කිරීමෙන් අනතුරුව, යාවත්කාලීන දත්ත විශ්ලේෂණය කිරීමට සහ QPM පුරෝකථන සඳහා අවශ්‍ය ගැලපුම් සිදු කිරීමට දෙවන මට්ටමේ කාර්ය මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබේ.

පූර්ව මුදල් ප්‍රතිපත්ති කමිටු (Pre-MPC) රැස්වීම විවෘත (I වන අදියර) සහ සංවෘත (II වන අදියර) සාකච්ඡා යන කොටස් දෙකකින් සමන්විත වේ. I වන අදියර යනු අවදානම් විශ්ලේෂණය සමඟ ගැටලු මත පදනම් වූ තාක්ෂණික මට්ටමේ සාකච්ඡාවන් වන අතර II වන අදියරේ දී හි දී මැදි කාලීන පුරෝකථන පිළිබඳව සාකච්ඡා කරයි.

### රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති, මුදල් ප්‍රතිපත්ති සහ මූල්‍ය පද්ධති ස්ථායීතා ප්‍රතිපත්ති සම්බන්ධීකරණය

මහ බැංකු පනතෙහි 83 වන වගන්තිය යටතේ නියම කර ඇති පරිදි, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මුදල් හා මූල්‍ය පද්ධති ස්ථායීතා ප්‍රතිපත්ති එකිනෙකාට බලපාන ආකාරය පිළිබඳ සවිස්තරාත්මකව සාකච්ඡා කිරීම සඳහා 2023 අග භාගයේ දී රාජ්‍ය මූල්‍ය, මුදල් ප්‍රතිපත්ති සහ මූල්‍ය ස්ථායීතා සම්බන්ධීකරණ කවුන්සිලය (සම්බන්ධීකරණ කවුන්සිලය) පිහිටුවන ලදී. මෙහි දී මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය මෑත කාලීන සාර්ව ආර්ථික ප්‍රවණතා, ඉදිරි දැක්ම සහ අවදානම් පිළිබඳ තොරතුරු හුවමාරු කර ගන්නා අතර උද්ධමනය, මුදල් තත්ත්වයන් සහ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කෙරෙහි රජයේ ආර්ථික ප්‍රතිපත්තිවල බලපෑම ද තක්සේරු කරනු ලැබේ. මහ බැංකු අධිපතිවරයා සහ භාණ්ඩාගාර ලේකම්වරයා අතර පැවති සම්බන්ධීකරණ කවුන්සිල රැස්වීම් 2024 පෙබරවාරි 19, ජූනි 19, සැප්තැම්බර් 09 සහ දෙසැම්බර් 19 යන දිනවල දී පැවැත්විණි.

[1]සෑම වසර තුනකටම වරක් හෝ විශේෂිත තත්ත්වයක් උද්ගත වූ අවස්ථාවක දී හෝ අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා මහ බැංකුවට උද්ධමන ඉලක්කය හා ඊට අදාළ පරාමිතීන් සමාලෝචනය කළ හැකිය. අමාත්‍යවරයා විසින් ඉන් අනතුරුව සංශෝධිත උද්ධමන ඉලක්කය හා පරාමිතීන් ගැසට් නිවේදනයන් මඟින් ප්‍රකාශයට පත් කළ යුතුය.





## මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය

රූප සටහන 04




මුදල් ප්‍රතිපත්ති කමිටුව මහ බැංකු අධිපති, නියෝජ්‍ය අධිපතිවරුන්, අදාළ සහකාර අධිපතිවරුන්, සහ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු ජ්‍යෙෂ්ඨ මහ බැංකු නිලධාරීන්ගෙන් සමන්විත වේ. කමිටුවේ මූලික කාර්යය වන්නේ ආර්ථික තත්ත්වයන් සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීමෙන් පසු සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීමයි. ඒ අනුව ප්‍රධාන වශයෙන් මුදල් ප්‍රතිපත්තියේ දිශාව නිර්දේශ කිරීමට මෙම කමිටුව කටයුතු කරයි. ඉන් අනතුරුව එම නිර්දේශ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබේ.

මුදල් ප්‍රතිපත්ති කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ සම්බන්ධ අවසාන අධිකාරිය මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සතුය. යෝජිත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුමත කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් සිදු කෙරේ. මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය තීරණයකට එළඹුණු පසුව, එම ප්‍රතිපත්තිය මුදල් ප්‍රතිපත්ති සමාලෝචන මාධ්‍ය නිවේදනයක් හරහා ප්‍රසිද්ධියේ නිවේදනය කරනු ලබයි. එය පසු දා සාමාන්‍යයෙන් පෙ.ව. 7:30 ට පමණ නිකුත් කරනු ලබන අතර, අදාළ තීරණය පිළිබඳව තවදුරටත් පැහැදිලි කිරීම සඳහා අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් මාධ්‍ය හමුවක් පැවැත්වේ.

### මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය

විනිවිදභාවය පිළිබඳ ප්‍රතිපත්තියට අනුගත වීමෙන් මහ බැංකුව එහි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සියලුම පාර්ශ්වකරුවන්ට නිසි ලෙස තේරුම් ගත හැකි ලෙස ප්‍රකාශයට පත් කරයි. 2024 දී, මුදල් ප්‍රතිපත්ති මණ්ඩල රැස්වීම් හයක් පවත්වන ලද අතර සෑම රැස්වීමකින් අනතුරුව ම මාධ්‍ය නිවේදන නිකුත් කළ අතර මාධ්‍ය සාකච්ඡා ද පවත්වන ලදී. ඊට අමතරව, බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පැහැදිලි කිරීම සඳහා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මාධ්‍ය සම්මුඛ සාකච්ඡාවලට සහභාගි විය. පුළුල් ප්‍රේක්ෂක පිරිසක් සම්බන්ධ කර ගැනීමට සහ ප්‍රතිපත්ති පිළිබඳ අවබෝධය ඉහළ නැංවීමට මහ බැංකුව එහි සමාජ මාධ්‍ය ඉතා හොඳින් භාවිත කරන ලද අතර සරල ප්‍රකාශන සටහන් ද යොදා ගන්නා ලදී.

වර්තමාන ආර්ථික වර්ධනයන් සහ ප්‍රතිපත්ති ගැළපීම් පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම සඳහා අර්ධ වාර්ෂික මුදල් ප්‍රතිපත්ති වාර්තා[2] නිකුත් කරන ලදී. 2024 දී ආරම්භ වූ තවත් අර්ධ වාර්ෂික ප්‍රකාශනයක් වන්නේ වෙළඳපොළ මෙහෙයුම් වාර්තාව[3] ය. මෙම වාර්තාවේ බැංකුවේ මධ්‍යම මුදල් මෙහෙයුම් පිළිබඳ සාරාංශයක් මෙන්ම දේශීය මුදල් වෙළඳපොළේ වර්ධනයන් ද ඇතුළත් වේ.

[2]https://www.cbsl.gov.lk/en/publications/economic-and-financial-reports/monetary-policy-reports

[3]https://www.cbsl.gov.lk/en/publications/economic-and-financial-reports/market-operations-report

### 2024 ප්‍රධාන ක්‍රියාකාරකම්

2024 දී මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳව රැස්වීම් හයක් පැවැත් වූ අතර, ජනවාරි 23, මාර්තු 26, මැයි 28, ජූලි 24, සැප්තැම්බර් 27 සහ නොවැම්බර් 27 යන දිනවල එම රැස්වීම්වලට අදාළ ප්‍රතිපත්ති නිවේදන නිකුත් කරන ලදි. 2024 පළමු කාර්තුවේ දී උද්ධමනය ඉලක්කයට ආසන්න පරාසයක් තුළ පැවතුණි. කෙසේ වෙතත්, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) මගින් මනිනු ලබන උද්ධමනය, දෙවන සහ තුන්වන කාර්තුවල දී අඛණ්ඩ කාර්තු දෙකක දී ඉලක්කයෙන් පහළ දිශාවට අපගමනය විය.

ඒ අනුව 2025 ජනවාරි 10 වන දින මුදල් අමාත්‍යවරයා හරහා උද්ධමනය ඉලක්කයෙන් බැහැර වීම පිළිබඳ වාර්තාවක්[4] පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර එම වාර්තාව 2025 ජනවාරි 23 වන දින රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවේදී (CoPF) තවදුරටත් සාකච්ඡා කරන ලදි. 2024 සිව්වන කාර්තුවේදී ද උද්ධමනය ඉලක්කයෙන් බැහැර වීම දිගටම පැවතුණි.

## මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

### දේශීය රුපියල් වෙළඳපොළ මෙහෙයුම්

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මගින් වර්තමාන නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ මෙහෙයුම් ඉලක්කය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) එක් දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සමාන ව හෝ ඊට ආසන්නව පවත්වා ගැනීම අරමුණු කරයි.

2024 නොවැම්බර් 27 දින නව ප්‍රතිපත්ති පොලී අනුපාතික රාමුවක් වෙත යොමු වීමත් සමඟ එක් දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 8.00%ක් ලෙස තීරණය කරන ලදි. මෙය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සන්නිවේදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ මූලිකම උපකරණය බවට පත් විය.

**ශ්‍රී ලංකාව තුළ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය** රූප සටහන 05




### නව ප්‍රතිපත්ති පොලී අනුපාතික යාන්ත්‍රණය හඳුන්වා දීම

2024 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි සඳහන්කර ඇති පරිදි 2024 නොවැම්බර් 27 දින සිට බලපැවැත්වෙන පරිදි එක් දින ප්‍රතිපත්ති පොලී අනුපාතික යාන්ත්‍රණය අවශ්‍ය මෙහෙයුම් වෙනස්කම් සහිතව හඳුන්වාදෙන ලදි. මෙම රාමුව යටතේ එක් දින මුදල් වෙළඳපොළ ගනුදෙනු සඳහා පදනම් අනුපාතිකයක් ලෙස සහ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සංඥා කිරීම සඳහා ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙසද මෙම එක් දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වා දෙන ලදි. උද්ධමනයේ ඉලක්කගත ගමන් මාර්ගය සමඟ පොලී අනුපාතික ව්‍යුහය පෙළ ගැස්වීම සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් එය වරින්වර සමාලෝචනය කර ගලපනු ලබයි.

### විවට වෙළඳපොළ මෙහෙයුම්

දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සඳහා විවට වෙළඳපොළ කටයුතු මහ බැංකුව විසින් භාවිතා කරනු ලබන අතර, එමගින් කෙටි කාලීන පොලී අනුපාතික ප්‍රතිපත්ති අරමුණු සමග අනුකූල වන බව සහතික කරයි.

ද්‍රවශීලතාව වෙළඳපොළට සැපයීම සඳහා වන මෙහෙයුම් ලෙස, කෙටි කාලීන සහ දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි (දින 1-7 සහ දින 8-90, පිළිවෙළින්), ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර මිල දී ගැනීමේ වෙන්දේසි, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා වන ද්‍රවශීලතා ආධාරක පහසුකම සහ විදේශ විනිමය හුවමාරු ගිවිසුම් (මිලට ගැනීම් - විකිණීම්) යොදාගනු ලබයි. අනෙක් අතට, කෙටි කාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි (දින 1-7), දිගුකාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි (දින 8-90), ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර විකුණුම් වෙන්දේසි සහ විදේශ විනිමය හුවමාරු ගිවිසුම් (විකුණුම් - මිලදී ගැනුම්) වෙළඳපොළෙන් අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කරගැනීම සඳහා වන මෙහෙයුම් ලෙස යොදාගනු ලබයි.

ඉහත සඳහන් මෙහෙයුම්වලට අමතරව මහ බැංකුව පහත පහසුකම් ද සපයනු ලබයි.

- **නිත්‍ය පහසුකම:** මුදල් වෙළෙඳපොළ සහ විවට වෙළඳපොළ කටයුතු හරහා කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාගැනීමට අපොහොසත් වන සහභාගීත්ව ආයතන සඳහා මෙම පහසුකම සපයනු ලබයි. මෙම පහසුකම තුළ නිත්‍ය තැන්පතු පහසුකම සහ නිත්‍ය ණය පහසුකම අන්තර්ගත වේ.
- **දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම:** තත්කාලීන දළ පියවුම් පද්ධතියෙහි සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා සෘජු අලෙවි සහභාගිකරුවන්ට පහසුකම් සැලසීමට මෙම පහසුකම සපයනු ලබයි.

**ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව:** බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය සමස්ත රුපියල් තැන්පතු වගකීම්වල කොටසක් මහ බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන සංචිත ගිණුම්වල අනිවාර්යයෙන්ම පවත්වාගෙන යා යුතුය.

### 2024 ප්‍රධාන ක්‍රියාකාරකම්

දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්වය 2024 වසර පුරා වර්ධනය වූ අතර, දෙසැම්බර් මස අවසානය වන විට රු.බි. 168.1ක අතිරික්තයක්ව පැවතුණි. මෙම වර්ධනය සඳහා මහ බැංකුවෙහි විදේශ විනිමය මිලට ගැනීම් සහ විදේශ විනිමය හුමවාරු ගිවිසුම් ප්‍රධාන වශයෙන්ම හේතු විය. සහභාගීත්ව ආයතන අතර ද්‍රවශීලතාව බෙදීයාමේ අසමතුලිතතාව හේතුවෙන් කෙටි කාලීන පොලී අනුපාතිකවල ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා මහ බැංකුව විසින් අවශ්‍යතාව අනුව ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලදි.

මුදල් වෙළඳපොළ හා විවට වෙළඳපොළ වෙන්දේසි හරහා කෙටි කාලීන අවශ්‍යතා සපුරාගැනීමට අපොහොසත් වූ සහභාගීත්ව ආයතනවලට එක් දින පහසුකමක් ලෙස නිත්‍ය පහසුකම සපයන ලදි.

තත්කාලීන දළ පියවුම් පද්ධතියෙහි සුමට ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සඳහා සුදුසුකම්ලත් සහභාගිත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම සපයන ලදි.

ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව 2%ක් ලෙස නොවෙනස්ව පැවතුණි.

2024 වසරේ දී, ද්‍රවශීලතා ආධාරක පහසුකම සඳහා හෝ හදිසි ද්‍රවශීලතා අවශ්‍යතා පහසුකම සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවුණි.

**2024 දී මහ බැංකුවේ නිත්‍ය පහසුකමේ හැසිරීම** ප්‍රස්ථාර සටහන - 02




[4] https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/report_on_deviation_of_inflation_target_Q2_and_Q3_2024_e.pdf

## දේශීය විදේශ විනිමය වෙළඳපොළ මෙහෙයුම්

ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමඟ නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියට අනුකූලව විදේශ විනිමය මෙහෙයුම් සිදු කරයි. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව, මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂක පද්ධතිය (CIMM) භාවිතා කරමින් අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළ අධීක්ෂණය කරයි. මෙම පද්ධතිය හරහා විනිමය අනුපාතිකයේ සැලකිය යුතු උච්චාවචනයන් හඳුනා ගැනීමට පුළුවනි. මෙම අධීක්ෂණ හරහා දේශීය විදේශ විනිමය වෙළඳපොළ සුමටව ක්‍රියාත්මක වීමට පහසුකම් සපයන අතර වෙළඳපොළ සහභාගිවන්නන් අතර ආචාරධර්ම සහ ඵලදායී ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කරයි.

දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ විනිමය අනුපාතිකයේ අධික අස්ථාවරත්වය කළමනාකරණය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය අවශෝෂණය හෝ සැපයීම මගින් වෙළෙඳපොළට මැදිහත්වීම් සිදු කරන අතර එමගින් දළ නිල සංචිත ගොඩනැගීම ශක්තිමත් කරයි. දළ නිල සංචිත රැස් කර ගැනීම සඳහා තාවකාලික පියවරක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමඟ ද්විපාර්ශ්වික ගැනුම්-විකුණුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම් සිදු කරනු ලබන අතර, සංචිත ස්ථිරවම ක්ෂය නොකර විදේශ විනිමය ද්‍රවශීලතාවය සැපයීමට හෝ රුපියල් ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමඟ විකුණුම්-ගැනුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම්වලට ද සම්බන්ධ වේ.

### 2024 ප්‍රධාන ක්‍රියාකාරකම්

දේශීය විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් වීමෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව එ. ජ. ඩො. මි. 3,028.6ක විදේශ විනිමය මිලදී ගැනීමක් සිදු කළ අතර එ. ජ. ඩො. මි. 183.0ක විදේශ විනිමය සැපයීමක් සිදු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස එ. ජ. ඩො. මි. 2,845.6 ක වාර්තාගත ශුද්ධ මිලදී ගැනීමක් සිදු වූ අතර එය බැංකු ඉතිහාසයේ වසරක් තුළ වාර්තා වූ ඉහළම අගය විය. එමගින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ සපුරා ගත යුතු ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්කය ඉක්මවා ගියේය.

ශ්‍රී ලංකා මහ බැංකුව එ. ජ. ඩො. මි. 856.0ක නව ගැනුම්-විකුණුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම් සිදු කල අතර එ. ජ. ඩො. මි. 1,125.0ක ගැනුම්-විකුණුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම් අලුත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස, දළ නිල සංචිත, 2023 වසර අවසානයේ වාර්තා වූ එ. ජ. ඩො. මි. 4,392.1 සිට 2024 වසර අවසාන වන විට එ. ජ. ඩො. මි. 6,122.0ක් දක්වා එ. ජ. ඩො. මි. 1,729.9කින් ඉහළ ගියේය.

### ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය ගෝලීය කේතය යොදා ගැනීම

ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහය යනු විදේශ විනිමය වෙළඳපොළ තුළ ආචාරධර්ම, විනිවිදභාවය, සහ විශිෂ්ට පරිචයන් ප්‍රවර්ධනය කරන ගෝලීය රාමුවකි. ශ්‍රී ලංකාවේ දේශීය විදේශ විනිමය වෙළඳපොළ ප්‍රවර්ධනය සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමයේ (SLFA) සහයෝගය ද ඇතිව, එහි මූලධර්ම හඳුන්වා දීමට බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව දිරි ගන්වමින් විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහය හඳුන්වා දෙන ලදි. සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහයෙහි දක්වා ඇති විශිෂ්ට පරිචයන් පිළිගැනීම සහ ඒවා අනුගමනය කිරීමට එකඟතාව දක්වන අනුගත වීමේ ප්‍රකාශයන් ඔවුන්ගේ අදාළ වෙබ් අඩවිවල සටහන් කර ඇත. විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහයට අනුගත වීම සඳහා තම කැපවීම ප්‍රකාශ කර ඇති ශ්‍රී ලංකා දේශීය විදේශ විනිමය වෙළඳපොළ සහභාගිවන්නන් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන පොදු ලේඛනය ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමයේ වෙබ් අඩවිය හරහා පරිශීලනය කළ හැකිය.





### දත්ත පදනම් කරගත් තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ට සහය වීම සඳහා භාවිතා කරන සමීක්ෂණ සහ දර්ශක

#### ▸ ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය

2014 වසරේ දී ආරම්භ කළ ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය යනු අනාගත ආර්ථික ප්‍රවණතා පිළිබඳ පුරෝකථන ලබා ගැනීම සඳහා වර්තමාන ආර්ථික වාතාවරණය සහ වෙළඳපොළ තත්ත්වයන් ග්‍රහණය කර ගැනීමට සැලසුම් කළ කාර්තුමය සමීක්ෂණයකි. කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා යන ප්‍රධාන ආර්ථික අංශ ත්‍රිත්වයෙහි ක්‍රියාත්මක වන මහා පරිමාණ ව්‍යවසායන් මෙම සමීක්ෂණයේ ඉලක්කයයි. ව්‍යාපාර තත්ත්වයන්, විකුණුම්, ඉල්ලුම, ලාභදායිතාව, පුහුණු ශ්‍රමිකයින් ලබා ගැනීමේ හැකියාව සහ ධාරිතා උපයෝජ්‍යතාව ඇතුළු විවිධ ව්‍යාපාර සංජානන දර්ශක හරහා මෙම සමීක්ෂණයෙහි සොයා ගැනීම් සාරාංශ කර ඇත.

https://www.cbsl.gov.lk/en/statistics/business-surveys/business-outlook-survey

#### ▸ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණ යනු නිෂ්පාදන සහ සේවා අංශ සඳහා 2015 වසරේ දී දියත් කරන ලද මාසික සමීක්ෂණයක් වන අතර, පසුකාලීනව 2017 වසරේ දී ඉදිකිරීම් අංශය ද ඇතුළත් කර එහි ආවරණය පුළුල් කරන ලදි. මෙම දර්ශක දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීමේ දී එහි අංශවල මෑත කාලීන ප්‍රවණතාවන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා, කෙටි කාල පරාසයන්හි දී ලබා ගනු ලබන ප්‍රධාන ආර්ථික දර්ශක ලෙස භාවිතා කරයි. සමීක්ෂණ ප්‍රතිඵල ප්‍රධාන දර්ශක පහකට සාරාංශ කර ඇති අතර, ලබා ගන්නා ලද තොරතුරු මාධ්‍ය නිවේදන මගින් මාසිකව ප්‍රකාශයට පත් කෙරේ.

https://www.cbsl.gov.lk/en/press/press-releases/purchasing-managers-index-survey

#### ▸ ණය සැපයුම් පිළිබඳ සමීක්ෂණය

2014 වසරේ දී අර්ධ වාර්ෂික පදනම මත ආරම්භ කරන ලද ණය සැපයුම් පිළිබඳ සමීක්ෂණය, 2019 වසරේ සිට ප්‍රතිව්‍යුහගතකරණය කර කාර්තුමය පදනමින් පවත්වාගෙන යනු ලබයි. මෙම සමීක්ෂණය සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු හා සියලුම බලපත්‍රලාභී විශේෂිත බැංකු ආවරණය වන පරිදි පවත්වන අතර මෙමගින් ආර්ථිකය තුළ ණය සැපයීමේ මෑත කාලීන ප්‍රවණතා හා ඉදිරි දැක්ම පිළිබඳ අවබෝධයක් ලබා දෙයි.

https://www.cbsl.gov.lk/en/statistics/business-surveys/survey-on-credit-supply

#### ▸ සහාධිපත්‍ය වෙළඳපොළ සමීක්ෂණය

සහාධිපත්‍ය වෙළඳපොළ සමීක්ෂණය 2017 වසරේ දී දියත් කළ කාර්තුමය සමීක්ෂණයක් වන අතර, මෙමගින් සහාධිපත්‍ය අංශයේ ප්‍රවණතා පිළිබඳ දත්ත රැස් කරයි. මෙම දත්ත ප්‍රතිපත්ති සම්පාදනය, විශේෂයෙන් මූල්‍ය පද්ධති ස්ථායීතාව සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා භාවිතා කරයි. ප්‍රධාන සහාධිපත්‍ය ඉදිකිරීමේ ආයතන මෙම සමීක්ෂණයේ ඉලක්කගත ජනගහනය වේ.

https://www.cbsl.gov.lk/en/statistics/business-surveys/condominium-market-survey

#### ▸ ඉඩම්, නිවාස සහ සහාධිපත්‍ය සඳහා වන ඉල්ලුම් දර්ශක

2019 වසරේ ඔක්තෝබර් මස සිට කොළඹ දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි මාසිකව රැස් කර ගත් වෙබ් අඩවිවල පළවන වෙළඳ දැන්වීම්වල දත්ත උපයෝගී කර ගනිමින්, ඉඩම්, නිවාස සහ සහාධිපත්‍ය සඳහා වන ඉල්ලුම් දර්ශක සම්පාදනය කෙරේ. මෙම දර්ශක වලින් ඉඩම්, නිවාස සහ සහාධිපත්‍ය සඳහා වන ද්විතීයික වෙළඳපොළ තුළ පවතින මිල ප්‍රවණතා නිරීක්ෂණය සහ විශ්ලේෂණය කිරීම අරමුණු කෙරේ.

https://www.cbsl.gov.lk/en/statistics/business-surveys/condominium-market-survey

### අභ්‍යන්තර විශ්ලේෂණ සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශය සඳහා පවත්වනු ලබන සමීක්ෂණ

මුදල් සමීක්ෂණය සහ බාහිර අංශ සමීක්ෂණවලට අමතරව, අභ්‍යන්තර තීරණ ගැනීම සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා මහ බැංකුව සමීක්ෂණ කිහිපයක් පවත්වයි. ශ්‍රම ඉල්ලුම දර්ශකය (LDI) වෙබ් අඩවිවල පළවන වෙළෙඳ දැන්වීම් හරහා ශ්‍රම ඉල්ලුමේ දත්ත ලබා ගනියි. නිවාස සහ සහාධිපත්‍ය සඳහා කුලී දර්ශක තුළින් නිවාස සහ සහාධිපත්‍ය යන දෙකෙහි ද්විතීයික වෙළෙඳපොළේ කුලී මිල ප්‍රවණතා විශ්ලේෂණය කරයි. භාවිතා කළ වාහන සඳහා මිල දර්ශක, වෙළඳපොළෙ භාවිතා කළ වාහනවල මිල ප්‍රවණතා පසු විපරම් කරයි. උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය ආයතනික සහ කුටුම්බ යන දෙඅංශයේම උද්ධමන අපේක්ෂා රැස් කරයි. මේ අතර, සිල්ලර භාණ්ඩ මිල දර්ශකය ද විනිමය අනුපාතිකයේ බලපෑම ඇතුළුව දේශීය සහ ආනයනික සිල්ලර භාණ්ඩවල මිල පිළිබඳ සතිපතා වාර්තා සපයයි.

## ජාත්‍යන්තර සංචිත කළමනාකරණය

ජාත්‍යන්තරව පිළිගත් මනා පරිචයන්ට සහ පාලක මණ්ඩලය විසින් නියම කරන මාර්ගෝපදේශවලට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රටේ ජාත්‍යන්තර සංචිත කළමනාකරණය කරයි. ආරක්ෂාව, ද්‍රවශීලතාව සහ ආදායම් උත්පාදනය යන අරමුණු ප්‍රධාන කොට ගනිමින් වත්කම් සහ වගකීම් ව්‍යුහය සමඟ සමපාත වන විද්‍යාත්මක රාමුවක් අනුගමනය කරමින් මෙම සංචිත කළමනාකරණ කටයුතු සිදු කරනු ලැබේ.

ජාත්‍යන්තර සංචිත කළමනාකරණ මෙහෙයුම් සඳහා ප්‍රතිපත්ති සහ සමස්ත අවදානම් පරාමිතීන් සහ අවදානම් රුචිය ස්ථාපිත කිරීම පාලක මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ. පාලක මණ්ඩලය විසින් අනුමත ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය (IPS) සහ උපායමාර්ගික වත්කම් වෙන් කිරීමේ රාමුව (SAA) තුළ, ජාත්‍යන්තර සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුව ආයෝජන කටයුතු අධීක්ෂණය කරමින් ඉහළ මට්ටමේ ආයෝජන තීරණ ගනියි.

ඉහත ක්‍රියාවලීන් අධීක්ෂණය කිරීම අවදානම් අධීක්ෂණ කමිටුව මගින් සිදු කරන අතර, එය කාර්තුමය පදනමක් මත හෝ අවශ්‍ය පරිදි ස්වාධීන ලෙස සිදු කරනු ලැබේ.

## අවදානම් කළමනාකරණය සහ ව්‍යාපාර අඛණ්ඩතාව

සංචිත කළමනාකරණ කණ්ඩායම සදාචාර සහ වෘත්තීමය ප්‍රමිති පිළිපැදීම පිළිබඳ වාර්ෂික තහවුරු කිරීම අවශ්‍ය කරන දැඩි ආචාරධර්ම සංග්‍රහයක් අනුගමනය කරයි.

හදිසි අවස්ථාවකදී වුවත් විදේශ සංචිත ආයෝජන අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා අවශ්‍ය වෙළෙඳ වේදිකා (trading platforms) පහසුකම් සහිත ආපදා ප්‍රතිසාධන කාර්යාලයක් ද පිහිටුවා ඇත.

### මෙහෙයුම් ව්‍යුහය

රූප සටහන 06

| ඉදිරි කාර්යාලය | මැද කාර්යාලය | පසු කාර්යාලය |
|---|---|---|
| වෙළෙඳපොළ විශ්ලේෂණ | අවදානම් කළමනාකරණය | ගනුදෙනු පියවීම් |
| කළඹ කළමනාකරණය | ප්‍රතිලාභ සහ ආයෝජන කළඹ කාර්යසාධනය ඇගයීම | නොස්ට්‍රෝ සහ භාරකාර ගිණුම් කළමනාකරණය |
| ස්ථාවර ආදායම් සහිත ආයෝජන | IPS, SAA සහ ආයෝජන මාර්ගෝපදේශ සමඟ අනුකූල වීම | ගනුදෙනු සසැඳීමේ ලේඛන |
| උපායමාර්ග ක්‍රියාත්මක කිරීම | විදේශ ප්‍රතිපාර්ශ්ව සමාලෝචනය | |
| විදේශ විනිමය ගනුදෙනු/මුදල් වෙළඳපොළ ආයෝජන | | |

## ආයෝජන උපකරණ සහ ආයෝජන කළඹ කළමනාකරණය

විදේශ විනිමය සංචිත විවිධ ආයෝජන කළඹ හරහා කළමනාකරණය කරන අතර එක් එක් ආයෝජන කළඹ නිශ්චිත මිණුම් දඬු සමග පෙළගස්වා ඇත.

සියලුම ගනුදෙනු සංචිත කළමනාකරණ පද්ධතිය තුළ වාර්තා කෙරෙන අතර, ඉන් කළඹ විශ්ලේෂණය, ගණුදෙනු වාර්තා කිරීම, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව, ගෙවීම් හා පියවීම් සහ කාර්යසාධන ඇගයීම සිදු කරයි. අදාළ වාර්තා නිතිපතා කාර්තුමය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා, මාසික සහ සතිපතා සිදු කරන රැස්වීම් තුළින් පාලක මණ්ඩලය, ජාත්‍යන්තර සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුව සහ කළමනාකාරිත්වය සමඟ හුවමාරු කර ගනියි.

ආයෝජන කළඹට විදේශීය ස්ථාවර ආදායම් සහිත සුරැකුම්පත්, මුදල් වෙළෙඳපොළ උපකරණ, රන් ආයෝජන, සුරැකුම්පත් ණය දීම (මහ බැංකුව වෙනුවෙන් භාරකරුවන් විසින් කළමනාකරණය කරන) ප්‍රතිමිලදී ගැනීම සහ ප්‍රති නැවත මිලදී ගැනීමේ ගනුදෙනු, විදේශ විනිමය හුවමාරු සහ ඉදිරි ව්‍යුත්පන්න ඇතුළත්ය.

### 2024 ප්‍රධාන ක්‍රියාකාරකම්

සංචිත මට්ටම ක්‍රමයෙන් වැඩිවීම හේතු කොටගෙන සංචිත කළමනාකරණ කටයුතු සාමාන්‍යකරණය වීමත් සමඟ, ණය හා වෙනත් වගකීම් සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් සහතික කරන අතරම, දියුණු ආයෝජන කළමනාකරණ ශිල්පීය ක්‍රම හරහා සංචිත මත ප්‍රතිලාභ වැඩිවිය.

සංචිත කළමනාකරණය තුළ ගෝලීය ප්‍රවණතාවලට අනුකූලව පාරිසරික, සමාජීය සහ පාලන (ESG) ආයෝජන හරහා තිරසාර ආයෝජන ඇතුළත් කරන ලද අතර, ආයෝජන කටයුතුවලින් ජනනය කරන ලද ප්‍රතිලාභ, කාර්යසාධනය මනිනු ලබන සමාජීය මිණුම් දඬුවල අත්කර ගත යුතු ප්‍රතිලාභය ඉක්මවා ගියේය.





### ස්විෆ්ට් KYC ලියාපදිංචිය සහ මහ බැංකුවේ භාවිතය

ස්විෆ්ට් KYC ලියාපදිංචිය, ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීමට (KYC) සහ ගනුදෙනුකාර නිසි සම්ප්‍රජන්‍ය (CDD) තොරතුරු හුවමාරුව ක්‍රමවත් කිරීමට, මහ බැංකු මෙන්ම මූල්‍ය ආයතන යොදාගන්නා ගෝලීය වේදිකාවකි. එය KYC අනුකූලතාව ප්‍රමිතිගත කරන අතර, මිනිස් ශ්‍රමය භාවිතා කරමින් සිදු කරන සමාලෝචන අඩු කරමින් ගෝලීය මූල්‍ය පද්ධතිය තුළ විනිවිදභාවය, ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව වැඩි කරයි. KYC දත්ත කරා කාලීන සහ නිවැරදි ප්‍රවේශය ලබා දෙමින්, මෙම අවකාශය අවදානම් අවම කිරීමට සහය වන අතර ජාත්‍යන්තර නියාමන ප්‍රමිති සමඟ අනුකූලතාව ද සහතික කරයි.

KYC සහ CDD මනා පරිචයන් සමඟ අනුකූල වෙමින් මහ බැංකුව 2024 ජූනි මස දී තම KYC සහ CDD විස්තරය ස්විෆ්ට් KYC හි ලියාපදිංචි කර ප්‍රකාශයට පත් කරන ලදි. ඒ සමඟ මහ බැංකුවට පහත දැක්වෙන ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවිය.

- මධ්‍යගත වේදිකාවක් හරහා විදේශීය ප්‍රතිපාර්ශ්ව පිළිබඳ කාර්යක්ෂම KYC/CDD සමාලෝචන පැවැත්වීම
- වේගවත් හා වඩාත් නිවැරදි සත්‍යාපනය සහතික කරමින්, මිනිස් ශ්‍රමය භාවිතයෙන් සිදු කළ KYC සමාලෝචන ක්‍රියාවලීන් ඩිජිටල්, මෙන්ම වඩාත් ප්‍රමිතිගත ප්‍රවේශයකින් ප්‍රතිස්ථාපනය කිරීම
- මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ අනුකූලතාව වර්ධනය කිරීම

### රජයේ ගිණුම් පවත්වාගෙන යාම සහ රජය වෙත ලැබෙන විදේශ ලැබීම් ගිණුම්කරණය

මහ බැංකුව රජයේ බැංකුකරු ලෙස සහ රජය වෙනුවෙන් තැන්පතුධාරියා ලෙස අදාළ කාර්යයන් සිදු කරයි.

ඒ අනුව, 2024 දී, මහ බැංකුව රජය වෙනුවෙන් රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය නියෝජිතායතන සහ ඇතැම් විදේශීය ආයතන වෙත බැංකු පහසුකම් අඛණ්ඩව ලබා දෙන ලදි. මහ බැංකුව 2024 වර්ෂය තුළ එවැනි ගිණුම් 48ක් පවත්වාගෙන යන ලදි.

එසේම, රජයේ සහ එහි ව්‍යාපෘති සඳහා ලැබෙන විදේශ ලැබීම් සම්බන්ධ ගිණුම්කරණ කටයුතු මහ බැංකුව විසින් සිදු කරනු ලබයි. ව්‍යාපෘති ගිණුම් සහ නොස්ට්‍රෝ ගිණුම් විවෘත කිරීම ද එයට ඇතුළත්ය.

මහ බැංකුව මීට අමතරව, රජය වෙනුවෙන් මුදල් හුවමාරු කිරීම සඳහා පහසුකම් සැපයීම සහ විදේශ ණය ආපසු ගෙවීමට පහසුකම් සැලසීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ලැබීම්, නැවත ගෙවීම්, ගාස්තු ගෙවීම් යනාදිය ඇතුළත්ව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අදාළ ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමට ද වගකිව යුතු වේ.

# මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහතික කිරීම

මූල්‍ය පද්ධතිය මගින් මූල්‍ය ආයතන, මූල්‍ය වෙළඳපොළ සහ මූල්‍ය යටිතල පහසුකම් යන ජාලය හරහා ආර්ථිකය තුළ මූල්‍ය සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීම සඳහා පදනම සපයයි. එබැවින් ශක්තිමත් ආර්ථිකයක් සහතික කිරීමේ දී, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව අත්‍යවශ්‍ය වේ.

තවද, මූල්‍ය පද්ධතිය තුළින් මෙන්ම වඩා පුළුල් ආර්ථිකය තුළින් ඇතිවන කම්පනවලට ඔරොත්තු දීමටත්, අහිතකර තත්ත්වයන් යටතේ වුව ද මූල්‍ය සේවා සැපයීම සහතික කිරීමටත් මූල්‍ය පද්ධතිය සමත් විය යුතුය.

මහ බැංකු පනත මගින් නියම කර ඇති පරිදි, මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම මහ බැංකුවේ ප්‍රධාන අරමුණකි. මෙය ඉටු කිරීම සඳහා මහ බැංකුව මූල්‍ය පද්ධතිය පිළිබඳ සාර්ව විචක්ෂණ සහ ක්ෂුද්‍ර විචක්ෂණ අධීක්ෂණයන් සිදු කරන අතර අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහතික කිරීමට මූල්‍ය අංශයේ වෙනත් නියාමකයින් සමඟ අවශ්‍ය ප්‍රතිපත්ති සහ නියාමන කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරයි.

මීට අමතරව, මහ බැංකුව මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් පද්ධති, මූල්‍ය අන්තර්ගතභාවය, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය, තැන්පතු ලබා ගැනීමේ මූල්‍ය ආයතන නිරාකරණය, තැන්පතු රක්ෂණය සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් ද පියවර ගනු ලබයි.

### මූල්‍ය පද්ධති ස්ථායීතාව සුරක්ෂිත කිරීම

රූප සටහන 07

පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු තක්සේරු රාමුව සංශෝධනය කිරීම

විස්තීර්ණ ද්‍රවශීලතා ආතති පරීක්ෂණ රාමුව

අන්තර් සම්බන්ධතා සහ සංස්පර්ෂණ (Contagion) විශ්ලේෂණය

මූල්‍ය ආයතන නියාමනය හා අධීක්ෂණය

24 බලපත්‍රලාභී වාණිජ බැංකු

06 බලපත්‍රලාභී විශේෂ බැංකු

32* බලපත්‍රලාභී මූල්‍ය සමාගම්

01 විශේෂිත කල්බදු සමාගම්

04 විශේෂිත ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්

05** ස්වාධීන ප්‍රාථමික අලෙවිකරුවන්

නියාමනය කළ මූල්‍ය ආයතනවල ව්‍යවස්ථාපිත පරීක්ෂණ පැවැත්වීම

බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීම සඳහා ප්‍රධාන සැලැස්මේ අදියර 1 යටතේ එක් ගනුදෙනුවක් අවසන් කරන ලදී




බැංකුවේ ප්‍රතිප්‍රාග්ධනීයකරණ රාමුව ස්ථාපිත කිරීම

මූල්‍ය අර්බුද කළමනාකරණ කමිටුවේ මෙහෙයුම තුළින් මූල්‍ය පද්ධති අර්බුද සූදානම

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය

62 සාමාජික ආයතන

74,440 2024 දක්වා ගෙවූ තැන්පත්කරුවන් ගණන

රජයේ ආයතනවලට ජනතාවගෙන් ඩිජිටල් ගෙවීම් භාරගැනීමට හැකිවන "GovPay" ක්‍රියාත්මක කිරීම

මහ බැංකුවේ SWIFT සේවය වැඩිදියුණු කරන ලදි

2024 තුළ විශාල වටිනාකම් ගෙවීම පද්ධති සහ පාරිභෝගික ගෙවීම් පද්ධති/උපකරණ ඵලදායීව ක්‍රියාත්මක කිරීම

*ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් හැර, විස්තර සඳහා පිටු අංක 210 සටහන (අ) බලන්න

**එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී සහ පර්පචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් හැර, විස්තර සඳහා පිටු අංක 210 සටහන් (උ) සහ (ඌ) බලන්න





## සාර්ව විචක්ෂණ අධිකාරිය සහ ප්‍රතිපත්ති රාමුව

ශ්‍රී ලංකාවේ සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස මහ බැංකුව මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා සාර්ව විචක්ෂණ රාමුව පුළුල් කරන ලදි.

සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින්, මහ බැංකුව මූල්‍ය අර්බුද ඇති කළ හැකි සහ ආර්ථික පසුබෑම් තීව්‍ර කළ හැකි පද්ධතිමය අවදානම් අවම කරමින් එහි ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කරයි.

මෙම පුළුල් කරන ලද කාර්යභාරයට අනුකූලව, ශ්‍රී ලංකාවේ සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස, මහ බැංකුව සිය විධිවිධාන ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබීය. ශ්‍රී ලංකාවට ගැළපෙන අයුරින් ජාත්‍යන්තර යහපත් පරිචයන් මත පදනම් වූ ශක්තිමත් රාමුවක් සැකසීම මෙයට ඇතුළත්ය. මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව මගින් අධීක්ෂණ යාන්ත්‍රණය තවදුරටත් පුළුල් කරමින් සාර්ව විචක්ෂණ අධිකාරියේ කටයුතු සඳහා දායක විය.

මහ බැංකු පනතේ 63(2) වගන්තිය යටතේ සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති රාමුව[1] මහ බැංකුව විසින් 2024 මාර්තු 14 වන දින ප්‍රකාශයට පත් කරන ලදි. මෙමගින් සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය පිළිබඳව පාර්ශ්වකරුවන් අතර දැනුම වර්ධනය කිරීම සහ මූල්‍ය ස්ථායීතාව පවත්වා ගැනීමට එම ප්‍රතිපත්තිවල වැදගත්කම ඉස්මතු කොට දැක්වීම අරමුණු කරයි. එය පද්ධතිමය අවදානම් ආවේක්ෂණය, සාර්ව විචක්ෂණ මෙවලම්, අනෙකුත් මහ බැංකු ප්‍රතිපත්ති සමඟ අන්තර්ක්‍රියා, ආයතනික සැකසුම සහ සාර්ව විචක්ෂණ ස්ථාවරයන් සහ පද්ධතිමය අවදානම් ප්‍රවණතා සන්නිවේදනය කිරීම වැනි ප්‍රධාන මාතෘකා ආවරණය කරයි.

සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති රාමුව මහ බැංකුවේ සාර්ව විචක්ෂණ ප්‍රවේශය අවබෝධ කර ගැනීමට උනන්දුවක් දක්වන්නන්ට අත්‍යවශ්‍ය මූලාශ්‍රයක් වේ.

### සාර්ව විචක්ෂණ රාමුව

රූප සටහන 08




### තිරසර මූල්‍යකරණ කාර්යයන්

මහ බැංකුව 2024 වසරේ දී තිරසර මූල්‍යකරණ කාර්යයන් අඛණ්ඩව සිදු කිරීමට සමත් විය. ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවයෙහි (International Finance Corporation) සහය ඇතිව පවතින තිරසර මූල්‍ය පෙරදැක්ම 2024 වසරේ දී සමාලෝචනය කළ අතර, 2025-2029 සඳහා මූල්‍ය අංශය ඉලක්ක කර ගනිමින් තිරසරභාවය හා බැඳුණු සමාජීය අංශය කෙරෙහි ද අවධානය යොමු කරමින් තිරසර මූල්‍ය පෙරදැක්ම 2.0 වැඩිදියුණු කරන ලදි. නව තිරසර මූල්‍ය පෙරදැක්ම 2.0, 2025 වසරේ පළමු භාගයේ දී දියත් කිරීමට අපේක්ෂා කෙරේ. තවද, තිරසර මූල්‍යකරණ සහ දේශගුණික විපර්යාස ආශ්‍රිත මූල්‍ය අවදානම් පිළිබඳ දැනුම ඉහළ නංවා ගැනීමේ අරමුණින් වසර තුළ දී මූල්‍ය ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීන් සහ නියාමකයින් සඳහා කුසලතා වර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදි.

[1] https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/macroprudential_policy_framework_2024_march_e.pdf

## 2024 ප්‍රධාන ක්‍රියාකාරකම්

### පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු

ශ්‍රී ලංකාවේ සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු (D-SIBs) නම් කිරීම මහ බැංකුවේ කාර්යභාරයකි. රටෙහි බැංකු පද්ධතිය තුළ සිදු වන වෙනස්වීම් හා අනුගතවෙමින්, මහ බැංකුව විසින් 2024 වසරේ දී පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු තක්සේරු රාමුව යාවත්කාලීන කරන ලදි. මෙම යාවත්කාලීන කරන ලද රාමුව මත පදනම් වූ පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු 2025 වසරේ මුල් භාගයේ දී ප්‍රකාශ කිරීමට නියමිතය.

### අන්තර් සම්බන්ධතා සහ සංස්පර්ෂණ විශ්ලේෂණය (Interconnectedness and Contagion Analysis)

බැංකුවල ප්‍රධාන ණය ලබාගන්නන් 100 දෙනා සඳහා වූ ද්විපාර්ශ්වික නිරාවරණයන් අන්තර්ගත කිරීම තුළින් මහ බැංකුව සිය අන්තර් සම්බන්ධතා සහ සංස්පර්ෂණ විශ්ලේෂණ රාමුව වැඩිදියුණු කළේය. අන්තර් සම්බන්ධතා සහ සංස්පර්ෂණ විශ්ලේෂණය සඳහා ආයතනික කණ්ඩායම් 27ක නිරාවරණ ද ඇතුළත් කරමින් එහි තක්සේරු හැකියාවන් තවදුරටත් ශක්තිමත් කරන ලදි.

### ද්‍රවශීලතා ආතති පරීක්ෂණය

මහ බැංකුව ද්‍රවශීලතා ආතති පරීක්ෂණ රාමුව තවදුරටත් පුළුල් කළ අතර, එහි දී විවිධ ආතති අවස්ථා, පොලී අනුපාත විචලනයන් සහ දේශීය ණය ප්‍රශස්ථකරණ වැඩසටහන් මගින් බැංකු පද්ධතිය මත ඇති කරන බලපෑම් සැලකිල්ලට ගන්නා ලදි.

### පද්ධතිමය අවදානම් අධීක්ෂණය සහ තක්සේරු කිරීම

මහ බැංකුවේ කාර්යභාරය ශක්තිමත් කිරීම සඳහා කාර්තුමය වශයෙන් පද්ධතිමය අවදානම් තක්සේරු කිරීම සඳහා විශ්ලේෂණ ගණනාවක් සිදු කරන ලද අතර, සාර්ව-මූල්‍ය තත්ත්වයන්, බැංකු ක්ෂේත්‍රය, මූල්‍ය සමාගම් සහ මූල්‍ය වෙළෙඳපොළ පරීක්ෂා කරන මෙවැනි තක්සේරු කිරීම් එයට ඇතුළත් වේ. 2024 වසරේ දී බැංකු ක්ෂේත්‍රයෙහි විශාල නිරාවරණ, ඒකක භාර අංශය තුළ අවදානම් සහ නිශ්චල දේපළ වෙළෙඳපොළ තුළ පවතින අවදානම් පිළිබඳ අධ්‍යන මාලාවක් සිදු කරන ලදි.

බැංකු සහ මූල්‍ය අංශයේ අවදානම් නිරීක්ෂණය කිරීම සඳහා තාප සිතියම් ( Heat-maps) සකස් කරන ලදි. පද්ධතිමය අවදානම් සමීක්ෂණ ද සිදු කරන ලදි. අර්ධ වාර්ෂික පද්ධතිමය අවදානම් සමීක්ෂණ සමඟින්, ගෘහස්ථ සහ ආයතනික අංශවලින් ඇති වන අවදානම් පිළිබඳ තක්සේරු කිරීම් සිදු කරන ලදි.

## බැංකු නියාමනය සහ අධීක්ෂණය

ශ්‍රී ලංකා මහ බැංකු පනත සහ 1988 අංක 30 දරන බැංකු (සංශෝධිත) පනත යටතේ, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු නියාමනය සහ අධීක්ෂණය කිරීමේ බලය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික කාර්යභාරය වන්නේ තැන්පතුකරුවන්ගේ සහ වෙනත් අදාළ පාර්ශ්වකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කරමින් බැංකු අංශයේ සුරක්ෂිතතාව සහ ශක්තිමත්භාවය තහවුරු කිරීමයි. වසර අවසානය වන විට, බලපත්‍රලාභී වාණිජ බැංකු 24ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 06ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන සහ අධීක්ෂණ විෂය පථය යටතේ ක්‍රියාත්මක විය.

අදාළ මූලික කාර්යයන් වනුයේ,

- **බලපත්‍ර ලබා දීම සහ නියාමනය:** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු මෙහෙයුම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම හා විචක්ෂණශීලී රෙගුලාසි සකස් කිරීම.
- **බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු අඛණ්ඩ අධීක්ෂණය සහ ව්‍යවස්ථාපිත පරීක්ෂණ:** නියාමන විධිවිධාන සඳහා අනුකූලතාව සහතික කිරීම සහ බැංකු අංශයේ ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩ අධීක්ෂණය සහ නිරන්තර පරීක්ෂණ පැවැත්වීම.
- **පාලන අධීක්ෂණය:** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ යථායෝග්‍යතාව තක්සේරු කර අනුමත කිරීම.
- **නියාමන ක්‍රියාමාර්ග:** බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සම්බන්ධයෙන් සංශෝධිත බැංකු පනත මගින් බලය දී ඇති ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට අධිකාරී බලය ඇත.

**අධීක්ෂණ රාමුවේ ප්‍රධාන අංග** රූප සටහන 09






මෙහෙයුම් තොරතුරු | මූල්‍ය ප්‍රකාශ | අතිරේක තොරතුරු
බැංකුවේ කාර්යභාරය ▸ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහතික කිරීම

## 2024 ප්‍රධාන ක්‍රියාකාරකම්

### නෛතික හා නියාමන ප්‍රතිසංස්කරණ

2024 වසරේ ජූනි 15 දින සිට ක්‍රියාත්මක 2024 අංක 24 දරන බැංකු (සංශෝධිත) පනත මගින් ශ්‍රී ලංකාවේ බැංකු අංශය පාලනය කරන නෛතික රාමුව සැලකිය යුතු ලෙස ශක්තිමත් කරන ලදි. ඊට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමට ප්‍රධාන රෙගුලාසි කිහිපයක් හඳුන්වා දෙන ලදි. මෙයට විශාල ගනුදෙනු නිරාවරණ වීම්, ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක, ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාත, අක්වෙරළ බැංකු ව්‍යාපාර, ආයතනික යහපාලනය, සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු යන නියාමන ඇතුළත් විය[2].

### පරීක්ෂණ සහ අඛණ්ඩ අධීක්ෂණය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු 04 ද ඇතුළුව සම්පූර්ණ-විෂය පථයක් සහිත ව්‍යවස්ථාපිත පරීක්ෂණ 15ක් පවත්වන ලදි. එමෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු රාශියක ශාඛා අධීක්ෂණ මෙන් ම සමූහ ආයතනවල විශාල ගනුදෙනු නිරාවරණ, සයිබර් අවදානම් සහ වංචා සහ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂණ කිහිපයක් ද සිදු කරන ලදි. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමට එරෙහිව අනුකූලතා කෙරෙහි අවධානය යොමු කරමින් මූල්‍ය බුද්ධි ඒකකය සමඟ එක් ව ඒකාබද්ධ අධීක්ෂණ ද සිදු කරන ලදි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන අඛණ්ඩ අධීක්ෂණයන් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් සපයනු ලබන මූල්‍ය හා විචක්ෂණශීලී තොරතුරු පහසුකම් සලසයි.

### නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කිරීම

බැංකු පනතට සහ ඒ යටතේ නිකුත් කළ විධානයන්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත අවස්ථා 26ක දී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සිදු කිරීමට නියෝග කර ඇත.

### වෙනත් විශේෂිත වැඩසටහන්

මනා ප්‍රාග්ධනීකරණය කළ බැංකු පද්ධතියක් ඇති කිරීම සඳහා බැංකුවල ප්‍රතිප්‍රාග්ධනීකරණ උපායමාර්ගය වැඩිදියුණු කරන ලදි. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ රෙගුලාසි නිකුත් කිරීමට සහය දක්වමින් කොළඹ වරාය නගරයේ අක්වෙරළ බැංකු කටයුතු සඳහා පහසුකම් සලසන ලදි.

### නියාමන අනුමැතීන්

2024 වසර තුළ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද නියාමන අනුමැතීන්වලට, ශාඛා සහ අනෙකුත් ඒකකවලට අදාළ ඉල්ලීම් 2,236ක් ඇතුළත් විය. ඉන් 1,925ක් සඳහා වසර තුළ අනුමැතිය ලබා දෙන ලද අතර, ඉල්ලීම් 311ක් විචක්ෂණශීලි පදනමින් ප්‍රතික්ෂේප කරන ලදි.

**ශාඛා සහ අනෙකුත් බැංකු ඒකකවලට අදාළ අනුමැතීන්**

| අනුමැතියේ ස්වභාවය | අනුමැතීන් සංඛ්‍යාව | |
|---|---|---|
| | ඉල්ලීම් | අනුමැතීන් |
| විවෘත කිරීම් සහ ස්ථාපනය කිරීම් | 1,995 | 1,698 |
| ශාඛාවන් | 16 | 8 |
| ස්වයංක්‍රීය සේවා සපයන යන්ත්‍ර | 91 | 78 |
| ශිෂ්‍ය ඉතුරුම් ඒකක | 148 | 90 |
| වෙනත් බැංකු ඒකක | 24 | 24 |
| අනුමත නියෝජිතයින් ගණන | 1,716 | 1,498 |
| ප්‍රතිස්ථාපනය කිරීම් | 63 | 49 |
| ශාඛාවන් | 59 | 46 |
| වෙනත් | 4 | 3 |
| ශාඛා සහ වෙනත් සේවා ඒකක වසා දැමීම් හෝ ලබා දුන් අනුමැතීන් අවලංගු කිරීම් | 58 | 58 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ අනෙකුත් ස්වයංක්‍රීය යන්ත්‍ර ස්ථාපනය සඳහා ලබා දුන් අනුමැතීන් අත්හිටුවීම් සහ අවලංගු කිරීම් | 60 | 60 |
| බලපත්‍රලාභී බැංකුවල නියෝජිතයින් සඳහා ලබා දෙන ලද අනුමැතීන් අත්හිටුවීම් සහ අවලංගු කිරීම් | 60 | 60 |
| මුළු එකතුව | 2,236 | 1,925 |

මීට අමතරව, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරින් සහ විධායක කාර්යයන් ඉටු කරන නිලධාරින් ලෙස අලුතින් පත් කිරීම් හෝ ධූරයේ අඛණ්ඩව රැඳී සිටීම් ඇතුළුව 2024 දී බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වෙනත් නියාමන අනුමත කිරීම් ද ලබා දෙන ලදි. තවද, විචක්ෂණශීලී පසුබිම මත පහත සඳහන් අනුමැතීන් ද ලබා දෙන ලදි.

[2] *බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන විධාන චක්‍රලේඛ හා මඟපෙන්වීම්වලට https://www.cbsl.gov.lk/en/laws/directions-circulars-guidelines-for-banks ඔස්සේ පිවිසිය හැකිය.*

## බැංකු වෙත ලබාදෙන ලද වෙනත් නියාමන අනුමැතීන් හා තක්සේරු කිරීම්

| අනුමැතීන්/තක්සේරුවල ස්වභාවය | අනුමැතීන් සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන කළමනාකරණ නිලධාරින්පත්කිරීම සඳහා යථායෝග්‍යතාව තක්සේරු කිරීම | 290 |
| සේවා බාහිරින් ලබා ගැනීමේ කටයුතු සඳහා - එකඟතාව | 22 |
| වෙළෙඳපොළ වටිනාකමට වඩා අඩු වටිනාකමකට දේපල බැහැර කිරීම | 9 |
| දෙවන ස්ථර ප්‍රාග්ධනයට ප්‍රත්‍යාගණන ලාභ ඇතුළත් කිරීම | 7 |
| දෙවන ස්ථර ප්‍රාග්ධනයට ණයකර ඇතුළත් කිරීම | 5 |
| අත්හරින ලද දේපළ ප්‍රතිපූරණයන් | 7 |
| විදේශික සේවකයන් සඳහා නව වීසා බලපත්‍ර ලබා දීම/ අලුත් කිරීම සඳහා නිර්දේශ නිකුත් කිරීම | 21 |
| වෙනත් අනුමැතින්/තක්සේරු කිරීම් | 31 |
| **මුළු එකතුව** | **392** |

## පාර්ශ්වකරුවන්ගේ සන්නිවේදනය සහ සහභාගිත්වය

බැංකු අංශය සමඟ විධිමත් සහ හිතකර සන්නිවේදනය මූල්‍ය පද්ධති ස්ථායිතාව සහතික කිරීමේ දී වැදගත් ප්‍රතිෂ්ඨාවකි. 2024 දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු අංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර අදහස් හුවමාරු කර ගැනීමේ සංසදයක් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ප්‍රධාන විධායක නිලධාරින්සමඟ මාසික රැස්වීම් පවත්වන ලදි. අධීක්ෂණ යාන්ත්‍රණයේ කොටසක් ලෙස, ප්‍රධාන අධීක්ෂණ ගැටලු/සොයාගැනීම් පිළිබඳව බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩල සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලද අතර බාහිර විගණකවරුන් සමඟ ද රැස්වීම් කිහිපයක් සංවිධානය කරන ලදි. බැංකු අංශයේ ක්‍රියාකාරිත්වය, ආර්ථික සංවර්ධනයන් සහ නියාමන රාමු සාකච්ඡා කිරීම සඳහා බැංකු සභාපතිවරුන්ගේ රැස්වීම් ද පවත්වන ලදි. මූල්‍ය අංශ අධීක්ෂණ කවුන්සිලය, මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුව, මූල්‍ය අංශ අර්බුද කළමනාකරණ කමිටුව සහ සම්බන්ධීකරණ කවුන්සිලය සමඟ සම්බන්ධ වෙමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්තාකරණ කාල සීමාව තුළ ඵලදායී යහපාලනය සහ මූල්‍ය අංශයේ ස්ථායිතාවය සහතික කරන ලදි.

**ප්‍රසිද්ධ වාර්තාකරණය සහ විනිවිදභාවය:** බැංකු අංශයේ, බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල සමස්ත මට්ටමේ මූල්‍ය දත්ත හා සාධනීය දර්ශක, ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙහි කාර්තුමය පදනමක් මත ප්‍රකාශයට[3] පත් කෙරේ.

## බැංකු නොවන මූල්‍ය ආයතන (NBFIs) නියාමනය හා අධීක්ෂණය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 61 වන වගන්තිය සමඟ කියවිය යුතු, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතෙහි[4] සහ 2016 අංක 06 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතෙහි විධිවිධානයන් යටතේ පිළිවෙලින්, මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් නියාමනය සහ අධීක්ෂණය කිරීමේ බලතල මහ බැංකුව වෙත පැවරී ඇත. මීට අමතරව 2009 අංක 01 දරන සංශෝධිත ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග සහ 2009 අංක 01 දරන සංශෝධිත දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග යටතේ ප්‍රාථමික අලෙවිකාර සමාගම් අධීක්ෂණය ද බැංකුව විසින් සිදු කරයි. අදාළ ප්‍රධාන කාර්යයන් වන්නේ;

- බලපත්‍ර නිකුත් කිරීම සහ නියාමනය: ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා බලපත්‍ර/ලියාපදිංචිය නිකුත් කරන අතර විචක්ෂණශීලී රෙගුලාසි සකස් කරයි.
- බැංකු නොවන මූල්‍ය ආයතනවල අඛණ්ඩ අධීක්ෂණය සහ ව්‍යවස්ථාපිත පරීක්ෂණ කටයුතු කිරීම: නියාමනයන් සමඟ අනුකූලතාව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩ නියාමනය සහ ව්‍යවස්ථාපිත පරීක්ෂණ පවත්වයි.
- නියාමන අනුමැතීන් ලබා දීම.
- නියාමන ක්‍රියාමාර්ග: බැංකු නොවන මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ඇත.
- ආයතන නීති විරෝධී ලෙස තැන්පතු භාර නොගන්නා බව හෝ නිසි අවසරයකින් තොරව ක්‍රියාත්මක නොවන බව සහතික කිරීම සඳහා අනවසර මුදල් ව්‍යාපාර කටයුතු සිදු කරන ආයතන පිළිබඳ විමර්ශනය කිරීම.

මෙම සෘජු නියාමන සහ අධීක්ෂණ කාර්යයන්ට අමතරව, මහ බැංකුව විසින් ශක්‍යතා වැඩි දියුණු කිරීම, මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, අධිකරණ කාර්යයන් සඳහා අවශ්‍ය පරිදි සහභාගී වීම සහ මහජන පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත් වීම වැනි කටයුතු වලදී වඩා පුළුල් කාර්යභාරයක් ඉටු කරයි.

## බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා නියාමන අනුමැතීන්

2024 වර්ෂය තුළදී මහ බැංකුව විසින් ණය උපකරණ නිකුත් කිරීම, කොටස් ප්‍රාග්ධනය වැඩි කිරීම, හිමිකාරත්වය මාරුකිරීම, සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීම, පාලිත සමාගම් පිහිටුවීම, වාර්ෂික ශාඛා ව්‍යාප්ති සැලසුම්, ප්‍රචාරණ දැන්වීම් සහ තැන්පතු දිරිදීමනා යෝජනාක්‍රම සහ ප්‍රධාන වගකිවයුතු නිලධාරින් පත් කිරීම, අඛණ්ඩව කටයුතු කරගෙන යාම, ඉල්ලා අස්වීම සහ විශ්‍රාමගැනීම වැනි කරුණු සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන වෙත අනුමැතීන් 904ක් ලබා දෙන ලදි.

[3]https://www.cbsl.gov.lk/en/statistics/statistical-tables/financial-sector

*[4]ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් සමාගම්වල අධීක්ෂණ, නියාමන හා නිරාකරණ රාමුව වැඩිදියුණු කිරීම සඳහා මුදල් ව්‍යාපාර පනතට සහ කල්බදු මූල්‍යකරණයෙහි හඳුනාගත් ගැටලුවලට පිළියම් යෙදීම සඳහා කල්බදු මූල්‍යකරණ පනතට අවශ්‍ය සංශෝධන සිදුකිරීමට කටයුතු කරමින් සිටී.*





## 2024 ප්‍රධාන ක්‍රියාකාරකම්

### නියෝග, නියමයන් සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම

2024 වසර තුළ, වත්මන් වෙළෙඳපොළ සහ ජාත්‍යන්තර විශිෂ්ට පරිචයන්ට අනුකූලව මුදල් සමාගම්වල පවත්නා නියාමන රාමුව තවදුරටත් ක්‍රමවත් කිරීමට සහ ශක්තිමත් කිරීමට විචක්ෂණශීලී රෙගුලාසි නිකුත් කිරීම මුදල් සමාගම් සහ මෙම අංශයේ අදාළ ඇල්ම ඇති පාර්ශ්වයන්ගේ උපදෙස් ද ලබා ගනිමින් සිදු කරන ලදි. 2024 දී හඳුන්වා දුන් ප්‍රධාන විචක්ෂණ ක්‍රියාමාර්ගයන් අතර කාලාවර්තක වාර්තා කිරීමේ අවශ්‍යතා, ණය අවදානම් කළමනාකරණය, තැන්පතු කැඳවීම සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණය පිළිබඳ විධාන සහ වැටුප් ප්‍රතිපත්ති සහ අනාවරණ අවශ්‍යතා පිළිබඳ මාර්ගෝපදේශ අන්තර්ගත විය.

### බැංකු නොවන මූල්‍ය ආයතන පිළිබඳ ව්‍යවස්ථාපිත පරීක්ෂණ සහ අඛණ්ඩ අධීක්ෂණය

මහ බැංකුව මුදල් සමාගම් 17ක, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් දෙකක ව්‍යවස්ථාපිත පරීක්ෂණ කටයුතු පවත්වන ලදි. අක්‍රමිකතා විමර්ශනය කිරීම සඳහා මුදල් සමාගම් තුනක සහ අධීක්ෂණ රාමුව පුළුල් කිරීමේ අවශ්‍යතාව තක්සේරු කිරීම සඳහා බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් හතරක ස්ථානීය පරීක්ෂණ සිදු කරන ලදි.

මහ බැංකුව, විගණන වාර්තා, බාහිර ශ්‍රේණිගත කිරීම්, පුවත් වාර්තා ඇතුළුව වෙනත් මූල්‍ය තොරතුරු ද විශ්ලේෂණය කරමින් සහ සිය ජාලගත දත්ත සම්ප්‍රේෂණ පද්ධතිය (FinNet) හරහා කාලාවර්තිකව ඉදිරිපත් කරන ලද මූල්‍ය තොරතුරු ද භාවිතා කරමින් අඛණ්ඩ සුපරීක්ෂණය සිදු කරන ලදි. දැනුම්වත් තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහතික කරමින් හඳුනා ගත් අවදානම් පාලක මණ්ඩලය වෙත දැනුම් දීම සිදු කරන ලදි. මුදල් සමාගම් වඩා අඩු අවදානම් කාණ්ඩයේ සිට ඉතා ඉහළ අවදානම් කාණ්ඩය දක්වා වර්ගීකරණය කරමින් ස්ථර පහකින් යුතු අභ්‍යන්තර අධීක්ෂණ ශ්‍රේණිගතකරණය පිළියෙල කරන ලදි. තවද, ප්‍රතිපත්තිමය ගැටලු සහ බලපත්‍ර අවලංගු කල මුදල් සමාගම් සම්බන්ධව ලද මහජන පැමිණිලි 118ක් ද නිරාකරණය කරන ලදි.

### සීමාකිරීම් සහ සම්බාධක

මහ බැංකුව කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග රාමුව යටතේ විචක්ෂණ විධානයන්ට අනුකූල නොවූ මුදල් සමාගම් මත නියාමන ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කරන ලදි.

- ප්‍රාග්ධන අවශ්‍යතාවලට අනුකූල නොවූ මුදල් සමාගම්වල තැන්පතු ලබා ගැනීම, ණය දීම සහ ණය ගැනීම සඳහා පනවන ලද සීමාවන් අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර, අනුකූලතාව අත්කර ගත් මුදල් සමාගම් සඳහා පනවා තිබූ සීමාවන් ඉවත් කරන ලදි.
- අනුකූල නොවන, මුදල් සමාගම්වල නියාමන ගැටලු විසඳීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා පවත්වන ලදි.
- ඈවර කිරීමේ ක්‍රියාවලීන් කඩිනම් කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව අසාර්ථක මුදල් සමාගම්වල ඈවර කරන්නන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලදි.

## බැංකු නොවන මූල්‍ය ආයතනවලට අදාළ සන්නිවේදනය සහ දත්ත බෙදාහැරීම

වෙළෙඳපොළ විනිවිදභාවය වැඩි කිරීම සඳහා නියාමන අවශ්‍යතා සහ විචක්ෂණ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට අසමත් වූ බැංකු නොවන මූල්‍ය ආයතනවල නම් මහ බැංකුව විසින් සිය වෙබ් අඩවියේ[5] පළ කරන ලදි.

එමෙන්ම බැංකුව පහත පුද්ගලයින් සමඟ සාකච්ඡා පැවැත්වීම තුළින් ඇල්මැති පාර්ශ්වයන්ගේ සහභාගීත්වය ඉහළ නංවන ලදි.

- නියාමන සංවර්ධනයන් පිළිබඳ මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන්
- අංශය තුළ පවතින ගැටලු විසඳීමට අධ්‍යක්ෂ මණ්ඩල ජ්‍යෙෂ්ඨ කළමනාකරණ නිලධාරීන්, ක්ෂේත්‍ර සංවිධාන, බාහිර විගණකවරු සහ ජාත්‍යන්තර නියෝජිතායතන

ආංශික අවබෝධයන් වෙත ප්‍රවේශය වර්ධනය සඳහා, මහ බැංකුව විසින් මුදල් සමාගම් ක්ෂේත්‍රයේ කාර්තුමය මූල්‍ය තොරතුරු[6] ප්‍රකාශයට පත් කරන ලද අතර ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව වැනි ගෝලීය ආයතන සහ රජයේ ආයතන සමඟ දත්ත හුවමාරු කර ගන්නා ලදි.

### මුදල් තැරැව්කරණ ආයතන නියාමනය කිරීම

2018 අංක 01 සහ 2019 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි යටතේ මහ බැංකුව විසින් මුදල් තැරැව්කරණ ආයතන නියාමනය කරයි. මහ බැංකුවේ නියාමන කාර්යභාරයට ඇතුළත් වන්නේ,

- සුදුසුකම්ලත් මුදල් තැරැව්කරණ ආයතන වෙත බලය පැවරීමේ සහතිකය නිකුත් කිරීම,
- බලයලත් ආයතන සඳහා වාර්ෂික සහතික පත්‍රය නිකුත් කිරීම සහ
- මාර්ගෝපදේශ,චක්‍රලේඛ සහ අධීක්ෂණ පරීක්ෂණ (එතැන් සහ විතැන්) හරහා අනුකූලතාව පරීක්ෂා කිරීමයි.

මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී මුදල් තැරැව්කරණ සමාගම්හි ලැයිස්තුව සඳහා 210 පිටුව බලන්න.

[5]https://www.cbsl.gov.lk/authorized-financial-institutions/licensed-finance-companies

[6]https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/statistics/sheets/quarterly_financial_information_lfc_sector_20241226.xlsx

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/statistics/sheets/key_financial_soundness_indicators_of_licensed_finance_companies_20250108_e.xlsx

## මූල්‍ය අන්තර්ගතභාවය සහ මූල්‍ය සාක්ෂරතාව

ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක වීමත් සමඟ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත කාර්යයක් බවට පත් විය. ශ්‍රී ලංකා මහ බැංකුව ඒ හා සම්බන්ධිත පාර්ශ්වයන්ගේ දායකත්වය ද සහිත ව ක්‍රියාකාරී සැලැස්මේ 80%කට වඩා සාක්ෂාත් කර ගනිමින් මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයෙහි පළමු අදියර (2021-2024) සාර්ථක කර ගැනීමට මූලිකත්වය ගෙන කටයුතු කරන ලදි. ප්‍රගතිය සහ වගවීම සහතික කිරීම සඳහා මෙම වැඩසටහන කාර්තුමය වශයෙන් අධීක්ෂණයට සහ ඇගයීමට ලක් කරන ලදි. මෙලෙස අත්පත් කරගන්නා ලද ප්‍රගතිය තවදුරටත් ඉදිරියට ගෙන යමින් මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයෙහි දෙවන අදියර 2026 දී දියත් කිරීමට නියමිතය.

### මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය (2024-2028)

2024 මැයි 21 දින, ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය (2024-2028) දියත් කළ අතර එය ශ්‍රී ලංකාව පුරා මූල්‍ය සාක්ෂරතාව ගොඩ නැංවීමේ ඒකීය ප්‍රතිපත්ති රාමුවක් යටතේ ජාතික උත්සාහයන් ඒකාබද්ධ කරමින් දියත් කරන ලද පස් වසරක වැඩසටහනකි. ජාතික මට්ටමේ පාර්ශ්වකරුවන් 40කට වැඩි පිරිසකගේ දායකත්වයෙන් යුතුව සංවර්ධනය කළ මෙම මාර්ගෝපදේශය දිගු කාලීන මූල්‍ය සවිබලගැන්වීම සහතික කිරීම උදෙසා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික කවුන්සිලය සහ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගික කළමනාකරණ කමිටුව විසින් මෙහයවනු ලබයි.

### මූල්‍ය සාක්ෂරතාව සහ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීමේ දී ප්‍රාදේශීය කාර්යාලවල කාර්යභාරය

මාතර, අනුරාධපුර, මාතලේ, කිළිනොච්චිය, ත්‍රිකුණාමලය සහ නුවරඑළිය යන ප්‍රාදේශීය කාර්යාල 6 හරහා ප්‍රාදේශීය වශයෙන් මහ බැංකුවේ දායකත්වය තවදුරටත් තීව්‍ර කිරීම සහ අඩු වරප්‍රසාදලාභී ජනතාවගේ මූල්‍ය අන්තර්ගතභාවය සහ මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරනු ලබයි.

වැඩි විස්තර සඳහා 206 පිටුව බලන්න.

2024 දී, ශ්‍රී ලංකා මහ බැංකුව ඌණ මූල්‍ය අධ්‍යාපනයක් පවතින ප්‍රදේශ තුළ සිටින පිරිස් ඉලක්ක කර ගනිමින් මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් 404ක් සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 116ක් පවත්වන ලදි. එමෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංවිධානය කරන ලද ප්‍රාදේශීය සමුළු දෙකක් කිළිනොච්චිය සහ ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලවල සහයෝගය ඇතිව යාපනය සහ මඩකලපුව යන ප්‍රදේශයන්හිදී සාර්ථකව පවත්වන ලදි. ශ්‍රී ලංකා මහ බැංකු අධිපති, ජ්‍යෙෂ්ඨ මහ බැංකු නිලධාරින්, රජයේ නිලධාරින්, බැංකුකරුවන්, අධ්‍යාපනවේදින් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහභාගිවන මෙවැනි සමුළු මගින් දිවයින පුරා මූල්‍ය අන්තර්ගතභාවය සහ මූල්‍ය සාක්ෂරතාව පෝෂණය කිරීම සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ කැපවීම පෙන්නුම් කරයි.

රූප සටහන - 10

**මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම – ඉදිරි ගමන්මග (2024-2028)**






මෙහෙයුම් තොරතුරු | මූල්‍ය ප්‍රකාශ | අතිරේක තොරතුරු

බැංකුවේ කාර්යභාරය ▸ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහතික කිරීම

## මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය

මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2023 අංක 01 දරන මූල්‍ය ආරක්ෂණ රෙගුලාසි මාලාව 2024 අගෝස්තු 8 වන දින සිට පූර්ණ වශයෙන් බලාත්මක විය. මෙමගින් ඉහත කී මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි මනාව ක්‍රියාත්මක වීම පරීක්ෂා කිරීමට ඵලදායී යාන්ත්‍රණයක් සපයමින් මූල්‍ය පාරිභෝගික අභිලාෂයන් සුරක්ෂා කිරීමට මෙන් ම වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය සඳහා ද මහ බැංකුව වෙත බලය පවරන ලදි.

### 2024 ප්‍රධාන ක්‍රියාකාරකම්

පාරිභෝගික පැමිණිලි සහ දුක් ගැනවිලි සම්බන්ධව මහ බැංකුව 2024 වසර පුරා අඛණ්ඩව කටයුතු කළ අතර වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණයට අදාළ ප්‍රයත්නයන් වැඩිදියුණු කර ඇත. අධීක්ෂණ කටයුතු ප්‍රමිතිගතව සිදු කිරීම සහ රෙගුලාසි නියාමනය කිරීමේ අඛණ්ඩතාව තහවුරු කිරීම සඳහා මහ බැංකුව විසින් වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ අත්පොත සකස් කරන ලදි. ඊට අමතරව දිගු කලක් පුරා පවතින පාරිභෝගික අවදානම් සහ ඒවායේ බලපෑම තක්සේරු කිරීම සඳහා ප්‍රධාන අවදානම් දර්ශක නවයක් උපයෝගී කර ගනිමින් අවදානම් මත පදනම් වූ ඇගයුම් ආකෘතියක් ද හඳුන්වා දෙන ලදි.

මෙම ඇගයීම් පදනම් කොටගෙන මූල්‍ය පාරිභෝගික රෙගුලාසිවලට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා 2024 වර්ෂය තුළ දී මහ බැංකුව විසින් එක් බලපත්‍රලාභී බැංකුවක් සඳහා පූර්ණ විෂයපථ ආවරණ පරීක්ෂණයක් සිදු කරන ලදි. එසේම වෙළඳපොළ හැසිරීම් සහ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ පරිචයන් ඉලක්ක කර ගනිමින් තවත් බලපත්‍රලාභී බැංකු තුනක් සඳහා තේමාත්මක පරීක්ෂණ සිදු කරන ලදි. මෙම පරීක්ෂණවල දී විශේෂයෙන් ම අසාධාරණ ව්‍යාපාර පරිචයන්, හෙළිදරව් කිරීම සහ විනිවිදභාවය යන අංශයන්ට අදාළව රෙගුලාසිවලට අනුකූල නොවන අවස්ථා කීපයක් ද අනාවරණය විය. තවද වසර තුළ පැනනැගුණු සුවිශේෂී පාරිභෝගික ආරක්ෂණ ගැටලු හා සම්බන්ධව ඒවා ඉලක්ක කරගත් විමර්ශනයක් ද මහ බැංකුව විසින් සිදු කරන ලදි. මහ බැංකුව විසින් මහජන විමසීම් සඳහා ත්‍රෛයි භාෂා පහසුකම්වලින් යුත් විශේෂිත ක්ෂණික ඇමතුම් අංකයක් සහිත සම්බන්ධතා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබන අතර මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි පිළිබඳව අවබෝධය වැඩිදියුණු කිරීම පිණිස නියාමනය කරන ලද මූල්‍ය ආයතනයන්හි සේවකයින් සහ මහජනතාව සඳහා පුහුණු සැසි කීපයක් පවත්වන ලදි.

ගෝලීය සහයෝගීතාවයේ වැදගත්කම හඳුනා ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව සිය නියාමන රාමුව වැඩිදියුණු කිරීම සහ එහි අධීක්ෂණ ප්‍රවේශය වැඩිදියුණු කිරීමේ අරමුණින් ලෝක බැංකුවේ ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව සහ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වූ සන්ධානය ඇතුළු ජාත්‍යන්තර මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ විශේෂඥයන් සමග සම්බන්ධ විය.

**පාරිභෝගික පැමිණිලි සහ විමසුම් හැසිරවීම**

රූප සටහන - 11

2024 වසරේ දී ලැබුණු පැමිණිලි
3,374




සම්පූර්ණයෙන් විසඳන ලද පැමිණිලි ප්‍රමාණය

ලැබුණු ප්‍රධාන පැමිණිලි/දුක් ගැනවිලි වර්ග

- මූල්‍ය පහසුකම් සඳහා සහන ඉල්ලීම
- ඉහළ පොලී අනුපාතික අය කිරීම
- සදාචාර විරෝධී/පිළිගත නොහැකි පරිචයන්
- කළමනාකරණ/මෙහෙයුම් ගැටලු
- ඉහළ ගාස්තු සහ කොමිස් මුදල් අයකිරීම
- මූල්‍ය වංචා

1935

මහජන විමසීම්වලට පිළිතුරු ලබා දීම සඳහා ත්‍රෛයි භාෂා පහසුකම්වලින් සමන්විත ක්ෂණික ඇමතුම් පහසුකම සහිත සම්බන්ධතා මධ්‍යස්ථානයක් මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබයි

49,560 දුරකථන විමසීම් සඳහා ඉතා ඉක්මනින් ප්‍රතිචාර දක්වන ලදි.

## නිරාකරණය කිරීමේ අධිකාරී බලය

2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී බැංකු පිළිබඳ නිරාකරණය කිරීමේ අධිකාරී බලය උසුලයි.

### 2024 ප්‍රධාන ක්‍රියාකාරකම්

#### නිරාකරණය කිරීමේ වැඩසටහන්

2024 දී, මහ බැංකුව මූල්‍ය ආයතන සඳහා එහි නිරාකරණ රාමුව ශක්තිමත් කරන ලදි:

- පාලක මණ්ඩලය විසින් 2024 මාර්තු 20 වන දින තැන්පතු රක්ෂණ සහ නිරාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ අර්ථ දක්වා ඇති සීමාවන් සහ හැකියාවන් තුළ, මහ බැංකුව වෙනුවෙන් නිරාකරණ බලය ක්‍රියාත්මක කිරීමට අදාළ කාර්යයන් සහ වගකීම් ඉටු කිරීමට බලය ලබා දී ඇත.
- මහ බැංකුවේ නිරාකරණ ප්‍රතිපත්තිය 2024 ජූලි 17 වන දින හඳුන්වා දෙන ලදි.
- මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීමට අවැසි නිරාකරණ පරමාර්ථවලට සහාය දැක්වීම සඳහා මූල්‍ය ස්ථායිතා අරමුදල 2024 ඔක්තෝබර් 03 වන දින ස්ථාපිත කරන ලදි.
- පාලක මණ්ඩලය විසින් 2024 ඔක්තෝබර් 10 වන දින බලපත්‍රලාභී බැංකු සඳහා නිරාකරණ ප්‍රේරක අනුමත කරන ලද අතර එය නිරාකරණ කටයුතු සඳහා පෙර සූදානම ශක්තිමත් කිරීමේ සුවිශේෂී පියවරක් ලෙස හැඳින්විය හැකිය.
- නිරාකරණ සැලසුම් සම්පාදනයේ දී ව්‍යුහගත දත්ත මත පදනම් වූ ප්‍රවේශයක් අනුගමනය කරන බව තහවුරු කරමින් ඒ සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්ත බලපත්‍රලාභී බැංකු විසින් සැපයීම අනිවාර්ය කරමින් 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ 2024 අංක 01 දරන බලපත්‍රලාභී බැංකු නිරාකරණ සැලසුම් සඳහා වන සම්මත දත්ත ආකෘති යන නියෝගය 2024 ඔක්තෝබර් 29 වන දින නිකුත් කරන ලදි.
- ශ්‍රී ලංකාවේ නිරාකරණ රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය අංශයේ ස්ථායිතා සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ ආසියානු සංවර්ධන බැංකුවෙන් තාක්ෂණික සහාය ලබා ගන්නා ලදි.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ පාර්ශ්වකරුවන් සහ ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයින් සමඟ එක්ව තෝරාගත් පද්ධතිමය වැදගත්කමක් හෝ බලපෑමක් ඇති බැංකු, සහ මධ්‍යම හා සුළු පරිමාණ බලපත්‍රලාභී බැංකු සඳහා නිරාකරණ සැලසුම් ක්‍රමානුකූලව සම්පාදනය කරමින් සිටී.

## ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය

2010 දී ආරම්භ කළ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය, 2023 බැංකු (විශේෂ විධිවිධාන) පනත බලාත්මක කිරීම සමඟ නෛතිකව ස්ථාපනය කරන ලදි. මහ බැංකුව විසින් එහි පරිපාලනය සහ කළමනාකරණය 2024 පුරාවට ද සාර්ථකව පවත්වාගෙන යන ලදි.

### 2024 ප්‍රධාන ක්‍රියාකාරකම්

#### තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ මෙහෙයුම්

2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානවලට අනුකූලව, ජාත්‍යන්තර තැන්පතු රක්ෂකයින්ගේ සංවිධානය (IADI) විසින් නිකුත් කළ ඵලදායී තැන්පතු රක්ෂණ ක්‍රම සඳහා වන ප්‍රධාන මූලධර්ම හා බෙහෙවින් බැඳුණු ප්‍රතිපත්ති මට්ටමේ වැඩි දියුණු කිරීම් කිහිපයක් හඳුන්වා දෙමින්, 2024 වසර තුළ, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය ශක්තිමත් කරන ලදි:

- තැන්පතු රක්ෂණ කාර්යය සහ නිරාකරණය කිරීමේ කාර්යයන් පැහැදිලිව නිරූපණය කරන නව ආයතනික ව්‍යුහයක් ස්ථාපිත කරන ලදි.
- ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා අරමුදල් සහතික කිරීමේ (backstop funding) සැකසුම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමකට ඇතුළත් විය.
- IADIහි මූලික මූලධර්ම සහ ජාත්‍යන්තර ප්‍රශස්ථ පරිචයන් සමඟ අනුකූලව රක්ෂිත තැන්පතු ප්‍රතිපූරණය සඳහා නව මාර්ගෝපදේශයක් හඳුන්වා දෙන ලදි.
- ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ තොරතුරු බෙදා හැරීමට සහ පාර්ශ්වකරුවන්ට අදාළ තොරතුරු වෙත පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ ලාංඡනය සහිත විශේෂිත වෙබ් පිටුවක් දියත් කරන ලදි.
- 2025 ජනවාරි මාසයේ දී පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද නව ආයෝජන ප්‍රතිපත්තියක් සංචිත කළමනාකරණය සඳහා ස්ථාපිත කරන ලදි.

තවද, ස්ථාපිත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් කටයුතු ඵලදායී ලෙස සිදු කිරීමට සමත් විය:

- 2024 අවසානය දක්වා, ලැබීමට නියමිත ද්‍රවශීලතා ආධාරක ණය රු.මි. 261.46ක් නැවත අයකර ගන්නා ලදි.
- 2024 දක්වා බලපත්‍ර අවලංගු කරන ලද සමාගම් හතක තැන්පත්කරුවන්ට වන්දි වශයෙන් රු.බි. 31.3ක් ගෙවා ඇත.

#### මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය

මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ණයකරු ලෙස ශ්‍රී ලංකා රජය සමඟ ලෝක බැංකු අරමුදල්කරණය යටතේ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය එ.ජ.ඩො.මි. 150ක් අනුමත කර ගෙන ඇත. මුළු ණය මුදලෙන්, එ.ජ.ඩො.මි. 100ක් ව්‍යාපෘති කොන්දේසි සපුරාලීම මත ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය වෙත ලබා දෙන ලද අතර, දැනට එම අරමුදල එම කාර්යය සඳහා පමණක් භාවිතා කළ හැකි ආරක්ෂිත සංවෘත (Ring-Fenced) ඩොලර් ගිණුමක තබා ඇත.



මෙහෙයුම් තොරතුරු | මූල්‍ය ප්‍රකාශ | අතිරේක තොරතුරු

බැංකුවේ කාර්යභාරය ▸ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සහතික කිරීම

## පිරමිඩ යෝජනා ක්‍රම නිරාවරණය කිරීම: ශ්‍රී ලංකාවේ නීතිමය පසුබිම සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග

මූල්‍ය අර්බුදයක දී බොහෝ විට සිදුවන අනපේක්ෂිත ප්‍රතිවිපාකයක් වන්නේ වංචනික ක්‍රියාකාරකම් කැපී පෙනෙන ලෙස ඉහළ යාමයි. එහි ප්‍රතිඵලයක් ලෙස ඕනෑම පොදු පුරවැසියෙකු මෙවැනි සංකීර්ණ හා වේගයෙන් ව්‍යාප්ත වන මූල්‍ය වංචාවන්වල වින්දිතයන් බවට පත්විය හැකිය. මෑත අතීතයේ දී, විශේෂයෙන් 2022 අර්බුදයෙන් පසුව, පිරමිඩ යෝජනා ක්‍රම පිළිබඳ සංසිද්ධිය බේදජනක ලෙස නැවත ඉස්මතු වී ඇත. නීතිමය වශයෙන් තහනම් මෙම යෝජනා ක්‍රම වැළැක්වීම සඳහා නිලධාරීන් අඛණ්ඩව ම කටයුතු කළත් මේවා තවදුරටත් තනි පුද්ගල ආයෝජනයන්ට මෙන්ම සමස්ත ආර්ථිකයට ද තර්ජනයක්ව පවතී.

මෙකී තහනම් යෝජනා ක්‍රම ඉක්මන් සහ ක්ෂණික ප්‍රතිලාභ පිළිබඳව සහභාගීවන්නන්ට විශාල පොරොන්දු ලබා දෙන අතර ඒවා නීත්‍යානුකූල ආර්ථික ක්‍රියාකාරකම් වෙනුවට සාමාජිකයින් බඳවා ගැනීම මත රඳා පවතී. මෙවැනි ආකර්ෂණීය පොරොන්දු හේතුවෙන් අවම දැනුමක් සහිත අවදානම් සහගත ප්‍රජාවන්ගේ සාමාජිකයින් පිරමිඩ යෝජනා ක්‍රමවල ගොදුරු බවට පත්විය හැකිය. පිරමිඩ යෝජනා ක්‍රමවල සත්‍ය නිෂ්පාදන නොමැති වීම සහ ස්ථිර නොවන වර්ධන රටා හේතුවෙන් ඒවා නොවැළැක්විය හැකි ලෙස කඩාවැටීම්වලට ලක්වේ. එමනිසා මේ සඳහා සහභාගීවන්නන් බොහෝ දෙනෙකුට හෝ සමස්තයට සැලකිය යුතු අලාභ හානි ඇති විය හැකිය. කෙසේ වෙතත්, නීතිය බලාත්මක කිරීමේ දී පවතින අභියෝග සහ වංචාකරුවන් අනුගමනය කරනු ලබන උපක්‍රම හේතුවෙන් මෙවැනි යෝජනා ක්‍රම සහ ඒ පිටුපස සිටින බලවේග තවදුරටත් සක්‍රීයව කටයුතු කරන බව දැක ගත හැකිය.

### නීතිමය පසුබිම

නව සාමාජිකයින් බඳවා ගැනීම මත හෝ සාමාජිකයින්ගේ දායක මුදල් ඉහළ දැමීම මත ප්‍රතිලාභ සපයන යෝජනා ක්‍රමයක් පිරමිඩ යෝජනා ක්‍රමයක් ලෙස අර්ථ දක්වන අතර එවැනි යෝජනා ක්‍රම පවත්වාගෙන යාම 1988 අංක 30 දරන බැංකු පනතේ 83(ඇ) වගන්තිය උල්ලංඝනය කරනු ලබයි. පිරමිඩ යෝජනා ක්‍රමයකට සම්බන්ධ වීම දැඩි අහිතකර නීතිමය ප්‍රතිවිපාකයන්ට මුහුණ දීමට හේතු විය හැකි අතර වරදකරුවන්ට වසර තුනක් දක්වා සිර දඬුවම් හෝ රුපියල් මිලියනයක් දක්වා දඩ මුදලක් හෝ මෙකී දඬුවම් ද්විත්වයටම මුහුණ පෑමට සිදුවේ. මූල්‍යමය හානියක් කිරීමේ අරමුණින් මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇත්නම්, දඬුවම් වඩාත් බරපතල වන අතර වසර තුනකට නොඅඩු සහ වසර පහකට නොවැඩි බරපතල සිර දඬුවමක් සහ රුපියල් මිලියන දෙකක් හෝ සහභාගිවන්නන්ගෙන් ලැබුණු මුදල මෙන් දෙගුණයක් යන දෙක අතුරින් ඉහළ අගය දඩයක් ලෙස නියම කළ හැකිය.

### වංචාකාරී උපායමාර්ග

වංචාකරුවන් බොහෝ විට පිරමිඩ යෝජනා ක්‍රම නීත්‍යානුකූල ව්‍යාපාරික අවස්ථාවන් ලෙස පෙන්වීමට ප්‍රයත්න දරයි, උදාහරණ ලෙස,

- ඒවා බහු ස්ථර අලෙවිකරණ ව්‍යාපාරයක් ලෙස ඉදිරිපත් කිරීම
- විශ්වාසදායක බව පෙන්වීමට ව්‍යාපාර ලියාපදිංචිය අනිසි ලෙස භාවිතා කිරීම
- අවම ප්‍රයත්නයකින් යථාර්ථවාදී නොවන ප්‍රතිලාභ ලබා දීමට පොරොන්දු වීම
- පීඩනකාරී විකුණුම් උපාය මාර්ග භාවිත කිරීම සහ මේවා ප්‍රවර්ධනය සඳහා විවිධ පුද්ගලයින්ගේ නොමඟ යවන සුළු අත්දැකීම් ඉදිරිපත් කිරීම
- මාර්ගගත ලෙස පවත්වාගෙන යාම සහ ක්‍රිප්ටෝ මුදල්වල ආයෝජනය කරන මුවාවෙන් මූල්‍ය වංචා සිදු කිරීම
- බඳවා ගැනීමේ වැඩසටහන්, පුහුණු වැඩසටහන් ලෙස සඟවා දැක්වීම

### මහ බැංකුවේ භූමිකාව

1988 අංක 30 දරන බැංකු පනතේ 83 (ඇ) වගන්තිය ප්‍රකාරව පිරමිඩ යෝජනා ක්‍රම සහ අනෙකුත් වංචා ඇතුළු තහනම් මූල්‍ය යෝජනා ක්‍රම පිළිබඳ මහජන පැමිණිලි සම්බන්ධයෙන් මහ බැංකුව සක්‍රීයව කටයුතු කර ඇත. 2024 වසර මුළුල්ලේ මේ සම්බන්ධයෙන් මහ බැංකුවට පැමිණිලි රාශියක් ලැබුණු අතර, එමඟින් මෙම නීති විරෝධී ක්‍රියාකාරකම් පිළිබඳව වැඩි වන මහජන අප්‍රසාදය එළිදරව් වී ඇත.

එසේම තවදුරටත් අනුකූලතාව ශක්තිමත් කිරීමට සහ නීති විරෝධී ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා, මහ බැංකුව වසර පුරා විමර්ශන කටයුතු සිදු කරන ලදි. මෙම විමර්ශන නීති විරෝධී මෙහෙයුම් හඳුනා ගැනීමට සහ ඒවා නිරාකරණය කිරීමේ ක්‍රියාවලියට තීරණාත්මක ලෙස උපකාරී වූ අතර එය මහජන අභිලාෂයන් සුරක්ෂා කිරීම මෙන්ම මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහතික කිරීමට ද දායක විය. මහ බැංකුව විසින් මහජන පැමිණිලි මත පදනම්ව, වැදගත් සාක්ෂි රැස් කරමින්, තොරතුරු සොයා බැලීමේ විමර්ශන සිදු කරන ලද අතර, එමඟින් අපරාධකරුවන්ට එරෙහිව කඩිනම් සහ බලපෑම් සහගත ක්‍රියාමාර්ග ගැනීමට අවස්ථාව සලසන ලදි. ඒ අනුව සියලුම පාර්ශ්වකරුවන්ට සුරක්ෂිත මූල්‍ය පරිසරයක් සහතික කිරීම සඳහා කැප වූ, සුපරීක්ෂාකාරී නියාමන අධිකාරියක් ලෙස මහ බැංකුවේ කාර්යභාරය වඩාත් සාර්ථකව ඉටු කිරීමට හැකි විය.

2024 වර්ෂයේ දී, මහ බැංකුව විසින් මෙවැනි වංචා හඳුනා ගනිමින් ඒවා වළක්වා ගැනීම පිණිස මහජනතාවට උපකාර කිරීමට හා දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීමට සැලසුම් කරන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් මගින් පිරමිඩ යෝජනා ක්‍රමවලට සම්බන්ධ බහුවිධ වංචනික මෙහෙයුම් අඩපණ කිරීමට කටයුතු කරන ලදි. තව ද අපරාධකරුවන්ට එරෙහිව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට පහසුකම් සැපයීම අරමුණු කොටගෙන නීති විරෝධී ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම සඳහා නීතිය බලාත්මක කරන ආයතන සමඟ ඉහළ සම්බන්ධීකරණයකින් යුතු සහයෝගීතාවයක් පවත්වාගෙන යාමට මහ බැංකුව කටයුතු කර ඇත.

## අනවසර මුදල් ව්‍යාපාර සම්බන්ධ විමර්ශන කටයුතු

අනවසර තැන්පතු ලබා ගැනීම් සහ මුදල් ව්‍යාපාර සම්බන්ධව ලැබුණු පැමිණිලි සහ තොරතුරු මත පදනම්ව, 2024 වසර අවසානය වන විට, මුදල් ව්‍යාපාර පනතේ 42 වන වගන්තිය ප්‍රකාරව විමර්ශන 158ක් මෙහෙයවන ලදි.

මෙම විමර්ශනවල අරමුණ වූයේ මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් ආයතන හෝ පුද්ගලයින් මුදල් ව්‍යාපාරවල නියැලී සිටින්නේ ද, නැතහොත් තැන්පතු භාර ගන්නේ ද යන්න නිර්ණය කිරීමයි.

2024 දී, විමර්ශනයට ලක්ව ඇති ආයතන සහ පුද්ගලයින්ගේ වත්කම් අන්සතු කිරීම වැළැක්වීම සඳහා, මුදල් ව්‍යාපාර පනතේ 44 වන වගන්තිය යටතේ අත්හිටුවීමේ නියෝග සඳහා කොළඹ මහාධිකරණයෙන් දීර්ඝ කිරීම් 18ක් ලබා ගෙන ඇත. තවද, මුදල් ව්‍යාපාර පනතේ 45(3) වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණවල නියෝග සමඟ පුද්ගලයින් 15 දෙනෙකු විගමන තහනම්වලට යටත් විය.

මෙම තීරණ පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීම සඳහා මුදල් ව්‍යාපාර පනතේ 42 (10) වගන්තිය ප්‍රකාරව දෛනික සහ සති අන්ත පුවත්පත්වල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් මහ බැංකුව නිවේදන ප්‍රකාශයට පත් කිරීම සිදු කරන ලදි.

# ශ්‍රී ලංකාවේ ගෙවීම් සහ පියවීම් පද්ධතිය

මූල්‍ය ආයතන සහ ඒවායේ ගනුදෙනුකරුවන්ට මුදල් නෝට්ටු හෝ කාසි රහිතව කාර්යක්ෂමව ගනුදෙනු සිදු කිරීමට හැකියාව ලබා දෙමින් ශ්‍රී ලංකාවේ ජාතික ගෙවීම් පද්ධතිය රටේ මූල්‍ය පද්ධතියේ ජීවනාලිය ලෙස ක්‍රියා කරයි. විවිධ පුද්ගලයින්, ව්‍යාපාර සහ රජයේ ආයතන අතර පහසුවෙන් සහ බාධාවකින් තොරව මූල්‍ය ගනුදෙනු සිදු කිරීම සහතික කිරීම සඳහා ජාතික ගෙවීම් පද්ධතියේ සුරක්ෂිත සහ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය ඉතා වැදගත් වේ. මෙතුළින් රටේ මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය ඇති කරන අතර එමඟින් රටේ මූල්‍ය ස්ථාවරත්වය ද ඇති කරයි. හොඳින් වැඩිදියුණු වූ ජාතික ගෙවීම් පද්ධතියක් මගින් ගනුදෙනු සඳහා වන පිරිවැය අවම කරන අතරම වෙළඳාම සහ ආයෝජනය සඳහා පහසුකම් සැලසීමෙන් ආර්ථික වර්ධනය ද ඉහළ නංවයි.

මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන ජාතික ගෙවීම් පද්ධතියට විශාල වටිනාකම් සඳහා වූ ගෙවීම් පද්ධතියක් වන මහ බැංකුව යටතේ ක්‍රියාත්මක වන තත්කාලීන දළ පියවීම් පද්ධතිය (Real Time Gross Settlement System) මෙන්ම ජාතික ගෙවීම් ජාලයේ ක්‍රියාකරු වන ලංකාපේ (LankaPay) පුද්ගලික සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන සුළු පරිමාණ ගෙවීම් පද්ධති සහ බලපත්‍රලාභී සේවා සපයන්නන් (Licensed Service Providers) විසින් සපයනු ලබන ගෙවීම් සේවා ඇතුළත් වේ. මෙම පද්ධති හරහා, ඉහළ වටිනාකමක් ඇති අන්තර් බැංකු ගනුදෙනු මෙන්ම දෛනික සුළු පරිමාණ ගෙවීම් ද සිදු කිරීමට අවස්ථාව ලැබෙන අතර, එතුළින් පුද්ගලයන්, ව්‍යාපාර සහ රජයේ ආයතන සඳහා ඩිජිටල් ගනුදෙනු සඳහා ඇති නැඹුරුව වැඩි කරමින් මූල්‍ය පද්ධතියට ඇති ප්‍රවේශ්‍යතාව වැඩිදියුණු කිරීම ද සිදු කරනු ලබයි.

**ශ්‍රී ලංකාවේ ජාතික ගෙවීම් පද්ධතිය**

රූප සටහන - 12








## තත්කාලීන දළ පියවීම් පද්ධතියේ මෙහෙයුම්

පද්ධතිමය වශයෙන් වැදගත් ගෙවීම් පද්ධතියක් (Systemically Important Payment System) වන තත්කාලීන දළ පියවීම් පද්ධතිය මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර, එම පද්ධතිය මගින් එහි සහභාගීකරුවන් 35 දෙනෙක් අතර තත්කාලීන, ආරක්ෂිත සහ අවලංගු කළ නොහැකි ලෙස විශාල වටිනාකම් සඳහා වූ ගෙවීම් සඳහා පහසුකම් සපයයි. මෙලෙස සිදුවන විවිධ ආකාරයේ ගනුදෙනු අතර අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි වන ගනුදෙනු, රජයේ සුරැකුම්පත් සඳහා වන ගනුදෙනු, විවට වෙළෙඳපොළ මෙහෙයුම්, විදේශ විනිමය හුවමාරු සඳහා අදාළ වන ශ්‍රී ලංකා රුපියල් ගනුදෙනු, නිෂ්කාශන ආයතනය (LankaPay) මගින් ඉදිරිපත් කරනු ලබන ගනුදෙනු, සහභාගීකරුවන් අතර සිදුවන අනෙකුත් ගනුදෙනු සහ පාරිභෝගික ගනුදෙනු හඳුනාගත හැකිය.

තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගීකරුවන් අතරට මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු 24 ක්, බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්, බලයලත් ප්‍රාථමික අලෙවිකරුවන් 07 දෙනෙකු, සේවක අර්ථසාධක අරමුදල සහ කොළඹ කොටස් හුවමාරුවේ මධ්‍යම තැන්පතු පද්ධතිය ඇතුළත් වේ. මෙම පද්ධතියේ පියවීමේ අවදානම අවම කිරීම සඳහා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලයලත් ප්‍රාථමික අලෙවිකරුවන් වෙත රජයේ සුරැකුම්පත් ඇපකරයක් ලෙස භාවිතා කරමින් දිනය තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම නොමිලේ සපයයි.

කාල සංවේදී, විශාල වටිනාකම් සඳහා වූ ගෙවීම් සඳහා තත්කාලීන දළ පියවීම් පද්ධතිය සුරක්ෂිත සහ කාර්යක්ෂම විසඳුමක් ලෙස ක්‍රියාත්මක වෙයි. පද්ධතිමය වශයෙන් වැදගත් ගෙවීම් පද්ධතියක් ලෙස, තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සිදුවන බිඳ වැටීමක් තීරණාත්මක මූල්‍ය මෙහෙයුම්වලට බාධා සිදු කළ හැකි අතර, එමගින් රටේ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට සහ සාර්ව ආර්ථිකයට තර්ජනයක් සිදු විය හැකිය.

**තත්කාලීන දළ පියවීම් (RTGS) පද්ධතියේ ගනුදෙනු වර්ග: 2024**

ප්‍රස්ථාර සටහන - 02




**තත්කාලීන දළ පියවීම් (RTGS) පද්ධතියේ පාරිභෝගික ගනුදෙනුවල වර්ධනය: 2015-2024**

ප්‍රස්ථාර සටහන - 03




### 2024 ප්‍රධාන ක්‍රියාකාරකම්

2024 වසරේ දී, තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා රු. ට්‍රි. 406ක වටිනාකමක් සහිත ගනුදෙනු 597,666ක් සිදු විය. ඒ අතර රු. ට්‍රි. 22.4ක වටිනාකමක් සහිත පාරිභෝගික ගනුදෙනු 308,000ක් ද පැවති අතර, එය 2023 වසරට සාපේක්ෂව 25%ක වැඩිවීමකි.

මෙම වසර තුළ, මහ බැංකුව විසින් සිය තත්කාලීන දළ පියවීම් පද්ධතිය වැඩිදියුණු කර එය LankaRTGS ලෙස සන්නාම කරන ලදි. මෙම LankaRTGS පද්ධතිය මූල්‍ය ආයතන අතර විද්‍යුත් දත්ත හුවමාරුව සඳහා පවතින ISO 20022 ප්‍රමිතියට අනුකූල වන අතර එතුළින් සිය මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ අවදානම් කළමනාකරණ හැකියාවන් වැඩිදියුණු කර ගන්නා ලදි.

## ජාතික ගෙවීම් පද්ධතිය නියාමනය, ආවේක්ෂණය සහ අධීක්ෂණය කිරීම.

2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ අර්ථ දක්වා ඇති පරිදි, මහ බැංකුව විසින් ජාතික ගෙවීම් පද්ධතිය ස්ථාපිත කිරීම, දියුණු කිරීම සහ ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වයි.

ඒ යටතේ, රට තුළ ක්‍රියාත්මක වන ගෙවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය සහ කාර්යක්ෂමතාව සහතික කිරීම මෙන්ම අවදානම් පාලනය සඳහා මහ බැංකුව විසින් එම පද්ධතිවලට අදාළව ආවේක්ෂණ කටයුතු සිදු කරයි.

මීට අමතරව, බලපත්‍රලාභී සේවා සපයන්නන් විසින් ගෙවීම් කාඩ්පත් නිකුත් කරන්නෙකු ලෙස, ගෙවීම් කාඩ්පත් පිළිබඳ මූල්‍ය අත්පත්කරුවකු ලෙස සහ විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවකු ලෙස පාරිභෝගිකයින් වෙත සේවාවන් සැපයීමේ නිසි සහ සාධාරණ අයුරින් කටයුතු කරන බව තහවුරු කිරීම සඳහා අවශ්‍ය අධීක්ෂණ කටයුතු ද මහ බැංකුව සිදු කරයි.

## මූල්‍ය ආයතනවල ගිණුම් පවත්වාගෙන යාම

තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පාර්ශ්වකරුවන් සඳහා ගෙවීම් සහ පියවීම් පහසුකම් සපයමින් ආරක්ෂිතව සහ කාර්යක්ෂමව ගෙවීම් සහ පියවීම් සිදුකරමින් ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථිකයෙහි ක්‍රියාකාරීත්වය සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. විශාල වටිනාකමක් සහිත ගෙවීම් සිදු කිරීමට පහසුකම් සැපයීම සහ අන්තර් බැංකු මුදල් වෙළඳපොළෙහි කටයුතු සඳහා පහසුම් සැපයීම තුළින් මෙම කාර්යභාරය ඉටු කෙරේ. පොදු ලෙජර් ගිණුම් මඟින් ගෙවීම් හා පියවීම් සඳහා පහසුකම් සැපයීම මෙන්ම, තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පාර්ශ්වකරුවන් අතර නිර්ලේඛන සුරැකුම්පත් ගනුදෙනුවල ගෙවීම් හා පියවීම් නිෂ්කාශනය සඳහා පහසුකම් සැපයීම ද සිදු කෙරේ. 2024 වසර අවසානය වන විට, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු 24කට, ජාතික ඉතිරිකිරීමේ බැංකුවට සහ ප්‍රාථමික අලෙවිකරුවන්ට අදාළව තත්කාලීන දළ පියවීම් ගිණුම් පවත්වාගෙන යනු ලැබීය.

## සුළු පරිමාණ ගෙවීම් පද්ධතිවල මෙහෙයුම්

පුද්ගලයින්ට, ව්‍යාපාරවලට සහ රජයේ ආයතනවලට ඩිජිටල් ගෙවීම් මඟින් ලබා දෙන පහසුව සහ ආරක්ෂාව හේතුවෙන් මහජනතාව අතර ඩිජිටල් ගෙවීම් සඳහා වන පිළිගැනීම අඛණ්ඩව වර්ධනය වෙමින් පවතී. රටේ සුළු පරිමාණ ගෙවීම් පද්ධති, ඒවායේ සුරක්ෂිත සහ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය හරහා, මෙම වර්ධනයට පහසුකම් සපයා ඇත. එවැනි පද්ධති අතරට ප්‍රධාන වශයෙන් ලංකාපේ ආයතනය විසින් ක්‍රියාත්මක කරන අන්තර් බැංකු ගෙවීම් පද්ධති, අන්තර්ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රම (ICS) මඟින් ක්‍රියාත්මක කරන ගෙවීම් කාඩ්පත් ජාල සහ විදුලි සංදේශ සේවා සපයන්නන් විසින් ක්‍රියාත්මක කරන විද්‍යුත් මුදල් පද්ධති ඇතුළත් වේ.

ලංකාපේ ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන සුළු පරිමාණ ගෙවීම් පද්ධති අතරට විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS), ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (CAS), විකුණුම්පොළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (CPS), ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS) හා ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතිය (CITS) ඇතුළත් වේ.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ක්ෂණික ගෙවීම් පද්ධතියක් (Fast Payment System) වන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා 2024 වසරේ දී සිදු කරන ලද ගනුදෙනුවල වටිනාකම එම වසරේ දී සිදු කරන ලද සියලු අන්තර් බැංකු සුළු පරිමාණ ගෙවීම්වල වටිනාකමෙන් සියයට 50ක් වූ අතර එහි සමස්ත ගනුදෙනු වටිනාකම රු. ට්‍රි. 17.3කි.

සුළු පරිමාණ ගෙවීම් සඳහා විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය පදනම් කරගත් ගෙවීම් ක්‍රමවේද භාවිතා කිරීමේ ඉහළ නැඹුරුවක් පවතින බව මෙයින් පෙන්නුම් කරයි. මෙම යාන්ත්‍රණය මඟින් ගනුදෙනුකරුවන්හට අන්තර්ජාල බැංකුකරණය, ජංගම දුරකථන බැංකුකරණය, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, Kiosk යන්ත්‍ර සහ මූල්‍ය ආයතනවල කවුන්ටරය හරහා ගෙවීම් සිදුකිරීමට ඇති ක්‍රමය වැනි ක්‍රමවේද ඔස්සේ ක්ෂණිකව මාර්ගගත ක්‍රමයට මුදල් හුවමාරු කිරීමේ හැකියාව ලැබේ. QR කේත පදනම් කරගත් ගෙවීම් ක්‍රමයක් වන LANKAQR ක්‍රමවේදය ද විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය ඔස්සේ ක්‍රියාත්මක වන අතර මෙම ක්‍රමවේදය ජංගම ගෙවීම් යෙදුම් භාවිතා කරන ගනුදෙනුකරුවන්ගෙන් ඩිජිටල් ගෙවීම් ලබා ගැනීමට වෙළඳුන් විසින් භාවිතා කරනු ලැබේ.

**විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CEFTS) ගනුදෙනුවල වර්ධනය: 2015-2024**

ප්‍රස්ථාර සටහන - 04




මීට අමතරව, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි දිගුවක් ලෙස ක්‍රියාත්මක වන ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LankaPay Online Payment Platform) හරහා ක්ෂණිකව මාර්ගගත ලෙස ගෙවීම් ලබා ගැනීමට රාජ්‍ය ආයතන වෙත පහසුකම් සපයයි. ලංකාපේ මංගත ගෙවීම් වේදිකාවෙහි සාමාජික මූල්‍ය ආයතනවල ගනුදෙනුකරුවන්හට සිය ජංගම හෝ ඉතිරිකිරීමේ ගිණුමෙන් ක්ෂණිකව සහ ආරක්ෂිතව රජයේ ආයතනයකට මුදල් හුවමාරු කිරීමේ පහසුකම මේ තුළින් සලසයි. දැනට ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව හරහා ගෙවීම් භාරගන්නා ආයතන අතරට ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, සේවක අර්ථසාධක අරමුදල, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, වාණිජ දෙපාර්තමේන්තුව, මධ්‍යම තැන්පතු පද්ධතිය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඇතුළත් වේ. 2024 වසරේ දී ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව හරහා රු. ට්‍රි. 1.78ක මුළු ගනුදෙනු වටිනාකමක් සහිත ගෙවීම් සිදු කරන ලදි.



මෙහෙයුම් තොරතුරු | මූල්‍ය ප්‍රකාශ | අතිරේක තොරතුරු
බැංකුවේ කාර්යභාරය ▸ ශ්‍රී ලංකාවේ ගෙවීම් සහ පියවීම් පද්ධතිය

## 2024 ප්‍රධාන ක්‍රියාකාරකම්

"GovPay" ගෙවීම් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට මහ බැංකුව පහසුකම් සැලසූ අතර එමඟින් පළාත් පාලන ආයතන ඇතුළු තමන්ගේම තොරතුරු තාක්ෂණ පද්ධති නොමැති බොහෝ රාජ්‍ය ආයතනවලට ද මහජනතාවගෙන් ක්ෂණිකව ඩිජිටල් ගෙවීම් ලබා ගැනීමට හැකියාව ලබා දී ඇත. මෙම යාන්ත්‍රණය මඟින් ඩිජිටල් ගෙවීම් ලබා ගැනීමට හැකියාව ඇති රාජ්‍ය ආයතන ප්‍රමාණය තවදුරටත් පුළුල් කරන අතරම, එම ආයතනවල කාර්යක්ෂමතාව සහ මහජනතාවට එම ආයතනවලට ප්‍රවේශ වීමේ හැකියාව වැඩිදියුණු කරයි. GovPay ගෙවීම් ක්‍රමවේදය 2025 පෙබරවාරි මාසයේ දී දියත් කරන ලදි.

නේපාල් ක්ලියරින් හවුස් ආයතනයේ ගෙවීම් පද්ධතිය සමඟ ඇති සම්බන්ධතාවය පුළුල් කිරීමට මහ බැංකුව විසින් ලංකාපේ ආයතනය වෙත අවසර ලබා දුන් අතර, එමඟින් නේපාල ජාතිකයින්හට ශ්‍රී ලංකාව තුළ දී ගෙවීම් සිදු කිරීම සඳහා NEPALPAY QR පහසුකම සහිත ජංගම යෙදුම් භාවිතා කිරීමට ඉඩ සැලසේ. මෙතුළින්, දැනටමත් චීනය සහ ඉන්දියාව සමග සම්බන්ධ වී ඇති LANKAQR ගෙවීම් ක්‍රමයෙහි විදේශීය ගෙවීම් ක්‍රමවේද සමඟ වන අනුකූලතාව වැඩි කරනු ලබයි.

2024 දී මහ බැංකුව විසින් බලපත්‍රලාභී සේවා සපයන්නන්ගේ අනුකූලතාවය සහතික කිරීම සඳහා එතැන් පරීක්ෂණ සහ දුරස්ථ අවේක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදි. ඩිජිටල් ගෙවීම්වල සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා මහ බැංකුව විසින් රු. 10,000ට වැඩි JustPay ගනුදෙනු සඳහා එක් වරක් භාවිතාවන මුරපදයක් (one-time password) හඳුන්වා දීම මෙන්ම ජංගම ගෙවීම් යෙදුම්වල පාරිභෝගික හඳුනාගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම වැනි පියවර කිහිපයක් ද ක්‍රියාත්මක කළේය.

මහ බැංකුවේ නායකත්වය යටතේ ජාතික ගෙවීම් කවුන්සිලය (National Payment Council) මගින් ජාතික ගෙවීම් පද්ධතිය වැඩි දියුණු කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම උදෙසා ගෙවීම් පද්ධතියේ පාර්ශවකරුවන් අතර සංවාදයකට පහසුකම් සැලසීම තවදුරටත් ක්‍රියාත්මක කරන ලදි. තවද, රට තුළ ඩිජිටල් ගෙවීම් සාක්ෂරතාව ඉහළ නැංවීම උදෙසා මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මෙන්ම ජාතික ගෙවීම් පද්ධතියට අදාළ තොරතුරු සහ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කිරීම සඳහා කාර්තුමය වශයෙන් පළ කරන "Payments Bulletin" ප්‍රකාශනය නිකුත් කිරීම ද මහ බැංකුව විසින් සිදු කරන ලදි.

### SWIFT පද්ධතියේ මෙහෙයුම්

මහ බැංකුව දේශීයව සහ ජාත්‍යන්තරව සිදු කරනු ලබන මූල්‍ය ගනුදෙනු පිළිබඳ තොරතුරු එහි ප්‍රතිපාර්ශ්වකරුවන් සමඟ ආරක්ෂිතව හුවමාරු කර ගැනීම සඳහා SWIFT (Society for Worldwide Interbank Financial Telecommunication) ජාලය භාවිතා කරයි.

එය මහ බැංකුවේ තත්කාලීන දළ පියවීම් පද්ධතිය, සුරැකුම්පත් පියවීම් පද්ධතිය සහ සංචිත කළමනාකරණ පද්ධතිය සමඟ ඒකාබද්ධ කිරීම මහ බැංකුවේ ගෙවීම් සහ රජයේ සුරැකුම්පත් ගනුදෙනු වඩා විධිමත් කිරීමට උපකාරී විය. මෙම ඒකාබද්ධ කිරීම ඉහත ගනුදෙනු සඳහා ගතවන කාලය සහ වැයවන පිරිවැය සැලකිය යුතු ලෙස අඩු කරමින් මහ බැංකුවේ සමස්ත කාර්යක්ෂමතාව වැඩි කරනු ලැබීය.

ජාත්‍යන්තරව පිළිගත් භාවිතයන්ට අනුකූල වන පරිදි මහ බැංකුවේ SWIFT යටිතල පහසුකම, මූල්‍ය ආයතන අතර විද්‍යුත් දත්ත හුවමාරුව සඳහා පවතින ISO 20022 ප්‍රමිතියට අනුකූල වන පරිදි යාවත්කාලීන කරන ලදි.

### ආසියානු නිෂ්කාශන සංගමයේ මෙහෙයුම්

ආසියානු නිෂ්කාශන සංගමයේ (Asian Clearing Union) සාමාජිකයෙකු ලෙස මහ බැංකුව 2024 වසරේ දී මෙම බහුපාර්ශ්වික ගෙවීම් පද්ධතිය තුළ සිය කාර්යභාරය නිසි ලෙස ඉටු කරන ලදි.

ආසියානු නිෂ්කාශන සංගමය, එහි සාමාජික රටවල් වන බංග්ලාදේශය, බෙලරුස්, භූතානය, ඉරානය, ඉන්දියාව, මාලදිවයින, මියන්මාරය, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව අතර ගනුදෙනුවල දී විනිමය සංචිත භාවිතය සහ හුවමාරු පිරිවැය අඩු කරමින් ශුද්ධ පදනමක් මත අන්තර් කලාපීය ගෙවීම් පියවීමට හැකියාව ලබා දෙන අතර, ඒ හරහා වෙළඳ හා බැංකු සබඳතා ප්‍රවර්ධනය කරනු ලබයි.

ආසියානු නිෂ්කාශන සංගමය විසින් ගෙවීම් පිළිබඳ පණිවිඩ හුවමාරුව විධිමත් කිරීම සඳහා ACUMER නමින් වෙබ්-පාදක පද්ධතියක් දියත් කරන ලද අතර එතුළින් සාමාජික මහ බැංකු සහ ආසියානු නිෂ්කාශන සංගමයේ ලේකම් කාර්යාලය අතර සන්නිවේදනය පහසු කරනු ලබයි.

### මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා නියාමනය සහ අධීක්ෂණය

මහ බැංකුව විසින් 2024 වසරේ දී 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ නිකුත් කරන ලද 2024 අංක 1 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග හරහා ශ්‍රී ලංකාවේ මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් නියාමනය සහ අධීක්ෂණය කිරීම ආරම්භ කරන ලදි.

මෙම නියෝග මගින් සියලුම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් මහ බැංකුවේ ලියාපදිංචි විය යුතු බව දක්වා ඇති අතර ඒ හරහා නියාමනය කරන ලද පරිසරයක් තුළ එම සේවාවල ගනුදෙනුකරුවන් හට සුරක්ෂිත සහ කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමටත් එම මෙහෙයුම් විධිමත් කිරීමටත් ඉඩ සලසා දෙනු ලැබේ.

# ව්‍යවහාර මුදල් නිකුතුව සහ කළමනාකරණය

මහ බැංකු පනත ප්‍රකාරව, ශ්‍රී ලංකා රුපියල ආකාරයෙන්, මුදල් නිකුත් කිරීම සහ කළමනාකරණය කිරීමේ පරම අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. බලපත්‍රලාභී වාණිජ බැංකුවල ඉල්ලීම මත ඔවුන් වෙත ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි නිකුත් කිරීම සහ තැන්පතු භාර ගැනීම මහ බැංකුවේ වගකීම්වලට අයත් වේ. 1950 සිට, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විවිධ තේමාවන් යටතේ නෝට්ටු කාණ්ඩ එකොළහක් නිකුත් කර ඇති අතර එයින් නවතම නෝට්ටු කාණ්ඩය 2011 දී මහජනතාව වෙත නිකුත් කරන ලදි. රු. 1/-, රු. 2/-, රු. 5/- සහ රු. 10/-න් සමන්විත වඩාත්ම මෑතක දී නිකුත් කරන ලද සංසරණ කාසි කාණ්ඩය 2017 දී හඳුන්වා දෙන ලදි.

### මහ බැංකුව විසින් නිකුත් කර ඇති ව්‍යවහාර මුදල් නෝට්ටු කාණ්ඩ

| කාණ්ඩය | තේමාව | මුහුණත වටිනාකම | වසර |
|---|---|---|---|
| 1 | හයවන ජෝර්ජ් රජු | 1, 10 | 1951 |
| 2 | දෙවන එළිසබෙත් රැජින | 1, 2, 5, 10, 50, 100 | 1952 |
| 3 | ලංකාවේ රාජ්‍ය ලාංඡනය | 1, 2, 5, 10, 50, 100 | 1956 |
| 4 | එස් ඩබ් ආර් ඩී බණ්ඩාරනායක | 2, 5, 10, 50, 100 | 1962 |
| 5 | පරාක්‍රමබාහු රජු | 2, 5, 10, 50, 100 | 1965 |
| 6 | ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනය | 50, 100 | 1975 |
| 7 | වන සතුන් සහ වෘක්ෂලතා | 2, 5, 10, 20, 50, 100 | 1979 |
| 8 | ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක | 5, 10, 20, 50, 100, 500, 1,000 | 1981 |
| 9 | ඓතිහාසික සහ සංවර්ධනය | 500, 1,000 | 1987 |
| 10 | ශ්‍රී ලංකාවේ උරුමයන් | 10, 20, 50, 100, 500, 1,000 | 1991 |
| | | 2,000 | 2005 |
| 11 | සංවර්ධනය සෞභාග්‍යය සහ ශ්‍රී ලංකාවේ නැටුම් ශිල්පීන්[1] | 20, 50, 100, 500, 1,000, 5,000 | 2011 |

**2011 වසරේ දී නිකුත් කරන ලද එකොළොස් වන මුදල් නෝට්ටු කාණ්ඩයේ තේමාව වනුයේ "සංවර්ධනය, සෞභාග්‍ය සහ ශ්‍රී ලංකාවේ නැටුම් ශිල්පීන්" යන්නයි.**

**රු. 5,000 නෝට්ටුව**

රූප සටහන - 13

| | |
|---|---|
| ප්‍රමුඛ වර්ණය | රන් |
| පරිමාණය | මි.මී 153 x මි.මී 67 |




**නෝට්ටුවේ මුහුණත**

වෙහෙරගල වේල්ලේ දර්ශනයක් කලාකරුවකුගේ නිර්මාණයක් ලෙසින් සහ ඊට පසුබිමින් කැනියොන් වේල්ලේ දර්ශනයක් දැක්වේ. නෝට්ටුවේ දකුණු පසට වන්නට ශ්‍රී ලංකා කහ කන්කොණ්ඩයා සහ නෝට්ටුවේ වම්පස පහළ දෙහි සැරියා නමැති සමනලයා දැක්වේ.




**නෝට්ටුවේ පිටුපස**

නෝට්ටුව සිරස්ව අල්ලා බැලූ විට, නාග රාක්ෂ නැටුමේ යෙදෙන ශිල්පියෙක් සහ ගුරුළු රාක්ෂ නැටුමේ යෙදෙන ශිල්පියෙක් ද ඉහළ දකුණු කෙළවරෙහි රත්න ප්‍රාසාදය මුරගල සහ දකුණු පස දිගට කල්ප වෘක්ෂ ලියවැල් මෝස්තරයක් ද දැක්වේ.

[1]https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/notes_coins/11th%20Currency%20Note%20Series%20of%20Sri%20Lanka%20-%20English-resize.pdf





**2017 දී හඳුන්වා දෙන ලද සංසරණයේ පවතින නව කාසි**

රූප සටහන - 14



### ව්‍යාජ මුදල් නෝට්ටුවලට එරෙහිව කටයුතු කිරීම

ව්‍යාජ මුදල් නෝට්ටු සැකසීම වැළැක්වීම සහ මුදල් නෝට්ටු කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් ඒකකය සමග සම්බන්ධව නිරන්තරයෙන් කටයුතු කරයි.

### ආරක්ෂක සලකුණු

දිය සලකුණ, ආරක්ෂණ නූල, විනිවිද පෙනෙන සලකුණ, ඉතා කුඩා අක්ෂර, දෘශ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් යොදා ඇති සලකුණ සහ උස් වූ මුද්‍රිත ඇතුළු වැඩිදියුණු කරන ලද ආරක්ෂණ සලකුණු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ව්‍යවහාර මුදල් නෝට්ටුවලට ඇතුළත් කර ඇත.

### නෝට්ටු සහ කාසි පිළිබඳ වගකීම

2024 දී මුදල් නෝට්ටු සඳහා ඇති ඉල්ලුමේ සැලකිය යුතු වැඩි වීමක් පැවති අතර, එය 2023 දී සංසරණයේ පැවති මුදල් රු.බි. 1,186.50ට සාපේක්ෂව 14.5%කින් රු.බි. 1,358.72ක් දක්වා වර්ධනය වී ඇත.

### සමරු මුදල් නෝට්ටු

මහ බැංකු පනත යටතේ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ඕනෑම පුද්ගලයෙකු හෝ විශේෂ සිදුවීමක් සැමරීම සඳහා මුදල් නෝට්ටු හෝ කාසි නිකුත් කිරීමට මහ බැංකුවට හැකිය. 2024 දී නව සමරු නෝට්ටු හෝ කාසි නිකුත් කර නොමැත.

### මුද්‍රණය සහ ටංකනය කිරීම

ශ්‍රී ලංකාවේ එකම මුදල් නිකුත් කරන්නා ලෙස, සුපරීක්ෂාකාරී සැලසුම, අධීක්ෂණය සහ පුරෝකථනය තුළින් ප්‍රමාණවත් මුදල් නෝට්ටු සහ කාසි සැපයුමක් සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව බැඳී සිටියි.

### ව්‍යවහාර මුදල් හුවමාරුව

මහ බැංකුව විසින් සිය ප්‍රධාන කාර්යාලයේ හානි වූ මුදල් නෝට්ටු කවුළුව හරහා සේවා පහසුකම් සලසන අතර ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවේ විශේෂ මුදල් කවුළුව හරහා ව්‍යවහාර මුදල් හුවමාරුව සඳහා ද පහසුකම් සලසයි.

### සේවා අනිසි ව්‍යවහාර මුදල් ප්‍රතිස්ථාපනය කිරීම

සංසරණයේ පවතින මුදල්වල ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිතර සේවා අනිසි මුදල් නෝට්ටු සහ කාසි මුදල් සංසරණයෙන් ඉවත් කරනු ලැබේ.

### ව්‍යවහාර මුදල් තොග කළමනාකරණය

විධිමත් සැලසුම් සහ පුරෝකථනය හරහා ස්ථාවර සැපයුමක් සහතික කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි තොග කළමනාකරණය කරනු ලබයි. සැපයුම් ප්‍රමාදයන්, ස්වාභාවික විපත් වැනි අනපේක්ෂිත සිදුවීම් හෝ උත්සව සමයක් වැනි කාලවල දී සිදු විය හැකි ඉල්ලුමේ හදිසි වැඩිවීම්වලින් ඇති වන අවදානම් අවම කිරීම සඳහා ආරක්ෂිත තොග මට්ටම් පවත්වා ගනු ලැබේ. මෙය අභියෝගාත්මක තත්ත්වයන් යටතේ වුව ද ඇති විය හැකි බාධාවන් මැඩපැවැත්වීම සහ රටේ ව්‍යවහාර මුදල් අවශ්‍යතාව සපුරාලීමට බැංකුව සතු අඛණ්ඩ හැකියාව සහතික කිරීම අරමුණු කරගත් පුළුල් හදිසි අවස්ථා සඳහා වන දෙවන පෙළ උපායමාර්ගයක කොටසකි.

[2]https://www.cbsl.gov.lk/en/notes-coins/notes-and-coins/commemorative-coins-and-notes

## ඔබ සතු මුදල් නෝට්ටු සැබෑ මුදල් නෝට්ටුදැයි තහවුරු කරගන්න

රූප සටහන - 15





- නෝට්ටු මුද්‍රිත කඩදාසියේ ස්වභාවය ස්පර්ශයෙන් හඳුනාගන්න
- පහත දක්වා ඇති ආරක්ෂණ සලකුණු එකකට වඩා වැඩි ප්‍රමාණයක් පරීක්ෂාවෙන් බලන්න.

### 1 දිය සලකුණ



එක් එක් මුදල් නෝට්ටුවේ මුහුණත දකුණු පස දක්වා ඇති පක්ෂීන්ගේ රූප අදාළ නෝට්ටුවේ දිය සලකුණ ලෙස දක්වා ඇත. තවද නෝට්ටුවේ වටිනාකම විශේෂිත දිය සලකුණක් ලෙසින් සිරස් අතට ඉලක්කම්වලින් දක්වා ඇත.

### 2 ආරක්ෂණ නූල



ආරක්ෂණ නූල නෝට්ටුවෙන් නෝට්ටුවට වෙනස් වන අතර රු. 100, රු. 50 සහ රු. 20 නෝට්ටුවල "CBSL" යන අක්ෂර සහ අදාළ නෝට්ටුවේ වටිනාකම, Rs. 100, Rs. 50 යනාදී වශයෙන් නෝට්ටුවේ සිරස් අතට ඇතුළත් කර ඇත. රු. 5000, රු. 1000 සහ රු. 500 යන නෝට්ටුවල පිළිවෙලින් මි.මී. 3, මි.මී. 2.5 හා මි.මී. 2 යන පළලින් යුතු වූ රතු සහ කොළ ලෙස වර්ණය වෙනස්වන්නා වූ "ස්ටාර්ක්‍රොම්" ආරක්ෂණ නූල සිරස්ව තැනින් තැන මතු වී පෙනෙන ලෙස යොදා ඇත. රු. 100, රු. 50 සහ රු. 20 නෝට්ටුවල යොදා ඇති නූල සම්පූර්ණයෙන් ම නෝට්ටුව තුළට ඇතුළු කර ඇති අතර, එය අඛණ්ඩ ඉරක් ලෙස දිස්වේ.

### 3 වැර ගැන්වූ කොන්



"වැර ගැන්වූ කොන්" නමැති දිය සලකුණ එක් එක් නෝට්ටුවේ කොන් හතරේ විකර්ණ ආකාරයෙන් දිවෙන්නා වූ ඉරි ලෙසින් දැක්වේ.

### 4 විනිවිද පෙනෙන සලකුණ



නෝට්ටුව ආලෝකයට යොමු කොට බැලීමේ දී, නෝට්ටුවේ මුහුණත වර්ණ දෙකකින් දක්වා ඇති වටිනාකම සඳහන් ඉලක්කම් කොටස් (සමනළ රූපය අසල) නෝට්ටුවේ පිටුපස ඇති ඒ හා සමාන ඉලක්කම් කොටස් සමග එකිනෙකට සමපාත වී සම්පූර්ණ ඉලක්කම් සේ දිස්වේ.

### 5 ඉතා කුඩා අක්ෂර



නෝට්ටුවේ සමනළ රූපයට පහළ කොටස් දෙස සමීපව බැලූ විට, ඉතා කුඩා ලෙස මුද්‍රිත "CBSL" යන අක්ෂර සහ නෝට්ටුවේ වටිනාකම ඉලක්කමින් දැකිය හැකිය.

### 6 දෘශ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් යොදා ඇති සලකුණ



නෝට්ටුවේ වම් පස සිරස් අතට රළු ලෙස මුද්‍රිත තිත් නෝට්ටුවේ වටිනාකම අනුව වැඩිවෙමින් යන ආකාරයට මුද්‍රණය කර ඇති අතර (රු. 20 නෝට්ටුවේ එක් තිතක්) ඒවා දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට නෝට්ටුවල වටිනාකම හඳුනා ගැනීමට උපකාරී වේ.

### 7 උස් වූ මුද්‍රිත



නෝට්ටුවේ ඇඟිලි තුඩු මගින් ස්පර්ශ කිරීමේ දී උස් වූ මුද්‍රිත ප්‍රදේශ හඳුනාගත හැකිය. (උදා: ශ්‍රී ලංකා මහ බැංකුව නමැති පාඨය සහිත කොටස සහ නෝට්ටුව මධ්‍යයේ පිහිටි මෝස්තර).

සටහන: ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංසරණය සඳහා නිකුත් කරන ලද අනෙකුත් මුදල් නෝට්ටු තවදුරටත් ශ්‍රී ලංකාව තුළ ඕනෑම මුදලක් ගෙවීම සඳහා නීතියෙන් වලංගු වේ.

මුදල් නෝට්ටු විකෘති කිරීම හෝ අනුකරණය කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.





### 2024 ප්‍රධාන ක්‍රියාකාරකම්

2024 දී, බැංකුව විසින් රු.බි. 493.22ක මුදල් නෝට්ටු සහ රු.බි. 0.60ක කාසි නිකුත් කරන ලද අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් රු.බි. 321.24ක මුදල් නෝට්ටු සහ රු.බි. 0.009ක කාසි තැන්පතු භාර ගන්නා ලදි. 2024 වර්ෂය තුළ, රු.බි. 95.39ක සේවා අනිසි මුදල් නෝට්ටු මිලියන 154.01ක් මුදල් සංසරණයෙන් ඉවත් කර විනාශ කරන ලදි.

මහජන ඉල්ලුම සපුරාලීම සඳහා මහ බැංකුව නව මුදල් නෝට්ටු මිලියන 275ක් ඇණවුම් කරන ලදි.

ඊට අමතරව, බැංකුව ව්‍යාජ මුදල් සම්බන්ධව අධිකරණ කටයුතු සඳහා සාක්ෂි ලෙස සහතික 137ක් නිකුත් කරන ලද අතර, ව්‍යාජ මුදල් නෝට්ටු සම්බන්ධ අධිකරණ නඩු විභාග 18ක් ද, සැක සහිත ව්‍යාජ නෝට්ටු 2,178ක් සහ ව්‍යාජ නෝට්ටු මුද්‍රිත පත්‍ර 66ක් ද අනාවරණය කළේය.

### පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා මහ බැංකුවේ පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය මගින් මහජන භාවිතය සඳහා මුදල් නෝට්ටු හොඳ තත්ත්වයේ පවතින බව සහතික කෙරේ.

දැනුම්වත් කිරීමේ වැඩසටහන් හරහා, අපිරිසිදු වීම, ඉරී යාම සහ විකෘති කිරීම වැළැක්වීමෙන් ව්‍යවහාර මුදල් නිසි ලෙස හැසිරවීම පිළිබඳව මහජනතාව දැනුම්වත් කරනු ලැබේ.

මෙම උත්සාහයන් හේතුවෙන් මුදල් නෝට්ටුවල කල්පැවැත්ම වැඩි කර ගැනීමට හැකි වී ඇති අතර, සංසරණයේ පවතින නුසුදුසු මුදල් නෝට්ටු ප්‍රමාණය අඩු කිරීම මගින් සහ සමස්ත ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම තුළින් මූල්‍ය පද්ධතියට සහ මහජනතාවට ප්‍රතිලාභ සලසා ඇත.

### ආර්ථික ඉතිහාස කෞතුකාගාරය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික ඉතිහාස කෞතුකාගාරය වැදගත් අධ්‍යාපනික මූලාශ්‍රයක් ලෙස කටයුතු කරමින් වසර 2,500කට වැඩි කාලයක් පුරා වූ ජාතියේ ආර්ථික පරිණාමය පිළිබඳ පුළුල් අවබෝධයක් ජනතාව වෙත පිරිනමයි. මෙම කෞතුකාගාරය ශ්‍රී ලංකා මූල්‍ය ඉතිහාසයේ ප්‍රධාන අංග ඉස්මතුකොට දක්වන අතර, එයට මූල්‍ය පද්ධතියේ ආරම්භය සහ විකාශය, මහ බැංකුව ස්ථාපිත කිරීම, සහ රටේ මුදල් ප්‍රතිපත්ති හැඩ ගැස්වීමේ දී මහ බැංකුවේ කාර්යභාරය ඇතුළත්ය. දශක ගණනාවක වෙළෙඳ හා වාණිජ භාවිතාවන් පිළිබඳ අවබෝධයක් ලබා දෙමින්, කෞතුකාගාරය ජාතියේ ප්‍රගතියට බලපා ඇති ආර්ථික සාධක පිළිබඳ ගැඹුරු ඇගයීමක් සිදු කරයි.

කෞතුකාගාරයේ ප්‍රධාන අවධානයක් යොමු වන්නේ විධිමත් මුදල් ඒකකයක් නොමැතිව පාරිභෝගික භාණ්ඩ වෙළෙඳාම් කරන ලද භාණ්ඩ හුවමාරු ක්‍රමයේ සිට ප්‍රමිතිගත මුදල් මෙවලම් සංවර්ධනය කිරීම දක්වා වූ හුවමාරු පද්ධතිවල ඓතිහාසික ප්‍රගතියයි. ප්‍රදර්ශන අයිතමවලට, ශ්‍රී ලංකාවේ ඉතිහාසය පුරා කාසි සහ මුදල් නෝට්ටු හඳුන්වා දීම සහ එහි විකාශය, ඒවායේ සංසරණය සහ භාවිතය ඇතුළත්ය.

මීට අමතරව, කෞතුකාගාරය තුළ සමරු කාසි සහ නෝට්ටු විශාල එකතුවක්, කාසි ටංකනය කිරීමේ සහ මුදල් නෝට්ටු නිෂ්පාදනයේ සංකීර්ණ ක්‍රියාවලීන් පිළිබඳ විස්තර සහ ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය වැළැක්වීම සඳහා නව මුදල් නෝට්ටුවලට ඇතුළත් කර ඇති වැඩි දියුණු වූ ආරක්ෂක සලකුණු ප්‍රදර්ශනය කරනු ලැබේ. මෙම සංක්ෂිප්ත එකතුව අධ්‍යාපනවේදීන්, පර්යේෂකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා ඉතාමත් වටිනා දැනුම් සංචිතයක් වේ.

කෞතුකාගාරය ප්‍රධාන ප්‍රදර්ශන කලාප තුනකට ව්‍යුහගත කර ඇත.
**1 කලාපය:** මුල් කාලීන ආර්ථික කටයුතු පිළිබඳ මූලික අවබෝධයක් ලබා දෙමින්, මුදල්, වෙළඳාම සහ වාණිජ ඉතිහාසයේ වැදගත් සංධිස්ථාන ඉස්මතු කරයි.

**2 කලාපය:** මහ බැංකුව පිහිටුවීමෙන් පසු නිකුත් කරන ලද සමරු අයිතම ඇතුළුව මුදල් නෝට්ටු සහ කාසි කාණ්ඩ සවිස්තරාත්මකව ප්‍රදර්ශනය කරයි.

**3 කලාපය:** කාසි නිෂ්පාදන ක්‍රියාවලිය, මුදල් නෝට්ටු මුද්‍රණයේ තාක්ෂණික ක්‍රම සහ නව මුදල් නෝට්ටුවලට ඇතුළත් කර ඇති උසස් ආරක්ෂණ ක්‍රියාමාර්ග පිළිබඳ ගැඹුරු ගවේෂණයක් ඉදිරිපත් කරයි. මෙවැනි ක්‍රමානුකූලව සංවිධානය කළ ප්‍රදර්ශන අයිතම හරහා, ජාතියේ මූල්‍ය පද්ධතිය සහ ප්‍රතිපත්ති අවබෝධ කර ගැනීමේ දී එහි වැදගත්කම ශක්තිමත් කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය පිළිබඳ අධ්‍යයනය කිරීමට හා සංරක්ෂණය කිරීමට කෞතුකාගාරය දායක වේ.
2024 දී, මහ බැංකුවේ ආර්ථික ඉතිහාස කෞතුකාගාරය නරඹන්නන් 9,018ක් පැමිණි අතර ඉන් 759ක් ජාත්‍යන්තර අමුත්තන් විය.

# උපායමාර්ගික සන්නිවේදනය

මහ බැංකු මෙහෙවර වන දේශීය මිල ස්ථායීතාව හා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සඳහා ගන්නා ක්‍රියාමාර්ග සාර්ථක වීම, මහ බැංකුව සතු සන්නිවේදනය කිරීමේ හැකියාව හා විශ්වාසය ගොඩනගා ගැනීමේ හැකියාව මත පදනම් වේ. එබැවින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ විවිධ කටයුතු, නියාමන කාර්යයන් සහ ප්‍රතිපත්ති තීරණ පිළිබඳ ව මහජනයා තුළ උනන්දුවක් ඇති කිරීම සඳහා මනා ව සැලසුම් කරන ලද සන්නිවේදන උපාය මාර්ගයක් පැවතීම අත්‍යාවශ්‍ය වේ.

ව්‍යවස්ථාපිත වශයෙන් ස්වාධීන, රටේ මුදල් අධිකාරිය ලෙස කටයුතු කරන ශ්‍රී ලංකා මහ බැංකුව, එක් අතකින්, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය දිනා ගැනීමට ද, අනෙක් අතින්, නිවැරදි තීරණ ගැනීමේ දී සහාය වීම සඳහා ද පැහැදිලි, සංක්ෂිප්ත සහ සඵලදායී සන්නිවේදනයකට ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය.

මෙම අවශ්‍යතාව හඳුනා ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රටේ සාමාන්‍ය පුරවැසියන්ට, ව්‍යාපාරවලට සහ අනෙකුත් සියලු ම පාර්ශ්වකරුවන්ට මහ බැංකුවේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සංකීර්ණතා සහ සියුම් බව වඩාත් හොඳින් අවබෝධ කර ගත හැකි සහ ඊට පහසුවෙන් පිවිසිය හැකි වන පරිදි, "ඉහළ විනිවිදභාවයක්, වගවීමක් සහ විශ්වසනීයත්වයක් සඳහා අභ්‍යන්තර හා බාහිර සන්නිවේදනය ශක්තිමත් කිරීම" යනුවෙන් උපායමාර්ගික ප්‍රමුඛතාවක් සැලසුම් කර ඇත.

## පණිවුඩ පැහැදිලි ව සහ සංක්ෂිප්ත ව ඉදිරිපත් කිරීම

මහ බැංකු පනතේ විධිවිධාන මත ගොඩනැගී ඇති, ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන උපායමාර්ගය, ප්‍රධාන වශයෙන් විනිවිදභාවය සහ වගවීම අපේක්ෂා කරයි. මහ බැංකු පනත මගින් පැහැදිලි සහ විවෘත සන්නිවේදන ක්‍රමයක වැදගත්කම අවධාරණය කරයි, එමෙන් ම තීරණාත්මක සාර්ව ආර්ථික ප්‍රවණතා පිළිබඳ ව මහජනතාවට සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට විශ්වාසදායී ලෙස දැනුම්වත් කිරීම අරමුණු කර ගත් අනාවරණය කිරීමේ අවශ්‍යතා මාලාවකින් ද යුක්ත වේ. මේ අතර, මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති තීරණ, ආර්ථිකය පිළිබඳ ඇගැයීම් සහ මූල්‍ය ස්ථායීතා වාර්තා නිරන්තරයෙන් නිකුත් කරනු ලබන අතර, එමගින් එහි අරමුණු සහ ක්‍රියාමාර්ග පරාසය පිළිබඳ ව අවශ්‍ය පැහැදිලිතාව ඇති කරයි.

## ග්‍රාහක පිරිස අවබෝධ කර ගැනීම

ඵලදායී සන්නිවේදනයක් සිදු කිරීමට බොහෝ විට ඉලක්කගත පාඨක පිරිස පිළිබඳ ව මනා දැනුම්වත්භාවයක් තිබිය යුතු වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ ග්‍රාහක පිරිස, එක් එක් පාර්ශ්වකරුවන්ට ආවේණික වූ තොරතුරුමය අවශ්‍යතා සහිත, කණ්ඩායමකින් සමන්විත වේ. මෙම කණ්ඩායමට ප්‍රතිපත්ති සම්පාදකයන්, මූල්‍ය ආයතන, අයෝජකයන්, ව්‍යාපාර, මාධ්‍ය සංවිධාන සහ පොදු ජනතාව ඇතුළත් වේ. මෙවැනි විවිධ ග්‍රාහක පිරිස් වෙත ගැළපෙන පරිදි සන්නිවේදනය කිරීමේ දී, අනිවාර්යයෙන් ම, අදාළත්වය සහ ප්‍රයෝජනවත් අයුරින් පිවිසිය හැකි බව පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.

### මහ බැංකුවේ ග්‍රාහක පිරිස

රූප සටහන - 16










වර්තමානයේ පැතිර පවත්නා ක්ෂණික සම්බන්ධතා සහිත වාතාවරණය තුළ, සන්නිවේදනය යනු මුළුමනින් ම ළඟා වීම පිළිබඳව යි. ප්‍රවේශය වඩාත් පහසු හා පුළුල් කිරීම සඳහා, මහ බැංකුව විසින් බහු විධ නාලිකා සන්නිවේදන ප්‍රවේශයක් අනුගමනය කරනු ලබයි. සම්ප්‍රදායික මුද්‍රිත මාධ්‍ය, රූපවාහිනී, සහ ගුවන් විදුලිය විශේෂයෙන් ම ඩිජිටල් ප්‍රවේශය සීමා සහිත වන කලාප තුළ අත්‍යවශ්‍ය සාධකයක් ව පවතින අතර, ඩිජිටල් වේදිකා යනු සන්නිවේදනයේ ඉදිරි ගමන් මග යි. ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය නාලිකා (මුහුණු පොත, x, ලින්ක්ඩ්ඉන්, යූටියුබ්, වට්ස්ඇප්, සහ ඉන්ස්ටග්‍රෑම් ඇතුළු ව) පාර්ශ්වකරුවන්ගේ උද්යෝගීමත් සහභාගීත්වයට උපකාරී වන අතර ම, නවත ම තොරතුරු එසැණින් ලබා දීම සහ අධ්‍යාපනික වැඩසටහන් ග්‍රාහක පිරිස් වෙත ලබා දීමේ දී අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්ව ඇත.

## සන්නිවේදන විධි පරාසයන්

මහ බැංකුවේ කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන නොයෙක් කණ්ඩායම්වල අවශ්‍යතා හඳුනා ගැනීමෙන් අනතුරුව විවිධ තොරතුරු මෙන් ම විවාදාත්මක තොරතුරු ද සිය අරමුණු සඳහා වඩාත් හොඳින් ගැලපෙන ආකාරයෙන් එක් එක් කණ්ඩායමට දැනුම් දීම සඳහා කළ විවිධ නිර්මාණ සන්නිවේදනය කෙරෙයි. විස්තරාත්මක ප්‍රතිපත්ති වාර්තා සහ සංඛ්‍යාලේඛනවල සිට වඩාත් පහසුවෙන් තේරුම් ගත හැකි රූප සටහන් සහිත නිර්මාණ (infographics) සහ ඩිජිටල් නිර්මාණ දක්වා එම පරාසය විහිදෙයි. මාධ්‍ය වෘත්තිකයන්ට සහ විවිධ විශ්ලේෂකයන්ට මහ බැංකු කටයුතු සමග සමීප වීමට මෙන් ම මහ බැංකුවේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට ද අවස්ථාවක් ලබා දෙනු පිණිස මාධ්‍ය සාකච්ඡා නිරතුරු ව ම පැවැත්වේ. මේ අතර, ප්‍රජා සම්බන්ධතා වැඩසටහන් සහ මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ වැඩසටහන්, වගකීම් සහගත සහ විචක්ෂණශීලී මූල්‍ය ව්‍යවහාර සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වය පිළිබඳ වඩා හොඳ ජනතා අවබෝධයක් ප්‍රවර්ධනය කරමින් ප්‍රජා සහභාගීත්වය තවදුරටත් වැඩිකර ගැනීමට උපකාරී වේ. මේ අතර, ප්‍රජා සම්බන්ධතා වැඩසටහන් සහ මූල්‍ය සාක්ෂරතා මුලපිරීම්, වගකිවයුතු සහ විචක්ෂණශීලී මූල්‍ය භාවිතයන් මෙන් ම, සාර්ව ආර්ථික ස්ථාවරත්වය පිළිබඳ වඩා හොඳ මහජන අවබෝධයක් ප්‍රවර්ධනය කරන අතර ම, ප්‍රජා සහභාගීත්වය තවදුරටත් ඉහළ නැංවීමට උපකාරී වේ

## ඇතිවන බලපෑම මැන බැලීම

කිසිදු සන්නිවේදන උපායමාර්ගයක් එහි බලපෑම පිළිබඳ විෂයමූලික ඇගයීමකින් තොර ව, සම්පූර්ණ නොවේ. සිය සන්නිවේදන මූලිකාංගවල සඵලදායීත්වය මැන බැලීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව ග්‍රාහක පිරිස සිය පණිවුඩ වෙත ළඟා වීම, සහභාගිත්ව මට්ටම්, සහ වඩාත් පුළුල් ලෙස, මහ බැංකුවේ වඩාත් සංකීර්ණ ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳ පොදු ජනතාවගේ අවබෝධය ඇගයීමට ලක් කරන බලපෑම් තක්සේරු කරයි. විශේෂයෙන් ම, මෙවැනි ඇගයීම්වලින් අවශ්‍ය පරිදි සිදු කළ යුතු උපායමාර්ගික ගැළපීම් දැනුම් දෙන අතර, ඒ අනුව මහ බැංකුවට වෙනස්වන පාර්ශ්වවල අපේක්ෂා සහ තාක්ෂණික දියුණු වීම් වෙත කඩිසර ව ප්‍රතිචාර දැක්වීමට හැකි වේ.

මූල්‍ය අස්ථාවරත්වය ඉහළ යෑමට හේතු වන, බොහෝ විට විශ්වාස කළ නොහැකි පුවත් සහිත සාවද්‍ය තොරතුරු බහුල ව දැකිය හැකි කාලපරිච්ඡේදයක් තුළ, නිවැරදි, පූර්ව ක්‍රියාකාරී සහ සියලු පාර්ශ්ව ඇතුළත් කරගත් සන්නිවේදනයක අවශ්‍යතාව අන් කවරදාටත් වඩා වැඩිය. ආර්ථිකයේ දැනට පවතින තත්ත්වය සම්බන්ධයෙන් මහජන මතය හැඩගැස්වීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය අවතක්සේරු කළ නොහැකි ය. සාම්ප්‍රදායික ක්‍රම සහ ඩිජිටල් නවෝත්පාදනයන්ගේ සම්මිශ්‍රණයක් භාවිත කරමින්, සියලුම පාර්ශ්ව අතර විශ්වාසය සහ මූල්‍ය සාක්ෂරතාව ඇති කිරීම වන සිය දිගු කාලීන අරමුණ ක්‍රියාත්මක කිරීම සඳහා, මහ බැංකුව ආර්ථික තොරතුරුවල විශ්වාසදායී සහ බලයලත් මූලාශ්‍රයක් ලෙස එය අඛණ්ඩ ව ඉටු කරනු ඇත.

### 2024 ප්‍රධාන ක්‍රියාකාරකම්

2024 වසරේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද සන්නිවේදනය මූලික කරගත් වැඩසටහන් මහ බැංකු කටයුතුවල විනිවිදභාවය වැඩිදියුණු කිරීමට උපකාරී විය. විශේෂයෙන් ම, මාධ්‍ය සබැඳියාවන් ඇති කර ගැනීමේ සංසදයක් ලෙස, දෙසැම්බර් 18 වන දින මුද්‍රිත මාධ්‍යවල මාධ්‍යවේදීන් සමග පවත්වන ලද "මහ බැංකු අධිපතිවරයා හමුවන්න" නම් වූ වැඩසටහන එහි සුවිශේෂී අවස්ථාවක් විය. නිවැරදි තොරතුරු අඛණ්ඩ ව බෙදාහැරීමට පහසුකම් සැලසීම සඳහා මුද්‍රිත මාධ්‍ය වෘත්තිකයින් සමග හවුල්කාරත්වයක් පිහිටුවීම මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ විය. මහ බැංකුවේ සන්නිවේදන ප්‍රයත්න එහි මූලික අරමුණුවලට අනුකූල බව සහතික කිරීම සඳහා සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ මහ බැංකුවේ සමස්ත සන්නිවේදන උපායමාර්ගය අධීක්ෂණය කිරීමේ කාර්යය සඳහා සන්නිවේදන සමාලෝචන කමිටුවක් පිහිටුවන ලදී. මහ බැංකුව විසින් ගනු ලබන ප්‍රතිපත්ති තීරණ මහ බැංකු කාර්ය මණ්ඩලයට පැහැදිලි කර දීමට සහ මනා අවබෝධයක් ඇති කිරීමට ද 2024 වසරේ දී අභ්‍යන්තර දැනුම බෙදා දීමේ වැඩසටහන් කිහිපයක් දියත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය මගින් වඩාත් දැනුම්වත් සාකච්ඡා සිදු කිරීමට සහ උපායමාර්ගික වැඩසටහන් සඳහා වඩාත් ශක්තිමත් අභ්‍යන්තර සහයක් ලබා දීමට අපේක්ෂා කෙරිණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණ වන මිල ස්ථායීතාව සහ එහි අනෙක් අරමුණ වන මූල්‍ය ස්ථායීතාවට අදාළ ව සිදු කෙරෙන ප්‍රවණතා සහ මූලිකත්වය පිළිබඳ ව මහ බැංකු කාර්ය මණ්ඩලයේ දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා මෙම වසර පුරා ම අභ්‍යන්තර සන්නිවේදන ප්‍රයත්න ශක්තිමත් කරන ලදි. මහ බැංකුවේ මෙම අරමුණු දෙක සහ සමස්ත සාර්ව ආර්ථික ස්ථායීතාව කෙරෙහි ඒවායෙහි කාර්යභාරය අතර අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය මෙම ප්‍රයත්න මගින් අවධාරණය කෙරිණි. මූල්‍ය සාක්ෂරතාව වැනි ප්‍රධාන මූලිකත්වයන් පිළිබඳ මනා දැනුම්වත්භාවය සමග මෙයින් ඇති කර ගනු ලබන මනා අවබෝධය මගින් වඩාත් සමීප ප්‍රවේශයක් දියුණු කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, බාහිර සන්නිවේදනය වඩාත් පැහැදිලි ව සහ සඵලදායී ව සිදු කිරීමට හැකි වේ.

වසර පුරා ම, බැංකුවේ අරමුණු සහ මෑත කාලීන ආර්ථික ප්‍රවණතා පිළිබඳ ව විවිධ පිරිස් දැනුම්වත් කිරීම අරමුණු කරගත් දැනුම්වත් කිරීමේ වැඩසටහන් ගණනාවක් ඔස්සේ මහ බැංකුව මහජනතාව කරා ළඟා වීමට සිය ප්‍රමුඛත්වය ලබා දුන්නේය. 2024 වසරේ දී දැනුම්වත් කිරීමේ වැඩසටහන් 86ක් පැවැත් වූ අතර, එම වැඩසටහන් සඳහා 5,984 දෙනෙක් සහභාගි වූහ. මාර්ගගත ව පවත්වනු ලැබූ වැඩසටහන් හතරක් සඳහා අතිරේකව, පුද්ගලයන් 400 දෙනෙකු සම්බන්ධ කර ගැනීමට හැකි විය. සාම්ප්‍රදායික සැලසුම්වලින් ඔබ්බට ගොස් අධ්‍යාපනික ජංගම වැඩසටහන් 10ක් ද සංවිධානය කෙරුණු අතර ඒ සඳහා පාසල් සිසුන් හා ගුරුවරුන් 1,200ක් පමණ සහභාගී විය.

## 2024 වසරේ දී එළි දැක් වූ නව ප්‍රකාශන




### වාර්ෂික ආර්ථික සමාලෝචනය

වාර්ෂික ආර්ථික සමාලෝචනය යනු 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 80(3) වන වගන්තියට අනුකූල ව, එක් එක් මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් පසු මාස හතරක කාල සීමාවක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වාර්ෂික ප්‍රකාශනයකි. මෙම ප්‍රකාශනය 2024 අප්‍රේල් මාසයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. එම ග්‍රන්ථයෙන් මහ බැංකුවේ ප්‍රතිපත්තිමය අරමුණු, එහි ප්‍රතිපත්ති තක්සේරු කිරීම් සහ 2023 දී මූල්‍ය පද්ධතියේ සමස්ත තත්ත්වය ගෙනහැර දක්වයි.



### මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය

ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය 2024-2028, ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය යටතේ 2024 මැයි මාසයේ දී ප්‍රකාශයට පත් කර ඇති අතර, මූල්‍ය සාක්ෂරතා මුලපිරීම්වල නියැලී සිටින සියලුම පාර්ශ්වකරුවන්ට සාක්ෂි මත පදනම් වූ මග පෙන්වීමක් ලබා දීම සහ "ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය හැසිරීම වර්ධනය කිරීම සහ ඔවුන්ගේ මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම" යන පොදු පරමාර්ථයක් කරා ඔවුන් පෙළගැස්වීම මෙම ග්‍රන්ථයේ අරමුණ විය. මෙම මාර්ගෝපදේශය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආයතනික කාර්යභාරයන් සහ වගකීම් දක්වමින් පැහැදිලි ක්‍රියාමාර්ග සැලැස්මක් ද මෙම ප්‍රකාශනයට ඇතුළත් කර තිබේ.




### මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම්

මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් වාර්තාව යනු 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 99 (2) වන වගන්තියට අනුකූල ව වාර්ෂික ව මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ප්‍රකාශනයකි. ඉන් පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද සහ විගණකාධිපතිවරයා විසින් සහතික කරන ලද, සෑම වසරකම දෙසැම්බර් 31න් අවසන් වන වසර සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශ සහ වසර තුළ මහ බැංකුවේ මෙහෙයුම් පිළිබඳ සමස්ත නිරීක්ෂණයක් ඉදිරිපත් කරයි. මෙම වාර්තාව 2024 අප්‍රේල් මාසයේ දී මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත.




### සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති රාමුව

සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති රාමුව යනු ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 63(2) වන වගන්තියට අනුකූල ව සකසන ලද ප්‍රකාශනයකි. ඉන් මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වා ගනිමින්, සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සහ එහි කාර්යභාරය සම්බන්ධව පාර්ශ්වකරුවන්ගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීමට අරමුණු කෙරේ. මෙම ග්‍රන්ථය මගින් සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිවල අරමුණු, පද්ධතිමය අවදානම් ආවේක්ෂණය, ප්‍රධාන ප්‍රතිපත්ති මෙවලම්, අනෙකුත් මහ බැංකු ප්‍රතිපත්ති සමග සිදු කෙරෙන අන්තර් කටයුතු සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වන ආයතනික රාමුව දක්වා ඇත. මෙහි නවතම පිටපත විද්‍යුත් ස්වරූපයෙන් ලබා ගත හැකි ය.




### වෙළඳපොළ මෙහෙයුම් වාර්තාව

පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූල ව මහ බැංකුවේ මුදල් මෙහෙයුම් පිළිබඳ ව පාර්ශ්වකරුවන්ගේ දැනුම්වත්භාවය වැඩි කිරීම අරමුණු කරගනිමින්, වෙළඳපොළ මෙහෙයුම් වාර්තාව අර්ධ වාර්ෂික ව ප්‍රකාශයට පත් කෙරේ. මෙම වාර්තාව මගින් පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාවන් සහ අපේක්ෂාවන් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සමඟ පෙළගැස්වීමට අපේක්ෂා කෙරේ. වෙළඳපොළ මෙහෙයුම් වාර්තාව විද්‍යුත් මාධ්‍යයෙන් භාෂා තුනෙන් ම ලබා ගත හැකි ය.





## ප්‍රකාශන සහ තොරතුරු බෙදාහැරීම 2024

### ප්‍රකාශනය

#### ආර්ථික සහ මූල්‍ය

- මූල්‍ය ප්‍රතිපත්ති වාර්තාව - 2024 පෙබරවාරි, 2024 අගෝස්තු
- වාර්ෂික ආර්ථික සමාලෝචනය 2023
- මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් 2023
- මූල්‍ය ස්ථායිතා සමාලෝචනය 2024
- ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය (2024-2028)
- වෙළෙඳපොල මෙහෙයුම් වාර්තාව - 2024 ජූලි

#### වාර සටහන්

- සටහන
- නිව්ස් සර්වේ
- වෙප්පහම්

#### වෙනත් ප්‍රකාශන

- මාණ්ඩලික පත්‍රිකා
- සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තාව 2023
- මූල්‍ය බුද්ධි ඒකකයේ වාර්ෂික වාර්තාව 2023
- ජාතික ගිණුම් ආශ්‍රිත මූලික සංකල්ප
- ශ්‍රී ලංකා ව්‍යවහාර මුදලේ 70 වසරක ගමන් මඟ
- இலங்கை நாணய வெளியீட்டின 70 ஆண்டுகாலப் பயணம

### දත්ත සහ තොරතුරු බෙදාහැරීම

#### ආර්ථික දර්ශක හා විවරණිකා

- සාර්ව ආර්ථික කටයුතු පිළිබඳ ප්‍රස්ථාර එකතුව
- ආර්ථික දත්ත එකතුව
- දෛනික විදේශ විනිමය අනුපාත
- මූල්‍ය සාධනීය දර්ශක
- ගෙවීම් විවරණිකාව
- විදේශීය අංශ විවරණිකාව
- ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන
- ආර්ථික දත්ත පිළිබඳ මාසික විවරණිකාව
- සේවක ප්‍රේෂණ හා ශ්‍රම සංක්‍රමණය පිළිබඳ විවරණිකාව
- කෘෂිකර්ම දත්ත විවරණිකාව
- දෛනික, සතිපතා සහ මාසික ආර්ථික දර්ශක
- ජාතික ගිණුම් ඇස්තමේන්තු
- විශේෂ දත්ත ප්‍රචලිත සම්මතය (SDDS) පිළිබඳ ජාතික සාරාංශ දත්ත
- දෛනික මිල වාර්තාව (ප්‍රධාන වෙළඳපොළ තුළ තෝරාගත් මූලික පාරිභෝගික අයිතම)
- රජයේ සුරැකුම්පත් පිළිබඳ දත්ත

# ජාත්‍යන්තර කටයුතු

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය පුරාම, ශ්‍රී ලංකා මහ බැංකුව ලෝකයේ අනෙකුත් රටවල් සමග මූල්‍ය ගනුදෙනු කිරීමේ දී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර ඇත. ඒ අනුව මහ බැංකුව එහි විදේශීය පාර්ශ්වකරුවන් සමග මෙතෙක් පැවති සම්බන්ධතාවන් තවදුරටත් පවත්වාගෙන යාමටත් ආර්ථික වශයෙන් වැදගත් වන පාර්ශ්ව සමග නව සම්බන්ධතා ගොඩනගා ගැනීමටත් කටයුතු කරයි.

2024 වසර තුළ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) වැනි බහුපාර්ශ්වික ආයතන, විදේශීය මහ බැංකු, විදේශීය වාණිජ බැංකු, විවිධ ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන සහ ජාත්‍යන්තර සේවා සපයන්නන් සමග සමීපව කටයුතු කරමින්, ආර්ථික වශයෙන් වැදගත් වන 50කට අධික දූත මණ්ඩල සාකච්ඡා හා අනෙකුත් සාකච්ඡා සඳහා මහ බැංකුව සම්බන්ධ වී ඇත. තවද දැනුම හුවමාරු කිරීම් වැඩසටහන් හා සහයෝගිතා වැඩසටහන් හරහා ජාත්‍යන්තරව වෘත්තීය සබඳතා සවිමත් කර ගැනීමට ද මහ බැංකුවට හැකි විය.

## බහුපාර්ශ්වික නියෝජිත ආයතන හා සම්බන්ධවීම්

ආර්ථික අවපාතයෙන් පසුව මහ බැංකුව ගත් ක්‍රියාමාර්ග අතර විස්තීරණ ණය පහසුකම ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා සම්බන්ධ වීම ප්‍රමුඛතම කාර්යයකි.

මූල්‍ය පද්ධති ස්ථාවරත්වය හා ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ ආසියානු සංවර්ධන බැංකුව හා සම්බන්ධ වීමටත් මහ බැංකුව කටයුතු කරන ලදි. මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීම සඳහා 2024 මැයි මස මහ බැංකුව එළි දැක් වූ මාර්ගෝපදේශය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ලබාගත් තාක්ෂණික හා මූල්‍ය සහයෝගීතාව මත දියත් කිරීමට හැකිවිය.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමයේ මූල්‍ය හා ආයතනික රාමුව සවිමත් කිරීමට ලෝක බැංකු මූල්‍යාධාර මත දියත් වූ මූල්‍ය අංශය සවිමත් කිරීමේ ව්‍යාපෘතිය 2024 වසරේ දී සිදු කළ තවත් වැදගත් කාර්යයකි.

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විකල්ප අධ්‍යක්ෂක

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර ආර්ථික කටයුතු පිළිබඳ මහ බැංකු නිලධාරින්ගේ පුළුල් විශේෂඥතාව විදහා දක්වමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විකල්ප විධායක අධ්‍යක්ෂවරයා ලෙස මහ බැංකු නිලධාරියෙක් නොකඩවා සේවය කරයි.

මහ බැංකු ක්ෂේත්‍රයේ ඇති සංකීර්ණතා පිළිබඳ මනා අවබෝධය සහ ඵලදායි නායකත්වය මැනවින් ප්‍රකට කළ මහ බැංකු නිලධාරින් ගෝලීය තලයේ දී ශ්‍රී ලංකාව, ඉන්දියාව, බංගලාදේශය සහ භූතානය ඇතුළත් කලාපයේ අවශ්‍යතා නියෝජනය කිරීමට වඩාත් හොඳින් සන්නද්ධව සිටී.

මෙම පත් කිරීම් තුළින් ගෝලීය ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡාවල දී සිය වටිනා තීක්ෂණ බුද්ධිය සහ ඉදිරි දැක්ම භාවිතා කිරීමට මහ බැංකු නිලධාරින් සතු හැකියාව පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විශ්වාසය මැනවින් පිළිබිඹු වේ.

## දැනුම් හුවමාරුකිරීම් හා කුසලතා වර්ධන වැඩසටහන්

ශ්‍රී ලංකා මහ බැංකුවේ තාක්ෂණික දැනුම හා විශේෂඥතාව වැඩිදියුණු කිරීමේ උත්සාහය යටතේ 2024 වසරේදී ද මහ බැංකුව අංශ ගණනාවකින් ජාත්‍යන්තරය හා සම්බන්ධ විය. ඒ අනුව ජාත්‍යන්තර තැන්පතු රක්ෂණකරුවන්ගේ සංගමය (IADI) සහ අග්නිදිග ආසියානු මධ්‍යම බැංකු (SEACEN) පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය විසින් පවත්වන ලද තැන්පතු රක්ෂණ පද්ධති සඳහා නැගී එන අභියෝග පිළිබඳ ජාත්‍යන්තර සමුළුව වැනි සංසදවල දී මහ බැංකු නිලධාරින් ගෝලීය කතිකාවත් සඳහා ද දායක විය.

ජර්මානු මහ බැංකුව (Deutsche Bundesbank) විසින් පවත්වන ලද දැනුම බෙදා ගැනීමේ සැසිවලට ද IMF හි දකුණු ආසියානු කලාපීය පුහුණු සහ තාක්ෂණික සහාය මධ්‍යස්ථානය (SARTTAC) සමඟ සහයෝගයෙන් නවක මහ බැංකු නිලධාරින් සඳහා සකස් කරන ලද වැඩසටහනකට ද ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරින් සහභාගී විය. මධ්‍යගත විශාල දත්ත සැකසුම් සහ ඒකාබද්ධ කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා කොරියානු බැංකුව සමඟ 2024 වසරේ දී ඇති කර ගත් දැනුම හවුල්කාරිත්ව වැඩසටහන තවත් කැපී පෙනෙන සිදුවීමක් විය. මීට අමතරව ශ්‍රී ලංකා තිරසාර මූල්‍ය මාර්ග සිතියම 2.0 සහ හරිත මූල්‍ය වර්ගීකරණය ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව (IFC) සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව සහයෝගීත්වයෙන් කටයුතු කරන ලදි.

විනිමය අනුපාත කළමනාකරණය, සංචිත කළමනාකරණය, විනිමය අනුපාත පාලනය සහ මුදල් කළමනාකරණය පිළිබඳ දැනුම හුවමාරු කරවමින් මාලදිවයිනේ මුදල් අධිකාරිය (MMA), ශ්‍රී ලංකා මහ බැංකුවේ අධ්‍යයන චාරිකාවක යෙදිණි. 2024 අප්‍රේල් මාසයේ දී කොළඹ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සත්කාරකත්වය දරන ලද ආසියා මූල්‍ය ස්ථාවරත්ව මණ්ඩලයේ (FSB) කලාපීය උපදේශක කණ්ඩායමේ (RCG) සම සභාපතිත්වය ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයා විසින් දරන ලදී. 2024 වසර ඉතා සාර්ථකව අවසන් කරමින්, පර්යේෂණ ඉදිරියට ගෙන යාමට සහ ගෝලීය සහයෝගීතාව පෝෂණය කිරීමට ඇති කැපවීම ඉස්මතු කරමින්, දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 13 වන වාර්ෂික ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව පවත්වන ලදි.

## ජාත්‍යන්තර මූල්‍ය පද්ධති හා සම්බන්ධ වීම

ජාත්‍යන්තර මූල්‍ය පද්ධති හා සම්බන්ධ වීම ශ්‍රී ලංකා මහ බැංකුවට ඉතා වැදගත් වේ. ඒ අනුව 2024 වසරේ දී මූල්‍ය සාක්ෂරතාව සඳහා වූ ජාත්‍යන්තර සහයෝගීතාවන් හා තිරසාර මූල්‍ය සඳහා ජාත්‍යන්තර මෙහෙයුම් කමිටුව හා සම්බන්ධ වෙමින් ජාත්‍යන්තරව බලපාන මූල්‍ය අභියෝගයන් හා තිරසාර මූල්‍යනයට අදාළ සැලසුම් සඳහා මහ බැංකුව සිය දායකත්වය ලබා දෙන ලදි.

## ණය ශ්‍රේණිගත කිරීම්

ශ්‍රී ලංකාවේ මූල්‍ය විශ්වාසනීයත්වය ඇති කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව ෆිච්, මූඩීස් සහ ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් (එස් ඇන්ඩ් පී) වැනි ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන සමඟ කටයුතු කරන ලදි.





## ප්‍රධාන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ සංසද සඳහා මහ බැංකු අධිපතිතුමාගේ සහභාගීත්වය

2024 දී මහ බැංකු අධිපතිතුමා ඉහළ මට්ටමේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ සංසද කිහිපයකට සහභාගී වූ අතර, මුදල් ප්‍රතිපත්තිය, මූල්‍ය ස්ථාවරත්වය සහ මහ බැංකුකරණය පිළිබඳ ගෝලීය සාකච්ඡාවලට ද දායක විය.

- **59 වන SEACEN මහ බැංකු අධිපතිවරුන්ගේ සමුළුව සහ 43 වන SEACEN පාලක මණ්ඩල රැස්වීම**

  2024 පෙබරවාරි 15 සිට 16 දක්වා ඉන්දියාවේ මුම්බායි නුවර පැවති 59 SEACEN මහ බැංකු අධිපතිවරුන්ගේ සමුළුවට සහ 43 වන SEACEN මහ බැංකු අධිපතිවරුන්ගේ මණ්ඩල රැස්වීමට ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා සහභාගී විය. මෙම අවස්ථාවට SEACEN සාමාජික මහ බැංකු සහ මුදල් අධිකාරීන් 19ක අධිපතිවරුන්, කළමනාකාර අධ්‍යක්ෂවරුන් සහ නියෝජිතයින් එක් රැස් විය. මණ්ඩල සාමාජිකයෙකු ලෙස, මහ බැංකු අධිපතිතුමා, මෑත ඉතිහාසයේ දී ශ්‍රී ලංකාවේ උද්ධමනය සැලකිය යුතු ලෙස ඉහළ යාම සහ ඵලදායී ප්‍රතිපත්තිමය පියවරයන් හරහා ශීඝ්‍ර උද්ධමනය අඩු කරමින් රට ලැබූ සාර්ථකත්වය සවිස්තරාත්මකව පැහැදිලි කරන ලදි. ඊට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව එහි සභාපති ලෙස 46 වන සාර්ක් මහා බැංකු අධිපතිවරුන්ගේ රැස්වීමට සත්කාරකත්වය ලබා දෙන ලදි.

- **නවීන මහ බැංකුකරණයෙහි අභියෝග සහ අපේක්ෂාවන් පිළිබඳ ඉහළ මට්ටමේ ජාත්‍යන්තර සමුළුව**

  2024 ජූලි 9-10 දිනවල මොන්ගෝලියානු මහ බැංකුව විසින් සංවිධානය කරන ලද නවීන මහ බැංකුකරණය පිළිබඳ ඉහළ මට්ටමේ ජාත්‍යන්තර සමුළුවට මහ බැංකු අධිපතිතුමා සහභාගී විය. මෙම රැස්වීම අතරතුර "මූල්‍ය ස්ථායීතාව: මූල්‍ය අංශයේ රෙගුලාසි - ශේෂ පත්‍ර ප්‍රවේශයක්" යන මැයෙන් පැවති මණ්ඩල සාකච්ඡාවක දී  අධිපතිතුමා සිය අදහස්  ඉදිරිපත් කරන ලදි. එමෙන්ම මෙම සංචාරය අතරතුර බ්ලූම්බර්ග් රූපවාහිනිය සමඟ පැවති සම්මුඛ සාකච්ඡාවක් තුළින්  මූල්‍ය ස්ථායීතාව පිළිබඳ ගෝලීය සංවාදයට ද දායක විය.

- **ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)/ලෝක බැංකු වාර්ෂික රැස්වීම**

  2024 අප්‍රේල් සහ ඔක්තෝබර් මාසවල දී, මහ බැංකු අධිපතිවරයා වොෂිංටන්හි IMF/ලෝක බැංකු වාර්ෂික රැස්වීම්වලට සහභාගී විය. ඔක්තෝබර් මාසයේ දී, මහ බැංකු අධිපතිවරයා "ස්වෛරීත්ව ණය සහ එහි බලපෑම: නව ලෝකයක ගෝලීය ආර්ථිකය" යන මාතෘකාව යටතේ පැවති Reinventing Bretton Woods කමිටුවේ (RBWC) මණ්ඩල සාකච්ඡාවකට සහභාගී විය.

- **ගෝලීය දකුණු කලාපයේ මහ බැංකුවල ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සම්මන්ත්‍රණය**

  2024 නොවැම්බර් 22 දින, මහ බැංකු අධිපතිවරයා ඉන්දියානු සංචිත බැංකුව (RBI) විසින් සංවිධානය කළ ගෝලීය දකුණු කලාපයේ මහ බැංකුවල ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සමුළුවට සහභාගී විය. මෙම සමුළුව අතරතුර මහ බැංකු අධිපතිවරයා "නව ගෝලීය මූල්‍ය ක්‍රමය සඳහා සංචිත කළමනාකරණය" පිළිබඳ විශේෂ දේශනයක් පැවැත් වූ අතර, ගෝලීය මූල්‍ය ස්ථායීතාව සහතික කිරීමේ දී මහ බැංකු පරිණාමය වන කාර්යභාරය පිළිබඳව ද විස්තර කළේය.

- **60 වන SEACEN මහ බැංකු අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණය සහ 44 වන SEACEN මහ බැංකු අධිපතිවරුන්ගේ මණ්ඩල රැස්වීම**

  මහ බැංකු අධිපතිවරයා, 2024 වර්ෂායේ දෙසැම්බර් මස  6-7 දිනවල දී, කොරියාවේ සෝල් නුවර පැවැති 60 වන SEACEN මහ බැංකු අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණයට සහ 44 වන SEACEN මහ බැංකු අධිපතිවරුන්ගේ මණ්ඩල රැස්වීමට සහභාගී විය. මෙම සම්මන්ත්‍රණයේ දී "2025 දී ගෝලීය ආර්ථිකය සහ මූල්‍ය වෙළඳපොළවල අපේක්ෂා" සහ "ආසියානු ආර්ථිකයන් සඳහා භූ ආර්ථික විච්ඡේදනයේ ප්‍රතිපත්ති ආර්ථික බලපෑම්" යනුවෙන් ප්‍රධාන සැසි දෙකක් පැවතිණි. මහ බැංකු අධිපතිවරයා පළමු සැසියේ මණ්ඩල සාකච්ඡාවකට සහභාගී වූ අතර සහ දෙවන සැසියේ මෙහෙයවන්නා ලෙස කටයුතු කරමින්, ගෝලීය ආර්ථිකයේ අනාගතය සහ ආසියානු ආර්ථිකයන්ට මුහුණ දීමට සදුවන අභියෝග පිළිබඳ තීරණාත්මක සාකච්ඡාවන්ට දායක විය.

- **"A" ශ්‍රේණියේ මහ බැංකු අධිපති සම්මානයට පාත්‍ර වීම**

  ශ්‍රී ලංකාවේ ආර්ථික අභියෝගවලට මුහුණ දීමේ දී අධිපතිවරයා දැක් වූ කැපී පෙනෙන නායකත්වය අගයමින් 2024 දී ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයා A ශ්‍රේණියේ මහ බැංකු අධිපතිවරයකු ලෙස සම්මානයට පාත්‍ර විය.

  උද්ධමනය පාලනය, ආර්ථික වර්ධනය, මූල්‍ය ස්ථාවරත්වය ඇති කිරීම සහ පොලී අනුපාතික කළමනාකරණය කිරීමේ දී දැක් වූ සාර්ථකත්වය මත මෙම සම්මානය පිරිනමන ලදි.

# වෙනත් පවරන ලද වගකීම්

## නියෝජිත කාර්යයන්

### විදේශ විනිමය ගනුදෙනු නියාමනය සහ ප්‍රවර්ධනය

ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ නියෝජිතයා වශයෙන්, රට තුළ විදේශ විනිමය ගනුදෙනු නියාමනය සහ ප්‍රවර්ධනය වෙනුවෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනත බලාත්මක කිරීමේ වගකීම දරනු ලබයි.

මෙම බලය යටතේ මහ බැංකුව පහත කාර්යයන් ඉටු කරයි

- පවතින ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම සහ විදේශ විනිමය වෙළෙඳපොළ වර්ධනවලට අනුකූලව නව ප්‍රතිපත්තිවල අවශ්‍යතාව තීරණය කිරීම.
- විදේශ විනිමය පනත යටතේ රෙගුලාසි සහ නියෝග නිකුත් කිරීම සඳහා අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- බලයලත් වෙළෙඳුන්ට විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධ විධාන නිකුත් කිරීම.
- බලයලත් මුදල් හුවමාරු කරන්නන්ට සහ අනෙකුත් ආයතනවලට විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධ අවසර ලබා දීම.
- පොදු අවසරය යටතේ ආවරණය නොවන විදේශ විනිමය ගනුදෙනු සඳහා විශේෂ අනුමැතීන් ලබා දීම.
- විදේශ විනිමය පනතට අනුකූල වීම අධීක්ෂණය කිරීම සහ උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කිරීම.
- මහ බැංකු පනත යටතේ නිකුත් කරන ලද රීතිවලට අනුකූලව ශ්‍රී ලංකාවට අපනයන ඉපැයීම් නැවත ගෙන්වා ගැනීම සහ ශේෂය (එනම්, අවසර ලබා දී ඇති ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව ඉතිරි වන අපනයන ඉපැයීම්) ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම නියාමනය කිරීම.

#### අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ පියවර

ශ්‍රී ලංකා මහ බැංකුව අනුකූලතාව සහතික කිරීමේ අරමුණින් බලයලත් සහ පරිසීමිත වෙළෙඳුන් සක්‍රීයව අධීක්ෂණය කරන ලද අතර අපනයන ඉපැයීම් ආපසු ගෙන්වා ගැනීමේ රීතියට අනුකූලතා වන බව ද අධීක්ෂණය කරන ලදි.

ඒ අනුව විමර්ශන 29ක් සහ ස්ථානීය පරීක්ෂණ 23ක් සිදු කරන ලදි. තවද අනුකූල නොවීම් හේතුවෙන් අපනයනකරුවන් හට අවවාද කිරීමේ ලිපි 101ක් සහ දැන්වීම් 19ක් නිකුත් කරන ලද අතර රු.මි. 3.5ක දඩ මුදල් ද නියම කරන ලදී. තැන්පතු ඉලක්ක සපුරාලීමට අපොහොසත් වූ පරිසීමිත වෙළෙඳුන් වෙත අවවාද කිරීමේ ලිපි 41ක් යවන ලදි.

**අපනයන මුදල් නැවත ගෙන්වා ගැනීම සහ පරිවර්තනය: 2023 සහ 2024**

ප්‍රස්ථාර සටහන - 05




### නම්කළ විදේශීය විනිමය

1. ඔස්ට්‍රේලියානු ඩොලර් (AUD)
2. කැනේඩියානු ඩොලර් (CAD)
3. චීන රෙන්මින්බි (CNY)
4. ඩෙන්මාර්ක ක්‍රෝනර් (DKK)
5. යුරෝ (EUR)
6. හොංකොං ඩොලර් (HKD)
7. ඉන්දියානු රුපියල් (INR)
8. ජපන් යෙන් (JPY)
9. නවසීලන්ත ඩොලර් (NZD)
10. නෝර්වීජියානු ක්‍රෝනර් (NOK)
11. ස්ටර්ලින් පවුම් (GBP)
12. සිංගප්පූරු ඩොලර් (SGD)
13. ස්වීඩන් ක්‍රෝනර් (SEK)
14. ස්විස් ෆ්‍රෑන්ක් (CHF)
15. තායි බාට් (THB)
16. එක්සත් ජනපද ඩොලර් (USD)







### 2024 ප්‍රධාන කාර්යයන්

2024 වර්ෂය තුළ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය පනත සහ මහ බැංකු පනත යටතේ පහත සඳහන් ප්‍රධාන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී.

1. විදේශයන්හි සිදු කරන ලද ඇතැම් ප්‍රාග්ධන ගනුදෙනු සඳහා පනවා තිබූ අවහිරතා සහ සීමාවන් ලිහිල් කරමින්, විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නියෝග නිකුත් කිරීම.
2. සුරැකුම්පත් ණයට ගැනීමේ සහ ණයට දීමේ යාන්ත්‍රණය හරහා නියාමනය කරන ලද ඉදිරි විකුණුම් සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් කොළඹ කොටස් වෙළෙඳ පොළේ ලයිස්තුගත කර ඇති සුරැකුම්පත් අත්පත් කර ගැනීමට, විකිණීමට හෝ ඇපයට තැබීමට අනේවාසිකයන්ට අවසර ලබා දෙමින් අදාළ රෙගුලාසි සහ විධාන නිකුත් කිරීම.
3. මහ බැංකුව විසින් ආයෝජකයින්ට ප්‍රමාණවත් විදේශ විනිමය ශේෂ හෝ මුදල් ප්‍රවාහ නොමැති අවස්ථාවල දී ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය තුළින් ගෙවීම් සිදු කිරීම මත පනවා තිබූ සීමා ඉවත් කරමින් පහත ගනුදෙනු සඳහා විදේශ විනිමය පනත යටතේ රෙගුලාසි සහ විධාන කරමින් පහසුකම් සැපයීම:
   - විදේශ මුදලින් නම් කර ඇති ලයිස්තුගත සුරැකුම්පත් හෝ කොටස්වලින් ලැබෙන ආදායම හෝ කල් පිරීම් මුදල් අනේවාසිකයන් වෙත ගෙවීම.
   - ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හෝ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සිදු කිරීමේ අරමුණින් විදේශයන්ගෙන් ලබා ගත් ණය ආපසු ගෙවීම.
   - නේවාසික සමාගම් විසින්, අනේවාසිකයන්ගෙන් වසර තුනකට අඩු කාලයක් සඳහා ලබා ගත් ණය ගෙවීම.
4. අපනයනකරුවන්ගේ අපනයන ඉපැයීම් ශ්‍රී ලංකා රුපියල් බවට අනිවාර්යයෙන් පරිවර්තනය කිරීමට ලබා දී ඇති කාල සීමාව මාසයක සිට මාස තුනක් දක්වා දීර්ඝ කරමින්, මහ බැංකු පනත යටතේ 2024 අංක 01 දරන අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම සම්බන්ධ රීති නිකුත් කරන ලදි. 2024 වසරේ දී ශ්‍රී ලංකාවට ගෙන්වා ගන්නා ලද මුළු අපනයන ආදායම එ.ජ.ඩො.මි. 16,008 වූ අතර එයින් එ.ජ.ඩො.මි. 4,325ක් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන ලදී. එය 2023 වසරට සාපේක්ෂව පිළිවෙලින් 6.7% සහ 7.9% වූ වර්ධනයක් පිළිබිඹු කරයි.
5. නියාමන අනුකූලතාව සහ අධීක්ෂණය ශක්තිමත් කිරීමට මහ බැංකුව බලපත්‍ර 111ක් ලබා දී ඇති අතර කරුණු පැහැදිලි කිරීම් 491ක් හා නිෂ්කාශන 999ක් නිකුත් කර ඇත.
6. නව බලපත්‍ර දෙකක් ද ඇතුළුව මුදල් හුවමාරු කරන්නන් 57ක් (ශාඛා ඇතුළුව), බලපත්‍රලාභී මූල්‍ය සමාගම් 06ක් සහ හෝටල් 15ක් සඳහා බලපත්‍ර නිකුත් කරන ලදී. මෙම ආයතන විසින් හසුරුවන ලද මුළු තැන්පතු ප්‍රමාණය එ.ජ.ඩො.මි. 192කි.

## සේවක අර්ථසාධක අරමුදල

ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදල වන, සේවක අර්ථසාධක අරමුදල පුද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින්ට විශ්‍රාම ප්‍රතිලාභ ලබා දීමේ පරමාර්ථය ඇතිව 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ස්ථාපිත කරන ලදි. එම පනතේ විධිවිධානවලට අනුව අරමුදලේ පොදු පරිපාලනය කම්කරු කොමසාරිස් වෙත පවරා ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අරමුදලේ භාරකරු ලෙස ඊට අදාළ කළමනාකරණ කටයුතු පවරා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පනත යටතේ පවරන ලද බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. එම කාර්යයන් වනුයේ: පනත යටතේ ගෙවන ලද සියලුම දායක මුදල්, අධිභාර සහ ගාස්තු මෙන්ම අරමුදල් ආයෝජනවලින් ලැබෙන ආදායම් ලබා ගැනීම, සාමාජිකයන් සඳහා කේවල ගිණුම් පවත්වාගෙන යාම, කම්කරු කොමසාරිස් විසින් සහතික කරන ලද අයට ප්‍රතිලාභ ගෙවීම, අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම සහ අරමුදලට අදාළ මූල්‍ය තොරතුරු පවත්වාගෙන යාම, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම් සහ, එම ප්‍රකාශන කම්කරු අමාත්‍යවරයා සහ විගණකාධිපතිවරයා යන දෙදෙනාටම සමාලෝචනය සඳහා ඉදිරිපත් කිරීම යනාදියයි.

### අරමුදලේ පොදු ගිණුම් සහ සාමාජික ගිණුම් පවත්වාගෙන යාම

2024 අවසානය වන විට, අරමුදලේ වටිනාකම පසුගිය වසරට සාපේක්ෂව 12.6% ක වර්ධනයක් වාර්තා කරමින් රු. ට්‍රි. 4.4 ඉක්මවා ඇත.

සක්‍රීයව දායක මුදල් ලැබෙන ගිණුම් මිලියන 2.7 සමඟ මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව ආසන්න වශයෙන් මිලියන 21 ක් විය.

#### දායක මුදල් ලැබීම් සහ ප්‍රතිලාභ ගෙවීම්

2024 දී, සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ලැබීම් රු. බි. 234.4 වූ අතර එය 2023 දී පැවති රු. බි. 210.6ට සාපේක්ෂව 11.3% වැඩිවීමකි. සාමාජිකයින්ට සහ ඔවුන්ගේ නීත්‍යානුකූල උරුමකරුවන්ට ගෙවන ලද ප්‍රතිලාභ ප්‍රමාණය රු. බි. 188.1ක් වූ අතර, එය 2023 දී ගෙවන ලද රු. බි. 215.9ට සාපේක්ෂව 12.9%ක අඩුවීමකි.

**දායක මුදල් ලැබීම් සහ ප්‍රතිලාභ ගෙවීම්** ප්‍රස්ථාර සටහන - 06




#### සාමාජික ශේෂ මත පොලී ගෙවීම

සේවක අර්ථසාධක අරමුදල් පනතේ 14(1) වගන්තියට අනුව, බෙදා හැරීම සඳහා ඇති ලාභ මත පදනම්ව, වසර අවසාන සාමාජික ගිණුම් ශේෂයන් සඳහා සාධාරණ පොලී අනුපාතයක් සෑම වසරකම ගණනය කරනු ලැබේ. 2023 වසර සඳහා, සේවක අර්ථසාධක අරමුදල 13%ක පොලී අනුපාතයක් ගෙවූ අතර, 2024 සඳහා, මුදල් අමාත්‍යවරයාගේ සහ කම්කරු අමාත්‍යවරයාගේ එකඟතාවය ලැබීමට යටත්ව පාලක මණ්ඩලය විසින් 11%ක පොලී අනුපාතයක් අනුමත කර ඇත.

#### සාමාජික ගිණුම් ප්‍රකාශ

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදල් පනතේ 5(1)(ඒ) සහ 5(අ) වගන්ති පරිදි, සක්‍රියව දායක මුදල් එවන සාමාජිකයින් වෙත ගිණුම් ප්‍රකාශ අර්ධ වාර්ෂිකව නිකුත් කරයි. 2023 වර්ෂයේ දෙසැම්බර් මස අවසානයට පැවති සාමාජික ගිණුම්වල ශේෂය දැක්වෙන දෙවන අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශ මිලියන 2.5 ක් සහ 2024 ප්‍රථම අර්ධ වර්ෂයට අදාළව එම වර්ෂයේ ජූනි මස අවසානය දක්වා සාමාජික ගිණුම් ශේෂ දැක්වෙන ප්‍රථම අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශ මිලියන 2.1 ක් 2024 වර්ෂය තුළ දී නිකුත් කරන ලදි.

### ආයෝජන කටයුතු

ස්ථාපිත ආයතනික පාලන ව්‍යුහයට අනුකූලව සාමාජිකයින් වෙත අවදානම මත ගලපන ලද සාධාරණ ප්‍රතිලාභයක් ලබා දීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් 2024 වසරේ දී සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර සුරැකුම්පත්වල ආයෝජනයට වැඩි වශයෙන් යොමු විය. ආයෝජන කළඹෙහි අවදානම තුලනය කිරීම සඳහා වඩාත් සුපරික්ෂාකාරී ප්‍රවේශයක් අනුගමනය කරමින් සමාගම් කොටස්වල ද ආයෝජනය කරන ලදි. ඒ අනුව, 2024 දී අරමුදලේ මුළු ආයෝජන කළඹ රජයේ සුරැකුම්පත්වල 94.5%ක්, සමාගමේ කොටස්වල 4.4%ක්, සාංගමික ණයකරවල 0.3%ක් සහ ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම්වල 0.8%ත් සමඟ රු. බි. 4,393.8ක් විය.

**ආයෝජන කළඹ** ප්‍රස්ථාර සටහන - 07




### වාර්ෂික මූල්‍ය ප්‍රකාශ

සේවක අර්ථසාධක අරමුදලේ 2023 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර, සේවක අර්ථසාධක අරමුදලේ වෙබ් අඩවියේ[1] ප්‍රකාශයට පත් කරන ලදි. 2024 සඳහා වන මූල්‍ය ප්‍රකාශ ව්‍යවස්ථාපිත කාලසීමාව තුළ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදි.

**අරමුදලට අදාළව 2023 හා 2024 වසර සඳහා ප්‍රධාන සංඛ්‍යා ලේඛන** (රු. බිලියන)

| අයිතමය | 2023 | 2024 [අ] | වෙනස % |
|---|---|---|---|
| අරමුදලේ මුළු වටිනාකම | 3,886.7 | 4,375.7 | 12.6 |
| සාමාජිකයින් වෙත වූ මුළු වගකීම් | 3,817.9 | 4,289.5 | 12.4 |
| මුළු දායක මුදල් ලැබීම් | 210.6 | 234.4 | 11.3 |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් | 215.9 | 188.1 | (12.9) |

[අ] තාවකාලික

### සාමාජිකයින්ට සහ වෙනත් පාර්ශ්වකරුවන්ට ලබා දුන් සේවා

2024 දී සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සිය සාමාජිකයින්ගේ සහ වෙනත් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා වෘත්තීමයභාවයේ ඉහළම ප්‍රමිතීන් සපුරාලමින් සිය සේවා කාර්යක්ෂමව සහ ඵලදායීව ලබා දීමට කැපවිය. සේවක අර්ථසාධක අරමුදල මංගත ගෙවීම් ක්‍රමවේදයෙහි සැලකිය යුතු වර්ධනයක් සනිටුහන් කරමින් මේ වන විට සේවායෝජකයින් 11,800ක් ලියාපදිංචි වී ඇති අතර, එය පෙර වසරට සාපේක්ෂව 275%ක වැඩිවීමකි. විද්‍යුත් මාධ්‍ය හරහා රු. බි. 191.2ක් රැස්කරන ලද අතර, එලෙස ඉලෙක්ට්‍රොනිකව සිදු කර ඇති දායක මුදල මුළු දායක මුදලින් 81%කි. සේවක අර්ථසාධක අරමුදල මංගත ගෙවීම් ක්‍රම තුළ නිරවද්‍යතාව වර්ධනය කරමින් සහ ප්‍රමාදයන් අවම කරමින් ගෙවීම් ලැබී පැය 24ක් තුළ සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ හැකියාව ඇති කරන ලදි.

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව එහි සාමාජිකත්වය වෙත රු. මි. 12,717ක වටිනාකමකින් යුත් නිවාස ණය පහසුකම් සැලසීම සඳහා ඇපකර සහතික 14,533ක් ද නිකුත් කරන ලදි. නැවත ලියාපදිංචි කිරීම් ක්‍රියාමාර්ගය 2024 දී ද අඛණ්ඩව සිදු කළ අතර සාමාජිකයින් 70,222ක් නැවත ලියාපදිංචි කරන ලදි. එය පෙර වසරේ නැවත ලියාපදිංචි කිරීම් 25,019ට සාපේක්ෂව 181%ක වැඩිවීමකි. සමස්තයක් වශයෙන්, සාමාජික වාර්තා මිලියන 1.78ක් නැවත ලියාපදිංචි කර ඇත.

සේවක අර්ථසාධක අරමුදල විසින් 2024 දී වාර්තා සංශෝධන 101,743ක් සිදු කරන ලද අතර, ඒ තුළ නම සහ ජාතික හැඳුනුම්පත් අංක සංශෝධන 91,095ක් සහ ගිණුම් සංශෝධන 10,648ක් විය. සේවා විමධ්‍යගතකරණය වර්ධනය කරමින් මහ බැංකුවේ ප්‍රාදේශිය කාර්යාල හරහා ද මෙවැනි සංශෝධන සිදු කිරීමට පහසුකම් සලසන ලදි.

තවද, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් තම සේවාවන් පිළිබඳ දැනුම්වත්භාවය වැඩි කිරීමට ප්‍රමුඛත්වය දෙන ලදි. ඒ අනුව, 2024 දී, වරලත් පිරිස් කළමනාකරණ ආයතනය (CIPM) විසින් සංවිධානය කරන ලද ජාතික මානව සම්පත් සමුළුව ඇතුළු විවිධ ජංගම සේවා, මහජන ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ සඳහා සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සහභාගී විය. දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදල මාර්ගගත සේවා පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලද අතර, එමඟින් සේවායෝජකයින්ට සාම්ප්‍රදායික ක්‍රමවලින් ඉවත්ව සේවක අර්ථසාධක අරමුදල මාර්ගගත සේවා පහසුකම කරා මාරුවීමට උපකාරී විය.

යෝජිත වසර තුළ, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව ශේෂ විමසීම් 97,928ක්, පොදු තොරතුරු විමසීම් 64,382ක් සඳහා ප්‍රතිචාර දක්වන ලද අතර, වෙනත් ඉල්ලීම් 11,195ක් නිරාකරණය කරන ලදි.

[1] https://epf.lk/?page_id=243

## රාජ්‍ය ණය කළමනාකරණය

### රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 132 වන වගන්තිය ප්‍රකාරව, 2024 වර්ෂයේ දී රජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා පහසුකම් සලසන ලදී. මහා භාණ්ඩාගාරයේ මුදල් ස්වාරක්ෂකයක් පවත්වාගෙන යාමේ උපායමාර්ගය, මූල්‍ය වර්ෂය තුළ දී එලදා අනුපාතික මත අධික පීඩනය පැවති අවස්ථාවල දී, එය මැඩපැවැත්වීමට උපකාරී විය. එසේම, පුළුල් රාජ්‍ය මූල්‍ය විනය, විචක්ෂණශීලී ණය කළමනාකරණය සහ මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම, වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස පහළ යෑමට දායක විය. මේ අතර, සාමාන්‍ය වෙළඳපොළ තත්ත්වයන් යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර මෙන් ම භාණ්ඩාගාර බිල්පත්වල පරිණත කාලසීමාව දීර්ඝ කිරීමට ද කටයුතු කරන ලදී.

### භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම, 2023-2024

| උපකරණය | 2024 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|
| | නිකුත් කිරීම් (රු.බි.) | බර තබන ලද සාමාන්‍ය එලදා අනුපාතිකය (%) | නිකුත් කිරීමේ සාමාන්‍ය පරිණත කාලය (වර්ෂ) | නිකුත් කිරීම් (රු.බි.) | බර තබන ලද සාමාන්‍ය එලදා අනුපාතිකය (%) | නිකුත් කිරීමේ සාමාන්‍ය පරිණත කාලය (වර්ෂ) |
| භාණ්ඩාගාර බිල්පත් (අ) | 7,900.6 | 10.02 | 0.51 | 15,446.3 | 22.36 | 0.34 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 3,071.9 | 12.27 (ආ) | 5.06 (ආ) | 7,614.5 | 21.00 (ආ) | 3.96 (ආ) |

*(අ) ශ්‍රී ලංකා මහ බැංකුවට නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව දළ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම්*

*(ආ) දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන හා විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර ඇතුළත් නොවේ.*

මැතිවරණ ආශ්‍රිත අවිනිශ්චිතතාවන් සහ දීර්ඝ කාලයක් ගත වූ විදේශ ණය ප්‍රතිව්‍යුහගතකරණ සාකච්ඡා මධ්‍යයේ වුව ද, සැලකිය යුතු මට්ටමක ස්ථාවරත්වයක් පවත්වා ගනිමින් රජයේ දේශීය අරමුදල් අවශ්‍යතා වෙළඳපොළ මූලාශ්‍ර හරහා සපුරාලීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2024 වර්ෂය තුළ දී කටයුතු කරන ලදී. මේ අතර විචක්ෂණශීලී උපායමාර්ග සහ රාජ්‍ය මූල්‍ය අංශයේ සිදු වූ වර්ධනයන් පොලී අනුපාතික පහළ යාම සහ දිගු කාලීන ණය උපකරණ නිකුතුව සඳහා සහාය වූ අතර, එතුළින් පොලී වියදම පහළ යාම සහ රාජ්‍ය මූල්‍ය අවකාශය පුළුල් වීම සිදු විය.

### අන්තර්ජාතික මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම යටතේ රජයට ලබා දෙන ශුද්ධ ණය ඉලක්කය

2023 සැප්තැම්බර් මාසයේ දී රජයේ නොපිය වූ ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමෙන් අනතුරුව, 2024 පළමු කාර්තු තුන (3) තුළ, කාර්තුවකට රු.බි. 80 බැගින් රු.බි. 240ක භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳපොළ වෙත මුදා හරින ලදී. මෙමගින්, පොලී අනුපාතික මත අනවශ්‍ය පීඩනයක් ඇති වීම වළකා ගනිමින් වෙළඳපොළ ස්ථායීතාවය පවත්වා ගන්නා ලද අතරම අන්තර්ජාතික මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම යටතේ ළඟා කරගත යුතු වූ රජයට ලබා දෙන ශුද්ධ ණය පිළිබඳ ඉලක්කය ද සපුරා ගැනීමට හැකියාව ලැබුණි.

### දේශීය හා විදේශීය ණය ප්‍රතිව්‍යුගතකරණය

අන්තර්ජාතික මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම යටතේ රාජ්‍ය ණය තිරසාරභාවය ළඟා කර ගැනීම තුළින් රජයට සහ එහි උපදේශකයන්ට අවශ්‍ය සහයෝගය ලබා දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව කැප වී සිටී. ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ රාජ්‍ය මූල්‍ය නියෝජිතයා ලෙස, කාලීනව ණය ප්‍රතිව්‍යුහගතකරණය ක්‍රියාත්මක කිරීම තුළින්, දිගු කාලීන ආර්ථික ස්ථායීතාව සහ මූල්‍ය ශක්තිය තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරන ලදී.

### රාජ්‍ය ණය කළමනාකරණ පනත සහ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ස්ථාපිත කිරීම

2024 ජුනි 18 වන දින නීතිගත කරන ලද 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත ප්‍රකාරව, මුදල් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද පරිදි, 2024 නොවැම්බර් 25 වන දින සිට පනතේ විධිවිධාන බලාත්මක වේ. මෙම පනත යටතේ, 2024 දෙසැම්බර් 2 වන දින රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ස්ථාපිත කරන ලදී.

රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 37 වන වගන්තියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 132 වන වගන්තියේ අදාළත්වය, රාජ්‍ය ණය කළමනාකරණ පනත ක්‍රියාත්මක වන දින සිට මාස 18ක් ඇතුළත අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරන ලද දිනයක දී බලාත්මක වනු ඇත. ඒ අනුව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට 2026 මැයි 25 වන දින දක්වා එහි කාර්යයන් අඛණ්ඩව කරගෙන යාමට මෙම සංක්‍රාන්ති කාලය තුළ ඉඩ සලසා ඇත.

මෙම පනත කෙටුම්පත් කරන කාලය තුළ දී, ශ්‍රී ලංකා මහ බැංකුව අදාළ තාක්ෂණික විශේෂඥතාව සැපයීමට සහ මෙහෙයුම්, නෛතික සහ ප්‍රතිපත්තිමය අභියෝගවලට විසඳුම් ලබා දීමට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ බාහිර පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කරන ලදී. ඉදිරි කාලයේ දී, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට අවශ්‍ය වන පුහුණුව සහ සහාය ලබා දීමෙන් ණය කළමනාකරණ කාර්යයන් ක්‍රමවත්ව පැවරීමට අවශ්‍ය සහාය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙනු ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 81(7) වන වගන්තිය යටතේ, රජය විසින් නිකුත් කරන ලද සුරැකුම්පත් සඳහා වන ලේඛනය තව දුරටත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගනු ඇත.





### ලංකාසෙක්‍යු පද්ධතිය සහ ඩිජිටල්කරණය

ලංකාසෙක්‍යු පද්ධතිය, රජයේ නිර්ලේඛන සුරැකුම්පත්වල හිමිකාරිත්වය වාර්තා කරන මධ්‍යම තැන්පතු පද්ධතිය (CDS) සහ ඒවායේ ගනුදෙනු හසුරුවන නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතිය (SSSS) යන පද්ධතිවලින් සමන්විත වේ. 2024 වසර තුළ දී ලංකාසෙක්‍යු පද්ධතිය, පූර්ණ උපයෝජ්‍යතාවයකින් යුතුව ක්‍රියාත්මක විය.

2024 අප්‍රේල් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ලංකාසෙක්‍යු විසින් කාලීන ආයෝජක ප්‍රකාශන (රඳවා ගැනීමේ, ගනුදෙනු සහ ගෙවීම් ප්‍රකාශන) මුද්‍රිත පිටපත් ආකෘතියක සිට ඉලෙක්ට්‍රොනික ආකෘතියකට (ඊ-ප්‍රකාශන) සම්පූර්ණයෙන්ම පරිවර්තනය කරන ලදී. වඩාත් ආරක්ෂිත සහ ඉහළ ප්‍රවේශයක් ලබා දෙමින් මෙම විද්‍යුත් ප්‍රකාශන දැනට ලියාපදිංචි ආයෝජකයින්ට විද්‍යුත් තැපෑලෙන් යවනු ලැබේ.

### ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන සමඟ සම්බන්ධීකරණය

ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතන මගින් 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය තක්සේරු කිරීමේ දී, විශේෂයෙන් විදේශ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය තුළ, ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාකාරීව සහයෝගය ලබා දුන් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස නියෝජිත ආයතන දෙකක් මගින් ශ්‍රේණිගත කිරීම් ඉහළ දැමීමක් වාර්තා විය.

### ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම

රූප සටහන 17

**Moody's**

2024 දෙසැම්බර් 23:

- දිගු කාලීන විදේශීය ණය ශ්‍රේණිගත කිරීම "Ca" සිට "Caa1" දක්වා ඉහළ නංවන ලදී.
- එ.ජ.ඩො. මත පදනම් වූ නිකුත් කිරීම් සඳහා "Caa1" ශ්‍රේණිගත කිරීම ලබා දෙන ලදී. (2024 නොවැම්බර් 28 වන දින තාවකාලික ශ්‍රේණිගත කිරීමක් නිකුත් කරන ලදි)

**Fitch Ratings**

2024 දෙසැම්බර් 20:

- දිගු කාලීන විදේශ විනිමය ණය පැහැර හැරීමට අදාළ ණය ශ්‍රේණිගත කිරීම, "RD" සිට "CCC+" දක්වා ඉහළ නංවන ලදී.
- ශ්‍රී ලංකාවේ දේශීය ණය පැහැර හැරීමට අදාළ ණය ශ්‍රේණිගත කිරීම, "CCC-" සිට "CCC+" දක්වා ඉහළ නංවන ලදී.

2024 දෙසැම්බර් 30:

- "CCC+" ශ්‍රේණිගත කිරීම පහත බැඳුම්කර සඳහා ලබා දෙන ලදී.
  - (අ) 2035 දී කල් පිරෙන යහ පාලනය හා බැඳුණු බැඳුම්කර
  - (ආ) 2038 දී කල් පිරෙන ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත එ.ජ.ඩො. බැඳුම්කර

**S&P Global**

2024 දෙසැම්බර් 27:

- විදේශීය ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම, "SD" ලෙස තහවුරු කරන ලදී.
- දේශීය ණය ශ්‍රේණිගත කිරීම "CCC+/C" ලෙස තහවුරු කරන ලදී.
- ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු නිකුත් කළ කාණ්ඩ තුනක් සඳහා "CCC+" ශ්‍රේණිගත කිරීමක් ලබා දෙන ලදී.
  - (අ) 2035 දී කල් පිරෙන යහ පාලනය හා බැඳුණු බැඳුම්කර
  - (ආ) 2038 දී කල් පිරෙන ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත එ.ජ.ඩො. බැඳුම්කර
  - (ඇ) 2030 දී කල් පිරෙන උපචිත පොලී සඳහා වන බැඳුම්කර

## මූල්‍ය බුද්ධි ඒකකය

2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ 2006 මාර්තු මස ස්ථාපිත කළ, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය 2007 වසරේ පෙබරවාරි සිට ශ්‍රී ලංකා මහ බැංකුව තුළ මෙහෙයුම් ක්‍රියාවලියේ දී ස්වාධීන සහ ස්වතන්ත්‍ර ආයතනයක් ලෙස කටයුතු කරයි. මුදල් විශුද්ධිකරණයට, ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමට, සහ මූල්‍යමය අපරාධ මැඩ පැවැත්වීමට, මූල්‍ය බුද්ධි ඒකකය මූල්‍ය බුද්ධි තොරතුරු රැස්කර, විශ්ලේෂණය කර නීති ක්‍රියාත්මක කරන ආයතන සහ නියාමන අධිකාරීන් වෙත යොමු කරයි.

2024 වසරේ දී, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තාකරණ ආයතනවලින් සහ මහජනතාවගෙන් සැක කටයුතු ගනුදෙනු වාර්තා 2,513ක් ලැබුණි. විශ්ලේෂණය කළ ප්‍රතිඵල සාකච්ඡා කිරීමට සහ ගත යුතු පියවර තීරණය කිරීමට මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2024 වසර තුළ දී සැක කටයුතු ගනුදෙනු වාර්තා පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් 101ක් සහ සැක කටයුතු ගනුදෙනු වාර්තා සමාලෝචන කමිටු රැස්වීම් 12ක් පවත්වන ලදි. ජාත්‍යන්තර සහ දේශීය සහයෝගිතාව ශක්තිමත් කරනු පිණිස, මූල්‍ය බුද්ධි ඒකකය 2024 දී බහරේන් රාජධානියේ හි මූල්‍ය බුද්ධි ජාතික මධ්‍යස්ථානය සහ දේශීය ආයතන හතරක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලදි. එම දේශීය ආයතන හතර නම් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සහ රාජ්‍ය-නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයයි.

### ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණ තර්ජන

රූප සටහන 18




මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15 (2) වගන්තිය යටතේ, නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් පවත්වන ලද විමර්ශනවලට සහාය වීමට මූල්‍ය බුද්ධි ඒකකය 2024 වසර තුළ ගනුදෙනු අත්හිටුවීමේ බලතල ක්‍රියාත්මක කරන ලදි.

2024 වසර තුළ, මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය ආයතන පිළිබඳ ස්ථානීය අධීක්ෂණ සහ විතැන් අධීක්ෂණ 86ක් පවත්වන ලද අතර මෙයට විවිධ අංශ එනම්, ප්‍රාථමික අලෙවිකරුවන්, මුදල් හෝ වටිනාකම් හුවමාරු සේවා සපයන්නන්, පරිසීමිත වෙළඳුන්, රක්ෂණ සමාගම්, කොටස් තැරැව්කරුවන්, කැසිනෝ, මැණික් හා රන්භාණ්ඩ අලෙවිකරුවන්, නීති ආයතන, නිශ්චල දේපළ ආයතන, ගණකාධිකාරී/ගිණුම් ආයතන, සහ භාර සහ සමාගම් සේවා සපයන්නන් ඇතුළත් විය. අධීක්ෂණ සොයා ගැනීම් මත පදනම් වී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් අවවාද ලිපි 55ක්, නිදහසට කරුණු විමසීමේ ලිපි 12ක්, නිකුත් කළ අතර, රු.මි. 8.75ක දඩ මුදල් නියම කරන ලදි.

එමෙන්ම, මූල්‍ය බුද්ධි ඒකකය තේමාත්මක සමාලෝචන 12ක් පවත්වන ලද අතර මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ සහ ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ අවශ්‍යතාවන්ට අනුකූලවීම සහතික කිරීමට චක්‍රලේඛ පහක් නිකුත් කරන ලදි. මූල්‍ය බුද්ධි ඒකකය අදාළ අංශයේ නියාමකයින් සමඟ කාලීනව හවුල් වී මූල්‍ය ආයතන සහ නම් කළ මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීමය අංශ සඳහා මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධයෙන් අවදානම් තක්සේරු කිරීම් 191ක් සිදු කරන ලදි.

2024 තුළ, මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය බුද්ධි ඒකකයේ විශ්ලේෂණ අවකාශය වෙත ගනුදෙනු වාර්තා කරන goAML පද්ධතිය වැඩිදියුණු කිරීම පිළිබඳ සැලකිය යුතු ප්‍රගතියක් සිදු කරන ලදි. මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය විසින් කළ නිෂ්පාදනය කළ goAML පද්ධතිය වාර්තාකරණ ආයතන සහ මූල්‍ය බුද්ධි ඒකකය අතර ආරක්ෂිත තොරතුරු හුවමාරුව ශක්තිමත් කරමින් මූල්‍ය අපරාධ මැඩපැවැත්වීමට මූල්‍ය බුද්ධි ඒකකයට සහය වේ. goAML පද්ධතිය වර්ධනය කිරීම සඳහා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව සහ මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය සමඟ මූල්‍ය බුද්ධි ඒකකය තාක්ෂණික සාකච්ඡා පවත්වන ලදි. වලංගු නොවන දත්ත වාර්තා කිරීම වැළැක්වීමට, goAML ගනුදෙනු වාර්තාවල වලංගුභාවය තහවුරු කරගැනීමේ මෙවලම (Submission Validator Tool) සහ කේතන කිරීමේ යාන්ත්‍රණය (hashing mechanism) හඳුන්වා දෙන ලදි. මූල්‍ය බුද්ධි ඒකකය 2024 වසර තුළ ප්‍රාථමික අලෙවිකරුවන් සහ පරිසීමිත වෙළඳුන් goAML පද්ධතිය තුළ ලියාපදිංචි කරන ලදි.

මූල්‍ය බුද්ධි ඒකකය 2024 වසර තුළ සිය ප්‍රධාන අණ පනත් වන, 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත, සහ 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යන ඒවාට අවශ්‍ය සංශෝධන කිරීමේ කටයුතු තවදුරටත් සිදු කරන ලදි. මීට අමතරව, අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත, 2007 අංක 7 දරන සමාගම් පනත සඳහා වූ සංශෝධිත කෙටුම්පත, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචිය හා අධීක්ෂණ කිරීමේ) පනත සඳහා වූ සංශෝධන සහ සූදු නියාමන අධිකාරී පනත් කෙටුම්පත ඇතුළු නව අණ පනත් සමාලෝචනය කර සංශෝධන කිරීම සඳහා පැවති නීති කෙටුම්පත් කමිටුවලට ද මූල්‍ය බුද්ධි ඒකකය ක්‍රියාකාරීව සහභාගී විය.



මෙහෙයුම් තොරතුරු   මූල්‍ය ප්‍රකාශ   අතිරේක තොරතුරු

# මහ බැංකුව කළමනාකරණය කිරීම

ආර්ථිකය යථා තත්ත්වයට ගෙන තිරසර වර්ධනයක් කරා යන මාවතට ගෙන ඒම සඳහා මහ බැංකුව යම් ප්‍රගතියක් පෙන්නුවේ නම්, ඒ එහි සිටින කුසලතා පූර්ණ බුද්ධිමත් ශ්‍රම බලකාය හේතුවෙනි. මහ බැංකුවේ සියලුම කාණ්ඩවල සේවා නියුක්තිකයින්ගේ කැපවීම හා මහන්සිය තුළින් මෙන්ම පරිපාලන රාමුවේ ශක්තිමත්භාවයෙන් ද තොරව මහ බැංකුවට සාර්ථකත්වය ළඟා කර ගත නොහැකි ය. මහ බැංකු නිලධාරින්ගේ දායකත්වය නොවන්නට පසුගිය දෙවසර තුළ සිදු වූ ආර්ථික පුනර්ජීවනය තවදුරටත් සිහිනයක් වන්නට තිබූ බව කීම අතිශයෝක්තියක් නොවේ.

කුසලතා කළමනාකරණය, පරිපාලන ක්‍රියා පටිපාටි විධිමත් කිරීම සහ පාලනය ශක්තිමත් කිරීම සමඟ 2024 දී, බැංකුව මානව සම්පත් සංවර්ධනය හා පරිපාලන කටයුතු ඉහළ නැංවීම යන දෙඅංශයෙන්ම සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන ඇත. ශක්තිමත්, වේගවත් හා අනාගතයට සූදානම් බැංකුවක් නිර්මාණය කිරීම උදෙසා මේ සියලු වෑයම් උපකාරී විය.

## මානව ප්‍රාග්ධනය කළමනාකරණය

වගකිවයුතු සේවා යෝජකයෙකු වශයෙන් මහ බැංකුවේ අරමුණු වන මිල ස්ථායීතාව හා මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම උදෙසා බැංකුව සතු දක්ෂ ශ්‍රම බලකාය අත්‍යවශ්‍යයෙන් ම සිය දායකත්වය ලබා දිය යුතු බව මහ බැංකුව පිළිගනියි. සිය වෘත්තීයභාවය, තාක්ෂණික නිපුණත්වය හා සුපිළිපන් බව තුළින් ඔවුහු නිරතුරුවම මහ බැංකුවට හා මුළු මහත් ආර්ථිකයටම ඉතා හොඳින් සේවය කරති. ආකර්ෂණය, රඳවා තබා ගැනීම හා කුසලතා වැඩිදියුණු කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කිරීම තුළින් 2024 වසරේ දී බැංකුවේ මානව ප්‍රාග්ධනය කළමනාකරණය සඳහා වන ප්‍රවේශය හැඩගැස්විණි. සේවකයින් අනුයුක්ත කර ගැනීමේ හා රඳවා තබා ගැනීමේ උපායමාර්ග පිළියෙල කිරීමේ දී හා ආකර්ෂණීය සේවා යෝජකයෙක් ලෙස බාහිර පුද්ගලයින් විසින් මහ බැංකුව පිළිගන්නා බව තහවුරු කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමේ දී සේවකයින් මහ බැංකුවට සම්බන්ධ වීම, එහි රැඳී සිටීම හා ඉන් ඉවත්වීමට හේතු වූ කරුණු දැන ගැනීම අත්‍යවශ්‍යය.

### මානව ප්‍රාග්ධනය

රූප සටහන 19



පුළුල් ආයතනික ඉලක්ක සමග අනුගත වන පරිදි බැංකුවේ වත්මන් හා අනාගත මිනිස්බල අවශ්‍යතා නිරවද්‍යව තක්සේරු කිරීම සඳහා 2024 දී මහ බැංකුව මිනිස්බල සැලසුම් පිළියෙල කළේය. රැකියා කාණ්ඩ හඳුන්වා දීම සහ විධිමත් බඳවා ගැනීමේ ක්‍රමවේදය බැංකුවට අවශ්‍ය කුසලතාවන් වැඩිදියුණු කර ගැනීමට හා ගුණාත්මක බවෙන් යුතු බඳවා ගැනීම් සිදු කිරීමට උපකාරී විය. එමෙන් ම, තීරණාත්මක කාර්යයන්ට අදාළ තනතුරු සඳහා වන නව්‍ය අනුප්‍රාප්තික සැලසුම්කරණය මගින් නායකත්ව හා මෙහෙයුම් ස්ථාවරත්වය අඛණ්ඩ ව පවත්වා ගැනීම සඳහා වූ මහ බැංකුවෙහි හැකියාව ශක්තිමත් කර ඇත. නායකත්වය සංවර්ධනය කිරීමේ එක් අංගයක් ලෙස නායකත්වයේ සඵලදායි බව පිළිබඳ ව ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට ඉඩ සලස්වමින් මහ බැංකුව, අදාළ තනතුරුවලට සුදුසු පුද්ගලයින් ගැළපීමට කටයුතු කළේය. තව ද යම් සේවානියුක්තිකයෙකුගේ රාජකාරිය හා සම්බන්ධ සියලුම තලවල සිටින නිලධාරින් ආවරණය වන පරිදි අදාළ සේවානියුක්තිකයා පිළිබඳ ව සිදු කරන ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක් ද (360-degree feedback) ඇතුළත් ව්‍යුහගත ඇගයීම් ක්‍රමවේදයක් 2024 දී ක්‍රියාත්මක කරන ලදි.

අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය (SEACEN) සමඟ එක් ව වැඩිදියුණු කළ නායකත්ව ප්‍රවීණතා ආකෘති මඟින් අනුප්‍රාප්තික සැලසුම්කරණය හා අඛණ්ඩ නායකත්වය සඳහා අත්‍යවශ්‍ය නායකත්ව හැකියාවන් හා ඒ සඳහා වන සූදානම ඇගයීමේ විධිමත් ක්‍රමවේදයක් සකසන ලදි.

ඇප කැප වී වැඩ කිරීම ප්‍රතිලාභ ලැබීමට හා පිළිගැනීමක් ලැබීම සඳහා හේතු වන බව මහ බැංකුවේ මූලික විශ්වාසයකි. එම නිසා ඉහළ කාර්යසාධනයක් සහිත සේවකයින් අගයමින් හා බැංකුවේ උපායමාර්ගික ඉලක්ක සමඟ සේවක වෘත්තීය සංවර්ධනය සුසංයෝග කරමින් උසස් වීම් ලබා දීම 2024 දී ප්‍රධාන වශයෙන් අවධානයට ලක් වූ අංශයකි. මෙම වසර තුළ උසස් වීම් නිර්ණායක සඳහා පදනම් වූයේ කාර්යසාධක ඇගයීම්, නායකත්ව හැකියාවන් සහ බැංකුවේ අරමුණු වෙනුවෙන් ලබා දුන් සමස්ත දායකත්වයයි. ස්ථිර සහ කොන්ත්‍රාත් යන පදනම් දෙකම 2024 වසරේ දී කළ බඳවා ගැනීම්වලට ඇතුළත් වූ අතර අතිරේක පුරප්පාඩු සපුරාලීම සඳහා බාහිර සේවා සපයන්නන්ගේ සහාය ලබා ගැනුණි.

සහභාගිත්වය හා විනිවිදභාවය වැඩිදියුණු කිරීම උදෙසා විවෘතභාවයට හා සාමූහික ගැටලු නිරාකරණයට ඉඩ ප්‍රස්ථා සලසමින් න්‍යාය පත්‍රවලින් තොර විවෘත සාකච්ඡා වට පැවැත්වීමටත් ඉහළ කළමනාකාරිත්වය, සමස්ත සේවකයින් සමඟ විවෘත රැස්වීම් පැවැත්වීමටත් (Town hall meetings) ශ්‍රී ලංකා මහ බැංකුව මුල පුරා තිබේ. නිරන්තරයෙන් සිදු කරන සහභාගිත්ව සමීක්ෂණ මගින් ඉලක්කගත වැඩිදියුණු කිරීම් සඳහා මඟ පෙන්වමින් සේවක තෘප්තිය හා අභිප්‍රේරණය සම්බන්ධ වටිනා තොරතුරු කළමනාකාරීත්වය විසින් ලබා ගන්නා ලදි.

2024 දී ද බැංකුව අඛණ්ඩ ඉගෙනීම හා වෘත්තීය දියුණුව සඳහා කැප වී සිටියේය. කුසලතා සංවර්ධනය, නායකත්ව හැකියා ඉහළ නැංවීම හා තාක්ෂණික ප්‍රවීණතා වැඩි දියුණු කිරීම සඳහා ව්‍යුහගත ඉගෙනුම් සහ සංවර්ධන රාමුව උපකාරී විය. කුසලතා සංවර්ධනය වෙනුවෙන් වූ මෙම උපායමාර්ගික ඉලක්කය මතු වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දීමට සූදානම් දක්ෂ හා කඩිසර ශ්‍රම බලකායකින් සමන්විත වීමට මහ බැංකුවට ඉඩ සැලසීය.

උසස් මට්ටමේ චර්යාධර්ම පවත්වාගෙන යාම බැංකුවට අතිශය වැදගත් වේ. එබැවින් මහ බැංකු සේවකයින් සිය වෘත්තීයභාවය, වගවීම සහ විනිවිදභාවය පෙන්නුම් කරන දැඩි චර්යාධර්ම සංග්‍රහයක් පිළිපදිනු ලැබේ. දැඩි ආචාරධර්ම ප්‍රතිපත්තිය හා නිරන්තරයෙන් සිදු කරන දැනුම්වත් කිරීමේ වැඩසටහන් හරහා 2024 දී බැංකුව මෙම තත්ත්වයන් තවදුරටත් වැඩිදියුණු කිරීමට කටයුතු කළේය.

## 2024 වසරේ දී විශ්‍රාම ගිය අපගේ සාමාජිකයන්

වසර ගණනාවක් මහ බැංකු සේවයට කැප වී 2024 දී විශ්‍රාම ගිය මහ බැංකු නිලධාරින්ට අපගේ හෘදයාංගම කෘතඥතාව පුද කරන අතර ඔවුන්ගේ සියලු අනාගත අභිප්‍රායන් සාර්ථක වේවායි සුබ පතන්නෙමු.



ඉවට් ප්‍රනාන්දු
හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති



අරුසි තාසිම්
හිටපු නියෝජ්‍ය අධිපති

- රෝහණ විජේසේකර, සහකාර අධිපති
- මල්කාන්ති බණ්ඩාර, මහ බැංකු ලේකම්
- ජයවර්ධන රත්නායක, අධ්‍යක්ෂ, පහසුකම් කළමනාකරණ
- සෙනරත් ධර්මවර්ධන, අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන
- ප්‍රසන්න ජයතිලක, අධ්‍යක්ෂ, බැංකු විදු පියෙස
- රොහාන් විජේවර්ධන, අතිරේක අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ
- අශෝක සේනානායක, අතිරේක අධ්‍යක්ෂ, දේශීය මෙහෙයුම් කටයුතු
- අරුණ දීගල, අතිරේක අධිකාරී, ව්‍යවහාර මුදල්
- ලාල් මුතුකුමාර, අතිරේක අධ්‍යක්ෂ, කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ





## බැංකු විදු පියෙස

CBS
CENTRE FOR BANKING STUDIES
*Your Guide to the Future...*

ශ්‍රී ලංකා මහ බැංකුවේ මානව සම්පත් සංවර්ධන අංශය ලෙස කටයුතු කරන බැංකු විදු පියෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ බැංකු හා මූල්‍ය අංශයේ නිලධාරින්ගේ කාලීන පුහුණු අවශ්‍යතා අඛණ්ඩව සපුරාලමින් ඔවුන්ගේ මූල්‍ය අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් නිර්මාණය කරන ලද, වසර පුරාම පැවැත්වෙන වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරයි. වෘත්තීය අඛණ්ඩතාව, වගවීම, නවෝත්පාදන, අදාළත්වය, සේවා විශිෂ්ටත්වය සහ විවිධත්වය, බැංකු විදු පියෙසෙහි මෙහෙවරට පාදක වන මූලික අගයයන් වේ. නවීන බැංකුකරණයේ හා මූල්‍ය ක්ෂේත්‍රයේ අභියෝග සහ සංකීර්ණතා සඳහා සාර්ථකව මුහුණ දීමට අවශ්‍ය විචක්ෂණතාව සහ ඔරොත්තු දීමේ හැකියාව වෘත්තිකයින් තුළ ඇති කිරීම සඳහා බැංකු විදු පියෙස සෑම වසරකම පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ පවත්වයි. බැංකු හා මූල්‍ය අංශ පිළිබඳව පමණක් නොව සමස්තයක් වශයෙන් සාර්ව ආර්ථිකය පිළිබඳවම අවබෝධයක් පුහුණු වැඩසටහන් සඳහා සහභාගිවන්නන්ට ලබා දීම මෙම වැඩසටහන්වල අරමුණයි. අඛණ්ඩව දැනුම ප්‍රවර්ධනය කරන, විවිධ කුසලතා සංවර්ධන මූලාරම්භයන් හරහා, ශ්‍රී ලංකා මහ බැංකුවට මූල්‍ය පද්ධති ස්ථායීතාව සහ තිරසර ආර්ථික වර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා සහාය වෙමින් බැංකු විදු පියෙස වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

2024 වසරේ දී, බැංකු විදු පියෙස විසින් පෙර සැලසුම් කළ සැසි 59ක්, විශේෂ වැඩසටහන් 39ක්, ප්‍රසිද්ධ දේශන 9ක් සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල සහයෝගිත්වයෙන් සිදු කළ වැඩසටහන් 10ක් ඇතුළුව පුහුණු වැඩසටහන් 117ක් පවත්වන ලදි. මෙම වැඩසටහන් සඳහා සහභාගී වූ සමස්ත පිරිස 6,500කට අධික වූ අතර, එමගින් අවශ්‍යතා ඇති සියලු දෙනා වෙනුවෙන් ඵලදායි කුසලතා සංවර්ධනය උදෙසා කටයුතු කිරීමට බැංකු විදු පියෙසෙහි ඇති කැපවීම මැනවින් පිළිඹිබු කරයි. මෙම වැඩසටහන් තුළින් මහ බැංකුකරණය, මූල්‍ය කටයුතු, භාණ්ඩාගාර මෙහෙයුම්, ආර්ථික විද්‍යාව, තොරතුරු තාක්ෂණවේදය, නීතිමය රාමු, පර්යේෂණ, දත්ත විශ්ලේෂණය සහ මානව සම්පත් කළමනාකරණය ඇතුළු පුළුල් පරාසයක දිවෙන මාතෘකා ආවරණය කිරීමට හැකි වී ඇත.

ශ්‍රී ලංකාවේ බැංකු හා මූල්‍ය අංශයේ අනුකූලතාව, නවෝත්පාදන, සයිබර් ආරක්ෂාව සහ වෙළඳ ගිවිසුම් පිළිබඳව පැවැත් වූ විද්වත් මණ්ඩල කතිකාවත්වල දී එම ක්ෂේත්‍රවල පැවති ප්‍රධාන ගැටලු ඉස්මතු කෙරිණි. විශේෂයෙන්, බැංකු විදු පියෙස විසින් තිරසර මූල්‍ය පිළිවෙත්වල වැදගත්කම පිළිබඳ දැනුම්වත්භාවය ප්‍රවර්ධනය කිරීම සඳහා මොන්ගෝලියානු තිරසර මූල්‍ය සංගමය (Mongolian Sustainable Finance Association) සහ පිලිපීනයේ මහ බැංකුව (Bangko Sentral ng Pilipinas) වැනි ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගීත්වයෙන් කටයුතු කරන ලදි.

හවුල්කාර ආයතනවලින් තාක්ෂණික විශේෂඥතාව සහ මඟ පෙන්වීම ලබා ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා අග්නිදිග ආසියානු කලාපීය මහ බැංකු සංගමය (SEACEN), ජර්මන් මහ බැංකුව (Deutsche Bundesbank) සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි දකුණු ආසියානු කලාපීය පුහුණු හා තාක්ෂණික සහය මධ්‍යස්ථානය (IMF–SARTTAC) වැනි ගෝලීය ආයතන සමඟ ද බැංකු විදු පියෙස සහයෝගයෙන් කටයුතු කළේය. මෙයට, "විදේශ අංශය විශ්ලේෂණය", "නවෝත්පාදන, ගෙවීම්, සහ මහ බැංකු", "උපායමාර්ගික දුරදක්නාභාවය, උපායමාර්ග සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම", සහ "මහ බැංකු යහපාලනය", ඇතුළු විවිධ මාතෘකා ගණනාවක් පිළිබඳව ඉහළ මට්ටමේ පුහුණුවීම් ලබා දීම ඇතුළත් වේ. මීට අමතරව, මෙම වසර තුළ විදේශීය ආයතන සඳහා විශේෂ පුහුණු වැඩසටහන් සංවිධානය කළ අතර, එයට, "නේපාල බැංකුවල මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම" සහ "බැංකු කළමනාකරුවන් සඳහා විශිෂ්ට ශාඛා කළමනාකරණය" වැනි වැඩසටහන් ඇතුළත් විය. තවත් කැපී පෙනෙන සිදුවීමක් වූයේ ටැන්සානියා බැංකු ඇකඩමියේ (Bank of Tanzania Academy) නියෝජිතයින් බැංකු විදු පියෙසෙහි සිදු කළ ක්ෂේත්‍ර චාරිකාවයි.

2024 වසරේ දී විවිධ මුලපිරීම් හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ කුසලතා සංවර්ධනය කෙරෙහි බැංකු විදු පියෙසෙහි දැඩි අවධානය යොමු විය. මේ සඳහා, "Talks@CBSL" තුළින් ප්‍රමුඛ පෙළේ සමාගම්වලින් කළමනාකරණ උපාය මාර්ග පිළිබඳව අවබෝධය ලබා ගැනීම සහ අලුතින් බඳවා ගත් නිලධාරින් වෙනුවෙන් කළ පෞද්ගලික සංවර්ධන පුහුණු වැඩසටහන් ද ඇතුළත් විය. ජාතික මට්ටමින් මූල්‍ය හා ආර්ථික සාක්ෂරතාව වැඩිදියුණු කිරීම ඉලක්ක කර, ඒ සඳහා වඩාත් කැපවෙමින් සහ වැඩි පිරිසකට පුහුණු අවස්ථා සලසමින්, බැංකු විදු පියෙස විසින් 2024 වසරේ දී මහජන සම්මන්ත්‍රණ පැවැත්විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල සමඟ එක්ව සිදු කරන අඛණ්ඩ දැනුම්වත් කිරීම්වලට අමතරව, බැංකු විදු පියෙස කලාපීය මට්ටමින් මූල්‍ය ආයතනවල කුසලතා සංවර්ධනය අරමුණු කර ගත් විශේෂ පුහුණු වැඩසටහන් මාලාවක් ද පැවැත්විය. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සහයෝගීතා ශක්තිමත් කර ගනිමින්, බැංකු විදු පියෙස එහි පුහුණු සහ කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම් තුළ නවෝත්පාදන සහ නිර්මාණශීලිත්වය වැඩිදියුණු කිරීමට ඉදිරියේ දී ද බලාපොරොත්තු වේ. ශීඝ්‍රයෙන් වෙනස්වීම්වලට ලක්වන ආර්ථික පරිසරයක ඇති වන සංකීර්ණතා හඳුනා ගනිමින්, බැංකු විදු පියෙස, එහි නවීනතම අධ්‍යාපනික මුලපිරීම් හරහා, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සහතික කිරීමට උත්සාහ කරනු ඇත. මෙම උත්සාහයන් තුළින් ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය වඩාත් ඵලදායි සහ හිතකර තත්ත්වයකට ඔසවා තැබීමට අවශ්‍ය දැනුම සහ කුසලතාවලින් අදාළ නිලධාරින් සන්නද්ධ කිරීම අරමුණු කෙරේ.

## තොරතුරු තාක්ෂණය

පුළුල් පරාසයක පවතින ඩිජිටල් මූල්‍ය පද්ධතිය ආවරණය වන පරිදි මහ බැංකුව, මූල්‍ය කළමනාකරණය හා අවදානම් අධීක්ෂණයේ සිට ආයෝජන සහ වැටුප් ගෙවීමේ කටයුතු දක්වා පැතිරෙන ඉතා වැදගත් තොරතුරු පද්ධති කිහිපයක් පවත්වා ගනියි. බැංකුවේ මූල්‍ය තොරතුරු ජාල (FinNet) වාර්තාකරණ පද්ධතිය සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් නිර්මාණය කිරීම විශේෂයෙන් ඉස්මතු වී පෙනෙන කාරණයකි. මූල්‍ය දර්ශක තත්කාලීනව නිරීක්ෂණය කිරීම, ප්‍රවණතා හඳුනා ගැනීම සහ විභව අවදානම් සඳහා කඩිනම් හා ක්‍රියාකාරී ප්‍රතිචාර දැක්වීම සඳහා 2024 දී මෙම මෙවලම නිර්මාණය කර ඇත. අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි සැකසීමට හැකි වීමේ දෘශ්‍යපථ (customisable views) සහ පුළුල් ලෙස දත්ත විශ්ලේෂණය කිරීමේ පහසුකම් ඇති අංග (drill-down features) සහිතව මෙය සකසා ඇති බැවින් දත්ත මත පදනම් වූ තීරණ ගැනීම වඩාත් පහසු වේ.

### තත්කාලීන දළ පියවීම් පද්ධතිය වැඩිදියුණු කිරීම

2024 වසරේ කැපී පෙනෙන තවත් සිදුවීමක් වූයේ ISO20022 පිරිවිතර (Specifications) සපුරාලීම සඳහා වඩාත් වැඩිදියුණු කළ තත්කාලීන දළ පියවුම් පද්ධතියක් හඳුන්වා දීමයි. මෙම වැඩිදියුණු කිරීම විශාල වටිනාකමකින් යුත් ගනුදෙනු තත්කාලීනව ක්‍රියාවට නැංවීමට, පියවීමේ අවදානම පහත හෙළීමට හා ද්‍රවශීලතා කළමනාකරණය වැඩිදියුණු කිරීමට උපකාරී වෙයි.

### සයිබර් ආරක්ෂණය හා තොරතුරු තාක්ෂණික ඔරොත්තු දීමේ හැකියාව

පවතින සංවේදීතාවන් හමුවේ සයිබර් ආරක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ප්‍රමුඛතාවයක් බව විශේෂයෙන් සඳහන් කිරීම අවශ්‍ය නොවේ. අවදානම්වලට නතුවීමේ හැකියාව පිළිබඳ නිරන්තරයෙන් පවත්වන ඇගයීම් හා කෘතිම සයිබර් ප්‍රහාර විලාශයෙන් සිදු කෙරෙන ආරක්ෂක පරීක්ෂණ (Penetration Testing), බැංකුවේ ඩිජිටල් යටිතල පහසුකම් විභව අවදානම්වලින් ආරක්ෂා කිරීමට උපකාරී වෙයි. ආයතනය පුරා සයිබර් ආරක්ෂණය පිළිබඳ සුපරික්ෂාකාරී බව සහිත සංස්කෘතියක් නිර්මාණය කිරීමට උත්සාහ දරමින්, දත්ත ආරක්ෂා කිරීමේ නිසි භාවිතයන් පිළිබඳව කාර්යමණ්ඩලයේ දැනුම්වත්භාවය 2024 දී අවධානය යොමු වූ තවත් අංශයකි.

### දත්ත මත පදනම් වූ උපායමාර්ගික සැලසුම්

වඩාත් නිවැරදි තීරණ ගැනීම සඳහා මෙන්ම අධීක්ෂණ කටයුතුවල දී භාවිතා කිරීම සඳහා ද අවශ්‍ය දත්ත විශ්ලේෂණය කෙරෙහි මහ බැංකුව වැඩි වශයෙන් නැඹුරු වී ඇත. ප්‍රගතිය නිරීක්ෂණය හා දෘෂ්ටීන් (insights) උත්පාදනය කිරීම සඳහා වන පුවරු (Performance dash boards) නිර්මාණය කරන ලද අතර ආයතනික දත්ත රාමුව හා එහි විශ්ලේෂණය කිරීමේ හැකියාව වර්ධනය කර ගැනීම සඳහා කොරියානු මහ බැංකුවේ සහයෝගීතාව ලබා ගන්නා ලදි. දත්ත හා දත්ත ගබඩා කිරීම (Data warehouse) මත පවත්නා අවධානය වඩා හොඳ දැනුම්වත්භාවයක් සහිත උපායමාර්ගික තීරණ ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසයි.

## පරිපාලනය

2024 දී මහ බැංකු පරිපාලන කටයුතුවල දී මූලික අවධානය යොමු කරනු ලැබුවේ අභ්‍යන්තර මෙහෙයුම් කටයුතු සුමටව පවත්වාගෙන යාමට සහ ආයතනික යහපාලනය ශක්තිමත් කිරීමටය. කාර්යක්ෂම ආයතනික පරිපාලන ක්‍රමවේදයක් යටතේ පැහැදිලි ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි හා මාර්ගෝපදේශ සහිත චක්‍රලේඛ හා අභ්‍යන්තර ලිපි නිකුත් කිරීමෙන් එහි අභ්‍යන්තර සන්නිවේදනය සුමටව ක්‍රියාත්මක කරන ලදි. මෙම පරිචය සැලකිය යුතු මට්ටමකින් මෙහෙයුම් ඒකාග්‍රතාව ඉහළ නැංවීමටත් නව්‍ය පරිපාලන නියෝග සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය යාවත්කාලීනව තබා ගැනීමටත් එක සේ වැදගත් විය.

### ප්‍රසම්පාදනය හා ස්ථාවර වත්කම් කළමනාකරණය

මෙම වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව උසස් තත්ත්වයේ භාණ්ඩ හා සේවා ප්‍රශස්ත මිලකට අත් කර ගැනීම උදෙසා පාරදෘශ්‍ය හා කාර්යක්ෂම ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කළේය. තරගකාරී ප්‍රසම්පාදන භාවිතාවන්ට අනුගතව සිය මෙහෙයුම් අවශ්‍යතා සපුරා ගනිමින් මහ බැංකුව, පිරිවැය ඵලදායීතාව ද පවත්වා ගත්තේ ය. මේ අතර, වගකීම් සහගත වත්කම් කළමනාකරණය හා සම්පත් ප්‍රශස්ත අයුරින් භාවිතය සඳහා කල් ඉකුත් වූ, හානි වූ හා භාවිත කළ නොහැකි ස්ථාවර වත්කම් හඳුනා ගැනීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පවත්වන ලදි.

### නීතිමය කටයුතු

2024 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව එහි නීතිමය කටයුතු ඵලදායී ලෙස කළමනාකරණය කළ අතර නීතිමය ආරවුල්වල දී ආයතනයේ අරමුණු ආරක්‍ෂා වන අයුරින් කටයුතු කළේය. එමෙන්ම 2023 වසරේ දී ආරම්භ කළ නීති ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මහ බැංකුව මෙම වසරේ දීත් සක්‍රීයව දායක විය. එම වගකීම්වල කොටසක් ලෙස 2024 අප්‍රේල් 10 වන දින සම්මත වූ 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනතට අනුමැතිය ලබා ගැනීම, එම පනත බලාත්මක කිරීම හා අධීක්ෂණය කිරීමත්, 2024 ජුනි 18 දින සම්මත වූ 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත ක්‍රියාත්මක කිරීම සඳහා දැක් වූ දායකත්වයත් ඇතුළත් ය.

### බාහිර හා අභ්‍යන්තර පාර්ශ්වයන්ට කරන ගෙවීම්

මහ බැංකුව ස්ථාපිත ක්‍රමවේදයකට අනුගත වෙමින් පසුගිය වසරෙහි සේවක වැටුප්, මෙහෙයුම් වියදම් හා සැපයුම්කරුවන් වෙත කරන ගෙවීම් ඇතුළුව සියලු අභ්‍යන්තර හා බාහිර ගෙවීම් කාර්යක්ෂමව සිදු කළේ ය.

### ආරක්ෂාව හා පහසුකම් කළමනාකරණය

පුද්ගල හා යටිතල පහසුකම්වල ආරක්ෂාව සහතික කිරීම සඳහා මෙන්ම ගිනි ආරක්ෂණ හා නිරීක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීමෙන් ආරක්ෂාව පවත්වා ගැනීමට ද බැංකුව දැඩි අවධානයක් යොමු කළේ ය. ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කරමින් ඉලක්කගත පුහුණු වැඩසටහන් පැවැත් වූ අතර, ආරක්ෂක නිලධාරින්ගේ හැකියාවන් සහ නිපුණතාවන් ඔප් නැංවීය. බාධාවකින් තොරව මෙහෙයුම් කටයුතු සිදු කර ගැනීම හා පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයට උපකාරී වීම සඳහා ගොඩනැගිලි නඩත්තුව, ප්‍රවාහනය ඇතුළු අංග සම්පූර්ණ පහසුකම් කළමනාකරණ සේවාවක් ද බැංකුව පවත්වා ගෙන යන්නේය.



මෙහෙයුම් තොරතුරු | මූල්‍ය ප්‍රකාශ | අතිරේක තොරතුරු
බැංකුවේ කාර්යභාරය ▸ මහ බැංකුව කළමනාකරණය කිරීම

## තොරතුරු දැනගැනීමේ අයිතිය සහ විනිවිදභාවය

2024 දී ශ්‍රී ලංකා මහ බැංකුව විනිවිදභාවය සඳහා වූ සිය කැපවීම තවදුරටත් ශක්තිමත් කරමින්, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් අයදුම්පත් සඳහා, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාරව, අප්‍රමාදව ප්‍රතිචාර දැක්වීම තුළින්, විවෘත හා වගවීමේ පාලනයක් සඳහා වන සිය කැපවීම විදහා දක්වන ලදි.

**2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 10 වන වගන්තියට අනුකූලව ඉදිරිපත් කරනු ලබන 2024 වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ වාර්ෂික වාර්තාව**

| | | |
|---|---|---|
| 01 | 2024 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබුණු මුළු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 180 |
| 02 | 2024 වසර තුළ දී ලැබුණු මුළු තොරතුරු ඉල්ලීම් ගණනින් තොරතුරු සපයන ලද ඉල්ලීම් සංඛ්‍යාව | 139 |
| 03 | 2024 වසර තුළ දී මුළු තොරතුරු ඉල්ලීම් ගණනින් තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව | 19 |
| 04 | වෙනත් පොදු අධිකාරීන් වෙත යොමු කරන ලද මුළු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව (ඉල්ලීම් 9ක් සඳහා තොරතුරුවලින් කොටසක් සපයන ලදි) | 24 |
| 05 | 2024 වසර තුළ දී ලැබුණු හා 2024.12.31 දිනය වන විට තොරතුරු සැකසෙමින් පැවතුණු ඉල්ලීම් සංඛ්‍යාව | 7 |
| 06 | තොරතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වර්ෂය තුළ එකතු කරන ලද ගාස්තු | ගාස්තු එකතු කර නැත |
| 07 | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව | 5 |
| 08 | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව | 14 |
| 09 | තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද අභියාචනා සංඛ්‍යාව | 14 |
| 10 | තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවේ නියමය පරිදි තොරතුරු ලබා දී ඇති වාර සංඛ්‍යාව | 1 |
| 11 | නම් කළ නිලධාරී වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සංඛ්‍යාව | 32 |
| 12 | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්තා නඩත්තු කිරීම, කළමනාකරණය කිරීම සහ විනාශ කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන පරිචයන් | සටහන 01 |
| 13 | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 8 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ කටයුතු | අදාළ නොවේ |

**සටහන 01**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 7 වන වගන්තියේ විධිවිධාන සහ ශ්‍රී ලංකාවේ අදාළ වන වෙනත් ලිඛිත නීති අනුව, වාර්තා හා තොරතුරු පවත්වාගෙන යයි.

# පාලනය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් කටයුතු ඵලදායී ව අධීක්ෂණය සහ කළමනාකරණය කරන බව සහතික කිරීම සඳහා නිර්මාණය කර ඇති මහ බැංකුවේ පාලන ව්‍යුහය ප්‍රධාන මණ්ඩල දෙකකින් සමන්විතය. ඒවා නම් පාලක මණ්ඩලය සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය යි.

- **පාලක මණ්ඩලය:** මෙම මණ්ඩලය මූල්‍ය ප්‍රතිපත්තිය හැර, මහ බැංකුවෙහි කටයුතු පරිපාලනය සහ කළමනාකරණය අධීක්ෂණය කිරීම සම්බන්ධ ව වගකිව යුතුය. මහ බැංකු අධිපතිවරයා පාලක මණ්ඩලයේ සභාපතිවරයා වන අතර, ආර්ථික විද්‍යාව, බැංකුකරණය, මූල්‍ය, ගිණුම්කරණය සහ විගණනය, නීතිය හෝ අවදානම් කළමනාකරණය යන අංශවල විශේෂඥතාවක් සහිත තවත් සාමාජිකයින් හය දෙනෙකුගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ. බැංකුවේ පොදු ප්‍රතිපත්ති හා සම්බන්ධ තීරණ ගැනීම, බලගැන්වීමේ පියවර ක්‍රියාත්මක කිරීම, ආයතනික උපායමාර්ගය සකස් කිරීම, අයවැය සහ මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම, සහ අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ කටයුතු අධීක්ෂණය කිරීම පාලක මණ්ඩලය විසින් සිදු කරයි.
- **මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය:** මෙම මණ්ඩලයට පැවරී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ දේශීය මිල ස්ථායීතාව අත්කර ගැනීම සහ පවත්වාගෙන යාම සඳහා නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සමඟ සමපාත වන නම්‍යශීලී විනිමය අනුපාත ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමයි. එහි සභාපතිවරයා ලෙස මහ බැංකු අධිපති කටයුතු කරන අතර පාලක මණ්ඩලයේ සාමාජිකයින් සහ ආර්ථික විද්‍යාව හෝ මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥයින් දෙදෙනෙක් ද මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සඳහා වගකිව යුතු නියෝජ්‍ය අධිපතිවරු දෙදෙනා ද සාමාජිකයින් ලෙස කටයුතු කරති.

මෙම පාලන ව්‍යුහයන් සහ ක්‍රියාවලීන් මගින් මහ බැංකුවේ විනිවිදභාවය සහ වගවීම මනා අධීක්ෂණයකින් යුතුව ක්‍රියාත්මක වන බව සහතික කරන අතර ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහ අඛණ්ඩතාව පවත්වා ගනු ලබයි.

මහ බැංකුවෙහි පාලන ව්‍යුහය සඳහා රූප සටහන 20 බලන්න.

## පාලක සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින්

මුදල් අමාත්‍යවරයාගේ නිර්දේශය මත සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 අ වගන්තිය අනුව ස්ථාපිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ඇතිව ජනාධිපතිවරයා විසින් මහ බැංකු අධිපතිවරයා සහ පාලක සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින් පත් කරනු ලැබේ. අධිපතිවරයා හැර අනෙකුත් සාමාජිකයින් විධායක නොවන නිලධාරින් වේ. අධිපතිවරයාගේ සහ පත් කරන ලද සාමාජිකයින්ගේ ධූර කාලය වසර හයක් වන අතර, තවත් එක් ධූර කාලයක් සඳහා නැවත පත් කිරීමට ද හැකිය. එසේ වුව ද සමස්ත ධූර කාලය වසර දොළහක් නොඉක්මවිය යුතුය.

**පාලක මණ්ඩල සාමාජිකයින්**

ආචාර්ය නන්දලාල් වීරසිංහ – අධිපති (සභාපති)
නිහාල් ෆොන්සේකා මහතා – පත්කළ සාමාජික
ආචාර්ය රවීන්ද්‍ර රත්නායක – පත්කළ සාමාජික
අනුෂ්ක විජේසිංහ මහතා – පත්කළ සාමාජික
විශ්වනාදමූර්ති ගෝවින්දසාමි මහතා – පත්කළ සාමාජික
රජීව් අමරසූරිය මහතා – පත්කළ සාමාජික
මනිල් ජයසිංහ මහතා – පත්කළ සාමාජික

පාලක මණ්ඩලයෙහි ලේකම් – දිමුතු සමරතුංග මිය

**මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින්**

ආචාර්ය නන්දලාල් වීරසිංහ – අධිපති (සභාපති)
නිහාල් ෆොන්සේකා මහතා – පත්කළ සාමාජික
ආචාර්ය රවීන්ද්‍ර රත්නායක – පත්කළ සාමාජික
අනුෂ්ක විජේසිංහ මහතා – පත්කළ සාමාජික
විශ්වනාදමූර්ති ගෝවින්දසාමි මහතා – පත්කළ සාමාජික
ආචාර්ය දුෂ්නි වීරකෝන් මිය – පත්කළ සාමාජිකාව
මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ – පත්කළ සාමාජික
රජීව් අමරසූරිය මහතා – පත්කළ සාමාජික
මනිල් ජයසිංහ මහතා – පත්කළ සාමාජික
නෙළුමනි දවුලගල මිය – ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති
ජානක කරුණාරත්න මහතා – නියෝජ්‍ය අධිපති

මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයෙහි ලේකම් – ආචාර්ය චන්ද්‍රනාත් අමරසේකර

## පාලක සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩල රැස්වීම්

පාලක මණ්ඩලය අවම වශයෙන් මසකට වරක්වත් රැස්වන අතර මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය අවම වශයෙන් සෑම මාස දෙකකට වරක්වත් රැස් වේ. සභාපතිවරයාට රැස්වීම් කැඳවීමේ බලය ඇති අතර ඊට අමතරව ඕනෑම සාමාජිකයින් දෙදෙනෙකුගේ ලිඛිත ඉල්ලීමක් මත ද රැස්වීමක් කැඳවිය හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ව්‍යුහගත කර ඇත්තේ ගැඹුරු සාකච්ඡා සහ තීරණ ගැනීම සහතික කිරීම සඳහා ය. පාලක මණ්ඩල රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයින් පස් දෙනෙකු වන අතර, මුදල් ප්‍රතිපත්ති මණ්ඩල රැස්වීමක් සඳහා ගණපූරණය අධිපතිවරයා හෝ මිල ස්ථායීතාව භාර නියෝජ්‍ය අධිපතිවරයා ඇතුළුව සාමාජිකයින් අටදෙනෙකු වේ.

මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සෑම රැස්වීමකින්ම පසුව මෑත කාලීන ආර්ථික ප්‍රවණතා සහ ආර්ථික දැක්ම පිළිබඳ පැහැදිලි කිරීම් සමඟ මුදල් ප්‍රතිපත්ති තීරණ ප්‍රකාශයට පත් කරයි.



**මහ බැංකුවේ පාලන ව්‍යුහය** (2024 දෙසැම්බර් 31 දිනට)

රූප සටහන 20




ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉදිරි කාර්යාලය, මැද කාර්යාලය සහ පසු කාර්යාලයේ මෙහෙයුම් කටයුතු මධ්‍යගත කිරීම සඳහා 2025 වර්ෂයේ අප්‍රේල් 02 වන දින සිට ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව ආයෝජන කළමණාකරන දෙපාර්තමේන්තුව ලෙස ද, දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව ලෙස ද නම් කරන ලදී.

## මණ්ඩල කමිටු

මහ බැංකුවේ මෙහෙයුම් අධීක්ෂණය සහ කළමනාකරණය සඳහා සහාය වීමට විශේෂයෙන් පිහිටු වන ලද මණ්ඩල කමිටු කිහිපයක් ඇත. අI. විගණන කමිටුව

II. මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව
III. මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටුව
IV. ආචාරධර්ම කමිටුව

විස්තර සඳහා 55 පිටුව බලන්න.

## ප්‍රතිපත්ති හා සම්බන්ධිත අනෙකුත් කමිටු

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති ආශ්‍රිතව කමිටු දෙකක් පිහිටුවා ඇති අතර, ඒවායේ කාර්යය වන්නේ ආර්ථික තත්ත්වයන් ඇගයීම, මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව තහවුරු කිරීම සඳහා එහි අවදානම් තක්සේරු කිරීමයි.

I. මුදල් ප්‍රතිපත්ති කමිටුව
II. මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව

## අධීක්ෂණ/කළමනාකරණ කමිටු

පාලක මණ්ඩලය සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් සකසන ලද ප්‍රතිපත්ති දෛනික ව මෙහෙයවීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම ඒ සඳහා පත් කර ඇති අධීක්ෂණ/කළමනාකරණ කමිටු සතු වේ. මෙම කමිටුවලට ඇතුළත් වන්නේ,

i. ආයතනික කළමනාකරණ කමිටුව
ii. වෙළඳපොළ මෙහෙයුම් කමිටුව
iii. තොරතුරු තාක්ෂණ අධීක්ෂණ කමිටුව
iv. ආයෝජන අධීක්ෂණ කමිටු
    අ. අභ්‍යන්තර ආයෝජන අධීක්ෂණ කමිටුව
    ආ. ජාත්‍යන්තර සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුව
    ඇ. සේවක අර්ථසාධක අරමුදල් ආයෝජන අධීක්ෂණ කමිටුව
v. මූල්‍ය නොවන අවදානම් කළමණාකරන කමිටුව
vi. මානව ප්‍රාග්ධන කමිටුව

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නායකත්වය දරනු ලබන ජාතික මට්ටමේ කමිටු

ජාතික මට්ටමින්, ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රධාන කමිටු කිහිපයකට සම්බන්ධ වේ.

i. මූල්‍ය අංශ අධීක්ෂණ කමිටුව
ii. අර්බුද කළමනාකරණ කමිටුව
iii. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික කවුන්සිලය
iv. ජාතික ගෙවීම් කවුන්සිලය
v. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුව

## චර්යාධර්ම සංග්‍රහය

මහ බැංකුවේ චර්යාධර්ම සංග්‍රහය මගින් පාලක සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින්ගේ, මණ්ඩල කමිටු සාමාජිකයින්ගේ සහ සේවකයින්ගේ අතර සදාචාරාත්මක හැසිරීම් සහ සුපිළිපන්බව තහවුරු කරයි. මෙම සංග්‍රහය මගින්, වෘත්තීය ක්‍රියාකාරකම්වල දී පවත්වා ගත යුතු ඉහළ ආචාරධර්ම ප්‍රමිතීන්, බැඳියාවන් අතර ගැටුම් හෙළිදරව් කිරීම සහ රාජකාරියට අදාළ පොදු නොවන තොරතුරුවල දැඩි රහස්‍යභාවය සුරැකීම තහවුරු කර තිබේ. සේවක හැසිරීම සඳහා වෘත්තීයභාවය සහ වගවීම, මූලික වන අතර, අදාළ සියලුම නීති, රෙගුලාසි සහ අභ්‍යන්තර ප්‍රතිපත්ති සමඟ දැඩි අනුකූලතාවකින් යුතුව කටයුතු කිරීමේ අවශ්‍යතාව ද දක්වා ඇත.

## දෘෂ්කෘත නිවේදන ප්‍රතිපත්තිය (whistleblowing policy)

මහ බැංකුවේ දෘෂ්කෘත නිවේදන ප්‍රතිපත්තිය හරහා සදාචාර විරෝධී හැසිරීම්, විෂමාචාර හෝ බැංකුවේ අවශ්‍යතාවලට අහිතකර හෝ අගතිගාමී හෝ වැරදි ක්‍රියාවක් වාර්තා කිරීමට එහි සේවකයින්ට ආරක්ෂිත සහ රහසිගත ඉඩ ප්‍රස්ථාවක් ලබා දී ඇති අතර එය විනිවිදභාවය සහ වගවීමේ පරිසරය තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට හේතු වී ඇත. යහපත් විශ්වාසයකින් ක්‍රියා කරන හා රහස් හෙළි කරන්නන්, පළිගැනීම් සහ වෙනස්කම්වලට භාජනය වීමෙන් වළක්වන අතර සියලුම වාර්තා කිරීම් අවශ්‍ය පරිදි සුදුසු පිළියම් ක්‍රියාමාර්ග සමඟ පරිපූර්ණ සහ අපක්ෂපාතී පරීක්ෂණයකට යටත් වේ.

## දත්ත පාලනය

මහ බැංකුව එහි දත්තවල සංවේදීතාව සැලකිල්ලට ගෙන එහි තොරතුරුවල විශ්වසනීයත්වය සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා දත්ත පාලනයට ප්‍රමුඛත්වය දෙයි. ඒ අනුව නිවැරදි, සම්පූර්ණ සහ විශ්වසනීය දත්ත එහි දත්ත කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් වේ. එසේම දත්ත ආරක්ෂණ නීතිවලට අනුකූල වීම අත්‍යවශ්‍ය වන අතර, දත්ත ආරක්ෂණ පියවර තුළින් දත්ත සඳහා අනවසර ප්‍රවේශය, උල්ලංඝනය කිරීම් මෙන්ම වෙනත් තර්ජනවලින් දත්ත ආරක්ෂා කිරීමට ද කටයුතු යොදා ඇත. අදාළ තනතුරු සහ ඒවායේ වගකීම් මත පදනම්ව සංවේදී තොරතුරු වෙත ප්‍රවේශ වීම දැඩි ලෙස නියාමනය කරනු ලැබේ.





## මණ්ඩල කමිටු

### විගණන කමිටුව

**අරමුණ සහ කාර්යය**

අභ්‍යන්තර විගණන කාර්යය, මූල්‍ය ප්‍රකාශවල සුපිළිපන්බව, බාහිර විගණකවරුන් හා සම්බන්ධව කටයුතු කිරීම, දෘෂ්කෘත නිවේදන, අනුකූලතාව සහ වංචා වාර්තා කිරීම ඇතුළු අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ඇගයීම සහ අවදානම් කළමනාකරණ රාමුව තුළ අභ්‍යන්තර විගණන අනුකූලතාව සහ එහි කාර්යක්ෂමතාව නිරීක්ෂණය කිරීමෙන් මහ බැංකුවේ විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම.

**සාමාජිකයින්**

මනිල් ජයසිංහ මහතා – සභාපති
ආචාර්ය රවීන්ද්‍ර රත්නායක – සාමාජික
රජීව් අමරසූරිය මහතා – සාමාජික

### මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව

**අරමුණ සහ කාර්යය**

පාලක මණ්ඩලයේ විධිමත් බලය පැවරීමක් තුළින් මහ බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණය සහ අනුකූලතා කාර්යයන් අධීක්ෂණය කරනු ලබන අතර අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව අරමුණු කර ගත් පුළුල් උපායමාර්ග සහ ප්‍රතිපත්ති සැකසීමේ වගකීම දරයි.

**සාමාජිකයින්**

නිහාල් ෆොන්සේකා මහතා – සභාපති
ට්‍රෙවින් ජයසේකර මහතා – ස්වාධීන බාහිර සාමාජික
රනෙල් විජේසිංහ මහතා – ස්වාධීන බාහිර සාමාජික

### ආචාරධර්ම කමිටුව

**අරමුණ සහ කාර්යය**

මහ බැංකු පනතෙහි 133 වගන්තිය සමඟ කියවිය යුතු 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 8(1) වගන්තිය සහ මහ බැංකු පනතෙහි 22 සහ 25 වගන්ති ප්‍රකාරව සේවකයින් (2018 ජුනි 30 සිට ක්‍රියාත්මක වේ), පාලක මණ්ඩලය, මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින් සහ මණ්ඩල කමිටු සාමාජිකයින් (2019 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වේ) සඳහා වන චර්යාධර්ම සංග්‍රහයට අදාළ කරුණු අධීක්ෂණය කිරීම.

**සාමාජිකයින්**

අනුෂ්ක විජේසිංහ මහතා – සභාපති
ආචාර්ය රවීන්ද්‍ර රත්නායක – සාමාජික
අමල් කබ්රාල් මහතා – බාහිර සාමාජික

### මණ්ඩල මානව සම්පත් හා වැටුප් කමිටුව

**අරමුණ සහ කාර්යය**

මහ බැංකුවෙහි වැටුප් රාමුව, උපායමාර්ගික අරමුණුවලට අනුගතව වගවන, ඉහළ දක්ෂතා සහිත පුද්ගලයින් ආකර්ෂණය කර රඳවා ගැනීමට හා අභිප්‍රේරණය කිරීමට හැකිවන ලෙස සකස් කිරීම සඳහා පාලක මණ්ඩලයට උපදෙස් දීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

**සාමාජිකයින්**

නිහාල් ෆොන්සේකා මහතා – සභාපති
විශ්වනාදමූර්ති ගෝවින්දසාමි මහතා – සාමාජික
මනිල් ජයසිංහ මහතා – සාමාජික
චන්ද්‍රසිරි හේවාපත්තිනි මහතා – බාහිර සාමාජික

## ප්‍රතිපත්ති හා සම්බන්ධිත අනෙකුත් කමිටු

### මුදල් ප්‍රතිපත්ති කමිටුව

**අරමුණ සහ කාර්යය**

සාර්ව ආර්ථික ප්‍රවණතාවන් සහ පුරෝකථන ඇගයීම, සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයට අනාගත මුදල් ප්‍රතිපත්ති දිශානතීන් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.

**සාමාජිකයින්**

අධිපති – සභාපති

සියලුම නියෝජ්‍ය අධිපතිවරු, සහකාර අධිපතිවරු සහ ආර්ථික පර්යේෂණ, සංඛ්‍යාන, දේශීය මෙහෙයුම් කටයුතු, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු යන දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂවරුන් සහ මුදල් සහ බැංකු කටයුතු අධීක්ෂණය කරන ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ

### මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව

**අරමුණ සහ කාර්යය**

සාමාජිකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් ඉස්මතු කරන ලද මූල්‍ය පද්ධති ස්ථායීතාව හා සම්බන්ධ කරුණු ඇගයීම, මූල්‍ය පද්ධතියේ අවදානම අධීක්ෂණය කිරීම සහ සාමාජිකයින් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු මත පදනම් ව එම අවදානම් අවම කිරීම සඳහා පාලක මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම.

**සාමාජිකයින්**

මූල්‍ය පද්ධති ස්ථායීතාව භාර නියෝජ්‍ය අධිපතිවරයා – සභාපති

සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති භාර නියෝජ්‍ය අධිපතිවරයා, මිල ස්ථායීතාව භාර නියෝජ්‍ය අධිපතිවරයා, සහ සාර්ව විචක්ෂණතා අධ්‍යයන, බැංකු අධීක්ෂණ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ, ආර්ථික පර්යේෂණ, තැන්පතු රක්ෂණ හා නිරාකරණ, ගෙවීම් සහ පියවීම් යන දෙපාර්තමේන්තු භාර සහකාර අධිපතිවරුන් හා එම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## අධීක්ෂණ/කළමනාකරණ කමිටු

### ආයතනික කළමනාකරණ කමිටුව

**අරමුණ සහ කාර්යය**

බැංකුවේ මානව ප්‍රාග්ධනය අතර ඇති තරගකාරිත්වයට සහ මානව ප්‍රාග්ධනයේ තිරසාරභාවයට බලපෑමක් ඇති කරන ප්‍රතිපත්තිමය යෝජනා පිළිබඳව පාලක මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ ආයතනික සහාය කාර්යයන් සම්බන්ධ ගැටලු විසඳීම.

**සාමාජිකයින්**

අධිපති – සභාපති

සියලුම නියෝජ්‍ය අධිපතිවරු සහ සහකාර අධිපතිවරු

### වෙළඳපොළ මෙහෙයුම් කමිටුව

**අරමුණ සහ කාර්යය**

මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව බරිත සාමාන්‍ය ඒක්ෂණ පොළී අනුපාතික අපේක්ෂිත මට්ටමේ පවත්වා ගැනීම සඳහා අන්තර් බැංකු මුදල් වෙළඳපොළේ රුපියල් ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ විනිමය අනුපාත කළමනාකරණ මෙහෙයුම් සම්බන්ධයෙන් දිනය තුළ ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධ නිර්දේශ කිරීම.

**සාමාජිකයින්**

ආර්ථික ප්‍රතිපත්ති පර්ෂදය භාර නියෝජ්‍ය අධිපති - සභාපති

ආර්ථික පර්යේෂණ, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු, සහ දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තු භාර සහකාර අධිපතිවරුන් සහ එම දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්





### තොරතුරු තාක්ෂණ අධීක්ෂණ කමිටුව

**අරමුණ සහ කාර්යය**

බැංකුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රාමුව ආයතනික ඉලක්ක සමග අනුගතව උපායමාර්ගික දිශානතියකට යොමු කිරීම හා ඒ සමග පෙළගැස්වීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම.

**සාමාජිකයින්**

තොරතුරු තාක්ෂණ භාර නියෝජ්‍ය අධිපති – සභාපති

සියලුම සහකාර අධිපතිවරු

### මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව

**අරමුණ සහ කාර්යය**

මෙහෙයුම් සහ අනුකූලතා අවදානම් කළමනාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව තුළ ඵලදායි අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සහ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති, ක්‍රියාමාර්ග සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව එය ක්‍රියාත්මක වන බව අධීක්ෂණය කිරීම.

**සාමාජිකයින්**

පාලක මණ්ඩලය විසින් පත් කරනු ලබන නියෝජ්‍ය අධිපති – සභාපති

නියෝජ්‍ය අධිපතිවරු සහ සහකාර අධිපතිවරු, ප්‍රධාන අවදානම් නිලධාරි සහ ප්‍රධාන අනුකූලතා නිලධාරි

නිරීක්ෂකයින්: ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරි සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක

### ආයෝජන අධීක්ෂණ කමිටු

**අරමුණ සහ කාර්යය**

පුළුල් ආයෝජන තීරණ ගැනීමේ දී ආයෝජන මාර්ගෝපදේශවලට අනුකූල වීම තහවුරු කිරීම, ආයෝජන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීමට සහ සමාලෝචනය කිරීමට අවශ්‍ය තොරතුරු සැපයීම, පාලක මණ්ඩලයේ උපායමාර්ගික තීරණ මෙහෙයුම් නියෝග බවට පරිවර්තනය කිරීම, අරමුදල් කළමනාකරණ දෙපාර්තමේන්තු විසින් සිදු කරනු ලබන ආයෝජන කටයුතු අධීක්ෂණය කිරීම, නව ණය නිකුත් කරන්නන්/ප්‍රතිපාර්ශ්වයන් අනුමත කිරීම, ආයෝජන කාර්යසාධනය, අවදානම සහ අනුකූලතා අධීක්ෂණය, විශේෂයෙන් නොවැළැක්විය හැකි අවස්ථාවන්හි දී ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සඳහා අවශ්‍ය වෙනස්කම් නිර්දේශ කිරීම.

**සාමාජිකයින්**

අදාළ දෙපාර්තමේන්තු භාර නියෝජ්‍ය අධිපති – සභාපති

ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනවල දක්වා ඇති පරිදි අදාළ දෙපාර්තමේන්තු අධීක්ෂණය කරන සහකාර අධිපති

නිරීක්ෂකයින්: අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ප්‍රධාන අවදානම් නිලධාරි

### මානව ප්‍රාග්ධන කමිටුව

**අරමුණ සහ කාර්යය**

බැංකුවේ මානව ප්‍රාග්ධන අවශ්‍යතා ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා උපායමාර්ගික දිශානතිය පෙන්වීම සහ ඒ කෙරෙහි අවධානය යොමු කිරීම.

**සාමාජිකයින්**

මානව සම්පත් භාර නියෝජ්‍ය අධිපති – සභාපති

මානව සම්පත් භාර සහකාර අධිපති, ප්‍රධාන මානව සම්පත් නිලධාරියා, මානව සම්පත්, බැංකු විදු පියෙස, ප්‍රතිපත්ති සමාලෝචන සහ අධීක්ෂණ, කාර්ය මණ්ඩල සේවා කළමනාකරණය, අවදානම් කළමනාකරණය සහ අනුකූලතා, ලේකම් යන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහ අදාළ සහකාර අධිපතිවරුන් විසින් පත් කරන ලද නිත්‍ය නොවන සාමාජිකයින් හතර දෙනෙකු

නිරීක්ෂකයින්: ප්‍රධාන අනුකූලතා නිලධාරි සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක

# පාලක මණ්ඩල හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින්







**නන්දලාල් වීරසිංහ**
අධිපති/ප්‍රධාන විධායක නිලධාරි

ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය,
ඔස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය
ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය,
ඔස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී උපාධිය, කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
සභාපති - පාලක මණ්ඩලය
සභාපති - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම
පිළිබඳ පනත යටතේ නම් කරන ලද නිලධාරී - ශ්‍රී ලංකා මහ බැංකුව



**රවීන්ද්‍ර රත්නායක**

ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය, ලා ට්‍රෝබ් විශ්ව විද්‍යාලය, ඔස්ට්‍රේලියාව

ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

ආර්ථික විද්‍යාව පිළිබඳ කලාවේදී ගෞරව උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
සාමාජික - විගණන කමිටුව
සාමාජික - ආචාරධර්ම කමිටුව



**විශ්වනාදමූර්ති ගෝවින්දසාමි**

විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ශ්‍රාස්ත්‍රපති සහ විද්‍යාවේදි උපාධිය, හාර්වර්ඩ් විශ්ව විද්‍යාලය, එක්සත් ජනපදය

ජ්‍යෙෂ්ඨ සාමාජික, සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
සාමාජික - මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටුව



**නිහාල් ෆොන්සේකා**

විද්‍යාවේදී උපාධිය, ලංකා විශ්ව විද්‍යාලය, කොළඹ, ශ්‍රී ලංකාව
ජ්‍යෙෂ්ඨ සාමාජික, බැංකුකරුවන්ගේ වරලත් ආයතනය,
එක්සත් රාජධානිය
ගරු සාමාජික, සුරැකුම්පත් සහ ආයෝජන පිළිබඳ වරලත් ආයතනය,
එක්සත් රාජධානිය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
සභාපති - මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව
සභාපති - මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටුව



**අනුෂ්ක විජේසිංහ**

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ලීඩ්ස් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය
ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, යුනිවර්සිටි කොලේජ්, ලන්ඩන්, එක්සත් රාජධානිය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
සභාපති - ආචාරධර්ම කමිටුව



**රජීව් අමරසූරිය**

නීතිවේදී ගෞරව උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ

ජ්‍යෙෂ්ඨ සාමාජික, වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනය, එක්සත් රාජධානිය

ජ්‍යෙෂ්ඨ සාමාජික, සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
සාමාජික - විගණන කමිටුව



මෙහෙයුම් තොරතුරු  මූල්‍ය ප්‍රකාශ  අතිරේක තොරතුරු

පාලනය සහ අවදානම් කළමනාකරණය ▸ පාලක මණ්ඩල හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින්



**මනිල් ජයසිංහ**

ජ්‍යෙෂ්ඨ සාමාජික, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

ජ්‍යෙෂ්ඨ සාමාජික, වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනය, එක්සත් රාජධානිය

ජ්‍යෙෂ්ඨ සාමාජික, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනය

සාමාජික, වරලත් රාජ්‍ය මූල්‍ය හා ගණකාධිකරණ ආයතනය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
සභාපති - විගණන කමිටුව
සාමාජික - මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටුව



**දුෂ්නි වීරකෝන්**

ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය, මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදි උපාධිය, බෙල්ෆාස්ට්හි රැජින විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය



**ප්‍රියංග දුනුසිංහ**

ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යනාංශය,
කොළඹ විශ්ව විද්‍යාලය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය



**නෙළුමනී දවුලගල**
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති

මූල්‍ය හා ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය,
එසෙක්ස් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය
ව්‍යාපාර පරිපාලන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
ජ්‍යෙෂ්ඨ සාමාජික, වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය,
එක්සත් රාජධානිය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත
යටතේ තොරතුරු නිලධාරි – ශ්‍රී ලංකා මහ බැංකුව



**ජානක කරුණාරත්න**
නියෝජ්‍ය අධිපති

මූල්‍ය පිළිබඳ වාණිජ ශාස්ත්‍රපති උපාධිය, නිව් සවුත් වේල්ස් විශ්ව විද්‍යාලය, ඔස්ට්‍රේලියාව
ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ
විද්‍යාවේදී උපාධිය (භෞතික විද්‍යාව), කොළඹ විශ්ව විද්‍යාලය
ජ්‍යෙෂ්ඨ සාමාජික, වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනය,
එක්සත් රාජධානිය
වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරී
සාමාජික, වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය

පාලනය සහ අවදානම් කළමනාකරණය

# ප්‍රධාන නිලධාරීන්

➔ ආයතනික කළමනාකාරිත්වය




(1) නන්දලාල් වීරසිංහ, අධිපති (2) නෙළුමනී දවුලගල, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති
(5) චාමින්ද බණ්ඩාර, සහකාර අධිපති (6) චන්ද්‍රනාත් අමරසේකර, සහකාර අධිපති
(8) පී කේ ජී හරිස්චන්ද්‍ර, සහකාර අධිපති (ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මුදා හැර ඇත)

(3) ජානක කරුණාරත්න, නියෝජ්‍ය අධිපති (4) සිරිකුමාර කුඩාගම, සහකාර අධිපති
(7) අනුරාධා දිල්රුක්ෂිණී, සහකාර අධිපති
(9) දිමුතු සමරතුංග, සහකාර අධිපති (10) එනෝකා මොහොට්ටි, සහකාර අධිපති (11) රුවනි ගුණසේකර, සහකාර අධිපති

## අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානීන් (2024 දෙසැම්බර් 31 වන දිනට)



**සාලිය ගුණතිලක**
අතිරේක අධ්‍යක්ෂ, ආරක්ෂක සේවා



**මනීෂා විමලසූරිය**
අතිරේක අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්



**සුනන්ද ඔබේසේකර**
අතිරේක අධ්‍යක්ෂ, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු



**සුරේකා කැටවල**
අතිරේක අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ



**ප්‍රියංකා වීරසේකර**
අතිරේක ප්‍රධාන ගණකාධිකාරී



**එරන්දි වීරසිංහ**
අතිරේක අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ



**මල්කාන්ති වරකාගොඩ**
අතිරේක අධ්‍යක්ෂ, මානව සම්පත්



**උදයන්ති තෙන්නකෝන්**
අතිරේක අධ්‍යක්ෂ, දේශීය මෙහෙයුම් කටයුතු



**ලසන්තා සිරිවර්ධන**
අතිරේක අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල



**චන්ද්‍රිකා රාජපක්ෂ**
අතිරේක අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල



**ඉඳුනිල් ඒකනායක**
අතිරේක අධ්‍යක්ෂ, සංඛ්‍යාන



**ඩිල්හාන් ද සිල්වා**
අතිරේක අධිකාරී, ව්‍යවහාර මුදල්



**ලසිත පත්බේරිය**
අතිරේක අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ



**ලංකාපති ශ්‍රීධරන්**
අතිරේක අධ්‍යක්ෂ, සාර්ව විචක්ෂණතා අධ්‍යයන



**අයේෂ් ආරියසිංහ**
අතිරේක අධ්‍යක්ෂ, මූල්‍ය බුද්ධි ඒකකය



**චතුර ගමගේ**
අතිරේක අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ



**සිසිර ජයසේකර**
අතිරේක අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ





# විගණන කමිටු වාර්තාව

> විගණන කමිටුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය වෙත පාලනය, අවදානම් කළමනාකරණය, අනුකූලතාව, අභ්‍යන්තර පාලන පරිසරය සහ මූල්‍ය වාර්තාකරණයේ ඵලදායිතාව සම්බන්ධ ක්‍රමවත් සහ පද්ධතිමය අධීක්ෂණයක්, උපදෙස් සහ මඟපෙන්වීමක් සපයයි. තවද, කමිටුව විසින් අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සමාලෝචනය කරනු ලබයි.

## 1. ශ්‍රී ලංකා මහ බැංකු පනත නීතිගත කිරීමත් සමඟ විගණන කමිටුව ප්‍රතිස්ථාපනය කිරීම

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 103 වගන්තිය ප්‍රකාරව විගණන කමිටුව නැවත ස්ථාපනය කරන ලදි.

පනතේ 103 (4) වගන්තියට අනුව විගණන කමිටුවේ බලතල, කාර්යභාරය සහ කාර්යයන් යටතට (අ) අභ්‍යන්තර විගණන කාර්ය අධීක්ෂණය කිරීම (ආ) ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් නිකුත් කරන ලද නිරීක්ෂණ සහ නිර්දේශයන් සමඟ ඇති අනුකූලතාව පරීක්ෂා කිරීම (ඇ) එම විගණන නිරීක්ෂණයන් සම්බන්ධයෙන් විගණකවරුන් සමඟ සාකච්ඡා කිරීම හා (ඈ) විගණකවරුන් සමඟ වාර්ෂික මූල්‍ය වාර්තා සමාලෝචනය කිරීම ඇතුළත් වේ. පනතේ 103 (6) වගන්තියට අනුව පාලක මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණන අධිකාරි පත්‍රය මගින් කමිටුවේ සංයුතිය හා බලතල, කාර්යභාරය සහ කාර්යයන් නිර්වචනය කර ඇත. මෙම නීතිමය පසුබිම ජාත්‍යන්තර යහ පරිචයන් සමඟ ගැලපෙන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනය, අවදානම් කළමනාකරණය, අනුකූලතාව හා මූල්‍ය වගවීම ශක්තිමත් කිරීම සඳහා කමිටුවේ මෙහෙයුම්වල ස්වාධීනත්වය, වගවීම සහ විනිවිදභාවය තහවුරු කරයි.

ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය 2024 පෙබරවාරි 21 දින පැවති රැස්වීම් අංක 06/2024 දී පාලක මණ්ඩලයේ පත්කළ සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුත් නව විගණන කමිටුව පත් කරන ලදි.

මනිල් ජයසිංහ මහතා – සභාපති

ආචාර්ය රවීන්ද්‍ර රත්නායක – සාමාජික

රජීව් අමරසූරිය මහතා – සාමාජික

පාලක මණ්ඩලයේ ලේකම් විගණන කමිටුවේ ලේකම්වරයා වන අතර, ප්‍රධාන අභ්‍යන්තර විගණක, කමිටුවේ සහකාර ලේකම් ධූරය දරයි. විගණකාධිපතිගේ නියෝජිතයකු සියලුම විගණන කමිටු රැස්වීම්වල දී නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගි වේ.

### කමිටු සාමාජිකයින් හා රැස්වීම් සඳහා සහභාගිවීම්

| | සහභාගිවීම සඳහා සුදුසුකම්ලත්/සහභාගි වූ |
|---|---|
| මනිල් ජයසිංහ මහතා – සභාපති | 15/15 |
| ආචාර්ය රවීන්ද්‍ර රත්නායක – සාමාජික | 15/15 |
| රජීව් අමරසූරිය මහතා – සාමාජික | 15/15 |

## 2. විගණන අධිකාරි පත්‍රය

අන්තර්ජාතික යහ පරිචයන්ට සහ පාලන ප්‍රමිතීන්ට අනුකූලව, කමිටුවේ මෙහෙයුම්වල ඵලදායිතාව තහවුරු කරමින්, විගණන අධිකාරි පත්‍රය, විගණන කමිටුවේ සංයුතිය, අධිකාරිය, බලතල, කාර්යභාරය, සහ කාර්යයන් නිර්වචනය කරයි. විගණන අධිකාරි පත්‍රය බැංකුවේ මෙහෙයුම්වල පාලනය, අනුකූලතාව, අවදානම කළමනාකරණය, අභ්‍යන්තර පාලන පරිසරිය, සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ ස්වාධීන අධීක්ෂණයක් සඳහා අවශ්‍ය ක්‍රමවත් පද්ධතිමය රාමුවක් සපයයි.

ඒ අනුව, පාලක මණ්ඩලය විසින් 2024 ඔක්තෝබර් 10 දින පැවති එහි රැස්වීම් අංක 27/2024හි දී නව විගණන අධිකාරි පත්‍රය අනුමත කරන ලදි. ඒ දක්වා පෙර පැවති මුදල් මණ්ඩල උපදේශක කමිටු රාමුවට අනුව විගණන කමිටුව කටයුතු කරන ලදි.

එහි නිශ්චිත කාර්යභාරය සම්පූර්ණ කිරීමේ දී, ඵලදායී විගණන කාර්යයක් සඳහා අවශ්‍ය තොරතුරු, දත්ත, කළමනාකාරිත්වය සහ විගණන වාර්තා වෙත ඇති නිර්බාධි ප්‍රවේශය එමගින් බල ගන්වා ඇත. තවද අවශ්‍ය අවස්ථාවන්හි දී ස්වාධීන හා බාහිර උපදේශකයන්ගේ සේවය ලබා ගැනීමට අවශ්‍ය අධිකාරිය විගණන අධිකාරි පත්‍රය මගින් කමිටුවට සලසා ඇත්තේ එහි වෛශයික තීරණ ගැනීම සහ දැනුම්වත් පාලනය සඳහා පහසුකම් සැලසීමටය.

විගණන ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදු කිරීම, විගණන නිරීක්ෂණය සඳහා කාලෝචිත ලෙස ක්‍රියාමාර්ග ගැනීම, මතුවෙමින් ඇති අවදානම් සඳහා පාලන ව්‍යුහයන්ගේ ඇති ඔරොත්තු දීම තහවුරු කරමින් පාලක මණ්ඩලය, අභ්‍යන්තර හා බාහිර විගණකයින් සහ අනෙකුත් තහවුරු කරන්නන් අතර ඉතා වැදගත් සම්බන්ධීකාරකයක් ලෙස විගණන කමිටුව කටයුතු කරයි. මූල්‍ය ප්‍රකාශ අදාළ ගිණුම්කරණ හා නියාමන ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ ආකාරයට ඉදිරිපත් කර ඇති බව තහවුරු කිරිමේ දී, මූල්‍ය වාර්තාකරණය හා සබැඳි කරුණු සම්බන්ධයෙන් කළමනාකාරිත්වය සහ බාහිර විගණකයින් අතර වන එකඟ නොවීම් සම්බන්ධයෙන් මැදිහත්වීමට ද කමිටුව බල ගන්වා ඇත. තවද, විගණන අධිකාරි පත්‍රය මඟින් කමිටුවේ ක්‍රියාකාරීත්වය සඳහා පටිපාටිමය මඟපෙන්වීම සඳහා එහි සංයුතිය, ගණපූර්ණය, රැස්වීම් සංඛ්‍යාව, න්‍යාය පත්‍රය සැකසීම වාර්තාකරණයේ අවශ්‍යතා සහ කාර්යසාධන ඇගයීම පිළිබඳ ඇතුළත් කර ඇත.

කමිටුව එහි ක්‍රියාකාරකම්, ප්‍රධාන තීරණ හා නිර්දේශයන් මෙන්ම විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කළමනාකාරිත්ව ප්‍රගතිය පිළිබඳ සාරාංශගත වාර්තාවක් සෑම සිව්මසකට වරක් පාලක මණ්ඩලය වෙත ලබා දිය යුතුය. මෙම ක්‍රමවත් වාර්තාකරණය මහ බැංකුවේ මූල්‍යමය සහ මෙහෙයුම්වල ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා වන අඛණ්ඩ අධීක්ෂණය හා වගවීම තහවුරු කරයි.

විගණන අධිකාරි පත්‍රය තුළ පැහැදිලිව කාර්යභාරය, වගකීම්, සහ අධිකාරිය නිර්වචනය කිරිම තුළින් මූල්‍ය වාර්තාකරණයේ සුපිළිපන්බව, අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීම, අනුකූලතාව හා අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ඵලදායි ලෙස ක්‍රියාත්මක වීම තහවුරු කිරීම ශක්තිමත් කරයි. ශ්‍රී ලංකා මහ බැංකු පාලනයේ මූලිකාංගයක් ලෙස, මූල්‍ය ස්ථාවරත්වය, නියාමන අනුකූලතාව සහ ආයතනයේ මෙහෙයුම් පිළිබඳ මහජන විශ්වාසය ප්‍රවර්ධනය කිරීම එමඟින් සිදු වේ.

## 3. 2024 වර්ෂය තුළ සිදු කළ කාර්යයන්

### 3.1 අභ්‍යන්තර විගණන කාර්යය සහ අනෙකුත් තහවුරු කිරීම්

#### 3.1.1 අභ්‍යන්තර විගණනය

විගණන කමිටුව විසින් වසර තුළ දී පහත සමාලෝචන සිදුකරන ලදී.

i. අවදානම් පදනම් කරගත් 2025 වර්ෂය සඳහා වන වාර්ෂික විගණන සැලැස්ම

ii. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කළ විගණනවල ප්‍රගතිය

iii. ක්‍රියාවලි හිමිකරුවන් වෙත ලබා දුන් විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය

iv. 2023 සිදු කරන ලද බාහිර තත්ත්ව තක්සේරු සමාලෝචනයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය

v. 2024 වර්ෂයේ අවදානම් පදනම් කරගත් වාර්ෂික විගණන සැලැස්මේ ප්‍රගතිය

vi. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ 2025 වසර සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම

vii. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ 2025 වසර සඳහා වන අයවැය ඇස්තමේන්තුව

viii. අභ්‍යන්තර විගණන කාර්යය පිළිබඳ 2023 වසර සඳහා වන අඛණ්ඩ අධීක්ෂණ වාර්තා සහ

ix. අභ්‍යන්තර විගණනය පිළිබඳ සේවාදායක ප්‍රතිපෝෂණ සමීක්ෂණයේ ප්‍රතිඵල.

#### 3.1.2 මූල්‍ය ප්‍රකාශ හා බාහිර විගණනය

i. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ විගණනයට අදාළව විගණකාධිපතිවරයා විසින් පත්කරන ලද සුදුසුකම් ලත් විගණකගේ අතුරු කළමනාකාරිත්ව ලිපිය, අවසන් කළමනාකාරිත්ව ලිපිය සහ ඒ සඳහා වූ කළමනාකාරිත්වයේ ප්‍රතිචාර.

ii. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ

iii. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශ

iv. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ වාර්තාව

v. ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාම අරමුදල් හයේ (06) 2. 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ

vi. බාහිර විගණකගේ 2024 විගණන ප්‍රගතිය හා 2025 වසර සඳහා වන විගණන සැලසුම.

vii. ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු සහ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සඳහා වන විගණකාධිපතිවරයාගේ කෙටුම්පත් වාර්තාව.

#### 3.1.3 කමිටුව විසින් වසර තුළ දී සිදු කරන ලද අනෙකුත් කාර්යයන්

i. ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණන අධිකාරි පත්‍රය සමාලෝචනය කොට නිර්දේශ කිරීම.

ii. විගණන කමිටුව විසින් බැංකුවේ දෙපාර්තමේන්තු, කමිටු සහ බැංකුවේ කළමනාකාරිත්වය වෙත ලබා දුන් නිර්දේශවල ක්‍රියාකාරිත්වය සමාලෝචනය කිරීම.

iii. බැංකුව ප්‍රමුඛ දෙපාර්තමේන්තුවලට අදාළ අවදානම් සහ එම දෙපාර්තමේන්තුවල කටයුතු කමිටුවේ කාර්යය වපසරිය තුළ ද යන්න තහවුරු කර ගැනිම සඳහා එම දෙපාර්තමේන්තු සහ කළමනාකාරිත්වය සමඟ අදහස් හා සංවාද සැසි පවත්වන ලදී.

iv. පාලක මණ්ඩලය වෙත ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කමිටුවේ අදහස් ලබා දෙන ලදී.





# අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව

## අවදානම් කළමනාකරණය

විවිධ අවදානම්වලින් හෙබි පරිසරයක ක්‍රියාත්මක වන බැවින් බැංකුවේ පරමාර්ථවලට, එහි මූල්‍ය ස්ථාවරත්වයට හෝ කීර්තිනාමයට බලපෑම් කළ හැකි මූල්‍ය සහ මූල්‍ය නොවන අවදානම් අවම කිරීම සඳහා සැකසූ පරිපූර්ණ අවදානම් කළමනාකරණ රාමුවක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කිරීම අනිවාර්යය වේ. සිය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති නියමයන් මත පදනම්ව මහ බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව පිළියෙල කර ඇති අතර, එය ගෝලීය ප්‍රමිතීන් හා මනා පරිචයන්ට සමගාමී වෙයි. සියලු මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය හා සුදුසු අවදානම් අවම කිරීමේ උපායමාර්ග ගැනීමට මෙමඟින් ඉඩ ප්‍රස්ථා ලබා දෙන අතර විවිධ පාර්ශ්වකරුවන් තමන්ට අදාළ ව්‍යුහගත අවදානම්වල හිමිකාරීත්වය දැරීමත් ඒවාට වගවීමත් තහවුරු කරයි.

### මෙහෙයුම් අවදානම

දෙපාර්තමේන්තු අවදානම් ලේඛන සඳහා වන පහසුකම් සැලසීම සම්පූර්ණ කිරීමෙන් පසු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෝලීය මනා පරිචයන්ට අනුකූලව පහළ සිට ඉහළ සඳහා වන අවදානම් පාලන ස්වයං තක්සේරුව (Risk Control Self Assesment) හඳුන්වා දී ඇති අතර එමඟින් පළමු පෙළ අවදානම් හිමිකරුවන් ලෙස කටයුතු කරන දෙපාර්තමේන්තුවලට අවදානම් පාලන ස්වයං තක්සේරුව හරහා ඔවුන්ගේ අවදානම් තක්සේරුවට වරින් වර සිදු වන වෙනස්කම් දැනුම් දිය හැකිය.

අවදානම් රුචි රාමුවේ (Risk Appetite Framework) ප්‍රගතිය සැලකීමේ දී ආයතනික කළමනාකරණ මට්ටමින් පත් කරන ලද අවදානම් හිමිකරුවන්ගේ මැදිහත්වීමෙන්, මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව විසින් ප්‍රධාන අවදානම් දර්ශක (Key Risk Indicators) පිළියෙල කර අනුමත කරන ලදී. අවදානම් රුචි රාමුව (RAF) සඳහා වන පරිකල්පනය කරන ලද සන්ධිස්ථාන බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සහාය ඇතිව සාක්ෂාත් කර ගන්නා ලදී.

සිද්ධි වාර්තාකරණ පද්ධතිය මඟින් වාර්තා කරන ලද සිද්ධීන්ට අදාළව ගනු ලැබූ ක්‍රියාමාර්ගවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට හැකි වූ අතර, අවදානම් ප්‍රවණතා හඳුනා ගැනීමට සහ අවදානම් අවම කිරීමේ උපායමාර්ග පැහැදුමට සහය වන මධ්‍යගත අවදානම් තොරතුරු ගබඩාවක් ගොඩ නැගීමට සහය විය.

### ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් පාලන රාමුව

රූප සටහන 21



## මූල්‍ය අවදානම්

ශ්‍රී ලංකා මහ බැංකුවේ ශේෂ පත්‍රය විශේෂයෙන් මූල්‍ය මෙහෙයුම් සහ ජාත්‍යන්තර සංචිත කළමනාකරණය හා බැඳුණු පොලී අනුපාතික සහ විනිමය අනුපාත උච්චාවචනයන්ගෙන් මතු වන මූල්‍ය අවදානම්වලට මුහුණ දෙයි.

මෑත කාලයේ දී, මහ බැංකුවල ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සහ එහි ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්වය ආරක්ෂා කර ගැනීම සඳහා මූල්‍ය අවදානම් කළමනාකරණය ගෝලීය වශයෙන් පිළිගෙන ඇත. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහය සහිතව, ගෝලීය යහ පරිචයන්ට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශේෂ පත්‍ර අවදානම් තක්සේරු රාමුවක් වර්ධනය කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ශේෂ පත්‍රයේ මූල්‍ය ආතතීන් ව්‍යුහාත්මක ඇගයීමකට ලක් කිරීමට මාවත විවෘත කරමින් 2024 දෙවන කාර්තුවේ සිට ශේෂ පත්‍රයේ ආතති පරීක්ෂා කිරීම (Stress Testing) ආරම්භ කරන ලදි.

2024 වසරේ දී, ජාත්‍යන්තර සංචිත, අභ්‍යන්තර ආයෝජන අරමුදල් සහ සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය කිරීම සඳහා පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයෝජන ප්‍රතිපත්ති (Investment Policy Statement – IPS), උපායමාර්ගික වත්කම් විභජනයන් (Strategic Asset Allocation – SAA) සහ ආයෝජන මාර්ගෝපදේශයන්ට (Investment Guidelines – IGs) සම්පූර්ණයෙන්ම අනුකූල වන බව තහවුරු කරන ලදි. මෙම අරමුදල්වල මූල්‍ය අවදානම් නිතිපතා තක්සේරු කර අදාළ ආයෝජන අධීක්ෂණ කමිටු, මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව සහ පාලක මණ්ඩලය වෙත වාර්තා කරන ලදි.

## අනුකූලතාව

සිය අනුකූලතා මට්ටම සහ අවදානම් පාලන රාමුව ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව විසින් ස්වාධීන අනුකූලතා ඒකකයක් 2024 ඔක්තෝබර් 04 දින පිහිටුවන ලදි. එම ඒකකය මහ බැංකුවේ ආයතනික අවදානම් කළමනාකරණ රාමුව සමග ඒකාබද්ධව දෙවන පෙළ අවදානම් කළමනාකරණයේ ප්‍රධාන අංශයක් ලෙස ක්‍රියාත්මක වේ. එහි මූලික කාර්යය වන්නේ ආයතනය තුළ අනුකූලතා සංස්කෘතිය ශක්තිමත් කරමින් දේශීය නීති රෙගුලාසි සහ ජාත්‍යන්තර අනුකූලතා ප්‍රමිතීන් සමග අනුගත වීම ප්‍රවර්ධනය කිරීමයි.

පළමු පෙළ අනුකූලතා හිමිකරුවන් ලෙස මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු ඒවාට අදාළ පාලන ව්‍යුහය තුළ අනුකූලතා අවදානම් හඳුනාගැනීම, අවම කිරීම සහ වාර්තා කිරීම සඳහා මූලික වගකීම දරයි. මෙම ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අනුකූලතා ඒකකය විසින් අවදානම් පාලන රාමුව හරහා සමස්ත ආයතනයේ අනුකූලතා මට්ටම් ඇගයීමට ලක් කර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අධීක්ෂණය කරමින් සමස්ත වගවීම ශක්තිමත් කරනු ලබයි. සෑම කාර්තුවකම ප්‍රතිචාර දැක්විය යුතු අනුකූලතා ඇගයීම් ප්‍රශ්නාවලිය හරහා හඳුනාගනු ලබන සැලකිය යුතු අනුකූලතා ගැටලු මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව හරහා මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කරන අතර ඉතා තීරණාත්මක අනුකූලතා ගැටලු සම්බන්ධයෙන් ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉහළ කළමනාකරණය වෙත යොමු කෙරේ.

සිය අවදානම් කළමනාකරණ ව්‍යුහය තවදුරටත් බලගන්වමින් මහ බැංකුවේ 'ඔබේ ගනුදෙනුකරු හඳුනා ගන්න' (Know Your Customer) සහ 'ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්‍යෝගය' (Customer Due Diligence) යන අවශ්‍යතාවයන්ට අනුකූලව, සංචිත කළමනාකරණ කටයුතුවලට සම්බන්ධ සියලුම විදේශීය ප්‍රතිපාර්ශ්වයන්ගේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ දැඩි අනුකූලතාව සහතික කිරීම සඳහා මහ බැංකුව විසින් කටයුතු කරනු ලබයි. මුදල් විශුද්ධිකරණ වාර්තාකරණ නිලධාරියා ලෙස ද කටයුතු කරනු ලබන ප්‍රධාන අනුකූලතා නිලධාරියා වෙත මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමට අදාළ අවදානම් වාර්තාකරණය සහ අධික්ෂණය කිරීමේ කාර්යය පවරා ඇත. මෙයට මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සහ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත වැනි ප්‍රධාන නීති සම්පාදන ලියවිලිවල අනුකූලතාව සහතික කිරීම ඇතුළත් වේ.



# අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය මහ බැංකුවේ පාලනය, අවදානම් කළමනාකරණය සහ පාලන ක්‍රියාවලිය ඇගයීම සහ වැඩිදියුණු කිරීම සඳහා විනයවත් සහ පද්ධතිමය ප්‍රවේශයක් ගෙන එමින්, බැංකුවේ වටිනාකම් වැඩිදියුණු සහ ආරක්ෂා කිරීමට සහ බැංකුවේ අරමුණු ළඟා කර ගැනීමට සහය වීමට අවදානම් පදනම් කරගත් සහ වෛශයික තහවුරුවක්, උපදෙස් සහ දැක්මක් ලබා දෙයි.

අවදානම් කළමනාකරණ රාමුවේ තෙවැනි පෙළ ලෙස කටයුතු කරමින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, බැංකුවේ වටිනාකම් එකතු කිරීමට සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය ස්වාධීන වෛශයික තහවුරුව සහ නිර්දේශ ලබා දෙයි.

ප්‍රධාන අභ්‍යන්තර විගණක, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස කාර්යයමය වශයෙන් විගණන කමිටුව හරහා පාලක මණ්ඩලයට ද, පරිපාලනමය වශයෙන් අධිපතිවරයාට ද වාර්තා කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහාය.

අභ්‍යන්තර විගණන කාර්යයේ වැදගත්කම ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 102 වගන්තියෙන් මනාව පිළිගෙන, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ පත් කිරීම්, ඉවත් කිරීම් ද එහි නිර්වචනය කර ඇති අතර, තොරතුරු වෙත ඇති නිර්බාධී ප්‍රවේශය තහවුරු කරමින් අභ්‍යන්තර විගණන කාර්යයේ පාලනය, ස්වාධීනත්වය සහ වෛශයික බව එමඟින් වැඩිදියුණු කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 102(5) වගන්තියට අනුව පාලක මණ්ඩලය විසින් අනුමත කළ, ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණන අධිකාරී පත්‍රය තුළ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ කාර්යය සහ වගකීම නිර්වචනය කර ඇති අතර, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වය, ආයතන ව්‍යුහය තුළ ස්ථානගත වීම සහ වාර්තාකරණයේ වගකීම් ද ඇතුළත් කාර්ය වපසරිය, අධිකාරී නියමයන් සහ කොන්දේසි සඳහන්ව ඇත.

## විගණන සැලැස්ම සැකසීම, විගණනයන් සිදු කිරීම, විගණන ප්‍රගතිය වාර්තා කිරීම සහ විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පසුවිපරම් කිරීම

2024 වසර තුළ දී අවදානම් පදනම් කරගත් වාර්ෂික විගණන සැලැස්ම, බැංකුවේ වැදගත් කාර්යයන් ආවරණය තහවුරු වන පරිදි ක්‍රියාත්මක කළ අතර, ප්‍රතිපත්තීන්, අනුකූලතාව, මෙහෙයුම්, තොරතුරු ආරක්‍ෂණය, නෛතික සහ අනෙකුත් අදාළ අවදානම් ආවරණය කරමින්, බැංකුවේ උපායමාර්ගික අරමුණු ළඟා කර ගැනීම සඳහා එහි මෙහෙයුම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දෙන ලදි. වසර තුළ දී සිදුකරන ලද විගණනයන්වල ප්‍රගතිය සහ විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විගණන කමිටුවට වාර්තා කරන ලදි. තව ද විගණන කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය ද කාලච්ඡේදමය වශයෙන් සමාලෝචනය කර විගණන කමිටුවට වාර්තා කරන ලදි.

වාර්ෂික විගණන සැලැස්ම බැංකුවේ ආයතනික උපායමාර්ග සහ අරමුණුවලට අනුකූල වීම. ශක්තිමත් කරමින් එය සකස් කිරීමට වටිනාකම් දාම ප්‍රවේශයක් හඳුන්වා දෙන ලදි. ඒ අනුව නව, අංග සම්පූර්ණ අවදානම් තක්සේරුකරණ ක්‍රමවේදයක් අනුගමනය කරමින් සහ බැංකුවේ විගණනය කළ හැකි සියලුම කාර්යයන් යාවත්කාලීන කරමින් 2025 වර්ෂය සඳහා වන වාර්ෂික විගණන සැලැස්ම සකස් කරන ලදි. තවද, කාලපරිච්ඡේදය තුළ දී අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර විගණන කාර්‍යයන් අතර අවදානම් සම්බන්ධ තොරතුරු හුවමාරු කර ගැනීම ශක්තිමත් කරන ලදි.

## තත්ත්ව තහවුරු කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන

ඵලදායීතාව සහ මනා පරිචයන්ට අනුගත වීම තහවුරු කිරීම උදෙසා බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයන් ගෝලීයව පිළිගත් ප්‍රමිතීන්ට සහ රාමුවලට අනුගතව සිදු කරනු ලබයි. අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ (Institute of Interal Auditors) අන්තර්ජාතික වෘත්තිමය පරිචය රාමුව අනුගමනය කිරීම මගින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව එහි මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ඉහළ තත්ත්වයේ වෘත්තීමයභාවයකින්, සුපිළිපන්නතාවකින් සහ සදාචාරාත්මකව ක්‍රියා කිරීම අඛණ්ඩව සිදු කරන ලදි.

අන්තර්ජාතික වෘත්තීය පරිචය රාමුව සමඟ වන අනුකූලතාව තහවුරු කරනු වස් අභ්‍යන්තර තක්සේරුකරණයන් 2024 වර්ෂයේ විගණන කටයුතුවලට අදාළව සිදු කරනු ලැබූ අතර, ඊට අඛණ්ඩ කාර්ය සාධන අධීක්‍ෂණය සහ කාලච්ඡේදමය ස්වයං තක්සේරුකරණය ඇතුළත් විය. තව ද 2023 වසරේ සිදු කරන ලද බාහිර තත්ත්ව තක්සේරුකරණයේ නිර්දේශවලට අනුගත වන ලදි.

# 02.

# මූල්‍ය ප්‍රකාශ


74 මූල්‍ය සමාලෝචනය

77 විගණකාධිපති වාර්තාව

81 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

83 ආදායම් ප්‍රකාශය

84 අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

85 ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය

86 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

88 මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

# මූල්‍ය සමාලෝචනය

## මූල්‍ය කාර්යසාධනය හා වගවීම

ශ්‍රී ලංකා මහ බැංකුව, වෙනත් කරුණු අතර, මුදල් ප්‍රතිපත්ති, මූල්‍ය පද්ධති අධීක්ෂණය, ගෙවීම් පද්ධති නියාමනය, විදේශ විනිමය මෙහෙයුම් සහ මුදල් නිකුත් කිරීම සඳහා ජාතියේ අධිකාරිය ලෙස සේවය කරයි. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන මගින් මහ බැංකුව ස්ථාපිත කර පාලනය කෙරේ. මෙම පනත මගින් ප්‍රධාන අරමුණ ලෙස දේශීය මිල ස්ථායිතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වාගෙන ගැනීම නියම කර ඇති අතර, අනෙක් අරමුණ ලෙස මූල්‍ය පද්ධති ස්ථායිතාව සුරක්ෂිත කිරීම හඳුනාගෙන ඇත. බැංකුවේ සාර්ථකත්වය මනිනු ලබන්නේ මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී එහි ප්‍රතිපත්ති සහ ක්‍රියාවන්හි සඵලතාව මත මිස එහි ලාභදායිතාව මත නොවේ. මෙම වෙනස මහ බැංකුව වෙනත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනවලින් වෙන් කරයි. සිය මූල්‍ය මෙහෙයුම් හරහා ලාභ ඉපැයීමේ සුවිශේෂී හැකියාව බැංකුව සතු බැවින්, ලාභදායිත්වය කෙරෙහි පමණක් අවධානය යොමු කිරීම එහි අරමුණුවලට බාධා පමුණුවන ක්‍රියාවන් දිරිමත් කළ හැකිය. මෙම පසුබිම තුළ, මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මගින් එහි ප්‍රතිපත්ති සහ මෙහෙයුම් අතරින් විශේෂයෙන් මුදල් ප්‍රතිපත්තිය, විනිමය අනුපාත ප්‍රතිපත්තිය සහ මුදල් නිකුත් කිරීම ක්‍රියාත්මක කිරීමේ දී, අතුරු ඵලයක් ලෙස දරන ලද ලාභ හෝ අලාභ පිළිබිඹු කරයි. මෙම ප්‍රකාශයන්හි ඉදිරිපත් කර ඇති පරිදි බැංකුවේ මූල්‍ය කාර්යසාධනය අර්ථ නිරූපණය කිරීම සහ අවබෝධ කරගැනීම සඳහා මෙම සන්දර්භය ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි XVI වන කොටස (වගන්ති 92 සිට 99 දක්වා) තුළ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශයට පත්කිරීම (වගන්තිය 99) ඇතුළුව මහ බැංකුව සම්බන්ධ මූල්‍ය විධිවිධාන අඩංගු වේ. මහ බැංකු පනතේ 101 වන වගන්තිය ප්‍රකාර, මහ බැංකුවේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු අතර විගණකාධිපතිගේ මතය වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සමග ප්‍රකාශයට පත් කළ යුතුය. තවද මහ බැංකු පනතෙහි 103 (4) (ඈ) වගන්තිය අනුව, විගණකවරුන් සමඟ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීමට විගණන කමිටුවට භාර දී ඇත.

ඒ අනුව ඉදිරිපත් කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි විධිවිධානවලට අනුකූලව සකස් කර, සමාලෝචනය කර විගණනය කර ඇත.

## මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

**වත්කම් සංයුතිය**

වර්ධිත සමස්ත කාර්යසාධනයක් හමුවේ, මහ බැංකුවේ මුළු වත්කම් 2024 වසරේදී රු.බි. 333.9කින් අඩු වී ඇත. මෙම පහත වැටීමට මූලික වශයෙන් දේශීය මුදල් වත්කම්වල තියුණු සංකෝචනය හේතු විය. එය වාර්ෂිකව 25.1%කින් හෝ රු.බි. 628.7කින් පහත වැටුණි. කෙසේවෙතත්, විදේශීය මූල්‍ය වත්කම් වාර්ෂිකව 17.3%කින්, එනම් රු.බි. 294.8කින් වර්ධනය වීම මඟින් ඉහත සංකෝචනයේ කොටසක් නිෂ්ප්‍රභා විය.

දේශීය මුදල් වත්කම්වල අඩුවීමට භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල කල්පිරීම විශාල වශයෙන් හේතු වූ අතර, එය හිමිකාරත්වය තුළ රු.බි. 295.4ක පහත වැටීමකට ලක්විය. ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු රු.බි. 307.8කින් පහත වැටුන අතර, ඉන් දේශීය වෙළෙඳපොල ද්‍රවශීලතා තත්ත්වයන්ට ප්‍රතිචාරාත්මකව ගැලපීම් පිලිබිඹු කරයි. ද්‍රවශීලතා සහය පහසුකම් ඇතුළුව වෙනත් ආයතන වෙත ලබාදුන් ණය ද වසර තුළ සිදුකළ ආපසු ගෙවීම් හේතුවෙන් රු.බි. 38.2කින් අඩුවිය.

විදේශීය මූල්‍ය වත්කම්වල වැඩිවීමට ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ විදේශ සංචිත 2023 වසර අවසානයේදී පැවති ඇ.එ.ජ. ඩොලර් බි. 3.5 සිට 2024 වසර අවසානය වන විට ඇ.එ.ජ. ඩොලර් බි. 5.6 දක්වා වැඩිවීම හේතු විය. කෙසේවෙතත්, විදේශීය වත්කම්වල රුපියල් අගයේ වැඩිවීම සිදුවූයේ ප්‍රධාන මුදල්වලට සාපේක්ෂව රුපියලේ අගය ඉහළ යන අවස්ථාවකය. ඇ.එ.ජ. ඩොලරයට එරෙහිව රුපියල 2023 දෙසැම්බර් අවසානයේදී රු. 323.92 සිට 2024 අවසානයට රු. 292.58 දක්වාත්, විශේෂ ගැණුම් හිමිකමට එරෙහිව රුපියල, 2023 අවසානයේදී රු. 437.9894 සිට 2024 අවසානයට රු. 382.3288ක් දක්වාත් අධිප්‍රමාණය වී ඇත.

**මුළු වත්කම් සංයුතිය**

රු.බි.




විදේශීය මූල්‍ය වත්කම් | දේශීය මූල්‍ය වත්කම්

විදේශීය මූල්‍ය නොවන වත්කම් | දේශීය මූල්‍ය නොවන වත්කම්







**බැරකම් සංයුතිය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු බැරකම් රු.බි. 631.2කින් අඩුවූ අතර, එයට ප්‍රධාන වශයෙන් විදේශීය මූල්‍ය බැරකම්වල රු.බි. 786.3ක සැලකියයුතු අඩුවීම හේතු විය. මෙම අඩුවීම, දේශීය මූල්‍ය බැරකම්වල රු.බි. 154.7කින් වැඩිවීමක් මගින් අර්ධ වශයෙන් පියවී ඇත. විදේශීය මූල්‍ය වගකීම්වල අඩුවීම විවිධ සාධකවලින් ඇති වූ අතර, ඒ අතර ඉන්දියානු මහ බැංකුව (RBI) සමග ඇති විශේෂ මුදල් හුවමාරු පහසුකමේ මාසික වාරිකය හා අදාළ පොලී මුදල් ගෙවීම නිසා අඩු වූ රු.බි. 343.2 හා රුපියලට එරෙහිව චීන යුආන් අගයේ 13.9%ක අවප්‍රමාණය වීම නිසා පීපල්ස් බෑන්ක් ඔෆ් චයිනා (PBoC) සමඟ ඇති මුදල් හුවමාරු පහසුකමේ රුපියල් අගය රු.බි. 48.7කින් අඩුවීම හේතුවෙන් අනෙකුත් විදේශීය වගකීම් රු.බි. 48.7කින් අඩුවීම හේතුවෙන් අනෙකුත් විදේශීය වගකීම් රු.බි. 391.9 කින් අඩුවීම ඇතුළත් විය.

රජයේ ණය ආපසු ගෙවීම සඳහා අරමුදල් භාවිතා කිරීම හේතුවෙන් විදේශ මූල්‍ය බැරකම්වල 'වෙනත්' යටතේ වර්ගීකරණය කළ නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් (DST) ගිණුමේ ශේෂය රු.බි. 188.0ක ශුද්ධ අඩුවීමක් වාර්තා විය. මේ සමඟම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) ආශ්‍රිත බැරකම්, ණය ආපසු ගෙවීම සහ විශේෂ ගැණුම් හිමිකම්වල අවප්‍රමාණය හේතුවෙන් රු.බි. 185.7කින් පහත වැටුණි.

කෙසේවෙතත්, සංසරණයේ පවතින මුදල් රු.බි. 172.2කින් ප්‍රසාරණය වීම හේතුවෙන් සහ වාණිජ බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන සමඟ පැවති ශේෂවල රු.බි. 38.5ක වැඩිවීම හේතුවෙන් දේශීය මූල්‍ය බැරකම් රු.බි. 154.7ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. මෙම වැඩිවීම, නිත්‍ය තැන්පතු පහසුකම (SDF) රු.බි. 32.7කින් හා විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම්වල රු.බි. 23.4ක අඩුවීම හේතුවෙන් නිශ්ප්‍රභා විය.

**මුළු බැරකම් සංයුතිය**

රු.බි.




විදේශීය මූල්‍ය බැරකම් | දේශීය මූල්‍ය බැරකම්

අනිකුත් බැරකම්

## මුළු හිමිකරු ප්‍රාග්ධනය

2024 කාර්යසාධනය අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ හිමිකරු ප්‍රාග්ධනය රු.බි. 297.3ක වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරමින් රු.බි. 308.5 දක්වා වැඩි වී ඇති අතර, මේ සඳහා ප්‍රධානම සාධකය ලෙස 2024 වර්ෂයේ ශුද්ධ ලාභය වන රු.බි. 274.8 දැක්විය හැකිය.

ඉහත ශුද්ධ ලාභය ගණනය කිරීමේදී, උපලබ්ධි නොවූ විනිමය සහ මිල ප්‍රත්‍යාගණන සඳහා මහ බැංකු පනතේ 95 වගන්තිය යටතේ අවශ්‍ය කරන ගැළපීම් සිදුකර කර ඇත. තවද, මහ බැංකු පනතේ 94 වගන්තියට අනුකූලව වාර්තාකරන දිනයට රඳවාගත් ඉපයීම්වල ඍණාත්මක තත්ත්වය අවම කිරීමට පොදු සංචිතයෙන් රු.බි. 266.0ක මාරු කිරීම් දායක වී ඇත. තවද, පසුගිය වසරවල නිර්මාණය කරන ලද, භාවිතා නොකළ විශේෂ සංචිත තුළ ඇතුළත් වූ රු.බි. 35.1ක්, 2024 අවසානයේදී රඳවාගත් ඉපයීම්වලට මාරුකිරීම තුළින්, එහි ඍණාත්මක අගය රු.බි. 21.3කට අඩු කිරීමට දායක විය.

මහ බැංකු පනතේ 97 වගන්තිය මගින් මහ බැංකුවේ විගණනය කළ වාර්ෂික මූල්‍ය ප්‍රකාශවලින් සිය වත්කම්වල අගය සිය මුදල්මය බැරකම් සහ ගෙවා නිමි ප්‍රාග්ධනයේ එකතුවට වඩා අඩු බවට පිළිබිඹු කරන්නේ නම්, ප්‍රාග්ධනය යළි අනූන මට්ටමකට රැගෙන ඒමේ අවශ්‍යතාව මතුවිය හැකි බව දක්වා ඇත. මුදල්මය බැරකම්වලට, සංසරණයේ පවතින මුදල් සහ මහ බැංකුවෙහි බලපත්‍රලාභී වාණිජ බැංකු සහ රජයේ ආයතන විසින් දරනු ලබන තැන්පතු ඇතුළත් වේ. ඒ අනුව, 2024 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා, මහ බැංකුවේ වත්කම්, එහි මුදල්මය බැරකම් සහ ගෙවා නිමි ප්‍රාග්ධනය රු.බි. 2,286.8ක යහපත් මට්ටමකින් ඉක්මවා ඇත.

### හිමිකරු ප්‍රාග්ධනයේ සංයුතිය

රු.බි.




### බදුවලට පසු ශුද්ධ ලාභය/(අලාභය)

රු.බි.




### ශුද්ධ විදේශ විනිමය ලාභය/(අලාභය)

රු.බි.




### ආදායම් ප්‍රකාශය

#### ආදායම, වියදම සහ ශුද්ධ ලාභය/(අලාභය)

දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහනේ එක් දින පාඩුව වූ රු.බි. 766.4 මගින් මූලිකවම ඇතිකළ 2023 හි රු.බි. 114.4ක ශුද්ධ අලාභයට සාපේක්ෂව, මහ බැංකුව 2024 දී ඉහත සඳහන් කළ පරිදි රු.බි. 274.8ක ශුද්ධ ලාභයක් වාර්තා කළේය.

විදේශීය පොලී වියදම් රු.බි. 61.1 කින් තවදුරටත් අඩුවීම සහ විදේශීය ආදායමෙහි රු.බි. 24.3ක වැඩිවීම 2024 වසරේ ශුද්ධ ලාභයෙහි වැඩිවීමකට දායක විය. කෙසේවෙතත්, විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය රු.බි. 98.7කින් සහ දේශීය පොලී ආදායම රු.බි. 359.0කින් අඩුවීම, වසර සඳහා ශුද්ධ ලාභය අවම කිරීමට හේතු විය.

2024 වසර තුළ බැංකුවේ මෙම වර්ධිත මූල්‍ය කාර්යසාධනය, වර්ධිත හිමිකරු ප්‍රාග්ධනය සහ සංචිතවලින් එහි ශේෂ පත්‍රය ශක්තිමත් කරන ලද අතර, එය රජය විසින් ප්‍රතිප්‍රාග්ධනනීයකරණය සඳහා අවශ්‍යතාව අඩුකරමින් මූල්‍ය ස්වාධීනත්වය උසස් කරනු ලබයි. ශක්තිමත් ශේෂ පත්‍රයක් මූල්‍ය ප්‍රතිපත්තියේ ඵලදායිත්වය ශක්තිමත් කිරීමට ද සහය වේ.

### බෙදිය හැකි ලාභය

ශ්‍රී ලංකා මහබැංකු පනතේ, 95වන වගන්තිය ප්‍රකාරව, මිල ප්‍රත්‍යාගණනවලින් උද්ගත වන උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන ලැබීම් සහ විනිමය අනුපාතවලින් උද්ගත වන උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන ලැබීම් සහ අලාභ බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභවලින් බැහැර කළ යුතු වේ. 95 (2) වගන්තිය පරිදි, පසුගිය වසරවල වාර්තාකළ සමුච්චිත විනිමය අලාභ රඳවාගත් ඉපයීම්වලට මාරු කර ඇත. මහ බැංකු පනතේ 96 වන වගන්තිය පරිදි මහ බැංකුවේ බෙදාහැරිය හැකි ඉපයීම් තීරණය කෙරේ. 2024 දී මහ බැංකුව රු.බි. 274.8ක ශුද්ධ ලාභයක් උත්පාදනය කරනු ලැබූවද, ඉහත සඳහන් කළ ගැළපීම්වලින් පසු ලද අලාභය රු.බි. 50.6කි. ඒ අනුව, මහ බැංකු පනතෙහි 96 වන වගන්තිය අනුව 2024 වසරේදී බෙදා හැරීම සඳහා කිසිදු ලාභයක් නොතිබුණි.

මූල්‍ය ප්‍රකාශ සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපතිවරයාගේ මතය මින් ඉදිරියට ඉදිරිපත් කර ඇත.





# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/G/CBSL/FA/24/1 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 28 March 2025

ගරු මුදල් අමාත්‍යතුමා,

**ශ්‍රී ලංකා මහ බැංකුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශ

### 1.1 මතය

ශ්‍රී ලංකා මහ බැංකුවේ (බැංකුව) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තියේ සහ 2023 අංක 16 දරණ ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 101 (4) වගන්තයේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදි.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශවලින් 2024 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRS) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. එම ප්‍රමිතීන් යටතේ වූ මාගේ වගකීම්, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ විගණනය පිළිබඳ විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.3 බැංකුවේ 2024 මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් වාර්තාවේ අන්තර්ගත වූ වෙනත් තොරතුරු

2024 මහ බැංකු මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් වාර්තාවේ අන්තර්ගත වන එහෙත් මූල්‍ය ප්‍රකාශ සහ මාගේ විගණන වාර්තාවේ අන්තර්ගත නොවූ තොරතුරු, වෙනත් තොරතුරු ලෙස දක්වා ඇති අතර, මෙම තොරතුරු මා විසින් මෙම විගණන වාර්තාව ලබා දෙන දිනයෙන් පසු දිනකදී මා වෙත ලැබීමට නියමිතය. මෙම වෙනත් තොරතුරු පිළිබඳ වගකීම පාලක මණ්ඩලය සතු වේ.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මාගේ මතය තුළ මෙම වෙනත් තොරතුරු ආවරණය නොවන අතර, ඒ සඳහා කුමන ආකාරයක හෝ තහවුරු කිරීමක් මා විසින් ඉදිරිපත් කරනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේ දී, මට පැවරී ඇති වගකීම වන්නේ අදාළ වෙනත් තොරතුරු ලැබුණු අවස්ථාවකදී, එය කියවා බලා එම වෙනත් තොරතුරු මූල්‍ය ප්‍රකාශ සමඟ හෝ මෙම විගණනය පිළිබඳ මාගේ දැනුවත් වීම සමඟ ප්‍රමාණාත්මකව නොගැලපෙන බව හෝ ප්‍රමාණාත්මකව සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සමන්විත වේ ද යන්න තීරණය කිරීමයි.

මා විසින් බැංකුවේ 2024 මූල්‍ය ප්‍රකාශ හා මෙහෙයුම් වාර්තාව කියවන අවස්ථාවේ දී එහි කිසියම් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අඩංගු වේ නම් ඒවා නිවැරදි කිරීම සඳහා ඒ පිළිබඳව පාලනය කරන පාර්ශවයන් වෙත දැනුම් දීම මා විසින් සිදු කළ යුතුය. එයින් පසු තවදුරටත්, ප්‍රමාණාත්මක, නිවැරදි නොකළ සාවද්‍ය ප්‍රකාශයන් අඩංගු වේ නම්, ඒ පිළිබඳව මා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තිය ප්‍රකාරව ඉදිරියේ දී මවිසින් ගරු පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීමට නියමිත වාර්තාවේ ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ පාලක මණ්ඩලයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම පාලක මණ්ඩලයේ වගකීම වේ.

පාලක මණ්ඩලය විසින් බැංකුව ඈවර කිරීමේ අරමුණින් හෝ බැංකුවේ මෙහෙයුම් කටයුතු අවසන් කිරීමේ අරමුණින් හෝ එලෙස ඈවර කිරීම හෝ මෙහෙයුම් කටයුතු අවසන් කිරීම හැර වෙනත් කිසිඳු යථාර්තවාදී විකල්පයක් නොමැති අවස්ථාවකදී හැර, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම සහ අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අදාළ වන පරිදි අනාවරණය කිරීම ද පාලක මණ්ඩලය සතු වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් කරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.



මෙහෙයුම් තොරතුරු | මූල්‍ය ප්‍රකාශ | අතිරේක තොරතුරු

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.5 මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබා ගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ජාත්‍යන්තර විගණන ප්‍රමිති (ISAs) ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශ පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තිය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයන් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ පාලක මණ්ඩලය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම පාලක මණ්ඩලය යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත බැංකුවේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනයේ දී හඳුනාගත් අනෙකුත් කරුණු අතර සැලසුම් කරන ලද විෂය පථය, විගණනයේ කාලය සහ අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු යම් අඩුපාඩු ඇතුළත් සැලකිය යුතු සොයා ගැනීම් සම්බන්ධයෙන් පාලනය කරන පාර්ශවයන් වෙත මම දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද සියලු ප්‍රමාණාත්මක නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියා මාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් දෑ ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට බැංකුව සම්බන්ධවී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව;

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු සහ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව;

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව;

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

අත්සන් කළේ

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති



මෙහෙයුම් තොරතුරු　මූල්‍ය ප්‍රකාශ　අතිරේක තොරතුරු

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමානයන් | 8 | 1,063,528,275 | 1,198,979,570 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 9 | 672,461,750 | 223,406,791 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 10 | 27,957,163 | 5,775,226 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සම්බන්ධ වත්කම් | 11 | 222,876,069 | 265,339,197 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | 1,986,823,257 | 1,693,500,784 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 12 | 1,748,873,060 | 2,044,347,592 |
| ප්‍රති විකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් | 13 | 26,194,922 | 333,951,940 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | 14 | 46,834 | 2,169,541 |
| බැංකු සඳහා දෙන ලද ණය | 15 | 9,561,430 | 47,795,687 |
| විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 16 | 9,062,661 | 4,507,114 |
| වෙනත් වත්කම් | 17 | 52,777,144 | 42,184,721 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | 1,846,516,051 | 2,474,956,595 |
| **මුළු මූල්‍ය වත්කම්** | | 3,833,339,308 | 4,168,457,379 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | |
| රන් | 18 | 11,629,873 | 10,120,756 |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| තොගය | 19 | 4,839,378 | 5,433,838 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | 20 | 2,294,558 | 1,526,263 |
| දේපල, පිරියත හා උපකරණ | 21 | 23,489,058 | 23,723,256 |
| අස්පෘශ්‍ය වත්කම් | 22 | 515,650 | 689,883 |
| **මුළු මූල්‍ය නොවන වත්කම්** | | 42,768,517 | 41,493,996 |
| **මුළු වත්කම්** | | 3,876,107,825 | 4,209,951,375 |

පිටු අංක 88 සිට 204 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|---|
| **බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 23 | 1,038,618 | 54,113,792 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 10 | 37,196,388 | 48,947,900 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 24 | 781,616,569 | 967,325,212 |
| අනෙකුත් විදේශීය බැරකම් | 25.1 | 868,551,340 | 1,260,445,754 |
| අනිකුත් | 25.2 | 104,975,256 | 248,810,018 |
| මුළු විදේශීය මූල්‍ය බැරකම් | | 1,793,378,171 | 2,579,642,676 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 26 | 180,946,953 | 142,472,582 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 27 | 1,534,996 | 2,073,290 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් හා නිත්‍ය තැන්පතු පහසුකම | 28 | 194,337,033 | 227,035,873 |
| සංසරණයෙහි පවතින මුදල් | 29 | 1,358,722,883 | 1,186,503,181 |
| අනිකුත් ගෙවිය යුතු දෑ | 30 | 30,171,551 | 29,507,806 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 16 | 7,444,769 | 30,902,126 |
| මුළු දේශීය මූල්‍ය බැරකම් | | 1,773,158,185 | 1,618,494,858 |
| මුළු මූල්‍ය බැරකම් | | 3,566,536,356 | 4,198,137,534 |
| **අනිකුත් බැරකම්** | | | |
| විලම්භිත ප්‍රදාන | 31 | 7,168 | 2,475 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 32 | 1,051,139 | 626,310 |
| මුළු අනිකුත් බැරකම් | | 1,058,307 | 628,785 |
| මුළු බැරකම් | | 3,567,594,663 | 4,198,766,319 |
| **හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| ප්‍රාග්ධන අරමුදල් | | 50,000,000 | 50,000,000 |
| අනිකුත් සංචිත | 33 | 279,869,905 | 252,773,117 |
| රඳවාගත් ලාභ | | (21,356,743) | (291,588,061) |
| මුළු හිමිකරු ප්‍රාග්ධනය | | 308,513,162 | 11,185,056 |
| මුළු බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය | | 3,876,107,825 | 4,209,951,375 |

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2025 මාර්තු 21 වැනි දින පාලක මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

**ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ**
අධිපති

**ඩී. එස්. එල්. සිරිමාන්න**
ප්‍රධාන ගණකාධිකාරී

පිටු අංක 88 සිට 204 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.





# ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොලී ආදායම | 35 | 45,935,187 | 18,031,111 |
| උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/(පාඩුව) | 36 | 36,204,396 | 29,165,459 |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය/(පාඩුව) | | 28,410,885 | 39,013,468 |
| විදේශීය මූල්‍ය වත්කම්වලින් මුළු ආදායම | | 110,550,468 | 86,210,038 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | | | |
| පොලී වියදම | 37 | (81,422,985) | (142,515,856) |
| විදේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ ආපසු හැරවුම්/(අයකිරීම්) | 38 | (1,734,322) | (86,696) |
| විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත මුළු වියදම | | (83,157,307) | (142,602,552) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය/(පාඩුව) | | 41,422,028 | 140,077,201 |
| විදේශීය මූල්‍ය ආයෝජන ආදායම | | 68,815,189 | 83,684,687 |
| **ශුද්ධ දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොලී ආදායම | 35 | 219,402,560 | 595,962,421 |
| මිල වෙනස්කම් මත උපලබ්ධි ලාභය/(පාඩුව) | | 18,882,826 | (1,293,472) |
| පොලී වියදම | 37 | (15,093,654) | (21,810,330) |
| දේශීය ණය ප්‍රශස්තකරණයේ බැහැර කිරීම්වල ලාභය/(පාඩුව) | | 4,168,300 | 6,775,702 |
| දේශීය ණය ප්‍රශස්තකරණයේ පළමු දින ලාභය/(පාඩුව) | | – | (766,413,281) |
| දේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ ආපසු හැරවුම්/(අයකිරීම්) | 38 | 4,814 | 396,659 |
| දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ශුද්ධ ආදායම | | 227,364,846 | (186,382,301) |
| අනිකුත් ආදායම් | 39 | 1,457,028 | 1,585,485 |
| අනිකුත් වියදම් | 39.1 | (387,009) | (3,536,359) |
| මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම | | 297,250,054 | (104,648,488) |
| **මෙහෙයුම් වියදම්** | | | |
| සේවක මණ්ඩල වියදම් | 40 | | |
| – වැටුප් සහ වේතන | | (10,517,344) | (7,253,093) |
| – නිශ්චිත දායක සැලසුම් පිරිවැය | | (4,790,845) | 3,949,834 |
| – පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | | 91,918 | (891,177) |
| | | (15,216,271) | (4,194,436) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | (798,226) | (715,321) |
| තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය) | | (3,568,292) | (2,108,575) |
| පරිපාලන සහ අනිකුත් වියදම් | 41 | (2,876,131) | (2,763,994) |
| මුළු මෙහෙයුම් වියදම් | | (22,458,920) | (9,782,326) |
| බදුවලට පෙර ලාභය/(අලාභය) | | 274,791,135 | (114,430,814) |
| බදු | 42 | – | – |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | | 274,791,135 | (114,430,814) |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 88 සිට 204 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

# අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | | 274,791,135 | (114,430,814) |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | | |
| **පසු කාලයකදී ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය වන හෝ විය හැකි අයිතම** | | | |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය/(පාඩුව) | 33 | (37,849) | 1,266,198 |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන රජයේ සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය/(පාඩුව) | 33 | 6,552,700 | 61,897,210 |
| | | 6,514,851 | 63,163,408 |
| **පසු කාලයකදී ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොවන අයිතම** | | | |
| දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය | | – | 4,752,685 |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළ හඳුනාගත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම්(වියදම)/ආදායම | 16 | 17,222,767 | (24,625,742) |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන ස්කන්ධ ආයෝජන මත වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය | 33 | (2,122,707) | 352,408 |
| | | 15,100,060 | (19,520,649) |
| **අනෙකුත් විස්තීරණ ආදායම/(වියදම)** | | 21,614,911 | 43,642,759 |
| **මුළු විස්තීරණ ආදායම/(වියදම)** | | 296,406,045 | (70,788,055) |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 88 සිට 204 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.





# ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | දායක ප්‍රාග්ධනය රු. '000 | අනිකුත් සංචිත රු. '000 | රඳවාගත් ලාභ රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|
| **2023 ජනවාරි 1 දිනට ශේෂය** | 50,000,000 | (191,184,970) | 223,437,822 | 82,252,852 |
| 2022 වසර සඳහා ශ්‍රී. ලං. ම. බැංකුවේ බෙදාහැරිය හැකි ලාභය අතිරික්තය වෙත මාරු කිරීම | – | 235,034,628 | (235,034,628) | – |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය) | – | – | (114,430,814) | (114,430,814) |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | – | 512,228 | (512,228) | – |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | – | – | (24,625,742) | (24,625,742) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය/(අලාභය) මාරු කිරීම (IRR) | – | 140,077,201 | (140,077,201) | – |
| ශ්‍රී.ලං.ම.බැ. අභ්‍යන්තර අරමුදල්වලට මාරු කිරීම් | – | – | (345,219) | (345,219) |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම් | – | 4,752,685 | – | 4,752,685 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ ලාභය | – | 1,266,198 | – | 1,266,198 |
| ශ්‍රී.ලං.ම.බැ. සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | – | – | (51) | (51) |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ රජයේ සුරැකුම්පත්වල වෙළෙඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය | – | 61,897,210 | – | 61,897,210 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ ප්‍රාග්ධන ආයෝජන වල වෙළෙඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය | – | 352,408 | – | 352,408 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ ආයෝජන මත අපේක්ෂිත ණය අලාභ | – | 65,529 | – | 65,529 |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 50,000,000 | 252,773,117 | (291,588,061) | 11,185,056 |
| **2024 ජනවාරි 1 දිනට ශේෂය** | 50,000,000 | 252,773,117 | (291,588,061) | 11,185,056 |
| මහ බැංකු පනතේ 94(2) වගන්තිය පරිදි පොදු සංචිතයේ අරමුදල් රඳවාගත් ලාභවලට මාරු කිරීම | – | (266,061,930) | 266,061,930 | – |
| අනෙකුත් සංචිත වලින් රඳවාගත් ලාභ වෙත මාරු කිරීම් | – | (35,117,739) | 35,117,739 | – |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය) | – | – | 274,791,135 | 274,791,135 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | – | 709,906 | (709,906) | – |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය/(අලාභය) මාරු කිරීම (IRR) | – | 288,036,060 | (288,036,060) | – |
| ශ්‍රී.ලං.ම.බැ. අභ්‍යන්තර අරමුදල්වලට මාරු කිරීම් | – | – | (469,337) | (469,337) |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ ලාභය | – | (37,849) | – | (37,849) |
| ශ්‍රී.ලං.ම.බැ. සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | – | – | (191) | (191) |
| වෙළඳපළ ඇගයීම් සංචිතයට අරමුදල් මාරු කිරීම | – | 33,746,758 | (33,746,758) | – |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ මූල්‍යනය සඳහා වූ සංචිතයට අරමුදල් මාරු කිරීම | – | – | 17,222,767 | 17,222,767 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ රජයේ සුරැකුම්පත්වල වෙළෙඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය | – | 6,552,700 | – | 6,552,700 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ ප්‍රාග්ධන ආයෝජනවල වෙළෙඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය/(අලාභය) | – | (2,122,707) | – | (2,122,707) |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ ආයෝජන මත අපේක්ෂිත ණය අලාභ | – | 1,391,589 | – | 1,391,589 |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 50,000,000 | 279,869,905 | (21,356,743) | 308,513,163 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 88 සිට 204 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

# මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්** | | | |
| ලැබුණු පොලිය – විදේශීය මුදල් | | 32,083,551 | 15,104,897 |
| ලැබුණු පොලිය – දේශීය මුදල් – අනිකුත් | | 2,525,696 | 16,563,680 |
| ලැබුණු පොලිය – ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | | 212,853,272 | 648,857,381 |
| ද්‍රවශීලතා කළමනාකරණය සහ වෙළෙඳ ආදායම් | | 47,293,711 | 37,719,996 |
| උපලබ්ධි වූ විනිමය ලාභය/(අලාභය) | | (23,767,952) | 60,713,515 |
| ලැබුණු අනිකුත් ආදායම් | | 1,453,992 | 1,571,269 |
| | | 272,442,270 | 780,530,738 |
| **වියපැහැදම්** | | | |
| ගෙවන ලද පොලිය – විදේශීය මුදල් | | 84,280,154 | 146,093,995 |
| ගෙවන ලද පොලිය – දේශීය මුදල් | | 12,534,671 | 19,520,364 |
| සේවකයින්ට ගෙවීම් | | 13,830,850 | 11,295,646 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | | 17,047,380 | 50,131,974 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත් | | (307,757,018) | (364,117,279) |
| | | (180,063,963) | (137,075,300) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | 43 | 452,506,233 | 917,606,038 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්** | | | |
| අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම | | (4,298,616) | (3,508,310) |
| අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් ප්‍රාග්ධන අයකරගැනීම් | | 38,295,257 | 2,134 |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ආදායම | | 1,817 | 1,923 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ (අඩුවීම)/වැඩිවීම | | (32,698,840) | (103,511,000) |
| ලැබුණු පොලිය – දේශීය මුදල් – අභ්‍යන්තර අරමුදල් | | 2,855,316 | 2,352,369 |
| | | 4,154,934 | (104,662,885) |
| **වියපැහැදම්** | | | |
| විදේශ මුදල් සුරැකුම්පත්වල ශුද්ධ අඩුවීම | | 466,337,028 | 173,612,101 |
| අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | (9,480,198) | 10,037,550 |
| අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ (වැඩිවීම)/අඩුවීම | | 496,030,356 | (182,850,778) |
| අනිකුත් දේශීය තැන්පතු සහ ගෙවිය යුතු මුදල්වල ශුද්ධ (වැඩිවීම)/අඩුවීම | | 11,225 | (17,173) |
| දේපල, පිරියත හා උපකරණ මිලට ගැනීම් (ප්‍රදානයන් අඩු කිරීමෙන් පසු) | | 82,291 | 430,029 |
| අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනීම | | 307,336 | 6,557 |
| අනෙකුත් ආයතන වෙත ලබා දුන්/(අයකරගත්) ණය හා අත්තිකාරම් | | 70,657 | 19,370,476 |
| | | 953,358,695 | 20,588,762 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | (949,203,761) | (125,251,648) |





දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්** | | | |
| සංසරණ මුදල් නිකුතුව | | (400,604,963) | 469,219,521 |
| සංසරණ මුදල් ආපසු ගැනීම් | | 572,824,663 | (309,283,592) |
| **සංසරණ මුදල් ශුද්ධ නිකුතුව** | | 172,219,700 | 159,935,931 |
| **වියපැහැදම්** | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතු/(ආපසු ගැනීම්) | 44 | (306,067,744) | 80,475,964 |
| බැංකු සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව/(ආපසු ගැනීම්) | 45 | (38,474,372) | 180,573,600 |
| **සංසරණ මුදල් ශුද්ධ නිකුතු/(ආපසු ගැනීම්)** | | (344,542,116) | 261,049,564 |
| **සංසරණ මුදල් ශුද්ධ අඩුවීම** | | 516,761,816 | (101,113,633) |
| **වියපැහැදම්** | | | |
| විදේශීය මුදල් කාලීන බැරකම් ලැබීම්/(ආපසු ගෙවීම්) | | 62,561,507 | 54,502,757 |
| අනිකුත් අරමුදල් සඳහා ගෙවීම | | 190 | 50 |
| විශ්‍රාම අරමුදල සඳහා ගෙවීම | | 9,577,789 | – |
| | | 72,139,486 | 54,502,807 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | 444,622,330 | (155,616,440) |
| මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | (52,075,198) | 636,737,951 |
| මුදල් සහ මුදල් සමානයන් මත විනිමය අනුපාතයන්ගේ බලපෑම | | (26,985,613) | (20,232,670) |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමානයන් | | 742,570,330 | 126,065,050 |
| **දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමානයන්** | 8 | 663,509,519 | 742,570,330 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 88 සිට 204 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

# මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## 1 වාර්තා කිරීමේ ආයතනය සහ ව්‍යවස්ථාපිත පදනම

ශ්‍රී ලංකා මහ බැංකුව ("බැංකුව" හෝ "ශ්‍රී. ලං. ම. බැ.") 1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ස්ථාපිත කරන ලද අතර, ඒ මගින් මහ බැංකුවේ මුදල් මණ්ඩලයට ශ්‍රී. ලං. ම. බැ. පරිපාලනය සහ නියාමනයේ අරමුණ සහ අනෙකුත් අදාළ කරුණු සඳහා අවශ්‍ය බලතල, කාර්යයන්, සහ වගකීම් පවරන ලදී. මුදල් නීති පනත වෙනුවට 2023 අංක 16 දරණ ශ්‍රී ලංකා මහ බැංකු පනත 2023 සැප්තැම්බර් 15 වන දින බලාත්මක කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකු පනත, ශ්‍රී. ලං. ම. බැ. ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය හා නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා මහ බැංකු පනතින් මහ බැංකුවේ පාලක මණ්ඩලය සහ මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති මණ්ඩලය ස්ථාපිත කර ඇත. මහ බැංකුවේ කටයුතුවල පරිපාලනය සහ කළමනාකරණය අධීක්ෂණය කිරීමේ සහ මුදල් ප්‍රතිපත්ති නොවන මහ බැංකුවේ පොදු ප්‍රතිපත්තිය තීරණය කිරීමේ වගකීම පාලන මණ්ඩලයට පැවරී ඇත. මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සකස් කිරීමේ සහ දේශීය මිල ස්ථායීතාව අත්කර ගැනීම සහ පවත්වාගෙන යාම පිණිස, නම්‍යශීලී උද්ධමන ඉලක්ක රාමුව සමග සමපාත වන්නා වූ නම්‍යශීලී විනිමය අනුපාත උපායමාර්ගයක් ක්‍රියාත්මක කිරීමේ වගකීම මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයට පැවරී ඇත.

පාලක මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් මෙම මූල්‍ය ප්‍රකාශනයන්, 2025 මාර්තු 21 දින අනුමත කරන ලදී.

### 1.1 ප්‍රාථමික ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා මහ බැංකු පනත තුළ ශ්‍රී. ලං. ම. බැංකුවේ ස්වාධීනත්වය වර්ධනය කිරිම සඳහා විශේෂ විධිවිධාන ඇති අතර, ඒවායේ අරමුණ වන්නේ බැංකුවේ විනිවිද භාවය සහ වගවීම වැඩිකිරීම සහ ශ්‍රී ලංකාව තුළ අඛණ්ඩ මිල ස්ථායිතාව පවත්වාගෙන යාම සඳහා මූල්‍ය ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරිමත්ය.

ශ්‍රී ලංකා මහ බැංකු පනත පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුලික පරමාර්ථය වන්නේ දේශීය මිල ස්ථායිතාව අත්කර ගැනීම සහ පවත්වාගෙන යාමයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙක් පරමාර්ථය වන්නේ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීමයි. ඉහත සඳහන් බැංකුවේ මුලික සහ අනෙක් පරමාර්ථය හැර, ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය හා ගෙවීම් පද්ධතිය පරිපාලනය, අධීක්ෂණය, නියාමනය සඳහා සහ රජයේ මූල්‍ය නියෝජිතයා ලෙස කටයුතු කිරීමට බැංකුව මූලිකවම වගකීමට බැඳී සිටී.

## 2 ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය

බැංකුව සිදුකරනු ලබන ක්‍රියාකාරකම්වල ප්‍රධාන වශයෙන් ඇතුළත් වනුයේ,

- මුදල් ප්‍රතිපත්ති සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීම සහ කළමානාකරණය
- ශ්‍රී ලංකාවේ නිල ජාත්‍යන්තර සංචිත පවත්වාගෙන යාම සහ ඒ සංචිතවල විචක්ෂණශීලි සහ ඵලදායි කළමනාකරණය සහතික කිරීම.
- ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය හා නියාමනය හා සුරක්ෂිථභාවය, ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව සහතික කිරීම
- මූල්‍ය ආයතන ලියාපදිංචි කිරීම, බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය, අධීක්ෂණය හා නිරාකරණය
- මහ බැංකු පනතේ වගන්ති 7(1) ප්‍රකාරව පනවා ඇති අනෙකුත් කාර්යයන්

ඉහත සඳහන් ප්‍රධාන අරමුණු හා අනෙකුත් අරමුණු සාක්ෂාත් කර ගැනීමට අනුගමනය කරන කටයුතු විදේශ මුදල් හා දේශීය මුදල් කටයුතු ලෙස ප්‍රධාන වශයෙන් වර්ගකෙරේ. එම කටයුතුවලින් ඇති වූ ප්‍රතිඵල ශ්‍රී. ලං. ම. බැංකුවේ මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇත.

### 2.1 විදේශීය මුදල් ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ජනිත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ, විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වු විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳ අරමුණු සඳහා වු අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වර්ගවලින් පවත්වා ගනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ඕස්ට්‍රේලියානු ඩොලර්, යුරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපන් යෙන් සහ නවසීලන්ත ඩොලර්වලින් පවතී.

මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය උපකරණ ප්‍රධාන වශයෙන් සෛවරී සුරැකුම්පත්, ප්‍රතිවිකුණුම් ගනුදෙනු යටතේ රඳවා ගත් සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන සමඟ පවත්නා වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම්වලින් උද්ගත වන්නා වු විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.





### 2.2 දේශීය මුදල් ක්‍රියාකාරකම්

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ:

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම්/ගලාඒම් හිලව් කිරීම මගින් ද්‍රවශීලතා කළමනාකරණය සිදු කරනු ලබයි. මෙම කටයුතු බොහොමයක් දෛනික විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් මගින් සිදුකරනු ලැබේ.

(ii) සංසරණයේ පවතින මුදල් සඳහා වගකීමට සහයවීම සඳහා ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් සමන්විත ආයෝජන කළඹක් බැංකුව පවත්වා ගෙන යනු ලබයි. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළෙඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

### 2.3 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

භාරකාරත්ව සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන අගයන්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංගයන්ට අයත් කොටසක් නොවන බැවින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් කර නොමැත.

## 3 මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ පදනම

### 3.1 අනුකූලතා ප්‍රකාශනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙම මූල්‍ය ප්‍රකාශනයන් ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කර ඇති ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා. මු. වා. ප්‍ර.) ප්‍රකාර පිළියෙල කර ඇත.

### 3.2 සකස් කිරීමේ පදනම

පහත අයිතමයන් හැරුණු කොට මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය මත පදනම්ව පිළියෙල කරනු ලබයි.

- ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ, ලාභ අලාභ සඳහා පවත්වාගෙන යනු ලබන අනෙකුත් මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ලාභ අලාභ හා අනෙකුත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මිණුම් කරන ව්‍යුත්පන්න නොවන මූල්‍ය උපකරණ සාධාරණ අගයට මිණුම් කෙරේ.
- රන්, ආදායම් ප්‍රකාශය තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම.
- ඉඩම් හා ගොඩනැගිලි අත්පත් කර ගැනීමේදී පිරිවැයට මිනුම් කරන නමුත් අනතුරුව ප්‍රත්‍යාගණනය කරනු ලබන වටිනාකමින් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ වෙන්කිරීම් අඩුකරන ලද වටිනාකමට මිණුම් කෙරේ.
- සේවා නියුක්තියන්ගේ නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව, අදාළ නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම වල වත්කම්හි සාධාරණ අගය අඩුකර මිනුම් ගත කිරීම.

### 3.3 වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාළ ආදායම් සහ වියදම් මාර්ග ද විදේශීය මුදල් සහ දේශීය මුදල් මෙහෙයුම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේදී පුළුල් වශයෙන් එක් එක් වර්ගයන් යටතේ ද්‍රවශීලතාවයේ පිළිවෙළට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය සටහන් 2හි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ කටයුතු වලට උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

### 3.4 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, එය බැංකුවේ ක්‍රියාකාරී මුදල් ඒකකයද වේ. ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරන මූල්‍ය තොරතුරු ආසන්න රුපියල් දහසට වටයා ඇත. සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකයන්හි කිසිදු වෙනසක් සිදු වී නොමත.

### 3.5 ප්‍රමාණාත්මකභාවය හා සමාහාරය

එක් එක් සමාන කාණ්ඩයන්හි අයිතම මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරනු ලැබේ. අසමාන ස්වභාවයේ සහ කාර්යයන් හී අයිතම ඒවා වැදගත් නොවේනම් වෙන වෙන ඉදිරිපත් කෙරේ.

### 3.6 හිලව් කිරීම

බැංකුවට හඳුනාගත් ප්‍රමාණ හිලව් කිරිමට නෛතික හිමිකමක් ඇත්නම් සහ ඉන් මූල්‍ය වත්කම ශුද්ධ පදනම මත නිරවුල් කිරිමට හෝ උපලබ්ධි කිරිමට සහ ඒ සමඟම වගකීම නිරවුල් කිරිමට අපේක්ෂා කරන්නේනම් පමණක් මුල්‍ය වත්කම් හා වගකීම් හිලව් කොට ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශවල ඉදිරි පත් කෙරේ.

### 3.7 සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන වසරේ ඉදිරිපත් කිරීමට අනුකූලවීම සඳහා අවශ්‍ය විටක සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලබයි.

## 4 සැලකිය යුතු ගිණුම් විනිශ්චයන් ඇස්තමේන්තු භාවිතය සහ උපකල්පන

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මත, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම්වල හෙළිදරව් කිරීම්වලට බලපාන්නා වූ විනිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ.

මෙම උපකල්පනයන්, ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතතාවය, වත්කම් හා බැරකම්හි ධාරණ අගයන්වලට අනාගත කාලසීමාවල දී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැකිය.

ඇස්තමේන්තු සහ ඒ සඳහා පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුවල සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ. මූල්‍ය ප්‍රකාශවල හඳුනාගෙන ඇති ප්‍රමාණ කෙරෙහි වඩාත් ප්‍රමාණාත්මක බලපෑමක් සහිත ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේදී සිදුකළ විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන් මගින් පැහැදිලි කෙරේ.

### 4.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය

බැංකුව විසින් මූල්‍ය වත්කම් වල දරාගෙන සිටින ව්‍යාපාර ආකෘතිය හා මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි වලින් ඇතිවන මුදල් ප්‍රවාහ, මූලික මුදල හා ඒ මත වන පොලිය පමණක්ද යන්න තක්සේරු කිරීම සඳහා විනිශ්චයන් භාවිතා කරයි.

### 4.2 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තාකළ මූල්‍ය වත්කම් හා බැරකම්වල සාධාරණ අගය සක්‍රීය වෙළඳපොළ තුලින් ලබාගත නොහැකි අවස්ථාවලදී, එම අගයන් ලැබාගානීම සඳහා විවිධ ආකාරයේ ආගණනය කරනු ලබන ගණිතමය අකෘතිවලින් යුතු ශිල්පීය ක්‍රම උපයෝගීකරගෙන ඇත. මෙම ආකෘති තුළට යොදාගන්නා යෙදවුම් හැකි සෑම විටම නිරීක්ෂිත වෙළඳපොල දත්ත මත ලබා ගන්නා අතර, එවැනි දත්ත නොමැති අවස්ථාවන් හිදී විනිශ්චයන් මගින් සාධාරණ අගය ලබා ගනු ලබයි. විනිශ්චයන්ට එළඹීමේදී ද්‍රවශීලතාවය සහ දීර්ඝ කාලීන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල (long dated derviate) වෙනස්වීම වැනි අකෘති වලට යොදාගන්නා යෙදවුම් සැලකිල්ලට ගෙන ඇත

### 4.3 මූල්‍ය වත්කම් හානිකරණය

බැංකුව විසින් මුල්වරට හඳුනාගැනීමෙන් පසු මූල්‍ය වත්කමක ණය අවධානමෙහි සැලකිය යුතු වර්ධනයක් වී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා වන නිර්නායකයන් ස්ථාපිත කිරීමේදී, අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා ඉදිරි දැක්මක් සහිත තොරතුරු ඇතුලත් කිරීමේදී භාවිතා කරන ක්‍රමවේදය තීරණය කිරීමේදී සහ ගෙවීම් පැහැර හැරීමෙන් ඇති වන සත්‍ය අලාභය සහ ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවය තීරණය කිරීමේදී බැංකුව විනිශ්චයන් භාවිතා කරයි.

### 4.4 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයු ගණන අගයුමක් භාවිතයෙන් තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීම වට්ටම් අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම්වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. ආයුගණන ඇගයීමේදී භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 16 හි දක්වේ.

## 5 ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම්

මෙම මූල්‍ය වර්ෂය තුළදී ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව පැවති අතර, යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර මූල්‍ය වර්ෂයේ ඒවා සමඟ අනුකූලව පවතී.

පහත සඳහන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් සඳහා වූ සංශෝධන 2024 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන ගිණුම් කාල සීමාවන්ට අදාළ වන පරිදි වෙනස් වුවද, ඒවා බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි බැංකුව බලාපොරොත්තු නොවේ.

- කෙටි කාලීන සහ දිගුකාලීන ලෙස වත්කම් සහ බැරකම් වර්ගීකරණය කිරීම – IAS 1හි සංශෝධන.
- විකිණීම සහ ආපසු කල්බදු ගැනීම සම්බන්ධ බදු වගකීම – IFRS 16 හි සංශෝධන
- මූල්‍ය පහසුකම් සැපයීම සම්බන්ධ හෙළිදරව් කිරීම – IAS 7 සහ IFRS 7 සංශෝධන

## 6 ප්‍රකාශිත නමුත් වාර්තා කරන දිනට බලසහිත නොවූ ප්‍රමිතීන් මත වූ සංශෝධන සහ නිර්වචනයන්

නව සංශෝධන හා බැඳුනු නව නිර්වචනයන් 2025 ජනවාරි 01 දිනට පසු එළඹෙන වාර්ෂික කාලපරිච්ඡේද වලට බල පැවැත්වෙන අතර ඒවා නියමිත දිනට පෙර යොදා ගැනීමට අවසර ඇත. එසේ වුවද, මෙම මූල්‍ය වාර්තා පිලියෙල කිරීමේ දී බැංකුව විසින් මෙකී සංශෝධිත ප්‍රමිතීන් නියමිත දිනට පෙර අදාල කර නොගන්නා ලදී. තවද පහත දක්වා ඇති සංශෝධිත ප්‍රමිත බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත සැළකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි බැංකුව බලාපොරොත්තු නොවේ.

- මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මිණුම්කරණයට අදාල සංශෝධන – 2026 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාල සීමාවන් සඳහා බලපානු ලබන IFRS 9 සහ IFRS 7 හි සංශෝධන.
- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම – 2027 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාල සීමාවන් සඳහා බලපානු ලබන IFRS 18 හි සංශෝධන.

## 7 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 7.1 විදේශීය මුදල් පරිවර්තනය හා ශේෂයන්

විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතිකයට ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. වාර්තාකරන දිනයට විදේශීය මුදල්වලින් නම්කළ මූල්‍ය වත්කම් සහ බැරකම්, වාර්තාකරන දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාරව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. මුල්‍ය අයිතම මත විදේශ විනිමය පරිවර්තන ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. පරිවර්තන අරමුණ සඳහා, වාර්තා කරන දිනට, ප්‍රධාන ව්‍යවහාර මුදල් සඳහා පහත දක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

| මුදල | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| ඕස්ට්‍රේලියානු ඩොලර් 1 | 180.9920 | 220.2031 |
| කැනේඩියානු ඩොලර් 1 | 203.4796 | 245.1179 |
| යුරෝ 1 | 302.8822 | 357.4170 |
| ජපන් යෙන් 1 | 1.8617 | 2.2983 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1 | 382.3288 | 437.9894 |
| ස්ටර්ලින් පවුම් 1 | 365.9047 | 412.2896 |
| ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් 1 | 292.5833 | 323.9233 |
| චීන යුවාන් 1 (අක්වෙරළ) | 40.0837 | 45.6377 |

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදු වුන දින තිබූ විදේශ මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වල සටහන් කර ඇත.

### 7.2 සාධාරණ අගය මිනුම් කිරීම

බැංකුව විසින් විදේශීය සුරැකුම්පත්, ව්‍යුත්පන්න උපකරණ වැනි මූල්‍ය උපකරණයන් සහ රන් වැනි මූල්‍ය නොවන වත්කම් එක් එක් වාර්තාකරණ දිනයන්හි දි සාධාරණ අගයන්ට මිනුම්ගත කර ඇත. මීට අමතරව, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්ගත කරන ලද මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් අංක 49 සටහනෙහි හෙළිදරව් කර ඇත.

සාධාරණ අගය යනු වෙළෙඳපොළ ගණුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම්ගත කරන ලද දිනයට, වත්කමක් විකිණිමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදල ය. මෙම සාධාරණ අගය මිනුම් කිරීම සඳහා පදනම් වන පූර්ව නිගමනය වනුයේ වත්කමක් විකිණීම හෝ වගකීමක් හුවමාරු කිරීම යන ගනුදෙනුවක්:

- වත්කම හෝ වගකීම අදාළ ප්‍රධාන වෙළෙඳපොළෙහි දි සිදුවීම හෝ,
- එවැනි ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති අවස්ථාවකදී එම වත්කම හෝ වගකීම සඳහා වඩාත් ම වාසි සහගත වෙළෙඳපොළෙහි දි සිදුවීමය.

මෙම ප්‍රධාන වෙළෙඳපොළ හෝ වඩාත් වාසිසහගත වෙළෙඳපොළ බැංකුවට පිවිසිය හැක්කක් විය යුතු ය.

වෙළෙඳපොළ ගණුදෙනුකරුවන්, ඔවුන්ට උපරිම ආර්ථික වාසි සැලසෙන ආකාරයට කටයුතු කිරීමේදී යොදා ගනු ලබන උපකල්පන මත පදනම්ව වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මිනුම් ගත කරයි. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම් කිරීමේදී, එම වත්කම වෙළෙඳපොළ ගනුදෙනුකරුවෙක්ට එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කොට හෝ එම වත්කම් එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කිරීමට හැකියාව ඇති වෙනත් වෙළෙඳපොළ ගනුදෙනුකරුවෙක්ට විකිණීමෙන් ආර්ථික වාසි ජනනය කිරීමට ඇති හැකියාව සලකා බලනු ලැබේ.

බැංකුව විසින් අදාළ නිරීක්ෂණය කළහැකි දත්ත භාවිතය උපරිම කරමින් සහ නිරීක්ෂණය කළනොහැකි දත්ත භාවිතය අවම කරමින් සාධාරණ අගයන් මිනුම් කිරීමට ප්‍රමාණවත් දත්ත ලබාගත හැකි අවස්ථාවන්ට සුදුසු අගය කිරීමේ ක්‍රමවේදයන් යොදා ගනු ලබයි.

සාධාරණ අගය මිනුම්ගත කළ හෝ මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කළ සියලුම වත්කම් හා වගකීම් සාධාරණ අගයේ ධුරාවලිය තුළ වර්ගීකරණයට ලක් කරන අතර, සමස්තයක් වශයෙන් සාධාරණ අගයන් මැනීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම් වි පහත පරිද විස්තර කෙරේ:

මට්ටම 1 : අනන්‍ය වත්කම් හා වගකීම් සඳහා සක්‍රීය වෙළෙඳපොළ තුළ හිමි ප්‍රකාශිත (නො සැකසූ) මිළ ගණන්

මට්ටම 2 : ඍජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කළ හැකි, සාධාරණ අගයන් මිනුම් කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්

මට්ටම 3 : නිරීක්ෂණය කළ නොහැකි, සාධාරණ අගයන් මිනුම්ගත කිරීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්.

පුනරාවර්තන පදනම මත හඳුනාගත් වත්කම් හා වගකීම් වල ඉහත ධූරාවලි මට්ටම් අතර මාරුවීම් විදු වී ඇත්දැයි යන්න වර්ගීකරණයේ නැවත තක්සේරු කිරීම තුළින් (සාධාරණ අගයට මිනුම් කිරීම උදෙසා සමස්තයක් වශයෙන් වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව) සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම බැංකුව තහවුරු කරනු ලබයි.

## 7.3 මූල්‍ය උපකරණ

බැංකුව, විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් අතර වෙන්කොට දක්වමින් මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ග ඉදිරිපත් කරනු ලබයි.

විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන්ගෙන් ඇති වේ. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතුව සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මඟින් බැංකුවේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ අවදානම් පැතිකඩ වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව සලකනු ලැබේ.

### 7.3.1 හඳුනාගැනීම හා මූලික මිනුම් කිරීම

සියලුම මූල්‍ය වත්කම් හා වගකීම් මූලිකව දෙන ලද ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම සහ ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළු වන පිරිවැය මත හඳුනාගනී. මූල්‍ය වත්කම් හා බැරකම්වල සියලුම ආකාරයේ මිලදී ගැනීම් සහ විකුණුම් පිළිවෙළින් වෙළෙඳ දිනය මත හඳුනාගනු ලැබේ. සාමාන්‍ය ආකාරයේ මිලදී ගැනිම් සහ විකුණුම් යනු වෙළෙඳපොළේ රෙගුලාසිය හෝ සම්මුතිය මගින් පොදුවේ නියමිත කාල රාමුව තුළ දී වත්කම් භාරදීම අවශ්‍යවන මූල්‍ය වත්කම් මිලට ගැනිම හෝ විකිණීම වේ.

### 7.3.2 පළමු දින ලාභය හෝ අලාභය

මූල්‍ය උපකරණවල ගණුදෙනු මිල, එහි මුලින් හඳුනාගත් සාධාරණ අගයට වඩා වෙනස්වන විට සහ සාධාරණ වටිනාකම පදනම් වී ඇත්තේ වෙළඳපොල ගණුදෙනුවලදී නිරීක්ෂණය කළ හැකි යෙදවුම් පමණක් භාවිතා කරමින් තක්සේරු කිරීමේ තාක්ෂණක් මත වන විට, ගණුදෙනු මිල සහ සාධාරණ අගය අතර වෙනස බැංකුව ශුද්ධ වෙලඳ අදායමට ගිණුම් ගතකරනු ලැබේ. සමහර යෙදවුම් නිරීක්ෂණය කළ නොහැකි අකෘති මත සාධාරණ අගය ගණනය කර ඇති විටදී, ගනුදෙණු මිල සහ සාධාරණ වටිනාකම අතර වෙනස හඳුනා නොගනු ලබයි. හඳුනා ගැනීමට කල් දැමූ ප්‍රමාණය, වත්කම් හෝ බැරකම් වල මිල ගණනය කිරීමේදී වෙළඳපොල සහභාගීවන්නන් සැළකිල්ලට ගන්නා සාධකයක (කාලය ඇතුළුව) වෙනසක් ඇති වූ විට අදායාම් ප්‍රකාශයට හඳුනා ගැනේ. මෙම පදනම මත, බැංකු විසින් හඳුනා නොගෙන කල් දමන ලද ප්‍රමාණය සරල මාර්ග ක්‍රමයට හඳුනා ගැනීම සුදුසු බව බැංකුව තීරණය කරයි. එවැනි පවතින මුදලක් මූල්‍ය උපකරණ ඉවත් කරන අවස්ථාවකදී හෝ නිරීක්ෂණ යෙදවුම් නිරීක්ෂණය කල හැකි වූ විට ආදායම් ප්‍රකාශනයට හඳුනාගනු ලැබේ.

### 7.3.3 මූල්‍ය වත්කම් වර්ගීකරණය

**මූල්‍ය වත්කම්**

මූලික හඳුනාගැනීම මත, බැංකුව විසින් මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරනු ලබයි.

- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්
- විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් (FVOCI)
- ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් (FVTPL)

පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලන්නේනම් සහ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම් කර නොමැතිනම්, මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ.

- එම මූල්‍ය වත්කම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් රැස්කිරීමේ පරමාර්ථය සහිත ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම, සහ
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ, මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොලියෙන් පමණක් සමන්විත වීම.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලන්නේනම් සහ ලාභය හෝ අලාභය තුළින් නම්කර නොමැතිනම් පමණක් අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබයි.

- මූල්‍ය වත්කම ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ රැස්කිරීම හා මූල්‍ය වත්කම් විකිණීම යන පරමාර්ථ ද්විත්වයෙන් අත්කර ගන්නා ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම, සහ
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොලියෙන් පමණක් සමන්විත වීම.

**ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීම**

ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීම බැංකුවේ මූලික සහ අනෙකුත් පරමාර්ථ වන දේශීය මිල ස්ථායිතාව පවත්වාගෙන යාම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීම මත පදනම් වේ. බැංකුව විසින් ව්‍යාපාර ආකෘතියේ අරමුණ පිළිබඳ තක්සේරුවක් කරනු ලබන්නේ යම් වත්කමක් කළඹ මට්ටමක් දරාගෙන සිටීම තුළ වන අතර එයට හේතුව වන්නේ ව්‍යාපාරය කළමණාකරණය කරන ආකාරය හා කළමණාකාරිත්වයට තොරතුරු ලබාදෙන ආකාරය මෙමගින් හොඳින්ම නිරූපනය කිරීමයි. එසේ සලකා බලන තොරතුරු වලට පහත ඒවා ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

- ව්‍යාපාර ආකෘතියේ සහ එම ව්‍යාපාර අකෘතිය තුළ රඳවා ඇති මූල්‍ය වත්කම්වල කාර්ය සාධනය සහ අගය කිරීම ආයතනයේ ප්‍රධාන කළමණාකාරිත්වයට වාර්තා කරන ආකාරය
- ව්‍යාපාර ආකෘතියේ කාර්ය සාධනයට බලපෑ හැකි අවදානම් (සහ එම ව්‍යාපාර ආකෘතිය තුළ රඳවාගෙන ඇති මූල්‍ය වත්කම්) සහ විශේෂයෙන් අවදානම් කළමණාකරණය කරන ආකාරය.
- පූර්ව කාලසීමවාන් හි විකුණුම්වල වාර ගණන, වටිනාකම, එම විකුණුම්වල කාලසීමාව, එවැනි විකුණුම් සඳහා බලපෑ හේතු සාධක සහ අනාගත විකුණුම්වල කටයුතු පිළිබඳ අපේක්ෂාවන් සලකා බැලීම අවශ්‍ය වේ. කෙසේ වෙතත් විකුණුම් පිළිබඳ තොරතුරු හුදෙකලාව සැලකිල්ලට නොගත යුතු නමුත් ඒ වෙනුවට එය බැංකුවේ මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම හා මුදල් ප්‍රවාහ උපලබ්ධි කරගන්නේ කෙසේද යන සමස්ථ තක්සේරුවේ කොටසක් ලෙස යොදා ගත යුතුවේ.

වෙළදාම හෝ කළමනාකරණය සඳහා තබාගත් සහ සාධාරණ අගමේ පදනමක් මත කාර්ය සාධනය මනිනු ලබන මූල්‍ය වත්කම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මනිනු ලැබේ. එයට හේතුව ඒවා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සඳහා සහ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීමට හෝ රඳවාගෙන නොමැති නිසාය.

**ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ යනු, මූලික මුදල හා එහි පොලිය (SPPI) පමණක් ගෙවිම ද යන්න පිළිබඳ තක්සේරුව.**

බැංකුව විසින් මූලික මුදල සහ එහි පොලිය පමණක් ගෙවිමේ කොන්දේසිය (SPPI Test) සපුරා ඇති බව හඳුනා ගැනිම සඳහා මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත කොන්දේසි තක්සේරු කරනු ලැබේ. මෙම තක්සේරු අරමුණ සඳහා, 'මූලික මුදල' යන්න මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කමක සාධාරණ අගය ලෙස නිර්වචනය කරන අතර, 'පොලිය' යන්න මුදලේ කාලීන වටිනාකම සඳහා සහ නිශ්චිත කාලසීමාවක් තුළ ගෙවීමට ඇති මුල් මුදල හා බැඳි ණය අවධානම සඳහා සහ අනෙකුත් මූලික ණයදිමේ අවධානම හා පිරිවැය සඳහා ප්‍රතිෂ්ඨාව ලෙස නිර්වචනය කෙරේ.

ණය දීමේ වැඩපිළිවෙලක පොලියේ වඩාත් සැලකියයුතු පොලී අංක වන්නේ නියමාකාරයෙන් මුදලේ සහ ණය අවදානමේ කාලීන වටිනාකම සඳහ ප්‍රතිෂ්ඨාව වේ. මූලික මුදල සහ එහි පොලිය පමණක් ගෙවිමේ තක්සේරුව සිදු කිරීම සඳහා, බැංකුව විසින් විනිශ්චයන් අදාළ කර ගන්නා අතර, මූල්‍ය වත්කම් නම්කළ මුදල් ඒකකය හා පොලී අනුපාතය නියම කර ඇති කාලසීමාව වැනි අදාළ සාධක සලකා බලනු ලබයි.

මෙයට වෙනස්ව, ණය දීමේ මූලික එකඟතාවයකට සම්බන්ධ නැති ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි අවධානම හෝ විචලනයට අවමයට වැඩි අනාවරණයක් හඳුන්වාදෙන ආකාරයේ ගිවිසුම්ගත කොන්දේසි, හිඟ මුදල මත මූලික මුදල හා එහි පොලිය (SPPI) ගෙවීම පමණක් වන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ වලට හේතු නොවේ. එවන් අවස්ථාවලදී, එකී මූල්‍ය වත්කම ලාභය හෝ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම අවශ්‍ය වේ.

#### 7.3.3.1 ක්‍රමක්ෂය පිරිවැය යටතේ රඳවාගත් උපකරණ

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අරමුනින් මූල්‍ය වත්කම් දැරීම පර්මාර්ථය කරගත් ව්‍යාපාර ආකෘතිය යටතේ රඳවාගත් හා ගිවිසුම්ගත නියමයන් අනුව නිශ්චිත දිනයන්හි දී මූලික මුදල හා එහි පොලිය පමණක් ලබාදෙන මූල්‍ය වත්කම්, ක්‍රමක්ෂය පිරිවැය යටතේ රඳවාගත් උපකරණ ලෙස වරිගීකරණය කරනු ලැබේ. මෙම උපකරණ පසුකාලීනව සඵල පොලී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ.

#### 7.3.3.2 අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් වනුයේ ව්‍යුත්පන්න නොවන ආයෝජන හා අනෙකුත් මූල්‍ය වත්කම් කාණ්ඩයකට වාර්තා නොකරන ලද ආයෝජනයි. අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති ආයෝජන තුළ ස්කන්ධ සුරැකුම්පත් හා ණය සුරැකුම්පත් ඇතුලත් වේ.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති විදේශ විනිමය ණය සුරැකුම්පත් ප්‍රකාශිත වෙළෙඳපොල මිලගණන්වලට පසුව අගය කෙරේ. වෙළෙඳපොල වටිනාකම තුළ වෙනස්වීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති ආයෝජනවල වටිනාකමෙහි අඩුවීමක් හෝ වැඩිවීමක් ලෙස හඳුනා ගනී.

ස්කන්ධ ආයෝජන, නියාමන අවශ්‍යතා යටතේ සිදු කරන ලද උපායමාර්ගික ආයෝජන වන බැවින් පිරිවැයට හඳුනාගනු ලැබේ.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති දේශීය හා විදේශීය ණය සුරැකුම්පත් හා ස්කන්ධ ආයෝජන වල වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම් නිසා උද්ගතවන වාසි හෝ අවාසි සෘජුවම ප්‍රාග්ධන හිමිකම (අනෙකුත් විස්තීරණ ආදායම) තුළ හඳුනා ගන්නා අතර, ආයෝජනය විකිණීම, එකතු කිරීම හෝ වෙනත් ආකාරයෙන් බැහැර කරන තුරු, හෝ ආයෝජනය හානිකරණය කළයුතු බවට තීරණය කරන තුරු එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි අනෙකුත් සංචිත යටතේ පෙන්වනු ලබන අතර, එම අවස්ථාවේදී ස්කන්ධය ලෙස මෙයට පෙර වාර්තාකළ සමුච්චිත ලාභය හෝ අලාභය හඳුනා නොගැනීම මත ආදායම් ප්‍රකාශයට ප්‍රතිචක්‍රියකරණය නොකරනු ලබන ස්කන්ධ ආයෝජනවල සාධාරණ අගයෙහි වෙනස්වීමේ ව්‍යතිරේකය සහිතව ආදායම තුළ ඇතුළත් කෙරේ. පොලී ආදායම සඵල පොලී ක්‍රමය භාවිතයෙන් ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

#### 7.3.3.3 ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්

වෙළෙඳාම සඳහා තබාා ඇති මූල්‍ය වත්කම්, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්' වර්ගීකරණය තුළ ඇතුළත් කර ඇත. මූලික හඳුනාගැනීම මත, ආරෝපණය කළ ගනුදෙනු පිරිවැය ලාභය හෝ අලාභය තුල දරණ ලද ලෙස හඳුනා ගනී. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළෙඳපොළ මිලට අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයන් හී වෙනස්වීම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සුරැකුම්පත්වල වටිනාකම් තුළ වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස හඳුනා ගන්නා අතර, එයින් උද්ගත වන ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනී.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් ලාභය හෝ අලාභය 'උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් ලාභය/(අලාභය)' ලෙස වාර්තා කරනු ලැබේ. ලාභය හෝ අලාභය උපලබ්ධි වී ඇති විට (සුරැකුම්පත් විකිණීම මගින්) එය 'උපලබ්ධි මිල ප්‍රත්‍යාගණනයෙන් ලාභය/(අලාභය)' ලෙස වාර්තා කරනු ලැබේ.

### 7.3.4 මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් වෙනස් කිරීම

**මූල්‍ය වත්කම් වෙනස් කිරීම**

මූල්‍ය වත්කමක නියමයන් වෙනස් කරන්නේනම්, වෙනස්කළ වත්කම්වල මුදල් ප්‍රවාහ සැලකියයුතු ලෙස වෙනස් වන්නේද යන්න බැංකුව ඇගයීමට ලක් කරයි. මුදල් ප්‍රවාහ සැලකියයුතු ලෙස වෙනස් වන්නේනම්, එහිදී මුල් මූල්‍ය වත්කමෙන් මුදල් ප්‍රවාහවලට ගිවිසුම්ගත අයිතීන් කල්පිරී ඇති බවට සලකනු ලැබේ. මෙම සිද්ධිය තුළ, මුල් මූල්‍ය වත්කම හඳුනා නොගන්නා අතර නව මූල්‍ය වත්කමක් සාධාරණ අගයට හඳුනා ගනී.

ක්‍රමක්ෂය පිරිවැයට ගෙන ආ වෙනස්කළ වත්කමේ මුදල් ප්‍රවාහ සැලකියයුතු ලෙස වෙනස් වන්නේ නැතිනම්, එහිදී වෙනස් කිරීම මූල්‍ය වත්කම හඳුනා නොගැනීමට හේතු නොවනු ඇත. මෙම සිද්ධිය තුළ, බැංකුව මූල්‍ය වත්කමේ දළ ධාරණ අගය නැවත ගණනය කරන අතර, ලාභය හෝ අලාභය තුළ වෙනස් කිරීමේ ලාභයක් හෝ අලාභයක් ලෙස දළ ධාරණ අගය ගැලපීමෙන් ඇතිවන ප්‍රමාණය හඳුනා ගනී.

**මූල්‍ය බැරකම් වෙනස් කිරීම**

පවත්නා මූල්‍ය වගකීමක් වෙනුවට සැලකියයුතු වෙනස් නියමයන් මත එම ණයකරුගෙන් වෙනත් වගකීමකින් ප්‍රතිෂ්ඨාපනය කරන විට පවත්නා වගකීමක නියමයන් සැලකියයුතු ලෙස වෙනස් කරන විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනා නොගැනීමක් සහ නව වගකීමක හඳුනා ගැනීමක් ලෙසත් සලකනු ලැබේ. මෙම සිද්ධිය තුළ, වෙනස් කළ නියමයන් මත පදනම් නව මූල්‍ය වගකීමක් සාධාරණ අගයට හඳුනා ගනී. කල්පිරුණු මූල්‍ය වගකීමේ ධාරණ අගය සහ වෙනස් කළ නියමයන් සහිත නව මූල්‍ය වගකීම අතර වෙනස ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

### 7.3.5 ප්‍රතිවර්ගීකරණය

බැංකුව විසින් මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා වූ ව්‍යාපාර ආකෘතිය වෙනස් කිරීමේදී හැර, මූල්‍ය වත්කම් පළමුවරට හඳුනාගත් පසු ප්‍රතිවර්ගීකරණය නොකරයි.

### 7.3.6 ඉවත් කිරීම්

**මූල්‍ය වත්කම්**

බැංකුවට මූල්‍ය වත්කමෙහි මුදල් ප්‍රවාහ සඳහා ඇති ගිවිසුම්ගත අයිතිවාසිකම් අවසන්වීමේදී හෝ මූල්‍ය වත්කමේ සියලූ අවදානම් හා ප්‍රතිලාභවල හිමිකාරිත්වය සැලකිය යුතු ප්‍රමාණයක් වෙනත් පාර්ශ්වයකට පවරන ගනුදෙනුවක් තුළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය මාරු කිරීමේදී හෝ බැංකුව හිමිකාරිත්වයේ සියලූම අවදානම් සහ ප්‍රතිලාභ සැලකියයුතු ලෙස මාරු නොකර හෝ රඳවාගෙන නොමැති විට හා මූල්‍ය වත්කමේ පාලනය රඳවාගෙන නොමැති විට මූල්‍ය වත්කමක් ඉවත් කරනු ලබයි.

මූල්‍ය වත්කමක් ඉවත් කිරීමේදී, වත්කමේ ධාරණ අගය (හෝ ඉවත් කරන ලද වත්කමේ කොටසකට වෙන්කළ ධාරණ අගය) සහ (i) ලද ප්‍රතිශ්ඨාව (භාරගත් යම් නව වගකීම අඩුකළ නව වත්කම ඇතුළුව) අතර වෙනස සහ (ii) අනෙකුත් විස්තීරණ ආදායම් තුළ හඳුනා ගෙන තිබූ සම්මුච්චිත ලාභය හෝ අලාභය යන දෙකම ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනි.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට නම්කළ ස්කන්ධ ආයෝජන සම්බන්ධයෙන් අනෙකුත් විස්තීරණ ආදායම තුළ හඳුනාගත් සමුච්චිත යම් ලාභ/අලාභ එවැනි සුරැකුම්පත් හඳුනා නොගැනීම මත ලාභය හෝ අලාභය තුළ හඳුනා නොගනී. බැංකුව විසින් නිර්මාණය කරන හෝ රඳවාගන්නා ඉවත් කිරිම සඳහා සුදුසුකම් ලබන මාරුකළ මූල්‍ය වත්කම්වල පොලිය වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනා ගනී.

බැංකුව ගනුදෙනුවලට ඇතුළත් වන අතර, ඒතුළින් එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි හඳුනාගත් වත්කම් මාරු කරන නමුත් මාරුකළ වත්කමේ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ල හෝ සැලකියයුතු කොටසක් හෝ ඒවායින් කොටසක් රඳවා ගනී. එවැනි අවස්ථාවලදී, මාරුකළ වත්කම් හඳුනා නොගනී. එවැනි ගනුදෙනුවලට උදාහරණ වන්නේ සුරැකුම්පත් ණයදීම සහ විකිණීමේ සහ මිලදී ගැනීමේ ගනුදෙනුය. මූල්‍ය වත්කමක හිමිකාරත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ල සැලකියයුතු ලෙස රඳවා නොගන්නා හෝ මාරු නොකරන ගනුදෙනුවලදී සහ ඉන් වත්කමේ පාලනය රඳවාගනී නම්, මාරු කරන ලද වත්කමේ වටිනාකම තුළ වෙනස්වීම්වලට නිරාවරණය වන ප්‍රමාණය මගින් තීරණය කරන එහි අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට බැංකුව තවදුරටත් වත්කම හඳුනා ගනී.

**මූල්‍ය බැරකම්**

මූල්‍ය බැරකමක් ඉවත් කරනු ලබනුයේ එහි වගකීම යටතේ බැඳීම නිදහස් කිරීම, අවලංගු කිරීම හෝ කල් පිරීම සිදු වූ විටය. පවත්නා මූල්‍ය වගකීමක් වෙනුවට සැලකියයුතු වෙනස් නියමයන් මත එම ණයහිමියාගෙන් වෙනත් වගකීමකින් ප්‍රතිස්ථාපිත කිරීමේදී හෝ පවත්නා වගකීමේ කාලය සැලකියයුතු ලෙස වෙනස් කරන්නේනම්, එවැනි මාරු කිරීම හෝ වෙනස් කිරීම මුල් වගකිම හඳුනා නොගැනීම සහ නව වගකීමක් හඳුනා ගැනීම ලෙස සලකනු ලැබේ. මුල් මූල්‍ය වගකීමේ ධාරණ අගය සහ ගෙවන ලද ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

### 7.3.7 මූල්‍ය වත්කම් හා වගකීම් නිශ්ප්‍රභා කිරීම

මූල්‍ය ප්‍රකාශ තුළ දක්වා ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් නිශ්ප්‍රභා කර දැක්විය හැක්කේ, බැංකුවට පිළිගත් ප්‍රමාණයන් නිශ්ප්‍රභා කිරීමට දැනට බලාත්මක කළ හැකි නෛතික අයිතියක් තිබේ නම් සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට වත්කම් සාක්ෂාත් කර ගැනීමට සහ වගකීම් එකවර පියවීමේ අරමුණක් තිබේ නම් පමණි.

### 7.3.8 මූල්‍ය වත්කම් හානිකරණය

බැංකුව විසින් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මැනුම් කර නොමැති පහත මූල්‍ය උපකරණ මත අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරන දීමනා හඳුනා ගනී.

- අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට නිරූපිත මූල්‍ය වත්කම්
- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්
- ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ණය ඇපකර ගිවිසුම්

ස්කන්ධ ආයෝජන මත හානිකරණ අලාභ හඳුනා නොගැනේ.

බැංකුව විසින් ආයෝජන ශ්‍රේණියේ පවතින (Baa3/BBB- සහ ඉහළ ශ්‍රේණිගත) ආයෝජන සඳහා මාස 12 ක අපේක්ෂිත ණය අලාභවලට සමාන ප්‍රමාණයකට අලාභ දීමනා හඳුනා ගනී. අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට සහ ක්‍රමක්ෂය පිරිවැයට වර්ගීකරණය කරන ලද බැංකුවේ බහුතරයක් ආයෝජන Baa3/BBB- අගයට ඉහලින් ශ්‍රේණිගත වී ඇත. මාස 12 ක අපේක්ෂිත ණය අලාභයක් හඳුනාගන්නා මූල්‍ය උපකරණ 'පළමු අදියරේ මූල්‍ය උපකරණ' ලෙස හඳුනා ගනී.

මූලික හඳුනා ගැනීමේදී ආයෝජන ශ්‍රේණිය පහළ හෝ මූලික හඳුනා ගැනීමෙන් පසුව ණය අවදානම Baa3/BBB අගයට වඩා පහළ හෝ ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවය දෙගුණයක් දක්වා වර්ධනය වන ණය උපකරණ සඳහා ජීව කාල අපේක්ෂිත ණය අලාභ ගණනය කරයි. ජීව කාල අපේක්ෂිත ණය අලාභ හඳුනා ගන්නා නමුත් ණය හානිකරණය වී නොමැති මූල්‍ය උපකරණ 'දෙවන අදියරේ මූල්‍ය උපකරණ' ලෙස හඳුනා ගනී. ජීව කාල අපේක්ෂිත ණය අලාභ ණය හානිකරණය වූ වත්කම් සඳහා ගණනය කරනු ලබන අතර ඒවා 'තෙවන අදියරේ මූල්‍ය උපකරණ' ලෙස හැඳින්වේ.

**අපේක්ෂිත ණය අලාභ මැනීම**

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ යාන්ත්‍රණය පහත ප්‍රධාන මූලිකාංගයන් සමඟ විස්තර කර ඇත.

**ණය පැහැර හැරීමේ සම්භාවිතාව** (PD):

පැහැර හැරීමේ සම්භාවිතාව යනු දෙන ලද කාල සීමාවක් තුළ ගෙවීම් පැහැර හැරීමට ඇති නැඹුරුව සම්බන්ධ ඇස්තමේන්තුවකි. අදාළ පහසුකම මෙයට පෙර හඳුනා නෙගෙන ඇත්නම් හා තවමත් එය ආයෝජන කළඹෙහි ඇතුළත් නම් පමණක් තක්සේරු කරන කාලසීමාව තුළ දී ගෙවීම් පැහැර හැරීම, යම් නිශ්චිත කාලයක් තුළ සිදුවිය හැක. බැංකුව විසින් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට සහ ක්‍රමක්ෂය පිරිවැයට එහි සියලූ විදේශ ආයෝජන සඳහා බ්ලූම්බර්ග් (Bloomberg) වෙතින් නිකුත් කරන්නන්ගේ/ප්‍රතිපාර්ශයන්ගේ නිශ්චිත ස්කන්ධ කොටස් මත වන පැහැර හැරීමේ සම්භාවිතයන් තොරතුරු පද්ධතිය තුළින් ලබා ගනී. එවන් නිශ්චිත ස්කන්ධ කොටස් මත වන පැහැර හැරීමේ සම්භාවිතාව භාවිතා කරන අතර, ස්කන්ධ ණය පැහැර හැරීමේ සම්භාවිතයන් නැතිවිට බැංකුව විසින් අදාළ නිකුත් කරන්නන්ගේ හා ප්‍රතිපාර්ශ්වයන්ගේ ශ්‍රේණිගත කිරීම් සඳහා බ්ලූම්බර්ග් තොරතුරු පද්ධතියේ ඇති පොදු ණය පැහැර හැරීමේ සම්භාවිතා වගුව මගින් වාර්තා කරන දිනට ඇති පැහැර හැරීමේ සම්භාවිතාවය ලබා ගනු ලැබේ.

**ගෙවීම් පැහැර හැරීමේදී ඇති නිරාවරණයඃ**

ගෙවීම් පැහැර හැරීමේදී ඇති නිරාවරණය යනු අනාගත ගෙවීම් පැහැර හරින දිනයකදී බැංකුව නිරාවරණය වන මූල්‍ය වත්කමෙහි වටිනාකම පිළිබඳ ඇස්තමේන්තුවයි. එම ඇස්තමේන්තුව මූලික මුදල හා එහි පොලිය ආපසු ගෙවීම, ගිවිසුමකින් හෝ වෙනත් ආකාරයකින් නියම කරනු ලබන ණය බැඳියාවන්ගේ අනාගත නිකුත් කිරීම හා මඟහැරුණු ගෙවීම් සඳහා වන උපචිත පොලිය ඇතුළත්ව අනාගත නිරාවරණ ප්‍රමාණය මත වන අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් සිදු කරනු ලබයි.

**පැහැර හැරීමකදී වන අලාභය** (LGD):

පැහැර හැරීමකදී වන අලාභය යනු දෙන ලද දිනයකදී ගෙවීම් පැහැර හැරීම සිදු වූ නිසා බැංකුවට ඇතිවන අලාභය පිළිබඳ ඇස්තමේන්තුවකි. එය ගෙවිය යුතු ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හා ඇප උපලබ්ධි කිරීමෙන් ලැබෙන ප්‍රමාණයද ඇතුළුව ණයහිමියා ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහය අතර වෙනස මත පදනම් වේ. බැංකුවට සිය අවදානම් නිරාවරණය මත පදනම් විවිධ වර්ගයේ මූල්‍ය වත්කම් සඳහා පැහැර හැරීමකදී වන අලාභය යොදාගැනීමේදී අභ්‍යන්තරව අනුමත කරන ලද ප්‍රතිපත්තියක් ඇත.

**ආර්ථික සාධක ගැලපීමඃ**

පැහැර හැරීමේ සම්භාවිතාව, යම් මොහොතක පවතින පැහැර හැරීමේ සම්භාවිතාවයකට පරිවර්තනය කිරීම සඳහා බැංකුව විසින් ආර්ථික සාධක ගැලපීම යොදා ගනී. බැංකුව ප්‍රධාන වශයෙන් පැහැර හැරීමේ සම්භාවිතාව උත්තේජනය කිරීම තුළ ප්‍රධාන ආර්ථික සාධක ලෙස දළ දේශීය නිෂ්පාදනය, උද්ධමනය හා පොලී අනුපාතය යන දත්ත යොදාගනී.

**ණය අවධානමේ සැලකිය යුතු වැඩිවීම ඇගයීම** (SICR)

මූලික හඳුනාගැනීමේ සිට ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවේ දෙගුණයක් සිදු වී ඇති විට සහ මූලික හඳුනාගැනීමෙන් පසු යම් ශ්‍රේණිගත කිරීම BBB- වලට වඩා පහළ යාමක් සිදුවී ඇති විට මූල්‍ය උපකරණවලට ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇති බව බැංකුව සලකා බලනු ලැබේ. ආන්තිකයද ඇතුළුව ආයෝජන ශ්‍රේණියක ශ්‍රේණිගත කිරීමක සිට ආයෝජන නොවන ශ්‍රේණියක ශ්‍රේණිගත කිරීම් දක්වා වන සියලූ ශ්‍රේණිගත කිරීම්වල පහළ වැටීමත් Baa3 සිට Ba1 දක්වා පහත වැටීමක්ද ඇතුළත්ව ගෙවීම පැහැර හැරීමේ සම්භාවිතාව දෙගුණයක් හෝ ඊට වැඩි අගයකින් වැඩිවීමට තුඩුදෙන බවට වන නිරීක්ෂණය මත පදනම් වේ.

මෙහෙයුම් තොරතුරු | මූල්‍ය ප්‍රකාශ | අතිරේක තොරතුරු

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

**ණය හානිකරණය වූ මූල්‍ය වත්කම්**

එක් එක් වාර්තාකරන දිනයට, ක්‍රමක්ෂය පිරිවැයට, විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම් කළ මූල්‍ය වත්කම් හා ණය ඇපකරවල ණය හානිකරණය වී ඇත්දැයි (තෙවන අදියර මූල්‍ය වත්කම් ලෙස සඳහන් කර ඇති) බැංකුව විසින් අගයනු ලබයි. මූල්‍ය වත්කමේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත අවාසිදායක බලපෑමක් වී ඇති එක් හෝ ඊට වැඩි සිද්ධීන් ඇති වූ විට එම මූල්‍ය වත්කම ණය හානිකරණය වී ඇත. මූල්‍ය වත්කම ණය හානිකරණය වී ඇති බවට සාක්ෂි වලට පහත නිරීක්ෂණය කළහැකි දත්ත ඇතුළත් වේ.

- නිකුත් කරන්නාගේ හෝ ණය ගන්නාගේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා:
- ගෙවීම් පැහැර හැරීමක් හෝ කල් ඉකුත් වූ සිද්ධීන් වැනි ගිවිසුම් කඩ කිරීමක් ලෙස
- ණය ගැණුම්කරු බුන්වත් බවට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිව්‍යූහගත කිරීමකට පත්වීම අපේක්ෂා කළ හැකි බව.

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ අපේක්ෂිත ණය අලාභ සඳහා දීමනාව ඉදිරිපත් කිරීම**

අපේක්ෂිත ණය අලාභ සඳහා දීමනාවන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පහත අයුරින් ඉදිරිපත් කර ඇත.

- ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම්: වත්කම්වල දළ ධාරණ වටිනාකමෙන් අඩු කිරීමක් ලෙස
- විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්: මෙවැනි වත්කම්වල ධාරණ වටිනාකම ඒවායේ සාධාරණ අගය වන හෙයින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ කිසිදු අලාභ වෙන් කිරීමක් හඳුනා නොගනී. කෙසේ වෙතත් ණය දීමනාව අනාවරණය කරන අතර, වෙනත් විස්තීර්ණ ආදායම තුළ හඳුනා ගනී.
- ණය ඇපකර ගිවිසුම්: වෙන්කිරීමක් ලෙසඃ

### 7.3.9 ලියා හැරීම

මූල්‍ය වත්කමක් සම්පූර්ණයෙන්ම සහ එහි කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවක් නොමැති විට ණය සහ ණය සුරැකුම්පත් ලියා හරී. (කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන්). ණයකරුට ලියා හැරීමට යටත් වන ප්‍රමාණ ආපසු ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ රැස්කර ගැනීමට හැකි වත්කම් හෝ ආදායම් මූලාශ්‍ර නොමැති බව බැංකුව තීරණය කරන අවස්ථාවකදී මෙසේ ලියා හරිනු ලබයි. මෙම ඇගයීම එක් එක් වත්කම් මට්ටමේදී සිදු කරයි. පෙර ලියා හරින ලද ප්‍රමාණයන් ආපසු අයකර ගැනීම ආදායම් ප්‍රකාශයේ හා විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ 'මූල්‍ය උපකරණ මත වන හානිකරණ අලාභ' තුළ ඇතුළත් කරනු ලැබේ.

## 7.4 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

මුදල් හුවමාරු, ඉදිරි විදේශ විනිමය ගිවිසුම් වැනි ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ බැංකුව විසින් භාවිත කරනු ලබන අතර ඒවා භාවිත කරනුයේ අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණු සඳහා මිස සමපේක්ෂාත්මක අරමුණු සඳහා නොවේ. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ එහි සාධාරණ අගයට වාර්තා කරන අතර, එහි සාධාරණ අගය ධන අගයක් ගන්නා විට වත්කමක් ලෙසත් එම අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙසත් වාර්තා කරයි. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල සාධාරණ අගයෙහි ඇතිවන වෙනස්වීම් 'උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනවල වාසිය/(පාඩුව)' තුළ වාර්තා කරනු ලැබේ.

ගනුදෙණුවක මිල ඒ හා සමාන ගනුදෙනු පවතින්නා වූ නිරීක්ෂණය කළ හැකි වර්තමාන වෙළෙඳපළ ගනුදෙනුවල සාධාරණ අගයෙන් වෙනස් වේ නම් හෝ නිරීක්ෂණය කල හැකි වර්තමාන වෙළෙඳපළෙහි දත්ත පමණක් විචල්‍යන් වන ඇගයීම් ශිල්ප ක්‍රමයක් මත පදනම් වී, බැංකුව විසින් එම ගණුදෙණුවේ මිල හා සාධාරණ අගය අතර වෙනස (දින 1 වෙනස) 'උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු)' තුළ වහාම හඳුනාගනු ලබයි. සාධාරණ අගය නිරීක්ෂණය කළ නොහැකි දත්ත භාවිතයෙන් තීරණය කරන අවස්ථාවක දී, එම ගණුදෙණුවේ මිල හා ආකෘතියේ වටිනාකම අතර වෙනස, අදාළ යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වූ විට හෝ එම උපකරණය ඉවත් කල විට පමණක් ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

## 7.5 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට (IMF) අදාළ ශේෂයන්

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා. මු. අ.) සමඟ තම බලතල ප්‍රකාර ගනුදෙනු කරයි. බැංකුව විසින් ජා. මු. අ. සමඟ සිදුකෙරෙන සියලුම ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා. මු. අ. සමඟ වු පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කරන අතර, එම පංගුව සඳහා ජා. මු. අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා. මු. අ. විසින් වෙන් කරන ලද සමුච්චිත විශේෂ ගැනුම් හිමිකම් (වි. ගැ. හි.) ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා. මු. අ. පංගු වත්කම සහ වි. ගැ. හි. හිමිකම ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය ලෙස වර්ගීකරණය කරන අතර අනෙකුත් ජා. මු. අ. හා අදාල වත්කම් සහ වගකීම් සඵල පොළී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනු ලැබේ. ජා. මු. අ. විසින් ප්‍රකාශිත පරිදි වාර්තාකරණ දිනට යොදා ගන්නා විනිමය අනුපාතිකයට ජා. මු. අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ජා. මු. අ. සමඟ වු ශේෂයන්ට අදාළ සියලුම අනෙකුත් ගාස්තු සහ පොලිය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

## 7.6 මුදල් සහ මුදල් සමානයන්

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල්, කෙටිකාලීන තැන්පතු සහ පරිණත කාලය මාස තුනකට අඩු, සාධාරණ අගය වෙනස්වීමේ සැලකිය යුතු අවදානමක් නොමැති සහ බැංකුව මගින් එහි කෙටිකාලීන බැඳීම් කළමණාකරණය සඳහා යොදා ගන්නා ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු මූල්‍ය වත්කම් මුදල් සහ මුදල් සමානයන්ට අයත් වන අතර, මුදල් සහ මුදල් සමානයන් ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව ඇතැම් ආදායම් ඉපැයීම සහ ඇතැම් වියදම් දැරීම ද සිදුකරන අතර, එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර, එය ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමග ගනුදෙනු සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමග කරනු ලබන ගනුදෙනුවලින් සමන්විත වේ. ශ්‍රී ලංකා රජය සමග ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති යාන්ත්‍රණයක් ලෙස රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල සහ බැඳුම්කර මිලදී ගැනීම ඇතුළත් වේ. එවැනි මිලට ගැනීම්, බැහැර කිරීම් හෝ ඒ මත පොළීය හුදෙක් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල පොත් සටහන් වශයෙන් පිළිබිඹු කරනු ලැබේ. මේවා මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් 44 සහ සටහන් 45 යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාර, තනි ව්‍යවස්ථාපිත අධිකාරිය වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නා වෙනුවෙන් බැංකුව මගින් හිමිකමක් නියෝජනය කරයි. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ.

සංසරණ මුදල්වල වෙනස්වීම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන, මහ බැංකු අතර පවත්නා ක්ෂේත්‍රයේ පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන චෙක්පත් මගින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සහ මූල්‍ය ආයතන සමග වන තැන්පතු ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණ සඳහා වු මුදල් භාවිතා කිරීමෙන් බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහය සකස් කරයි.

## 7.7 ප්‍රතිමිලදි ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම්

ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව මුල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තා කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වු වගකීම (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම් සහ ප්‍රතිමිලදී ගැනීමේ මිල සහ ප්‍රතිවර්තන ප්‍රතිමිලදි ගැනීමේ ගනුදෙනුවල මිලදී ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර, එය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණීම සඳහා වු ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තා කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු ඒවායේ උපචිත ආදායම් හා වියදම් ද ඇතුළුව ක්‍රමක්ෂය පිරිවැය යටතේ වාර්තා කරනු ලැබේ.

## 7.8 නිත්‍ය තැන්පතු සහ ණයදීමේ පහසුකම්

2014 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, නිත්‍ය තැන්පතු පහසුකම (පෙර නිත්‍ය ප්‍රතිමිලදී ගැනුම් පහසුකම) සුරැකුම් රහිත 'තැන්පතු පහසුකමක්' බවට පරිවර්තනය කරන ලදි. එබැවින් සහභාගීත්ව ආයතන තම අතිරේක අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාත යටතේ දෛනික පදනමක් මත පිරිසිදු තැන්පතුවක් ලෙස ආයෝජනය කරනු ලබයි.

නිත්‍ය ණය පහසුකමේ ක්‍රියාපටිපාටිය, (පෙර නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම) නිත්‍ය ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනීමේ පහසුකම හා සමාන වන අතර, මෙම දෙවර්ගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනී.

## 7.9 ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත්වලින් වලින් සහ බැඳුම්කර වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්හි ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වාර්තා කරනු ලැබේ.

## 7.10 රජයට දෙන ලද කාලීන අත්තිකාරම්

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 127 වැනි වගන්තිය ප්‍රකාරව, මහ බැංකුව විසින් මුදල් වර්ෂයේ පළමු මාසය ඇතුළත ඒකාබද්ධ අරමුදලින් දරණු ලැබීමට බලයලත් වියදම් මූල්‍යනය කිරීම සඳහා අලුත්, ඍජු තාවකාලික අත්තිකාරම් රජයට ලබාදිය හැකිය. එවැනි සෑම නව අත්තිකාරමක් ම මාස 06 කට නොඉක්මවනු ලබන කාලසීමාවක් ඇතුළත ආපසු ගෙවනු ලැබිය යුතුය. අදාළ කාලය සඳහා 2003 අංක 3 දරන මුල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රකාශිත අර්ධ වාර්ෂික වාර්තාවේ වාර්තා කළ ඇති පරිදි, හිඟව පවතින එවැනි අත්තිකාරම්වල මුළු ප්‍රමාණය පෙර මූල්‍ය වර්ෂයේ පළමු මාස හතරේ ආදායමෙන් සියයට දහය නොඉක්මවිය යුතුය. එවැනි නව අත්තිකාරම් මහ බැංකුව විසින් තීරණය කරන පරිදි පවත්නා වෙළෙඳපොල අදාළ අනුපාතයට පොලී දැරිය යුතුය.

## 7.11 අනිකුත් ආයතනවලට දෙන ලද ණය

අනිකුත් ආයතනවලට දෙන ලද ණය ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගෙන දක්වා ඇත.

## 7.12 සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයුම් යටතේ ප්‍රධාන සංස්ථාපිත ආයෝජකයින් වෙතින් වරින් වර රාජ්‍ය සුරැකුම්පත් ණයට ගැනීම සිදුකරයි. මෙම ණයට ගත් සුරැකුම්පත්, බැංකුව විසින් ප්‍රති මිලදී ගැනීමේ ක්‍රියාකාරීත්වය මත වෙළෙඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට යොදාගනී.

සුරැකුම්පත් ණයට ගැනීම යනු නැවත බාරදීම අතපසු වන අවස්ථාවක, වෙළෙඳපොල අනුපාතයට (බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ සහභාගීවන්නන්ට දැනුම් දී ඇති වෙළෙඳපොළ අනුපාත පරිදි) සුරැකුම්පත් නැවත භාරදීම, එකඟ වූ ගාස්තු ගෙවීම සහ වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ගෙවීම සඳහා බැංකුවේ කොන්දේසි විරහිත ඇපවීමකි.

ණයට ගත් සුරැකුම්පත් වෙළෙඳපොළ වටිනාකම් සහ කිසියම් අවස්ථාවක ප්‍රතිමිලදී ගැනීමේ මෙහෙයුම් සඳහා භාවිතා නොකළ සුරැකුම්පත් අසම්භාව්‍ය බැරකමක් ලෙස වාර්තා කරනු ලැබේ. ගෙවන ලද කොමිස් මුදල උපචිත පදනම මත වියදම් කරනු ලැබේ.

ණයට දීමේ ගනුදෙනුවක් යටතේ ප්‍රතිපාර්ශ්වයකට සුරැකුම්පත් මාරු කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්නුම් කරනුයේ හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභය ද මාරු කරන්නේනම් පමණි.

## 7.13 සේවක ණය

සහනදායී පොලී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීම සඳහා මහ බැංකු සේවයේ ස්ථිර කර ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ට හිමිකම ලැබේ. 2008 වසරේ සිට නිකුත් කරන ලද මෙම ණය, ජා. මූ. වා. ප්‍ර. 9 'මූල්‍ය උපකරණ' අනුව, වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් ඒවායේ සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.

**වට්ටම් අනුපාතය** සාමාන්‍ය බරතබන ලද මූලික ණය දීමේ අනුපාතය (AWPR) වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරන අතර, එය ණයවල කාලසීමාව සමඟ වෙනස් වේ.

සහනදායී පොලී අනුපාතයන්ට මෙම ණය ලබාදීමේදී බැංකුව විසින් දරණ ලද වියදම වාර්තා කිරීමට වර්ෂයේ ආරම්භ දිනට සහ වර්ෂයේ අවසාන දිනට සේවක ණයවල වර්තමාන අගයන් අතර වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර, බැංකුව විසින් මෙම ණය වෙළෙඳපොළ අනුපාතිකයන්ට දෙනු ලැබුවේ නම්, බැංකුව විසින් උපයනු ලැබිය හැකි ආදායම වාර්තා කිරීමට සමාන අගය, අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

**සාධාරණ අගය කිරීම ගණනය සඳහා යොදාගනු ලබන උපකල්පනයන්**

- සේවක ණය ලබාදුන් දිනය ලෙස ජනවාරි 01 දින සලකනු ලැබේ.
- මෙම ණය සඳහා කිසිදු ආකාරයක ගැලපීමක් හෝ කලින් පියවීමක් නොමැත.

## 7.14 රන්

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ ජාත්‍යන්තර සංචිත කළමණාකරණය පිළිබඳ දක්වෙන 40 (2) වගන්තිය ප්‍රකාරව රත්‍රන් නියෝජනය කරන බැර ශේෂ ද ජාත්‍යන්තර සංචිතවල කොටසක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබිය හැක. එසේම එම පනතේ 94 (32) වගන්තිය මඟින් මහ බැංකුව විසින් ලාභ බෙදා හැරීමට පෙරාතුව පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ජාත්‍යන්තරව පිළිගත් මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව ආදායම් ප්‍රකාශයේ වාර්තා වූ රත්‍රන් සම්බන්ධයෙන් මහ බැංකුවේ තත්ත්වය හේතු කොටගෙන, වෙළෙඳපොළ මිල ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන උපලබ්ධි නොවූ ලැබීම් පිළිබඳව විස්තර කරනු ලබයි.

රත්‍රන් මූලික අවස්තාවේදී පිරිවැයට හඳුනා ගනු ලැබේ. මෙම රත්‍රන් ජාත්‍යන්තර සංචිතවල කොටසක් වන බැවින් සහ සාමාන්‍ය ව්‍යාපාර රටාව තුළ වෙළෙඳාම් කරන පාරිභෝගික භාණ්ඩයක් ලෙස භාවිතා නොකරන බැවින් රත්‍රන් සාධාරණය අගයට අගය කරන අතර, ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයට මාරු කෙරේ. ලාභ බෙදා හැරීමට පෙරාතුව, රත්‍රන්වලින් උපලබ්ධි නොවූ ලාභ අදාළ සංචිත ගිණුමට මාරු කෙරේ.

## 7.15 මුදල් තොග

බැංකුවේ තොගය තුළ, සංසරණය සඳහා මෙතෙක් නිකුත් කර නොමැති නව ව්‍යවහාර මුදල් අන්තර්ගත වේ. නව මුදල් නෝට්ටු සහ කාසි නිෂ්පාදනය සහ නිර්මාණය කිරීමේ පිරිවැය, මුල්වරට පිරිවැයට හඳුනාගනු ලැබේ. සංසරණය සඳහා නිකුත් කරනු ලබන නව මුදල් නෝට්ටු සහ කාසිවල පිරිවැය බර තබන ලද සාමාන්‍ය පදනමක් මත තීරණය කරන අතර, නිකුත් කරන අවස්ථාවේදී, එය ආදායම් ප්‍රකාශනයට ගලපනු ලැබේ. සෙමෙන් චලනය වන තොගය සඳහා වෙන් කිරීම් සිදු කෙරේ.

## 7.16 අනෙකුත් තොග

අනෙකුත් තොග, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි වටිනාකම් යන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනම්ව පිරිවැය නිශ්චය කරනු ලැබේ.

## 7.17 දේපළ, පිරියත හා උපකරණ

සියලුම දේපල, පිරියත හා උපකරණ මූලික අවස්ථාවේදී පිරිවැයට හඳුනාගනු ලැබේ. පසුව ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී පිරිවැයට, හඳුනා ගැනීම සඳහා වූ නිර්ණායකයන් සපුරන ලද්දේ නම්, පිරිවැය දරන අවස්ථාවේදී දේපල, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරිමේ පිරිවැය ඇතුළත් වනු ඇත.

ඉඩම් සහ ගොඩනැගිලි පසුකාලීන සමුච්චිත ක්‍ෂයවීම් සහ පසුකාලින සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ ප්‍රත්‍යාගණනය කරන දිනට එහි සාධාරණ අගය වන ප්‍රත්‍යාගණන අගයට අගය කරනු ලබයි.

සින්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීවකාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ජීවකාලය |
|---|---|
| සින්නක්කර ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50ට වැඩි |
| කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50 හෝ කල්බදු කාලසීමාව යන දෙකෙන් අවමය |
| පිරියත සහ පිරියත කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලී බඩු සහ උපකරණ | වර්ෂ 10 ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| 2014 වර්ෂයේ සිට මිලදී ගත් මෝටර් රථ | වර්ෂ 10 ක් තුළ |
| පරිගණක දෘඩාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරගත නොහැකි බව සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් මගින් පෙන්නුම් කරන විටක දේපල, පිරියත හා උපකරණවල සාධාරණ අගයන් හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ.

බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සඳහා වූ ප්‍රතිපත්තිය වන්නේ අවම වශයෙන් වසර තුනකට වරක් හෝ සැලකිය යුතු තක්සේරු ගැලපීමක් ඊට අඩු කාලසීමාවක් තුලදී ප්‍රත්‍යක්ෂ වූ විටය. ප්‍රත්‍යාගනන අතිරික්තය ප්‍රත්‍යාගන සංචිතයට බැරකර, මූල්‍ය තත්ව ප්‍රකාශයේ හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මීට පෙර එම වත්කමෙහි හඳුනාගත් ප්‍රත්‍යාගනන අඩුවීමක් ප්‍රතිවර්තනය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම්ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන් වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමග ගලපනු ලැබේ.

වත්කමක් බැහැර කිරීමේදී, කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙතොත් එය රඳවාගත් ලාභ වලට මාරුකරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරිමෙන් භාවිතා කිරීමෙන් හෝ ඉවත් කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවෙන් නොමැති නම් එය දේපල, පිරියත සහ උපකරණ ලෙස හඳුනාගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගත වන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල සහ ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීවකාලය, සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරු ගැලපීම් කරනු ලැබේ.

ප්‍රාග්ධන නොනිම් වැඩ එහි පිරිවැයට දක්වා ඇත. මෙම වියදම් ප්‍රාග්ධන ස්වභාවයේ වන අතර ගොඩනැගිලි ඉදි කිරීමේදී ප්‍රධාන පිරියත සහ යන්ත්‍ර සහ පද්ධති සංවර්ධනයේදී සෘජුව දරා ඇති අතර ප්‍රාග්ධනීකරණය කිරීමට සූදානමින් පවතින වියදම් වේ.

## 7.18 කල්බදු

යම් ගිවිසුමක් ආරම්භයේදී, එම ගිවිසුම කල්බදු ගිවිසුමක්ද හෝ ගිවිසුමෙහි කල්බද්දක් අන්තර්ගත වේද යන්න බැංකුව තක්සේරු කරයි. ප්‍රතිෂ්ඨාව හුවමාරුව තුළ යම් කාලසිමාවක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ අයිතිය ගිවිසුම පවරා දෙන්නේනම් එවන් ගිවිසුමක් කල්බද්දකි නැතිනම් කල්බද්දක් සමන්විත වේ. යම් ගිවිසුමක් හඳුනාගත් වත්කමක භාවිතය පාලනය කිරිමේ අයිතිය බැංකුවට පවරා දෙන්නේද යන්න තක්සේරු කිරීම සඳහා, බැංකුව විසින් ජා. මූ. වා. ප්‍ර. 16 හි ඇතුළත් වන කල්බදු සඳහා වන නිර්වචනය භාවිතා කරයි.

### බැංකුව කල්බදු ගැණුම්කරුවෙකු ලෙස ක්‍රියා කිරීම

බැංකුව විසින් කල්බද්ද ආරම්භ වන දිනයේ දී වත්කම භාවිතා කිරීමේ හිමිකමක් හා කල්බදු වගකීමක් හඳුනාගනු ලැබේ. වත්කම භාවිතා කිරීමේ හිමිකම මූලිකවම පිරිවැයට මනිනු ලබන අතර එය කල්බද්ද ආරම්භ වන දිනයට හෝ ඊට පෙර කරන ලද කල්බදු ගෙවීම් සඳහා කල්බදු වගකීම ගැලපීමේ මූලික ප්‍රමාණය සමඟ දරන ලද මූලික සෘජු පිරිවැය සහ ඉඩම් හා කාර්යාල පරිශ්‍රයන් සඳහා සිදුකරන ලද නවීකරණයන් ඉවත්කිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය සමන්විත වේ.

වත්කම භාවිතා කිරීමේ හිමිකම, ඉන්පසුව කල්බද්ද ආරම්භ කළ දිනයේ සිට කල්බදු කාලය අවසන් වන දිනය තෙක් සරල මාර්ගික ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. මීට අමතරව, වත්කම භාවිතා කිරීමේ හිමිකමෙන් කලින් කල හානිකරණ අලාභ අඩුකරන අතර, ඇත්නම්, කල්බදු වගකීමේ නැවත මැනීම් සඳහා ගලපනු ලැබේ.

කල්බදු ආරම්භ කළ දිනට, නොගෙවූ කල් බදු ගෙවීම් වල වර්තමාන වටිනාකමට කල්බදු වගකීම මනිනු ලැබේ. මේ සඳහා කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතිකය භාවිතයෙන් කල්බදු ගෙවීම් වට්ටම් කරනු ලබන අතර, එම පොලී අනුපාතිකය නිශ්චය කළ නොහැකි විට, ඒ සඳහා බැංකුවේ වර්ධක ණය අනුපාතිකය භාවිතා කරනු ලැබේ.

කල්බදු වගකීම් මැනීමේදි ඇතුළත් කල්බදු ගෙවීම්වල පහත දෑ සමන්විත වේ.

- ප්‍රධාන ස්ථාවර ගෙවීම් ඇතුළත් වන ස්ථාවර ගෙවීම්:
- අනුපාතිකයක් මත රඳා පවතින, කල්බද්ද ආරම්භක දිනට අනුපාතිකයක් භාවිතයෙන් මනිනු ලැබූ විචල්‍ය කල්බදු ගෙවීම්;

කල්බදු වගකීම සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ. යම් අනුපාතිකයක වෙනස්වීමකින් ඇතිවන අනාගත කල්බදු ගෙවිම්වල වෙනසක් ඇති අවස්ථාවක, අවශේෂ වටිනාකම් ඇපයක් යටතේ ගෙවීමට අපේක්ෂිත අගය පිළිබඳ බැංකුවේ ඇස්තමේන්තුව තුළ වෙනසක් ඇත්නම්, කලින් අවසන් කිරීමේ විකල්පයක් සඳහා එය දීර්ඝ කිරීමේ විකල්පයක් සහ දඩමුදල් ක්‍රියාවේ යොදවන්නේද යන්න පිළිබඳ තක්සේරුව බැංකුව වෙනස් කරන්නේනම් හෝ සංශෝධිත ප්‍රධාන ස්ථිර කල්බදු ගෙවිමක් ඇත්නම්, එය නැවත මනිනු ලැබේ.

කල්බදු වගකීම මේ ආකාරයෙන් මැනීමේදී, අනුරූප ගැලපීම වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ධාරණ අගයට ගලපනු ලැබේ නැතිනම් වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ධාරණ අගය ශුන්‍ය දක්වා අඩුවී ඇත්නම්, එම කල්බදු වගකීමෙහි වෙනස් වීම ආදායම් ප්‍රකාශයට වාර්තා කරනු ලැබේ.

බැංකුව විසින් වත්කම භාවිතා කිරීමේ හිමිකම හා කල්බදු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි පිළිවෙලින් 'දේපල, පිරියත හා උපකරණ' (සටහන 21) හා 'විවිධ බැරකම් හා උපචිත' (සටහන 32) තුළ දක්වා ඇත.

## 7.19 අස්පෘශ්‍ය වත්කම්

පරිගණක දෘඪාංගවල සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග, අස්පෘෂ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, මෙම අස්පෘෂ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හාණිකරණ අඩුකළ ධාරණ අගයකට පවත්වා ගෙන යනු ලැබේ. මෘදුකාංග වත්කම් සඳහා පසුකාලීනව ඇතිවන වියදම් ප්‍රාග්ධනීකරණය කරන්නේ එමඟින් ඊට අදාල නිශ්චිත වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළ යන්නේ නම් පමණි. අනෙකුත් සියලූ වියදම් දරා ඇති පරිදි වියදම් කෙරේ.

වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ අපේක්ෂිත පරිභෝජන රටාව වඩාත් මැනවින් පිළිබිඹු වන බැවින් අදාල වත්කම පාවිච්චිය සඳහා ලබාගතහැකි දිනයේ සිට වසර 4ක ඵලදායී ජීව කාලයක් තුළ සරල මාර්ගික පදනමක් මත ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

යම් ආයතනයකට පහත සඳහන් කරුණු පෙන්විය හැකි නම් පමණක් සංවර්ධනය තුළින් (හෝ අභ්‍යන්තර ව්‍යාපෘතියක සංවර්ධන අදියරකින්) ඇති වන්නා වූ අෂ්පෘශ්‍යය වත්කම් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගනු ලැබේ.

(අ) භාවිතයට ගැනීමට හැකි වන පරිදි අස්පෘශ්‍ය වත්කම් නිම කිරීමට ඇති තාක්ෂණික ශක්‍යතාව.
(ආ) අස්පෘශ්‍ය වත්කම සම්පූර්ණ කර එය භාවිතා කිරීමට ඇති අභිප්‍රාය
(ඇ) අස්පෘශ්‍ය වත්කම් භාවිතා කිරීමට ඇති හැකියාව
(ඈ) අස්පෘශ්‍ය වත්කම අනාගත ආර්ථික ප්‍රතිලාභ උපදවන ආකාරය. වෙනත් කරුණු ලෙස එය අභ්‍යන්තරව භාවිතා කිරීමට ඇති හැකියාව.
(ඉ) අස්පෘශ්‍ය වත්කම සංවර්ධනය සම්පූර්ණ කිරීමට සහ භාවිතා කිරීමට ප්‍රමාණවත්. තාක්ෂණික, මූල්‍ය සහ වෙනත් සම්පත් පැවතීම.
(ඊ) අස්පෘශ්‍ය වත්කම් එහි සංවර්ධනය තුළ අදාළ වියදම් විශ්වාසදායක ලෙස මැනීමට ඇති හැකියාව.

## 7.20 අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම් යන්නට අභ්‍යයන්තර අරමුදල්වල ආයෝජන, ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යනු ලබන සේවක ණය සහ රජයෙන් අය කර ගත යුතු දැ ඇතුළත් වේ.

## 7.21 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

එක් එක් වාර්තා කිරීමේ දිනයේ දී, ධාරණ අගය හානිකරණය වි ඇති බවට සිද්ධීන් හෝ වාතාවරණයන්හී වෙනස්විම් මඟින් දක්වන්නෙම්, කිසියම් මූල්‍ය නොවන වත්කමක හානිකරණය පිළිබඳ හැඟවීමක් තිබේද යන්න බැංකුව තක්සේරු කරයි. එවැනි හැඟවීමක් පවතිනම්, බැංකුව වත්කමේ අයකරගතහැකි ප්‍රමාණය පිළිබඳ තක්සේරුවක් සිදු කරයි. වත්කමක ධාරණ අගය එහි අයකරගතහැකි ප්‍රමාණය ඉක්මවන්නේනම්, වත්කම හානිකරණය වි ඇති බවට සලකනු ලබන අතර එහි අයකරගතහැකි ප්‍රමාණයට කපා හරිනු ලබයි. හාණිකරණ අලාභ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

එක් එක් වාර්තා කිරීමේ දිනයේදී, හානිකරණය පිළිබඳ යම් හැඟවීමක් තිබේද යන්න තීරණය කිරිමට මූල්‍ය නොවන වත්කම්වල ධාරණ අගය බැංකුව සමාලෝචනය කරයි. එවැනි හැඟවීමක් පවතිනම්, එහිදී වත්කමේ අයකරගතහැකි ප්‍රමාණය තක්සේරු කෙරේ.

හානිකරණ පරීක්ෂාව සඳහා, අනෙකුත් වත්කම්වල මුදල් ගලාඒම් වලින් බොහෝ දුරට ස්වාධීනව අඛණ්ඩ භාවිතයෙන් මුදල් ප්‍රවාහ උපදවන කුඩා වත්කම් සමූහවලට වත්කම් කාණ්ඩගත කරනු ඇත.

වත්කමක 'අයකරගත හැකි ප්‍රමාණය' එම වත්කමෙහි භාවිතයේ පවතින වටිනාකම සහ විකිණීමේ පිරිවැය අඩුකළ සාධාරණ අගය යන දෙකෙන් ඉහළ අගය වේ. වත්කමක 'භාවිතයේ වටිනාකම' මුදලේ කාලීන වටිනාකම සහ වත්කමට විශේෂිත අවදානම් පිළිබඳ වර්තමාන වෙළෙඳපොළ තක්සේරුව පිළිබිඹු කරන පූර්ව බදු වට්ටම් අනුපාතයක් භාවිතයෙන් ඒවායේ වර්තමාන අගයට වට්ටම් කළ එම වත්කමේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත පදනම් වේ. වත්කමක ධාරණ අගය එකී වත්කමේ අයකර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේනම් හානිකරණ අලාභයක් හඳුනාගනු ලබයි.

ගලපන ලද හානිකරණ අලාභ නැවත හැරවිය හැක්කේ අදාල වත්කමේ ධාරණ අගය එම වත්කම මත හානිකරණ අගයක් හඳුනා නොගත් අවස්ථාවක නිර්ණය කළ, ක්ෂය හෝ ක්‍රමක්ෂය ගලපන ලද ශුද්ධ ධාරණ අගය ඉක්මවා නොයන අවස්ථාවක පමණි.

## 7.22 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇති විටෙක සහ වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභවල ඇතුළත් සම්පත්වල ගලායාමක් අවශ්‍යවීමත්, එම බැඳීමේ ප්‍රමාණය විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීමත් මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූරණය කිරීමට බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූරණය නිසැකවම තහවුරු වන අවස්ථාවේදී එය වෙනම වත්කමක් ලෙස හඳුනාගනී.





## 7.23 සංසරණයේ පවතින මුදල

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් නියෝජනය කරයි. සංසරණයේ පවතින මුදල් සඳහා වගකීම. ඒවායේ මුහුණත වටිනාකම මත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

## 7.24 පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්ම

### 7.24.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායක යෝජනා ක්‍රමයක් නොවන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි. බැංකුව විසින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ක්‍රියාත්මක කරයි. පළමු යෝජනා ක්‍රම තුන සම්බන්ධයෙන් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන අරමුදල්වලට බැංකුව සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකක බැර ආයුගණක ඇගයීමේ ක්‍රමයක් භාවිතයෙන් එක් එක් සැලසුම සඳහා වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් බැංකුවේ බැඳීම් එක් එක් සැලැස්ම සඳහා වෙන වෙනම ගණනය කරනු ලබන්නේ සේවා නියුක්තිකයින්ගේ වර්තමාන හා පෙර කාලසීමාවන් හි සපයන ලද සේවා සඳහා උපයාගෙන ඇති අනාගත ප්‍රතිලාභ ප්‍රමාණය ඇස්තමේන්තු කරමින් ය. ප්‍රතිලාභ වට්ටම් කර එහි වර්තමාන අගය තීරණය කරයි. මෙහිදී හඳුනානොගත් අතීත සේවා පිරිවැය සහ සැලසුම් වත්කම්වල සාධාරණ අගය අඩුකරනු ලැබේ. වට්ටම් අනුපාතය වනුයේ ඉදිරියට ඇති සේවා කාලයේ සාමාන්‍යයට ආසන්න කල්පිරීම් දිනයන් සහිත රජයේ බැඳුම්කරවල තක්සේරු දිනට ඉපැයීම් අනුපාතයයි. සටහන් අංක 16 හි හෙළිදරව් කල සියළුම ප්‍රධාන ආයුගණන උපකල්පන, වාර්ෂිකව සංශෝධනය කරනු ලැබේ.

### 7.24.2 නිශ්චිත දායක සැලසුම්

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායකත්වයට සුදුසුකම් ලබයි. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදලේ නිශ්චිත දායක සැලසුම් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

නිශ්චිත දායක සැලසුම්වලට දායකත්වයන් සඳහා බැඳීම් ඒවා පැන නගින අවස්ථාවන්හි දි ආදයම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනී.

## 7.25 ප්‍රදානයන්

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, (ප්‍රදානයන් ලබා ගැනීම සඳහා යුක්තිසහගත සහතිකයක් ඇති සහ සියළුම අදාළ කොන්දේසි, ඇත්නම්, අනුකූල වෙන අවස්ථාව) හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතමයකට සම්බන්ධනම්, ක්‍රමානුකූල පදනමක් මත වියදමට ඒවා ගැලපීමට අවශ්‍ය කාලසීමාවන් පුරා ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. ප්‍රදානයක් වත්කමට සම්බන්ධනම්, එහි සාධාරණ අගය රජයේ විලම්භිත ප්‍රදාන ගිණුමකට බැරකර, එම වත්කමේ ක්ෂයකිරිමේ ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත අදාළ වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ ආදායම් ප්‍රකාශයට මුදා හරිනු ලැබේ.

## 7.26 අසම්භාව්‍ය බැරකම් සහ බැඳීම්

අසම්භාව්‍ය වගකීම් යනු අවිනිශ්චිත අනාගත සිදුවීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කෙරෙන වියහැකි බැඳීම් හෝ ආර්ථික ප්‍රතිලාභ මාරුකිරිම නිශ්චිත නොවන හෝ විශ්වාසනීය ලෙස අගය කළ නොහැකි වර්තමාන බැඳීම් වෙති. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනා නොගන්නා සියලූම ණය ගැතිකම් ඇපවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් අසම්භාව්‍ය වගකීම් හා බැඳීම් අයිතම ලෙස අදාළ ශීර්ෂ යටතේ දක්වා ඇත. අවශ්‍යවන අවස්ථාවන්හි දී එවැනි ප්‍රමාණ වඩාත් උචිත ඇස්තමේන්තු අනුව මිනුම් කරනු ලබයි.

## 7.27 ආදායම සහ වියදම

බැංකුව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ හැකියාව සහ ආදායම නිශ්චිතව මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් හඳුනා ගනී. දරන ලද පිරිවැය සහ ආදායමේ විශේෂ අයිතමවල ඉපයිම අතර ඍජු සම්බන්ධතාවයක් මත පදනම් වි ආදායම් ප්‍රකාශනයෙහි වියදම් හඳුනා ගනි. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත හා උපකරණ කාර්යක්‍ෂම තත්ත්වයකින් පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීමේදී ආදායමට අයකරනු ලැබ ඇත.

ආදායම් හා වියදම් හඳුනාගැනීමට පෙර පහත දක්වෙන විශේෂිත හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලිය යුතුය.

### 7.27.1 පොලී ආදායම් සහ වියදම්

පොලිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම් මිස, සැබෑ මිලදී ගැනීමේ මිල පදනම්ව, සඵල ඵලදායිත්ව ක්‍රමයට, උපචිත පදනමක් මත පොලී ආදායම සහ වියදම, ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනී. ස්ථාවර ආදායම් ආයෝජන හා සුරැකුම්පත් මත උපයන කූපන්, භාණ්ඩාගාර බිල්පත් හා අනිකුත් වට්ටම් කළ උපකරණ මත උපචිත වට්ටම් සහ අධිමිල, පොලී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවලදී පොලී ආදායම අත්හිටුවනු ලබයි. එවැනි ආදායම් ලැබෙනතුරු පොලී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

### 7.27.2 ලාභාංශ

බැංකුවේ ලැබීමේ අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

### 7.27.3 විවිධ ආදායම් හා වියදම්

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනමක් මත හඳුනාගනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීම මත උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, (විකුණුම් ප්‍රතිශ්ඨාවෙන් වත්කමේ ධාරණ අගය හා විකුණුම් වියදම් අඩු කිරීමෙන් ලැබෙන) විකුණුම් වියදම් ආදායම් ප්‍රකාශයෙහි ගිණුම්ගත කර ඇත.

ප්‍රධාන ලාභ උත්පාදන කටයුතුවලට අනුෂාංගික ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ අලාභ එකතුකොට ශුද්ධ පදනමක් මත වාර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

### 7.27.4 සේවක මණ්ඩල වියදම්

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම්, අනිකුත් දේශීයව ගෙවිය යුතු ශේෂයන් යටතේ ඇතුළත් කෙරේ.

### 7.27.5 ආදායම් බදු වියදම

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 116 වගන්තිය, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය සහ 2021 අංක 10 දරණ දේශීය ආදායම් (සංශෝධිත) 2022 අංක 45 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනත සහ 2023 අංක 04 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනත සහ 2023 අංක 14 දරණ දේශීය ආදායම් (සංශෝධිත) ප්‍රකාරව බැංකුවේ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වේ. 2020 අංක 04 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව 2020 ජනවාරි 01 න් ආරම්භව ආර්ථික සේවා ගාස්තු සඳහා තවදුරටත් වගකීමට බැඳී නැත. තවද, 2014 අංක 7 දරණ එකතු කල අගය මත බදු (සංශෝධිත) පනත යටතේ මූල්‍ය සේවා සැපයීම මත එකතු කල අගය මත බද්දෙන් බැංකුව නිදහස් වේ.

## 7.28 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිද්ධීන්

වාර්තාකරණ දිනයට පසු සිදු වූ සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර, මූල්‍ය ප්‍රකාශයන්හි නියමිත සටහන් තුළ සුදුසු සංශෝධන හෝ හෙළිදරව් කිරීම් සිදුකර ඇත.

## 7.29 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ජා.ගි.ප්‍ර. 7 – මුදල් ප්‍රවාහ ප්‍රකාශන සමග අනුකූලව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීම සඳහා 'ඍජු ක්‍රමය' භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයයේ අරමුණ සඳහා, මුදල්/ගෙවීම් නියෝග ගලායෑම් ගැළපීමෙන් අනතුරුව ලැබෙන අගය ඉහත නිර්වචනය කළ පරිදි, මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් හා මුදල් සමානයන් සමන්විත වේ.



මෙහෙයුම් තොරතුරු මූල්‍ය ප්‍රකාශ අතිරේක තොරතුරු

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

## 8 මුදල් සහ මුදල් සමානයන්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2024<br>රු 000 | 2023<br>රු 000 |
|---|---|---|---|
| බැංකු සමඟ ඇති ශේෂයන් | | 302,754,310 | 239,279,034 |
| බැංකු සමඟ ඇති කාලීන තැන්පතු | | 273,653,160 | 486,868,385 |
| එක්දින ස්ථාපනය කිරීම් | | 87,102,049 | 16,422,911 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මුදල් සහ මුදල් සමානයන් | | 663,509,519 | 742,570,330 |
| මුදල් සහ මුදල් සමානයන් මත ලැබිය යුතු පොලිය | | 390,010 | 897,400 |
| සීමාසහිත භාවිතයන් සඳහා පවතින මුදල් සහ මුදල් සමානයන් | 8.1 | 400,837,478 | 456,377,841 |
| අඩුකළා – මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභ | 8.2 | (1,208,732) | (866,001) |
| | | 1,063,528,275 | 1,198,979,570 |

**8.1** 25.1.1 සටහනෙහි පැහැදිලි කරන ආකාරයට ශ්‍රී. ලං. ම. බැ. හා පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා අතර ඇති වූ ද්වීපාර්ශවික මුදල් හුවමාරු පහසුකම යටතේ ලැබුනු චීන යුආන් බිලියන 10ක මුදල සීමාසහිත භාවිතයන් සඳහා පවතින මුදල් ශේෂය නියෝජනය කරයි. මෙම පහසුකම යටතේ ලැබුණු මුදල්, රටවල් දෙක අතර වෙළෙඳ කටයුතුවලදී, ඍජු ආයෝජනවලදී සහ දෙපාර්ශවය මගින් එකඟවන වෙනත් අරමුණු සඳහා යොදාගත හැකිය.

### 8.2 මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභයන්ගේ චලනය

| | 2024 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|
| | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | එකතුව<br>රු. '000 | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | එකතුව<br>රු. '000 |
| ජනවාරි 1 දිනට ශේෂය | 635,409 | 230,592 | 866,001 | 841,441 | 3,392 | 844,833 |
| වර්ෂය තුල අය කිරීම්/(ආපසු හැරවුම්) | 573,323 | (230,592) | 342,731 | (206,032) | 227,200 | 21,168 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,208,732 | _ | 1,208,732 | 635,409 | 230,592 | 866,001 |

## 9 විදේශ සුරැකුම්පත් වල ආයෝජන

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|---|
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් | | | |
| – විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන් | | 672,461,750 | 223,406,791 |
| විදේශ සුරැකුම්පත් ආයෝජනවල එකතුව | | 672,461,750 | 223,406,791 |
| ඇ.එ.ජ.ඩොලර් මිලියන 600.3ක්, නවසීලන්ත ඩොලර් මි. 37ක් සහ යුරෝ මිලියන 25.7ක් වටිනා විදේශ සුරැකුම්පත් වල ආයෝජනයන් 2024 වසර තුළදී විකුණා ඇත. තවද, ඇ.එ.ජ.ඩොලර් මිලියන 379.2ක් ස්ටර්ලින් පවුම් මිලියන 3.5ක්, ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 20ක්, චීන යුආන් මිලියන 1,412.5ක් කැනේඩියානු ඩොලර් මිලියන 9.4ක් සහ යුරෝ මිලියන 7.4ක් වටිනා විදේශ සුරැකුම්පත් ආයෝජන 2024 වසර තුළදී පරිනත විය. | | | |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභ | 9.1 | 1,461,863 | 70,273 |

### 9.1 අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2024 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|
| | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | එකතුව<br>රු. '000 | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | එකතුව<br>රු. '000 |
| ජනවාරි 1 දිනට ශේෂය | 70,273 | – | 70,273 | 4,744 | – | 4,744 |
| වර්ෂය තුල අය කිරීම්/(ආපසු හැරවුම්) | 1,391,590 | – | 1,391,590 | 65,529 | – | 65,529 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,461,863 | – | 1,461,863 | 70,273 | – | 70,273 |

## 10 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

**10.1** පහත දක්වා ඇති වගුව මගින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් එහි කාල්පනික අගයන් සමග වත්කම් හෝ බැරකම් වශයෙන් වාර්තා කර ඇත. දළ අගයන් වශයෙන් වාර්තා කර ඇති කාල්පනික අගය යනු ව්‍යුත්පන්නයට පාදක වූ වත්කමේ, නිර්දේශ අනුපාතයෙහි හෝ දර්ශකයෙහි අගය වන අතර, ව්‍යුත්පන්න උපකරණයන්ගේ අගයන්හි සිදුවන වෙනස්වීම් මිනුම් කිරීමේ පදනම ද වේ. කාලපරිච්ඡේදය අවසානයට හිඟව පවතින ගනුදෙණුවල පරිමාව කාල්පනික අගයන්ගෙන් නිරූපණය වන අතර, එමගින් වෙළඳපල අවදානම හෝ ණය අවදානම නොහැඟවේ.

| | 2024 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|
| | වත්කම්<br>රු. '000 | වගකීම්<br>රු. '000 | කාල්පනික අගය<br>රු. '000 | වත්කම්<br>රු. '000 | වගකීම්<br>රු. '000 | කාල්පනික අගය<br>රු. '000 |
| මුදල් හුවමාරු (Currency SWAPS) | 26,045,845 | 22,382,070 | 518,080,524 | 5,775,226 | 46,740,483 | 396,845,081 |
| ඉදිරියෙහි වූ හුවමාරු (Forex Forward) | 1,911,318 | 14,814,318 | 107,346,944 | – | 2,207,417 | 72,882,743 |
| එකතුව | 27,957,163 | 37,196,388 | 625,427,468 | 5,775,226 | 48,947,900 | 469,727,824 |

**10.2** ඉහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මුදල් හුවමාරු සහ ඉදිරි විදේශ විනිමය ගිවිසුම් වලින් සමන්විත වන අතර, ඒවා විදේශ සංචිත පවත්වා ගැනීමේ ව්‍යවස්ථාපිත අරමුණට අනුව බැංකුව විසින් දරන විදේශ සංචිතවල ආයෝජනය, වෙළෙඳපොළ සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණ සඳහා භාවිතා කරන ලදී. මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු, විදේශ මහ බැංකු, විදේශ බැංකු සහ මූල්‍ය ආයතන සමඟ හුවමාරු ගිවිසුම් සහ ඉදිරි විදේශ විනිමය ගිවිසුම්වලට එළඹීම මගින් ශ්‍රී ලංකා රුපියල අන්තර්ජාතිකව ස්ථාවරව පවත්වා ගැනීමත්, දේශීය මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ශක්තිමත් කිරීමත්, කලාපීය රටවල් අතර ආර්ථික හා මූල්‍ය සහයෝගිතාව වර්ධනය කිරීමත්, විදේශ සංචිත ලැබීම් වැඩි කිරීමත් සහ මෙරටට විදේශ විනිමය ප්‍රවාහයන් වර්ධනය කිරීමත් අරමුණු කෙරේ.

**10.3** ව්‍යුත්පන්නයන් යනු පොලී අනුපාත, මූල්‍ය උපකරණවල වටිනාකම, භාණ්ඩ මිල ගණන්, විදේශ විනිමය අනුපාත, ණය අවදානම් සහ දර්ශක වෙනස්වීම්වලට අනුව අගය තීරණය වන මූල්‍ය ගිවිසුම්ය.

**10.4** මෙම ව්‍යුත්පන්න ගනුදෙනු ඒවායේ කාල සීමාව මත පදනම්ව වර්ගීකරණය කර ඇති අතර, කෙටිකාලීන ව්‍යුත්පන්න වසරකට අඩු කාලසීමාවක් සහිත වන අතර දිගු කාලීන ව්‍යුත්පන්න වසරක් හෝ ඊට වැඩි කාලයක් සහිත වේ.

**10.5** විනිමය අනුපාත අවදානම, කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතා කළමනාකරණය කිරීම සහ ප්‍රතිලාභ වර්ධනය කිරීම සඳහා වූ උපායමාර්ගයක් ලෙස එළඹුණු මුදල් හුවමාරු (Currency SWAP) බැංකුවේ ව්‍යුත්පන්න කළඹෙහි වැදගත් කොටසක් වශයෙන් අඩංගු වී ඇත. මුදල් හුවමාරුවකදී බැංකුව වෙත එකඟ වූ අනුපාතවලට වෙනත් මුදල් ඒකකයක් හුවමාරු කිරීම සඳහා එකඟ වූ දිනක දී තවත් මුදල් වර්ගයකින් නිශ්චිත මුදල් ප්‍රමාණයක් ගෙවනු ලබයි.

**10.6** ඉදිරි විදේශ විනිමය ගිවිසුම් මගින්, බැංකුව එකඟ වූ අනුපාතයකට, එකඟ වූ අනාගත දිනයක දී නිශ්චිත විදේශ මුදල් ප්‍රමාණයක් මිලදී ගැනීමට හෝ විකිණීමට බැඳී සිටී.

**10.7** බැංකුවේ සමස්ථ අවදානම් කළමනාකරණයෙහි කොටසක් ලෙස ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් අපේක්ෂිත ප්‍රතිලාභ බැංකුව වෙත ලැබීම තහවුරු කිරීමට, ව්‍යුත්පන්න ගිවිසුම් වෙත බැංකුවේ නිරාවරණයවීම සමීප වශයෙන් අධීක්ෂණය කරනු ලබයි.





**10.8** බැංකුව විදේශ සංචිත නැංවීමේ අරමුණ සඳහා බලපත්‍රලාභි වාණිජ බැංකු සමග කෙටි කාලීන ඇ.එ.ජ. ඩොලර්/රුපියල් විකුණුම් මිලදී ගැනීම් හුවමාරු ගිවිසුම්වලට ඇතුළත් විය. 2024 දෙසැම්බර් 31 දිනට, හිඟව පවතික හුවමාරු ප්‍රමාණය ඇ. එ. ජ. ඩොලර් මිලියන 1,318.3 ක් විය. [සටහන 54 (ආ)] තවද බැංකුව 2024 වර්ෂය තුළ විදේශීය ප්‍රතිපාර්ශවයන් සමග කෙටි කාලීන ඇ. එ. ජ. ඩොලර්/ජපන් යෙන් විකුණුම් මිලදී ගැනීම් ගිවිසුම් වලට එළඹුණු අතර 2024 දෙසැම්බර් 31 වනවිට, හිඟව පවතින හුවමාරු ප්‍රමාණය ජපන් යෙන් මිලියන 71,000 කි [සටහන 54 (ආ)].

**10.9** විදේශ සංචිත ඉහළ නැංවීමේ අරමුණින් බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සමඟ දිගුකාලීන ඇ. එ. ජ. ඩොලර්/රුපියල් විකුණුම් - මිලදී ගැනීම් හුවමාරු පහසුකම් වලට එළඹෙන ලදි. 2024 දෙසැම්බර් 31 දිනට බලපත්‍රලාභී වාණිජ බැංකු සමඟ බැංකුවේ එවැනි දිගුකාලීන හුවමාරු පහසුකම් සඳහා ගෙවිය යුතු මුදල් පහත පරිදි වේ.

| බැංකුව | ගිවිසුම්ගත දිනය | ගෙවිය යුතු මුදල ඇ. එ. ජ. ඩොලර් (මිලියන) | අවසාන වාරිකය කල්පිරෙන දිනය | කාලසීමාව/කොන්දේසි | ගනුදෙනුවේ අදාළත්වය |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 2023 අගෝස්තු 15 | 225.00 | 2025 අගෝස්තු 12 | • මෙම හුවමාරු පහසුකමේ ඉදිරි පියවීමේ දිනය හා ඉදිරි පියවීමේ දිනයේ පවතින විනිමය අනුපාතිකය සමඟ සමපාත වන පරිදි, බැඳුම්කර හුවමාරු කරන දිනයට (2023 අගෝස්තු 15) ලංකා බැංකුවෙන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 225ක් මිලදී ගැනීම සඳහා අවුරුදු 02ක ස්ථිර පදනම මත ඇතිකරගනු ලබන ඉදිරි ගණුදෙනුවේ (forward transaction) ඉදිරි පියවීමේ දිනය හා ඉදිරි පියවීමේ දිනයේ පවතින විනිමය අනුපාතිකය සකස්කර, එම ඉදිරි පියවීම්වලදී අදාළ ඇ.එ.ජ. ඩොලර් ප්‍රමාණය සහ ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණය එකිනෙකට පියවී යන ලෙසට සැකසිය යුතුය. | දේශීය ණය ප්‍රශස්තකරණය වැඩසටහන යටතේ ලංකා බැංකුවට අයත් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල පැවති ආයෝජන ශ්‍රී ලංකා රුපියල්වලින් පවතින රජයේ බැඳුම්කරවලට හුවමාරු කිරීමට අවස්ථාව සලසාදෙන ලදී. |
| ලංකා බැංකුව | 2021 අප්‍රේල් 22 | 15.00 | 2025 දෙසැම්බර් 15 | • අවුරුදු 6 ක් සඳහා ශුන්‍ය පිරිවැය ලෙස<br>• ආසන්න වශයෙන් ඇ. එ. ජ. ඩොලර් මි. 10ක් සෑම මාස 6 කදීම පියවෙන පරිදි අදියර 5කදී පියවීම කළ යුතුය. | Asian Infrastructure Investment Bank (AIIB) මගින් කොවිඩ්-19 හදිසි හා ආපදා සහන ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා ලබාදුන් ණය. |
| ලංකා බැංකුව | 2021 ජූනි 29 | 44.78 | 2027 දෙසැම්බර් 15 | | |
| මහජන බැංකුව | 2021 අප්‍රේල් 23 | 15.00 | 2025 දෙසැම්බර් 15 | | |
| මහජන බැංකුව | 2021 සැප්තැම්බර් 30 | 44.78 | 2027 දෙසැම්බර් 15 | | |
| DFCC බැංකුව | 2021 නොවැම්බර් 15 | 93.75 | 2028 අගෝස්තු 15 | • අවුරුදු 7ක් සඳහා ශුන්‍ය පිරිවැය ලෙස.<br>• ඇ. එ. ජ. ඩොලර් මි. 6.25 ක් සෑම මාස 3කට වරක්ම පියවෙන පරිදි අදියර 20කදී පියවීම කළ යුතුය. | United States International Development Finance Corporation (DFC) ලබාදුන් ණය මුදල |
| කොමර්ෂල් බැංකුව | 2021 නොවැම්බර් 17 | 35.00 | 2026 නොවැම්බර් 23 | • වසර 05 ක කාලසීමාවක් සහිත මෙම ගිවිසුම පළමු මාස 18 සඳහා ශුන්‍ය පිරිවැය යටතේත්, ඉතිරි කාල සීමාව සඳහා ඇ. එ. ජ. ඩොලර් 01කට ශ්‍රී ලංකා රුපියල් 1ක් බැගින් අර්ධ වාර්ෂිකවත් පියවිය යුතුය. | එක්සත් රාජධානියේ CDC PLC වෙතින් ලැබුනු ණය |
| ජාතික සංවර්ධන බැංකුව (NDB) | 2022 මාර්තු 18 | 27.00 | 2029 මාර්තු 19 | • සම්පූර්ණ කාලසීමාව අවුරුදු 7කි. ඉන් පළමු මාස 18 තුළදී ඇ. එ. ජ. ඩොලර් 1කට ශ්‍රී ලංකා රුපියල් 1ක් බැගිනුත් ඉතිරි කාල සීමාව සඳහා ඇ. එ. ජ. ඩොලර් 1කට ශ්‍රී ලංකා රුපියල් 1ක් බැගින් අර්ධ වාර්ෂිකවත් පියවිය යුතුය.<br>• ඇ. එ. ජ. ඩොලර් මිලියන 3ක් අර්ධ වාර්ෂිකව පියවන පරිදි අදියර 12ක් යටතේ පියවිය යුතුය. | United States International Development Finance Corporation මගින් ලබාදුන් ණය |

## 11 ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සම්බන්ධ වත්කම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම් කළ | | | |
| ජා.මූ.අ. පංගුව | 11.1 | 221,291,888 | 253,508,295 |
| විශේෂ ගැනුම් හිමිකමේ දැරීම | 11.2 | 925,452 | 10,991,665 |
| | | 222,217,340 | 264,499,960 |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ මිනුම් කළ | | | |
| ජා.මූ.අ. සමඟ තැන්පතු | 11.3 | 301,574 | 345,479 |
| කලින් ගෙවීම් – ජා.මූ.අ. ණය | | 357,164 | 493,765 |
| අඩුකළා – ජා.මූ.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභ | 11.4 | (9) | (7) |
| | | 658,729 | 839,237 |
| | | 222,876,069 | 265,339,197 |

### 11.1 ජා.මූ.අ. පංගුව (IMF Quota)

ජා.මු.අ. හි වත්කම් වල ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ එහි සාමාජික රටවලින් ලබාගන්නා ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් පංගුව හෙවත් ප්‍රාග්ධන දායකත්වයයි. එක් එක් රටවල පංගුව, පුළුල් වශයෙන්, එම රටෙහි සාපේක්ෂ ආර්ථික ප්‍රමාණය මත පදනම් කර ගනිමින් තීරණය කරනු ලබයි. ජා.මූ. අරමුදලෙහි සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු තම පංගුවෙන් 25%ක ප්‍රමාණයක් පුළුල් වශයෙන් පිළිගත් විදේශ මුදලකින් හෝ විශේෂ ගැනුම් හිමිකම මගින්ද ඉතිරි 75% ක මුදල එම රටෙහි දේශිය මුදලින්ද ගෙවිය යුතුය. ජා.මූ. අරමුදලේ කොන්දේසිවලට අනුව රජය වෙනුවෙන් බැංකුව සිය ගිණුමෙන්ම ගනුදෙනු සිදුකරනු ලබන හෙයින් ජා.මූ.අ. පංගුව බැංකුවේ වත්කමක් ලෙස නියෝජනය වේ.

ජා.මු අරමුදල, පොදු පංගු සමාලෝචන ගිවිසුම මත පදනම්ව, 2016 ජනවාරි මස දී 189ක් වූ ජා.මු.අ සාමාජිකයන්ගේ පංගුව වැඩි කිරීමට තීරණය කරන ලදී. (වර්තමානයේ ජා.මු.අ. සාමාජික රටවල් ගණන 191 කි.) එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ ජා.මු.අ. පංගුව වි.ගැ.හි. මිලියන 413.40 ක් වූ පෙර පංගු ප්‍රමාණයේ සිට 2016 පෙබරවාරි 17 වන දිනට වි.ගැ.හි. මිලියන 578.80 දක්වා වර්ධනය විය.

ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල 24 වන සටහනේ පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත. සාමාජික පංගුව මගින් ජා.මු.අ. සමඟ රටක පවතින මූල්‍යමය සහ සංවිධානාත්මක සම්බන්ධතාවය තහවුරුකරනු ලබන අතර, පහත පහසුකම් ද මේ සඳහා ඇතුළත් වේ.

සාමාජිකයෙකු ජා.මු.අ. වෙතින් ඉවත්වුවහොත්, එහි පංගු දායකත්වය ජා.මු.අ. වෙත ශුද්ධ බැඳීම් පියවීමට අවශ්‍ය නොවන ප්‍රමාණය දක්වා ආපසු ගෙවනු ලැබේ. කෙසේ වෙතත්, සාමාජිකයන්ට ජා.මු.අ. පංගුව සඳහා පොලියක් හිමි නොවන අතර එම නිසා මුදල් වල කාල වටිනාකම සඳහා වන්දි මුදලක් හිමි නොවේ. එම නිසා, ජා.මු.වා.ප්‍ර. 9 යටතේ, මෙය ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට පවතින අගයක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සාධාරණ අගය ගණනය කිරීමට කල්පිරීමේ කාලයක් නොමැති බැවින් සාධාරණ අගය ක්‍රමක්ෂය පිරිවැය අගයට සමාන වේ.

(i) **දායකයන්:** ජා.මූ.අ. වෙත සාමාජිකයකුගේ දායකය සාමාජිකයාගේ පංගුවට සමාන වන අතර, එමගින් සාමාජිකයා විසින් ජා.මූ.අ. වෙත ලබාදීමට බැඳී ඇති උපරිම මූල්‍ය සම්පත් ප්‍රමාණය නිශ්චය කරනු ලැබේ. සාමාජිකයකු විසින් දායකය සම්පූර්ණයෙන්ම ගෙවිය යුතු අතර, සියයට 25 ක් ජා.මූ.අ. විසින් නියම කරනු ලබන සංචිත වත්කම්වලින් (වි.ගැ.හි. හෝ පාවිච්චි කළ හැකි මුදල්) ගෙවිය යුතුය. ඉතිරි ප්‍රමාණය සාමාජිකයාගේ ව්‍යවහාර මුදලින් ගෙවිය යුතුය.

(ii) **ඡන්දය දීමේ බලතල:** ජා.මූ.අ. තීරණවලදී සාමාජිකයාගේ ඡන්දය දීමේ බලතල පංගුව මගින් නිර්වචනය වේ. එක් එක් ජා.මූ.අ. සාමාජිකයාට මූලික ඡන්දයක් ද පංගුවෙහි සෑම වි.ගැ.හි. 100,000 ක් සඳහා එක් අතිරේක ඡන්දයක් ද බැගින් හිමි වේ. 2008 ප්‍රතිසංස්කරණ මගින් මූලික ඡන්ද සංඛ්‍යාව මුළු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 5.50 ක් ලෙස ස්ථාවර කරන ලදී.

(iii) **මූල්‍යකරණයට පිවිසීම** ජා.මු.අ. මගින් සාමාජිකයෙකුට ලබාගත හැකි මූල්‍ය පහසුකම් ප්‍රමාණය (එහි පිවිසීමේ සීමා) සාමාජිකයාගේ පංගුව මත පදනම් වේ. සමීපස්ථ සහ ව්‍යාප්ත කළ සැලසුම් යටතේ, නිදසුනක් ලෙස, සාමාජිකයෙකුට වාර්ෂිකව සිය පංගුවෙන් සියයට 200 ක් ද සමුච්චිත වශයෙන් සියයට 600 ක් දක්වාද ණය ලබාගත හැකිය. අසාමාන්‍ය අවස්ථාවකදි ප්‍රවේශය මීට වැඩිවිය හැකිය.

(iv) **වි.ගැ.හි. වෙන්කිරීම්:** සාමාජිකයන්ගේ පංගුවලට සමානුපාතිකව ඔවුන්ගේ වි.ගැ.හි. වෙන්කිරීම් ප්‍රමාණය නියම කරනු ලැබේ. ඇ.එ.ජ. ඩොලර් බිලියන 650 කට සමාන, සාමාන්‍ය වි.ගැ.හි. වෙන්කිරීමක් ජා.මු.අ සාමාජිකයන් මෙන්ම වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ සහභාගීවන්නන්හට ජා.මු.අ හි ඔවුන්ගේ පවතින පංගුවට සමානුපාතිකව 2021 අගෝස්තු 23 වන දින සිට බලපැවැත්වෙන පරිදි ලබාදෙන ලදී. මෙම සාමාන්‍ය වි.ගැ.හි වෙන් කිරීමෙන් ශ්‍රී ලංකාව ලද කොටස වි.ගැ.හි මිලියන 554.80 ක් විය.

### 11.2 විශේෂ ගැනුම් හිමිකම් දැරීම

විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) දැරීම යනු ජා.මූ.අ. සාමාජිකයන් හට නිදහස්ව භාවිතා කළ හැකි මුදල් වර්ග සඳහා පවතින විභව්‍ය හිමිකමකි. එනම්, වි.ගැ.හි. දරන්නන්ට එම මුදල් සඳහා අනෙකුත් සංචිත මුදල් හුවමාරු කරගත හැකිවීමය. වි.ගැ.හි සංචිත වත්කමක් ලෙස සලකනුයේ ජා.මු.අ. සාමාජිකයින් වි.ගැ.හි දැරීමට සහ පිළිගැනීමට බැඳී සිටීම සහ වි.ගැ.හි. පද්ධතියේ මෙහෙයුම්වලට අදාළ විවිධ වගකීම්වලට ගරු කිරීමට බැඳී සිටීම තුළිණි. අබාධව භාවිතා කළ හැකි මුදල් මත වි.ගැ.හි. වල පවතින හිමිකම දෙයාකාරයකින් ගරු කිරීම ජා.මූ.අ. විසින් තහවුරු කරනු ලැබේ. එනම්, දුර්වල විදේශීය තත්ත්වයන්හි පවතින සාමාජිකයන්ගෙන් වි.හැ.ගි. මිලට ගැනීම සඳහා බලවත් විදේශීය තත්ත්වයන් පවත්නා සාමාජිකයන් නම් කිරීම මගින් සහ කළමනාකරණය කළ වෙළෙඳපොළක් තුළ සාමාජිකයන් අතර, ස්වෙච්ඡා හුවමාරු කිරීම මගින් ය. අදාළ වාර්තාකරණ දිනයන්හී බැංකුව විසින් දරන ලද මුළු ප්‍රමාණය ඉහත සංඛ්‍යාවන්ගෙන් දැක්වේ.

විශේෂ ගැණුම් හිමිකම් දැරීමේ ලක්ෂණ සතුව මුදල් වලට සමාන ලක්ෂණ පවතී. එමනිසා, ජා.මු.වා.ප්‍ර. 9 යටතේ, මෙය ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට පවතින අගයක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සාධාරණ අගය ගණනය කිරීමට කල්පිරීමේ කාලයක් නොමැති බැවින්, සාධාරණ අගය ක්‍රමක්ෂය පිරිවැය අගයට සමාන වේ.

### 11.3 ජා.මූ. අරමුදලේ තැන්පතු – දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම – (PRGF – HIPC) භාර තැන්පතුව

දැඩි ණයගැති භාවයට පත්වී සිටින රටවල් වෙනුවෙන් දිළිදුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම (PRGF–HIPC) වෙනුවෙන්, 2000 අප්‍රේල් 21වන දින ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන (පරිපාලිත – Administrated) වි.ගැ.හි. 788,783 ක ශේෂයකින් යුතු විශේෂ විලම්භිත ගිණුම (SCA 2) පැවරීමක් අරඹන ලදී. මෙම ගිණුම අරඹන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මගපෙන්වීම මත SCA 2 ගිණුම වසා දැමීමට තීරණය කිරීමේදි ශ්‍රී ලංකවට අනුව SCA 2 ගිණුමෙහි පැවැති ශේෂය මාරු කිරීමෙන්ය. මෙම ගිණුමෙහි ශේෂයන් ඇති රටවලින් ජා.මූ.අ. පහත දැක්වෙන ඉල්ලීම් කරන ලදී. උක්ත ගිණුමෙහි සඳහන් ශේෂයන් (PRGF-HIPC) භාර ගිණුම වෙත ප්‍රතිපාදනය කිරීම කළ යුත්තේ එකවර දෙනු ලබන පැවැරුමක් ලෙසින් හෝ සහනාධාරයක් ලෙසිනි. මෙය PRGF-HIPC ණය වෙනුවෙන් සපයා දිය. යුතුය. ඒ අනුව SCA 2 ගිණුමේ ශේෂය PRGF-HIPC භාර ගිණුම වෙත පවරා දීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. මෙය පවරා දෙනු ලබන්නේ එකවර මුදාහරිනු ලබන සහනාධාරයක් ලෙසින් නොව 2018 වසර දක්වා බල පැවැත්වෙන පොලී රහිත තැන්පතුවක් වශයෙනි. පසුව මෙය 2024 දක්වා දීර්ඝ කරන ලදී.

### 11.4 ජා.මු.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| අදියර 1 | | |
| ජනවාරි 1 දිනට ශේෂය | 7 | 8 |
| වර්ෂය තුළ දී අයකිරීම්/(ආපසු හැරවුම්) | 2 | (1) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 9 | 7 |

## 12 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 අංක 16 දරණ ශ්‍රී.ලං.ම. බැංකු පනතේ 86 (4) වගන්තිය යටතේ ද්විතීක වෙළෙඳපොළෙන් හා 86 (5) වගන්තිය යටතේ ප්‍රාථමික වෙළෙඳපොළෙන් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම සිදුකරයි.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | – | 208,344,310 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 1,748,873,060 | 1,836,003,282 |
| | 1,748,873,060 | 2,044,347,592 |

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ආයෝජන අපේක්ෂිත ණය අලාභ (ECL) ගණනය කිරීම් වලට යටත් වේ. කෙසේ වෙතත් රජයේ මූල්‍ය වත්කම් සඳහා ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවය (PD) ශූන්‍ය වන අතර එබැවින් අපේක්ෂිත ණය අලාභ සඳහා වන ප්‍රතිපාදන ශූන්‍ය වේ.

## 13 ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් | 26,189,000 | 332,862,000 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් මත ලැබිය යුතු පොලී | 5,922 | 1,089,940 |
| | 26,194,922 | 333,951,940 |

## 14 මූල්‍ය සහ අනිකුත් ආයතනවල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 114 (2) (අ) වගන්තිය යටතේ මෙම ආයෝජන සිදු කරනු ලබයි. මෙම වගන්තිය යටතේ, පාලක මණ්ඩලයේ අභිමතය පරිදි බැංකු සහ මූල්‍ය අංශයේ මානව සම්පත් සහ තාක්ෂණික සංවර්ධනය, දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකු අතර ගනුදෙනු නිශ්කාෂණය කිරීම පහසු කිරීම සඳහා පිහිටුවන ලද සමාගමක කොටස් අත්පත්කර ගැනීමට සහ දරා ගැනීමට බැංකුව වෙත බලතල පවරා ඇත.

### 14.1 ආයෝජන තත්ත්වය

| ආයතනය | ව්‍යාපාර කටයුතුවල ස්වභාවය | 2024 කොටස් ගණන රු. '000 | 2024 මිලදී ගැනීමේ පිරිවැය රු. '000 | 2023 කොටස් ගණන රු. '000 | 2023 සාධාරණ අගය රු. '000 |
|---|---|---|---|---|---|
| සීමාසහිත ලංකා පේ (පුද්ගලික) සමාගම | ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය | 2,986,824 | 35,989 | 2,986,824 | 938,965 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | ස්වයංක්‍රීය අරමුදල් හුවමාරුව | 500,000 | 5,000 | 500,000 | – |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | ණය තොරතුරු සම්පාදනය | 48,244 | 5,845 | 48,244 | 1,230,576 |
| | | | 46,834 | | 2,169,541 |

මෙම ආයෝජන 2023 දෙසැම්බර් 31වන දින දක්වා අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් ලෙස වර්ගීකරණය කරන ලදී. කෙසේ වෙතත් මෙම ආයෝජන නියාමන අවශ්‍යතා යටතේ සිදුකරන ලද උපායමාර්ගික ආයෝජන වන අතර මෙම සමාගම්වල කොටස් සඳහා වෙළඳපල මිලක් නොමැති වීම සැලකිල්ලට ගනිමින්, වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම සඳහා 2024 දෙසැම්බර් 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ආයෝජන පිරිවැය මත දක්වා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 දෙසැම්බර් 31වන දිනට අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද කොටස් ආයෝජන සඳහා වූ රු. මි. 2,122.41 ක වෙළඳපල ඇගයීම් ලාභ, 2024 දී ඉවත් කරන ලදී.

## 15 බැංකු සඳහා දෙන ලද ණය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|
| බැංකු සඳහා දෙන ලද ණය | 15.1 | 9,704,369 | 47,931,158 |
| අඩුකළා – බැංකු සඳහා දෙන ලද ණය මත අපේක්ෂිත ණය අලාභ | 15.2 | (142,939) | (135,471) |
| | | 9,561,430 | 47,795,687 |

### 15.1 බැංකු සඳහා දෙන ලද ණය

මේවා 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 5 වන පරිච්ඡේදයේ III (අ) කොටසට අනුව ඵලදායීතා කටයුතු සඳහා ලබාදෙනු ලබන ණය වේ. කෙසේවෙතත්, 2023 අංක 16 දරණ නව ශ්‍රී ලංකා මහ බැංකු පනත පැනවීමත් සමඟ, ඉතුරුම් විධිවිධාන එනම් නව පනතේ 134 වන වගන්තිය යටතේ මෙම ණය පාලනය කරනු ලැබේ.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| මධ්‍යම සහ දිගුකාලීන ණය යෝජනා ක්‍රමය | | |
| – සම්බන්ධිත පාර්ශවයන් | 13,906 | 16,039 |
| උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය | | |
| – සම්බන්ධිත පාර්ශවයන් | – | 8,448 |
| සෞභාග්‍යා කොවිඩ් 19 පුනරුද සහන ණය පහසුකම | | |
| – සම්බන්ධිත පාර්ශවයන් | 129 | 34,612 |
| – අනෙකුත් | – | 38,215 |
| සෞභාග්‍යා කොවිඩ් 19 පුනරුද ප්‍රතිමූල්‍ය ණය පහසුකම | | |
| – සම්බන්ධිත පාර්ශවයන් | – | 576,334 |
| – අනෙකුත් | – | 212,185 |
| සෞභාග්‍යා ණය පහසුකම | | |
| – සම්බන්ධිත පාර්ශවයන් | 8,302,336 | 12,356,860 |
| – අනෙකුත් | 813,371 | 1,455,216 |
| ශ්‍රී.ලං.ම.බැංකුවේ ණය ඇපකර පහසුකම යටතේ ලබාදුන් ණය | | |
| – සම්බන්ධිත පාර්ශවයන් | 120,456 | 101,226 |
| – අනෙකුත් | 9,091 | 9,091 |
| දේශීය කෘෂිකර්මාන්තය නඟාසිටුවීමේ ණය යෝජනා ක්‍රමය (නියමු ව්‍යාපෘතිය) | | |
| – සම්බන්ධිත පාර්ශවයන් | 364,714 | 508,007 |
| – අනෙකුත් | 80,366 | 114,925 |
| බැංකු සඳහා ලබාදුන් ද්‍රවශීලතා ආධාරක පහසුකම | – | 32,500,000 |
| | 9,704,369 | 47,931,158 |





සෞභාග්‍යා ණය පහසුකම, සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම සහ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ප්‍රතිමූල්‍ය ණය පහසුකම යනු කෘෂි කාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආපදාවන්ගෙන් හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්ථාපිත කරන ලද ණය යෝජනා ක්‍රම වන අතර, සැමට ප්‍රතිලාභ බෙදී යන කෘෂිකාර්මික සංවර්ධනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා කුඩා පරිමාණ ගොවි ප්‍රජාව වෙත දැරිය හැකි මූල්‍ය පහසුකම් ලබාදීම ඇතුළුව වඩාත් හොඳ වෙළඳපොළ අවස්ථා උදාකිරීම හා තාක්‍ෂණික සහය ලබාදීම සඳහා දේශීය කෘෂිකර්මාන්තය නඟා සිටුවීමේ ණය යෝජනා ක්‍රමය DAD-PP නියමු ව්‍යාපෘතිය ලෙස හඳුන්වා දී ඇත. දැනට ශ්‍රී ලංකා මහ බැංකු පනත විසින් පනවා ඇති ප්‍රතිමූල්‍යකරණ සීමාවන් හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව ණය ලබා නොදෙන අතර සියලුම ණය පහසුකම් අයකර ගැනීමේ අදියර පවතී.

### 15.2 බැංකුවලට ලබා දුන් ණය මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2024 අදියර 1 රු.'000 | 2024 අදියර 2 රු.'000 | 2024 අදියර 3 රු.'000 | 2024 එකතුව රු.'000 | 2023 අදියර 1 රු.'000 | 2023 අදියර 2 රු.'000 | 2023 අදියර 3 රු.'000 | 2023 එකතුව රු.'000 |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | 14,696 | 10,457 | 110,318 | 135,471 | 6,057 | 251,565 | 86,307 | 343,929 |
| වර්ෂය තුල දී අයකිරීම්/(ආපසු හැරවුම්) | (7,476) | (4,284) | 19,228 | 7,468 | 8,639 | (241,108) | 24,011 | (208,458) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 7,220 | 6,173 | 129,546 | 142,939 | 14,696 | 10,457 | 110,318 | 135,471 |

## 16 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

සියම සුදුසුකම්ලත් සේවකයින් ආවරණය වන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හතක් බැංකුව විසින් මෙහෙයවනු ලැබේ. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (පැරණි) යටතේ, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවට බැඳුනු සේවකයින්, වර්ෂ 10 ක සේවා කාලයක් නිම කිරීමෙන් අනතුරුව එයට සුදුසුකම් ලබති. 1998 ජනවාරි 01 දිනට පසු බැංකු සේවයට එක්වී වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කල සේවකයන් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලබයි. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය දායක මුදල් නොගෙවන විශ්‍රාමවැටුප් යෝජනා ක්‍රමයක් වන අතර, එහිදී ප්‍රතිලාභ පිරිවැය සම්පූර්ණයෙන්ම බැංකුව විසින් දරනු ලැබේ. පිරිමි සේවකයන් සඳහා වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, කාන්තා සේවිකාවන් සඳහා වූ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවේ සේවයට බැඳුනු සේවකයින්ට විවෘතය. එහිදී 1998 ජනවාරි 01 දිනට පසුව එකතු වූ බැංකුවේ සේවකයින් සඳහා නව වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය විවෘතව පවතී. වැන්දඹු සහ අනත්දරු (පැරණි) සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු (පැරණි) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා 1994 අගෝස්තු 01 දිනට පෙර බඳවා ගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5% ක ප්‍රමාණයකින් දායක වන අතර, 1994 අගෝස්තු 01 දින හෝ ඊට පසු බඳවාගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 10% කින් දායක වේ. තවද නව වැන්දඹු අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අයත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5.5% කින් දායක වේ.

බැංකුවේ අවුරුදු 5 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින් සහ සේවක වැටුප් විශ්‍රාම ක්‍රමය යටතේ මාසික විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සේවකයන් සඳහා පාරිතෝෂික ප්‍රතිලාභ ද බැංකුව විසින් සලසනු ලැබේ. මෙම බැරකම පියවීම සඳහා, ආයුගණක අගය භාවිතා කරමින් ගණනය කළ බැරකමට සමාන ප්‍රතිපාදනයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඉදිරියට ගෙනයනු ලැබේ.

බැංකුවට පශ්චාත්-සේවක වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ඇති අතර, ඒ යටතේ විශ්‍රාමලත් සේවකයන්ට තමා හා තම කලත්‍රයන්, දෙමව්පියන් සහ වැන්දඹුවන්/වැන්දඹු පුරුෂයන් විසින් දරන ලද ඇතැම් වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය ලබා දේ.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, නව වැන්දඹු සහ අනත්දරු හා වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රමවල වර්ෂය තුළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් හා ප්‍රවර්ථන සේවා පිරිවැය නැවත තක්සේරු කිරීම සඳහා ස්වාධීන ආයුගණක, කේ. ඒ. පණ්ඩිත් උපදේශකයන් හා ආයුගණකයන්ගේ (මුම්බායි) සේවය ලබාගෙන ඇත.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන්හි අරමුදල් වෙන් වෙන්ව කළමනාකරණය කරන අතර, වෙන් වෙන වශයෙන් පොත් පවත්වාගෙන යනු ලබයි. කෙසේ වෙතත්, පාරිතෝෂික යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය බැංකුවේ ගිණුම් පොත්වලින් වෙන්ව පවත්වාගෙන යනු නොලැබේ. තවද, ආයෝජන හා ආයෝජන ආදායම්, බැංකු පොත්වල මෙම අරමුදල්වලට පරිබාහිරව වාර්තා කරනු ලබන අතර, ආයෝජන ආදායම් නැවත මෙම අරමුදල්වලට මාරු කරන අතර, බෙදාහැරීමක් නොමැතිව නැවත ආයෝජනය කරනු ලැබේ.

මුළු සැලසුම් වත්කම්/ආයෝජනයේ සාධාරණ අගය වන රු. මි. 79,783.16 (2023 - රු.මි. 55,571.05) මුළු ප්‍රතිලාභ බැරකමෙහි වර්තමාන අගය වන රු.මි. 68,107.70 (2023 – රු.මි. 75,377.83), ඉක්මවා යන අතර, වාර්තාකරණ කාලය අවසානයේදී රු. මි. 11,676.47 (2023 – හිඟය - රු.මි. 19,806.78) ක අතිරික්තයක් පෙන්නුම් කරයි.

2024 දෙසැම්බර් 31 දිනට

| ප්‍රතිලාභ බැරකම/(වත්කම) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම | 44,210,086 | 3,946,467 | 9,936,350 | 1,016,579 | 1,552,444 | 596,971 | 6,847,798 | 68,106,695 |
| සැලසුම් වත්කම්/ආයෝජනවල සාධාරණ වටිනාකම | (45,545,503) | (11,673,711) | (11,127,678) | (4,323,467) | (2,701,100) | (289,493) | (4,122,210) | (79,783,162) |
| ශුද්ධ ප්‍රතිලාභ බැරකම්/(වත්කම්) | (1,335,417) | (7,727,244) | (1,191,328) | (3,306,888) | (1,148,656) | 307,478 | 2,725,588 | (11,676,467) |

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ විශ්‍රාම සේවක හා අනෙකුත් සේවක පශ්චාත් ප්‍රතිලාභ සැලසුම් යටතේ දක්වා ඇති බැරකම් ශේෂය පහත සඳහන් කරුණු හේතුවෙන් ස්වාධීන ආයුගණක විසින් දෙනු ලැබූ ශුද්ධ බැරකම් ශේෂයෙන් වෙනස් වේ.

(අ) වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ ශුද්ධ වත්කම් ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශවල ගිණුම් ගතකොට නැත්තේ එකී අරමුදල්වල යම් ඉතිරි ශේෂයක් වෙතොත් එය ලබා ගැනීමට ඇති සම්භාවිතාව ඉතා අඩු බැවිනි.

(ආ) පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා, බැංකුව අදාළ වත්කම් වෙනම අරමුදලක් (අභ්‍යන්තරව පවත්වාගන්නා) තුළ තබා නොගන්නා බැවින්, ආයුගණකයාට අනුව මූල්‍ය ප්‍රකාශන නියෝජනය කරන්නේ ශුද්ධ බැරකම් ප්‍රමාණය නොව දළ බැරකම් ප්‍රමාණයයි.

| | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| **විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වල වත්කම් තත්ත්වය** | | |
| සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | 1,335,417 | – |
| සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය – නව | 7,727,244 | 4,507,114 |
| | 9,062,661 | 4,507,114 |
| **විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වල වගකීම් තත්ත්වය** | | |
| සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | – | 21,003,126 |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | – | 4,845,307 |
| පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (දළ අගය) | 596,971 | 562,315 |
| වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය (දළ අගය) | 6,847,798 | 4,491,378 |
| | 7,444,769 | 30,902,126 |





| ප්‍රතිලාභ බැරකම/(වත්කම) වෙනස් වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| 2024 ජනවාරි 1 දිනට | 21,003,126 | (4,507,115) | 4,845,307 | (1,927,607) | (814,840) | 323,203 | 884,701 | 19,806,775 |
| ශුද්ධ ප්‍රතිලාභ වියදම්/(ආදායම්) | 2,646,394 | (472,949) | 567,024 | (256,540) | (293,224) | 82,354 | 166,676 | 2,439,735 |
| අනෙකුත් විස්තීරණ ආදායම්වල හඳුනාගත් අගය | (16,862,608) | (1,936,291) | (4,874,262) | (1,122,741) | (40,592) | (98,079) | 1,674,211 | (23,260,362) |
| දායක ගෙවීම් | (8,122,329) | (810,889) | (1,729,397) | – | – | – | – | (10,662,615) |
| 2024 දෙසැම්බර් 31 දිනට | (1,335,417) | (7,727,244) | (1,191,328) | (3,306,888) | (1,148,656) | 307,478 | 2,725,588 | (11,676,467) |

| පුරෝකථනය කළ ප්‍රතිලාභ බැඳීම්හි වර්තමාන වටිනාකම්වල වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| 2024 ජනවාරි 1 දිනට | 52,618,936 | 2,964,009 | 12,463,640 | 1,310,948 | 966,603 | 562,315 | 4,491,378 | 75,377,829 |
| පොලී පිරිවැය | 6,629,986 | 373,465 | 1,570,419 | 165,179 | 121,792 | 70,852 | 565,914 | 9,497,607 |
| ප්‍රවර්තන සේවා පිරිවැය | – | 94,948 | – | – | – | 41,630 | 74,902 | 211,480 |
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (4,297,908) | (39,479) | (964,635) | (65,183) | (2,514) | (61,643) | (601,268) | (6,032,630) |
| මූල්‍ය උපකරණවල වෙනස හේතුවෙන් - බැඳීම් මත ආයුගණක (ලාභ)/අලාභ | (8,435,462) | 562,982 | (1,803,234) | (221,162) | 509,017 | (57,705) | 2,330,784 | (7,114,780) |
| බැඳීම් මත ආයුගණන ලාභ | (2,305,466) | (9,458) | (1,329,840) | (173,203) | (42,454) | 41,522 | (13,912) | (3,832,811) |
| 2024 දෙසැම්බර් 31 දිනට | 44,210,086 | 3,946,467 | 9,936,350 | 1,016,579 | 1,552,444 | 596,971 | 6,847,798 | 68,106,695 |

| සැලසුම් වත්කම්/ආයෝජනවල සාධාරණ අගයේ වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| 2024 ජනවාරි 1 දිනට | 31,615,810 | 7,471,124 | 7,618,333 | 3,238,555 | 1,781,443 | 239,112 | 3,606,677 | 55,571,054 |
| පොලී ආදායම | 3,983,592 | 941,362 | 959,910 | 408,058 | 224,462 | 30,128 | 454,441 | 7,001,953 |
| සේවායෝජක දායකත්වයන් | 8,122,329 | 810,889 | 1,729,397 | – | – | – | – | 10,662,615 |
| සේවාදායක දායකත්වයන් | – | – | 43,485 | 13,661 | 190,554 | – | 19,699 | 267,399 |
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (4,297,908) | (39,479) | (964,635) | (65,183) | (2,514) | (61,643) | (601,268) | (6,032,630) |
| සැලසුම් වත්කම්/ආයෝජන මත ප්‍රතිලාභ, පොලී ආදායම රහිත | 6,121,680 | 2,489,815 | 1,741,188 | 728,376 | 507,155 | 81,896 | 642,661 | 12,312,771 |
| 2024 දෙසැම්බර් 31 දිනට | 45,545,503 | 11,673,711 | 11,127,678 | 4,323,467 | 2,701,100 | 289,493 | 4,122,210 | 79,783,162 |

| 2024 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායම්හි හඳුනාගත් වියදම්/(ආදායම්) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වර්ෂය සඳහා බැඳීම් මත ආයුගණන (ලාභ)/අලාභ | | | | | | | | |
| මූල්‍ය උපකල්පන වෙනස මත | (8,435,462) | 562,982 | (1,803,234) | (221,162) | 509,017 | (57,705) | 2,330,784 | (7,114,780) |
| පළපුරුද්ද මත | (2,305,466) | (9,458) | (1,329,840) | (173,203) | (42,454) | 41,522 | (13,912) | (3,832,811) |
| සැලසුම් වත්කම්/ආයෝජන මත ප්‍රතිලාභ, පොලී ආදායම රහිත | (6,121,680) | (2,489,815) | (1,741,188) | (728,376) | (507,155) | (81,896) | (642,661) | (12,312,771) |
| වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් ශුද්ධ (ආදායම)/වියදම | (16,862,608) | (1,936,291) | (4,874,262) | (1,122,741) | (40,592) | (98,079) | 1,674,211 | (23,260,362) |





| 2024 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ප්‍රතිලාභ වියදම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ප්‍රතිලාභ බැඳීම් මත පොලී පිරිවැය | 6,629,986 | 373,465 | 1,570,419 | 165,179 | 121,792 | 70,852 | 565,914 | 9,497,607 |
| සැලසුම් වත්කම්/ආයෝජන මත පොලී ආදායම | (3,983,592) | (941,362) | (959,910) | (408,058) | (224,462) | (30,128) | (454,441) | (7,001,953) |
| ප්‍රවර්තන සේවා පිරිවැය | – | 94,948 | – | – | – | 41,630 | 74,902 | 211,480 |
| සේවාදායක දායකත්වයන් | – | – | (43,485) | (13,661) | (190,554) | – | (19,699) | (267,399) |
| ප්‍රතිලාභ වියදම/(ආදායම | 2,646,394 | (472,949) | 567,024 | (256,540) | (293,224) | 82,354 | 166,676 | 2,439,735 |

| සැලසුම් වත්කම්/ආයෝජනවල සංයුතිය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන | 44,650,902 | 11,485,484 | 11,010,285 | 4,277,287 | 2,663,919 | 286,048 | 3,933,210 | 78,307,134 |
| ප්‍රතිවිකුණුම්වල ආයෝජන | 333,050 | 70,146 | 68,195 | 12,999 | 15,756 | – | 107,601 | 607,746 |
| ණයකරවල ආයෝජන | 559,311 | 114,784 | 46,234 | 30,630 | 17,614 | 3,445 | 81,399 | 853,417 |
| ජංගම ගිණුම්වල ඉතිරි ශේෂය | 2,240 | 3,297 | 2,964 | 2,551 | 3,811 | – | – | 14,862 |
| 2024 දෙසැම්බර් 31 දිනට සැලසුම් වත්කම්/ආයෝජනවල එකතුව | 45,545,503 | 11,673,711 | 11,127,678 | 4,323,467 | 2,701,100 | 289,493 | 4,122,210 | 79,783,162 |

## 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභ ගෙවීම් සඳහා කල්පිරීම් විශ්ලේෂණය

| වාර්තා කළ දින සිට ඉදිරි වර්ෂ වල ගෙවීමට සැලසුම් කළ ප්‍රතිලාභ ගෙවීම් | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව<br>රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව<br>රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| ඊළඟ වසර 1 | 4,171,542 | 19,330 | 933,923 | 37,316 | 1,619 | 75,469 | 497,670 | 5,736,869 |
| ඊළඟ වසර 2 | 4,330,368 | 20,528 | 959,356 | 47,434 | 4,660 | 74,838 | 519,875 | 5,957,059 |
| ඊළඟ වසර 3 | 4,502,455 | 37,076 | 983,774 | 57,807 | 8,375 | 73,011 | 550,972 | 6,213,470 |
| ඊළඟ වසර 4 | 4,665,530 | 55,197 | 1,007,086 | 68,350 | 12,867 | 70,861 | 582,472 | 6,462,363 |
| ඊළඟ වසර 5 | 4,817,062 | 72,692 | 1,029,199 | 79,028 | 18,244 | 71,324 | 599,022 | 6,686,571 |
| වසර 6 සිට 10 දක්වා එකතුව | 25,755,120 | 894,305 | 5,430,441 | 557,586 | 212,471 | 346,259 | 3,485,189 | 36,681,371 |

## 2023 දෙසැම්බර් 31 දිනට

| ප්‍රතිලාභ බැරකම/(වත්කම) වෙනස් වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව<br>රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව<br>රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| 2023 ජනවාරි 1 දිනට | 1,609,738 | (4,147,766) | 1,018,938 | (1,382,294) | (844,696) | 105,741 | 654,844 | (2,985,495) |
| ශුද්ධ ප්‍රතිලාභ වියදම්/(ආදායම්) | 305,850 | (767,483) | 159,280 | (268,352) | (258,672) | 42,575 | 139,566 | (647,236) |
| අනෙකුත් විස්තීරණ ආදායම්වල හඳුනාගත් අගය | 19,317,266 | 908,895 | 3,667,089 | (276,961) | 288,528 | 174,887 | 90,291 | 24,169,995 |
| දායක ගෙවීම් | (229,728) | (500,761) | – | – | – | – | – | (730,489) |
| 2023 දෙසැම්බර් 31 දිනට | 21,003,126 | (4,507,115) | 4,845,307 | (1,927,607) | (814,840) | 323,203 | 884,701 | 19,806,775 |





| පුරෝකථනය කළ ප්‍රතිලාභ බැඳීම්හි වර්තමාන වටිනාකම්වල වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව<br>රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව<br>රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| 2023 ජනවාරි 1 දිනට | 28,743,485 | 742,361 | 6,594,557 | 769,222 | 256,344 | 316,311 | 3,430,954 | 40,853,234 |
| පොලී පිරිවැය | 5,461,262 | 141,049 | 1,252,966 | 146,152 | 48,705 | 60,099 | 651,881 | 7,762,114 |
| ප්‍රවර්තන සේවා පිරිවැය | – | 20,592 | – | – | – | 22,484 | 49,063 | 92,139 |
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (4,117,977) | (24,216) | (949,036) | (69,192) | (1,102) | (77,904) | (511,274) | (5,750,701) |
| බැඳීම් මත ආයුගණන ලාභ | 22,532,166 | 2,084,223 | 5,565,153 | 464,766 | 662,656 | 241,325 | 870,754 | 32,421,043 |
| 2023 දෙසැම්බර් 31 දිනට | 52,618,936 | 2,964,009 | 12,463,640 | 1,310,948 | 966,603 | 562,315 | 4,491,378 | 75,377,829 |

| සැලසුම් වත්කම්/ආයෝජනවල සාධාරණ අගයේ වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව<br>රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව<br>රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| 2023 ජනවාරි 1 දිනට | 27,133,747 | 4,890,127 | 5,575,619 | 2,151,516 | 1,101,040 | 210,570 | 2,776,110 | 43,838,729 |
| පොලී ආදායම | 5,155,412 | 929,124 | 1,059,368 | 408,788 | 209,198 | 40,008 | 527,461 | 8,329,359 |
| සේවායෝජක දායකත්වයන් | 229,728 | 500,761 | – | – | – | – | – | 730,489 |
| සේවාදායක දායකත්වයන් | – | – | 34,318 | 5,716 | 98,179 | – | 33,917 | 172,130 |
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (4,117,977) | (24,216) | (949,036) | (69,192) | (1,102) | (77,904) | (511,274) | (5,750,701) |
| සැලසුම් වත්කම්/ආයෝජන මත ප්‍රතිලාභ, පොලී ආදායම රහිත | 3,214,900 | 1,175,328 | 1,898,064 | 741,727 | 374,128 | 66,438 | 780,463 | 8,251,048 |
| 2023 දෙසැම්බර් 31 දිනට | 31,615,810 | 7,471,124 | 7,618,333 | 3,238,555 | 1,781,443 | 239,112 | 3,606,677 | 55,571,054 |

| 2023 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායම්හි හඳුනාගත් වියදම්/(ආදායම්) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය සඳහා බැඳීම් මත ආයුගණන (ලාභ)/අලාභ | | | | | | | | |
| මූල්‍ය උපකල්පන වෙනස මත | 23,834,427 | 2,076,957 | 5,697,363 | 719,047 | 708,123 | 241,566 | 1,369,209 | 34,646,692 |
| පළපුරුද්ද මත | (1,302,261) | 7,266 | (132,210) | (254,281) | (45,467) | (241) | (498,455) | (2,225,649) |
| සැලසුම් වත්කම්/ආයෝජන මත ප්‍රතිලාභ, පොලී ආදායම රහිත | (3,214,900) | (1,175,328) | (1,898,064) | (741,727) | (374,128) | (66,438) | (780,463) | (8,251,048) |
| වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් ශුද්ධ (ආදායම)/වියදම | 19,317,266 | 908,895 | 3,667,089 | (276,961) | 288,528 | 174,887 | 90,291 | 24,169,995 |

| 2023 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ප්‍රතිලාභ වියදම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රතිලාභ බැඳීම් මත පොලී පිරිවැය | 5,461,262 | 141,049 | 1,252,966 | 146,152 | 48,705 | 60,099 | 651,881 | 7,762,114 |
| සැලසුම් වත්කම්/ආයෝජන මත පොලී ආදායම | (5,155,412) | (929,124) | (1,059,368) | (408,788) | (209,198) | (40,008) | (527,461) | (8,329,359) |
| ප්‍රවර්තන සේවා පිරිවැය | – | 20,592 | – | – | – | 22,484 | 49,063 | 92,139 |
| සේවාදායක දායකත්වයන් | – | – | (34,318) | (5,716) | (98,179) | – | (33,917) | (172,130) |
| ප්‍රතිලාභ වියදම/(ආදායම | 305,850 | (767,483) | 159,280 | (268,352) | (258,672) | 42,575 | 139,566 | (647,236) |





| සැලසුම් වත්කම්/ආයෝජනවල සංයුතිය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන | 30,555,775 | 7,218,808 | 7,485,779 | 3,045,981 | 1,751,938 | 233,868 | 3,469,118 | 53,761,267 |
| ප්‍රතිවිකුණුම්වල ආයෝජන | 495,113 | 31,143 | 83,296 | 136,060 | 9,102 | – | 59,935 | 814,649 |
| ණයකරවල ආයෝජන | 561,664 | 217,706 | 46,234 | 52,506 | 17,431 | 5,244 | 77,624 | 978,409 |
| ජංගම ගිණුම්වල ඉතිරි ශේෂය | 3,258 | 3,467 | 3,024 | 4,008 | 2,971 | – | – | 16,729 |
| 2023 දෙසැම්බර් 31 දිනට සැලසුම් වත්කම්/ආයෝජනවල එකතුව | 31,615,810 | 7,471,124 | 7,618,333 | 3,238,555 | 1,781,442 | 239,112 | 3,606,677 | 55,571,054 |

**2023 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභ ගෙවීම් සඳහා කල්පිරීම් විශ්ලේෂණය**

| වාර්තා කළ දින සිට ඉදිරි වර්ෂ වල ගෙවීමට සැලසුම් කළ ප්‍රතිලාභ ගෙවීම් | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| ඊළඟ වසර 1 | 3,930,948 | 10,087 | 934,084 | 40,579 | 1,320 | 44,939 | 419,944 | 5,381,901 |
| ඊළඟ වසර 2 | 4,485,069 | 10,915 | 1,060,178 | 55,189 | 3,943 | 52,624 | 431,283 | 6,099,201 |
| ඊළඟ වසර 3 | 5,164,887 | 14,908 | 1,201,188 | 72,719 | 7,351 | 60,656 | 448,584 | 6,970,293 |
| ඊළඟ වසර 4 | 5,885,781 | 30,827 | 1,358,578 | 93,646 | 11,705 | 69,897 | 465,993 | 7,916,427 |
| ඊළඟ වසර 5 | 6,139,135 | 52,071 | 1,402,242 | 108,479 | 15,902 | 75,585 | 465,332 | 8,258,746 |
| වසර 6 සිට 10 දක්වා එකතුව | 34,078,687 | 703,167 | 7,623,927 | 780,894 | 173,809 | 387,533 | 2,580,042 | 46,328,059 |

සියලුම සේවක ප්‍රතිලාභ බැඳීම් නිශ්චය කිරීමේ දී යොදාගන්නා ලද ප්‍රධාන උපකල්පනයන් පහත දැක්වේ.

| | 2024 | 2023 |
|---|---|---|
| වට්ටම් අනුපාතිකය | 11.60% | 12.60% |
| වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකය | 11.60% | 12.60% |
| වැටුප් වැඩිවීම් අනුපාතය – පාරිතෝෂික හා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | 0.00% – 6.50% | 6.50% – 17.98% |
| අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | 0.00% – 5.00% | 2.50% – 16.00% |
| සේවය හැරයාමේ අනුපාතය | 2.00% | 2.00% |
| වෛද්‍ය පිරිවැයෙහි උද්ධමන අනුපාතය | 6.00% | 4.00% |
| ඉතිරි සාමාන්‍ය සේවා කාලය | | |
| ශ්‍රී ලං.ම.බැ. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | අවුරුදු 28 | අවුරුදු 26 |
| ශ්‍රී ලං.ම.බැ. විශ්‍රාම වැටුප් - නව | අවුරුදු 38 | අවුරුදු 38 |
| වැන්දඹු හා අනත්දරු යෝජනා ක්‍රමය | අවුරුදු 28 | අවුරුදු 26 |
| වැන්දඹු පුරුෂ හා අනත්දරු යෝජනා ක්‍රමය | අවුරුදු 28 | අවුරුදු 26 |
| වැන්දඹු හා අනත්දරු හා වැන්දඹු පුරුෂ හා අනත්දරු - නව | අවුරුදු 37 | අවුරුදු 39 |
| පාරිතෝෂික විශ්‍රාම වැටුප් | අවුරුදු 16 | අවුරුදු 17 |
| ශ්‍රී.ල.ම.බැ. වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | අවුරුදු 28 | අවුරුදු 27 |
| විශ්‍රාමික වයස | අවුරුදු 60 | අවුරුදු 60 |

2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු හිමිකරු ප්‍රාග්ධනය රු.බි. 308.5 (2023 - රු.බි. 11.1)ක් ලෙස සටහන් වූ අතර, එම අගය, බැංකුවේ කටයුතු අඛණ්ඩව කරගෙන යාමට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් බව පාලක මණ්ඩලයේ මතය වේ. ශ්‍රී.ලං.ම.බැ. පනතේ 97 වන වගන්තිය ප්‍රකාරව - මහ බැංකුවේ වත්කම්වල අගය එහි මුදල්මය බැරකම්වලට සහ එහි ගෙවා නිමි ප්‍රාග්ධනයේ එකතුවට වඩා අඩු බවට මහ බැංකුවේ විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශවලින් පෙන්නුම් කරන අවස්ථාවක, ප්‍රාග්ධනය යථාවත් කිරීම සඳහා රජය මඟින් ප්‍රාග්ධන දායකත්වයක් සිදු කරන ලෙසට මහ බැංකුවට ඉල්ලා සිටිය හැක. එවැනි අවස්ථාවනක දී, ශ්‍රී.ලං.ම.බැ. විසින් එම තත්ත්වය ගණනය කර, ප්‍රාග්ධන හිඟයේ ප්‍රමාණය තීරණය කර, පාලක මණ්ඩල අනුමැතිය සහිතව, රජය මඟින් සිදුකළ යුතු ප්‍රාග්ධන දායකත්වයක් සඳහා අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කරනු ලැබේ. ඉන්පසුව පාර්ලිමේන්තු අනුමැතියට යටත්ව, අවශ්‍ය මුදල, ව්‍යවහාර මුදලින් හෝ පවත්නා වෙළෙඳ පොළ ආශ්‍රිත පොලී අනුපාතික යටතේ නිකුත් කරනු ලබන, ගනුදෙනු කළ හැකි ණය සාධන පත්‍රවලින් මහ බැංකුව වෙත මාරු කරනු ලැබේ.

## 51 සංසන්දනාත්මක තොරතුරු

පහත සඳහන් සංසන්දනාත්මක තොරතුරු වර්තමාන වසරේ ඉදිරිපත් කිරීම සඳහා අනුකූලවීමට ප්‍රතිවර්ගීකරණය කර ඇත.

### 51.1 විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම්වලින් ඇතිවන වත්කම සහ වගකීම ප්‍රතිවර්ගීකරණය

| මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට වෙනස්වීම් | පෙර වාර්තා කළ පරිදි<br>රු. '000 | ගැලපීම<br>රු. '000 | ප්‍රතිවර්ගීකරණ ශේෂය<br>රු. '000 |
|---|---|---|---|
| **වගකීම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් | (26,395,012) | (4,507,114) | (30,902,126) |
| **වත්කම්** | | | |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් | – | 4,507,114 | 4,507,114 |

2023 දී නව සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය තුළින් ඇති වූ රු.මි. 4,507.11ක වත්කම, 2023 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් වගකීම යටතේ ශුද්ධ අගයක් ලෙස දැක් වූ අතර, එම අගය වඩා පැහැදිලි ඉදිරිපත් කිරීමක් සඳහා 2024 මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේශීය මූල්‍ය වත්කම් යටතේ අනාවරණය කර ඇත.

## 51.2 අනෙකුත් විදේශීය වගකීම් ප්‍රතිවර්ගීකරණය

| මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට වෙනස්වීම් | පෙර වාර්තා කළ පරිදි රු. '000 | ගැලපීම රු. '000 | ප්‍රතිවර්ගීකරණ ශේෂය රු. '000 |
|---|---|---|---|
| විදේශීය මූල්‍ය වගකීම් | | | |
| අනෙකුත් විදේශීය වගකීම් | – | 1,260,445,754 | 1,260,445,754 |
| අනෙකුත් | 1,509,255,772 | (1,260,445,754) | 248,810,018 |

2023 වසරේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ 'අනෙකුත් විදේශීය වගකීම් - අනෙකුත්' යටතේ වර්ගීකරණය කළ පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා සහ ඉන්දියානු මහබැංකුවට ගෙවිය යුතු මුදල් හුවමාරු පහසුකමට අයත් වගකීම වන රු.මි. 1260.45ක අගය වඩා පැහැදිලි ඉදිරිපත් කිරීමක් සඳහා 2024 වසරේදී අනෙකුත් විදේශීය වගකීම් යටතේ වෙන වෙනම දක්වා ඇත.

## 51.3 මෙහෙයුම්, ආයෝජන සහ මුදල් කාර්යයන්ගෙන් ලද මුදල් ප්‍රවාහ ප්‍රතිවර්ගීකරණය

| මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයට වෙනස්වීම් | සටහන | පෙර වාර්තා කළ පරිදි රු. '000 | ගැලපීම රු. '000 | ප්‍රතිවර්ගීකරණ ශේෂය රු. '000 |
|---|---|---|---|---|
| මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ | | | | |
| ලද පොලිය - දේශීය මුදල් - අනෙකුත් | | 19,813,449 | (3,249,769) | 16,563,680 |
| ලද පොලිය - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | | – | 648,857,381 | 648,857,381 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් | | – | 364,117,279 | (364,117,279) |
| ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ | | | | |
| ලද පොලිය - දේශීය මුදල් - අනෙකුත් | | – | 2,352,369 | 2,352,369 |
| මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ | | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදලේ ශුද්ධ නිකුතු/(ආපසු ගැනීම්) | | (932,498,697) | (1,012,974,660) | 80,475,963 |
| මුදල් හා මුදල් සමානයන් | 8 | 743,467,730 | 897,400 | 742,570,330 |

2023 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය තුළ මූල්‍ය කටයුතු යටතේ වර්ගීකරණය කළ රු.මි. 648,857.38ක් වන ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වලින් ලද පොලී ආදායම වර්තමානයේ වඩා පැහැදිලි ඉදිරිපත් කිරීමක් සඳහා මෙහෙයුම් කටයුතු යටතේ ප්‍රතිවර්ගීකරණය කර ඇත.

2023 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය තුළ මූල්‍ය කටයුතු යටතේ වර්ගීකරණය කළ රු.මි. 364,117.28ක් වන ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් වර්තමානයේ වඩා පැහැදිලි ඉදිරිපත් කිරීමක් සඳහා මෙහෙයුම් කටයුතු යටතේ ප්‍රතිවර්ගීකරණය කර ඇත.

2023 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය තුළ මෙහෙයුම් කටයුතු යටතේ වර්ගීකරණය කළ රු.මි. 2,352.37ක් වන අභ්‍යන්තර අරමුදල්වලින් ලද පොලී ආදායම වර්තමානයේ වඩා පැහැදිලි ඉදිරිපත් කිරීමක් සඳහා ආයෝජන කටයුතු යටතේ ප්‍රතිවර්ගීකරණය කර ඇත.

2023 දී මුදල් හා මුදල් සමානයන් යටතේ වර්ගීකරණය කළ සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් කටයුතු යටතේ වර්ගීකරණය කළ රු.මි. 897.40ක් වන විදේශිය ස්ථාවර තැන්පතු මත ලැබියයුතු පොලිය මේ වන විට මුදල් හා මුදල් සමානයන්ගෙන් ඉවත් කරනු ලැබ ඇත.



මෙහෙයුම් තොරතුරු | මූල්‍ය ප්‍රකාශ | අතිරේක තොරතුරු

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

## 51.4 දේශීය ණය ප්‍රශස්තකරණය යටතේ හුවමාරු වූ බැඳුම්කරවල සඵල පොලී අනුපාත ගැලපීම ප්‍රතිවර්ගීකරණය

| සටහන 12 - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් සඳහා වන වෙනස්වීම් | පෙර වාර්තා කළ පරිදි රු. '000 | ගැලපීම රු. '000 | ප්‍රතිවර්ගීකරණ ශේෂය රු. '000 |
|---|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | 1,804,175,760 | 31,827,522 | 1,836,003,282 |
| ලැබිය යුතු පොලිය | 31,827,522 | (31,827,522) | – |

2023 වසරේ සටහන 12 යටතේ භාණ්ඩාර බිල්පත් සඳහා ලැබිය යුතු පොලිය ලෙස වෙනම දක්වා තිබූ රු.මි. 31,827.52ක අගය, වඩා නිවැරදි ඉදිරිපත් කිරීමක් සඳහා මේ වසරේදී භාණ්ඩාර බිල්පත් ශේෂය යටතේ දක්වා ඇත.

# 52 සම්බන්ධිත පාර්ශව

## 52.1 රජය සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමග ගනුදෙනු

බැංකුව විසින් සාමාන්‍ය මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගණුදෙනුවලට ඇතුළත් වේ. ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ම.බැ. පරම අයිතිකරු වශයෙන්), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන සම්බන්ධිත පාර්ශ්වයන්ට ඇතුළත් වේ. අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත 24 (සංශෝධිත) සම්බන්ධිත පාර්ශ්වයන් පිළිබඳ හෙළිදරව් කිරීමේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව, තනිව ගත් කළ සැළකිය යුතු මට්ටමේ වන හා අනෙකුත් ගණුදෙනුවලදී තනිව නොව සාමූහිකව සැළකිය යුතු මට්ටමේ වන, රජය සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන සමඟ බැංකුව විසින් එළැඹි ගණුදෙනු සහ විධිවිධානයන් හි විස්තර පහත පරිදි වේ.

| ගනුදෙනු වල ස්වභාවය | සටහන | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|
| ගනුදෙනු: | | | |
| මිලදී ගන්නා ලද ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | | 1,125,844 | 1,394,499 |
| ප්‍රතිවිකිණීමේ/ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත්/විකුණු ශ්‍රී.ලං.ම.බැ. සහ රජයේ සුරැකුම්පත් | | 11,280,112,844 | 13,979,231,698 |
| ප්‍රතිවිකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් ශ්‍රී ලං.ම.බැ. සහ රජයේ සුරැකුම්පත් මත පොලී ආදායම | | 4,164,552 | 20,973,276 |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකිණු ශ්‍රී.ලං.ම.බැ. සහ රජයේ සුරැකුම්පත් මත පොලී වියදම | | 2,551,106 | 698,190 |
| බැංකු සඳහා ලබාදුන් ද්‍රවශීලතා පහසුකම | | – | 32,500,000 |
| රජය වෙනුවෙන් ලද අරමුදල | | 853,928,592 | 599,128,330 |
| රජය වෙනුවෙන් දරන ලද විය පැහැදම් | | 1,062,078,470 | 351,384,381 |
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ පිරිවැය | 52.1.3 | 2,947,555 | 2,603,776 |
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ, සේවා සහ බදු සඳහා ගෙවීම් | 52.1.4 | 11,136,712 | 11,136,712 |
| වර්ෂය තුළ දී දළ විදේශ විනිමය ගනුදෙනු | 52.1.6 | | |
| විකුණුම් | | 68,814,477 | 285,491,347 |
| මිලදී ගැනීම් | | 916,768,375 | 912,234,278 |
| ඇ.එ.ජ.ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | 4,086,139 | 10,742,797 |
| බාහිර නෛතික වියදම් | | 6,050 | 4,109 |
| වර්ෂය තුළදී අත්හල දේපල වෙනුවෙන් ලද අරමුදල | | 476,420 | 572,600 |
| කුලී ආදායම් | | 188,745 | 208,276 |
| ලාභාංශ ආදායම් | | 129,728 | 135,642 |
| අනෙකුත් ගනුදෙනු | 52.1.9 | 466,495 | 912,255 |

| ගනුදෙනු වල ස්වභාවය | සටහන | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|---|
| **ශේෂයන්:** | | | |
| ශ්‍රී ලං.ම.බැ. විසින් අයිතිකාරීත්වය දරන ලද ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 52.1.7 | 1,748,873,060 | 2,044,347,592 |
| කොවිඩ් -19 පුනරුද ණය පහසුකම යටතේ ලබාදුන් ණය | | 8,302,464 | 12,391,471 |
| DAD-PP ණය පහසුකම යටතේ ලබාදුන් ණය | | 364,714 | 508,007 |
| නිශ්චිත අරමුණු සඳහා දරන ලද රජයේ සුරැකුම්පත් | | 23,923,607 | 20,491,905 |
| බැංකු හා මූල්‍ය ආයතනවල තත්කාලීන දළ පියවුම් පද්ධතියේ (RTGS) ශේෂයන් | 26 | 132,888,982 | 93,734,813 |
| ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන නොස්ට්‍රෝ ගිණුමේ ශේෂය | | 36,714 | 41,368 |
| භාණ්ඩාගාරය හා අනෙකුත් අමාත්‍යාංශ වෙතින් ලැබිය යුතු දෑ | | 19,033,179 | 8,698,715 |
| භාණ්ඩාගාරය හා අනෙකුත් අමාත්‍යාංශ වෙත කළ යුතු ගෙවීම් | 25.2.1 | 29,660,536 | 248,714,938 |
| දෙසැම්බර් 31 දිනට රජයේ හා රජයේ ආයතන සමග ජංගම ගිණුම් ශේෂයන් | | 178,324 | 198,910 |
| අත්හල දේපල වල ශේෂයන් | | 8,172,494 | 8,766,945 |
| අනෙකුත් ශේෂයන් | 52.1.9 | 57,571 | 284,800 |

**52.1.1** ශ්‍රී ලංකා මහ බැංකු පනතේ IX කොටසේ 61 වන වගන්තිය යටතේ පැවරෙන බලය හා පාලක මණ්ඩලය මඟින් පැවරෙන බලය ප්‍රකාරව, ශ්‍රී.ලං.ම.බැ. විසින් බලපත්‍ර නිකුත් කළ බැංකුවල කටයුතු නියාමනය හා සුපරීක්ෂණය බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි.

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකු පනතේ IX කොටසේ 61 වන වගන්තිය යටතේ පැවරෙන බලය හා පාලක මණ්ඩලය මඟින් පැවරෙන බලය ප්‍රකාරව, ශ්‍රී.ලං.ම.බැ. විසින් බලපත්‍ර නිකුත් කළ බැංකු නොවන, මූල්‍ය සමාග ම්වල නියාමනය සහ සුපරීක්ෂණ කාර්යයන් කරගෙන යනු ලබයි.

**52.1.2** 2023 අංක 16 දරණ ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 132 වැනි වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුව ආණ්ඩුවේ නියෝජිතයා ලෙස තවදුරටත් කටයුතු කළ යුතු අතර, එය රාජ්‍ය ණය කළමණාකරණ ඒජන්සිය හෝ කාර්යාලය හෝ සම්බන්ධයෙන් අදාළ වන නීතිය ක්‍රියාත්මක වන දිනය තෙක්, ආණ්ඩුවේ ගිණුම සඳහා ආණ්ඩුවේ සුරැකුම්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් සහ දේශීය හා විදේශීය ණය සඳහා සේවා සැපයීම ද ඇතුළත් වන පරිදි රාජ්‍ය ණය කළමණාකරණය සම්බන්ධයෙන් ආණ්ඩුවේ නියෝජිතයා ලෙස කටයුතු කිරීමට පමණක් සීමා විය යුතුය. තවද, 2004 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 37 වගන්තිය පරිදි, 2023 අංක 16 දරණ ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 132 වැනි වගන්තියේ අදාළත්වය අමාත්‍යතුමා විසින් නියම කළ දිනයේ සිට (එනම් 2024.11.25) මාස දහඅටක කාලයක් තුළ ගැසට් පත්‍රයේ පළකළ නියෝගයක් මඟින් පනවන දින සිට ක්‍රියාත්මක වේ. එසේවුවද, මෙම වගන්තියේ විධිවිධානවල කුමක් තිබුනද, බැංකුවට ශ්‍රී.ලං.ම.බැ. පනත යටතේ සිය බලතල හා කාර්යයන් ඉටුකිරීමට හැකිය.

**52.1.3** ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 44 වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකාව තුළ මුදල් නිකුත් කිරීමේ තනි අයිතිය හා බලතල බැංකුව සතු වේ. ඒ අනුව, බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව තුළ නෛතික ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ තනි බලධාරියා ලෙස කටයුතු කරයි. මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම ඩී ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (පුද්) සමාගම විසින් කරගෙන යනු ලබන අතර, මෙහි කොටස් හිමිකමෙන් 40% දරන්නේ රජය විසිනි.

**52.1.4** බැංකුව සාමාන්‍ය මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී. විවිධ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන හෝ රජයේ සුවිශේෂ බලපෑමක් හෝ පාලනයක් ඇති ආයතන සමඟ ගනුදෙනුවලට එළඹෙනු ලැබේ.

**52.1.5** සටහන් අංක 56 හි පැහැදිලි කර ඇති පරිදි බැංකුව පොදුවේ භාරකරු ලෙස කටයුතු කිරීම මගින් රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදුකරනු ලැබේ.

**52.1.6** ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන අනුව, බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දේශීය, විදේශීය විනිමය වෙළෙඳපොළෙහි සංවර්ධනය හා වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ එක් දින විවෘත විදේශ විනිමය තත්ත්වය සුපරීක්ෂණය කරනු ලැබේ. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ සංවර්ධනය සුපරීක්ෂණයේදී, ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය දැඩි ලෙස වෙනස්වීම ලිහිල් කිරීමේ අරමුණින් බැංකුව වෙළෙඳපොළෙහි මෙම අංශ දෙකෙහි ම සිටිය යුතු බව සැළකේ. කෙසේවෙතත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් (IMF-EFF) වැඩසටහන යටතේ දක්වන ලද දළ නිල විදේශ විනිමය සංචිත (NIR) ඉලක්කය සපුරාලීම සඳහා විදේශ සංචිත එක්රැස් කිරීමේ අවශ්‍යතාව හේතුවෙන් බැංකුවේ උපායමාර්ගික අවධානය ප්‍රධානවම විදේශ විනිමය මිලදී ගැනීම කෙරෙහි යොමුවිය. 2024 වසර තුළදී බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොලෙන් ඇ.ඩො.බි. 2.8ක ශුද්ධ මිලදී ගැනීම් සිදුකර ඇති අතර, එය බැංකුවේ ඉතිහාසය තුළ මේ දක්වා ඉහළම වාර්ෂික ශුද්ධ මිලදී ගැනීම වේ. ඒ සමඟ, වසර අවසානයේ දී NIR වැඩසටහනේ ඉලක්කය මනාව සාක්ෂාත් කර ගන්නා ලදී. තවද, 2024 නොවැම්බර් හා දෙසැම්බර් සඳහා IMF-EFF වැඩසටහන යටතේ නියමකළ ඇ.ඩො. මිලියන 150.0ක මිලදී ගැනීමේ ඉලක්කය ඇ.ඩො.මිලියන 394.8කින් වැඩිපුර සාක්ෂාත් කර ගන්නා ලදී.

**52.1.7** 2023 අංක 16 දරණ ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 31 වගන්තිය ප්‍රකාරව, බැංකුවේ දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ප්‍රධාන වශයෙන් විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් තුළින් බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ එහි සෘජු කාර්යයන් ඉටු කිරීම සහ එම පනතේ 32-34 වගන්ති ප්‍රකාරව නෛතික සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාව බලාත්මක කිරීම හා රජයට හිමිකාරිත්වය ඇති වාණිජ බැංකුවල හා අනෙකුත් සමහරක් මූල්‍ය ආයතන හා රාජ්‍ය ආයතනවල බැංකුකරු ලෙස කටයුතු කරයි. 2024 දෙසැම්බර් 31 දිනට මෙම කාර්ය කිරීමේ දී උද්ගත වූ මුළු ශේෂය සටහන් අංක 12, 26 සහ 28 හි දක්වා ඇත. රජයේ සුරැකුම්පත් මත උපයාගත් පොලිය 35 සටහනෙහි දැක්වේ.

**52.1.8** රජයේ පාලනයට යටත් එක් බැංකුවක භාරකාරත්ව විධිවිධානවල බැංකුව නියැලුනි.

**52.1.9** තනි වශයෙන් ගත්කල සුවිශේෂී නොවන, රජය, රජයේ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය වන ආයතන සමඟ බැංකුව විසින් සිදුකල ගනුදෙනුවල ශේෂයන්, අනෙකුත් ගනුදෙනු හා ශේෂයන් හි ඇතුලත් වේ.

## 52.2 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සමඟ ගණුදෙනු

අධිපතිතුමා සහ නියෝජ්‍ය අධිපතිවරුන් ඇතුළත් පාලක මණ්ඩලය සහ සහකාර අධිපතිවරුන් ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයට ඇතුළත් වේ. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය බැංකුව සමඟ සිදුකරන ලද ගනුදෙනු පහත පරිදි වේ.

## 52.3 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය වෙත කළ ගෙවීම්

| | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|
| කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | 295,175 | 170,108 |

ඉහත ගෙවීම් තුළ, ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සඳහා ඔවුන්ගේ සේවා ගිවිසුම්වලට යටත්ව සිදුකරන මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ ඇතුළත් වේ.

## 52.4 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් සමඟ වූ වෙනත් ගණුදෙනු

| | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|
| කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන්ට දුන් ණය ශේෂය | 94,260 | 250,997 |
| වසර තුළ දී ප්‍රදානය කළ ණය | 124,331 | 153,118 |
| වසර තුළ දී අය කරගත් ණය | 238,654 | 205,474 |

සියලුම ණය ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත කොට ඇති අතර, මෙම ණය සඳහා අදාළ වන වාර්ෂික පොලී අනුපාතයන් 2% සිට 7% දක්වා පරාසයන්හි වේ. සියලු ණය මාසිකව ගෙවිය යුතු වේ.

## 52.5 පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් සමග ගණුදෙනු

| | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|
| ගෙවන ලද සහ ගෙවිය යුතු දායකය | 103,855 | 69,624 |

සටහන් අංක 16 හි දක්වා ඇති පරිදි බැංකුව විසින් විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා විශ්‍රාම සැලසුම් සඳහා විවිධ මුදල් ප්‍රමාණවලින් දායක වූ අතර 2024 වසරේදී රු.මි. 1,617.89 ක් (2023 - රු.මි. 1,017.89) සේවක අර්ථසාධක අරමුදලට ගෙවන ලදී. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී, බැංකුව විසින් ස්වකීය පශ්චාත් සේවා සැලසුම් සඳහා බැංකු සහ මූල්‍ය සේවා සපයනු ලබයි. එවැනි සැළසුම් වල ශේෂ ප්‍රමාණයන් 30.2 සටහනෙහි දක්වා ඇත.

## 53 අසම්භාව්‍ය බැරකම්

### 53.1 මූල්‍ය ඇප කොන්ත්‍රාත්

බැංකුව රජයේ හෝ එහි නියෝජිතයන්ගේ සහ ආයතනවල නියෝජිතයෙක් ලෙස ක්‍රියාකරමින්, මහා භාණ්ඩාගාරය විසින් බැංකුව වෙත නිකුත් කරනු ලබන ප්‍රති ඇප මත විවිධ පාර්ශ්වයන්ට ඇප සපයනු ලැබේ. 2024 දෙසැම්බර් 31 දිනට එවැනි ඇප කිසිවක් නොවීය.

### 53.2 ණය ඇපකර

බැංකුවෙහි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ (ප්‍රා.සං.දෙ.) කාර්යයන් වන්නේ පිටස්තර ණය මාර්ග තුළින් ලැබෙන මුදල් සහභාගී මූල්‍ය ආයතන මගින් ප්‍රතිමූල්‍යකරණ ණය ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබාදීම, එම ණය මත සහභාගි මූල්‍ය ආයතන වෙත ණය ඇපවීම් නිකුත් කිරීම, ඇප වාරික රැස්කිරීම, ණය ඇපකර මුදල් පරිපාලනය සහ ලබාගත් ණය අරමුදල් පැහැරහැරීමකින් තොරව නිසි පරිදි භාවිතා කරන බවට සහතික කිරීම සඳහා පශ්චාත් ණය සුපරීක්ෂණයයි. මෙම වැඩපිළිවෙල යටතේ ලබාදුන් ණය සම්බන්ධයන් සහභාගීත්ව මූල්‍ය ආයතනවලට සිදුවිය හැකි පාඩු සඳහා ආවරණයක් ලෙස ණය ඇපකර පහසුකම් සැලසීම, ප්‍ර.සං.දෙ. විසින් 2023 වසර තුළදී අඛණ්ඩව සිදුකරන ලදී. මෙය ණය පැහැර හැරීමේ ප්‍රමාණය මත වන ඇපයක් නොවන අතර සහභාගත්ව මූල්‍ය ආයතන මගින් ණය ලබාදුන් පාර්ශ්වයන්ගෙන් ණය ආපසු අයකර ගැනිමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් පසු, ඉතිරිවන පාඩු සඳහා වන ආවරණයකි. මෙම වැඩපිළිවෙල මගින් උද්ගත වන අසම්භාව්‍ය බැරකම් ප්‍රමාණය පහත දැක්වේ.

**දේශීය වාණිජ බැංකු වෙත ලබාදුන් ණය ඇපකර**

| | නොපියවා පැවැති ඇප ප්‍රමාණය | |
|---|---|---|
| | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
| සම්බන්ධිත පාර්ශව | 131,687 | 114,763 |
| අනෙකුත් | 109 | 5,979 |
| මුළු ණය ඇප ප්‍රමාණය | 131,796 | 120,742 |

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණය ඇපකර මත අපේක්ෂිත ණය අලාභය, සටහන 38 හි වාර්තා කොට ඇත.

### 53.3 නෛතික හිමිකම්

බැංකුවට එරෙහිව නීති කෘත්‍යන් ගණනාවක් 2024 දෙසැම්බර් 31 දිනට ශේෂව තිබුණු අතර, මේ සම්බන්ධයෙන් සැලකිය යුතු පාඩුවක් බැංකුවට ඇති නොවේය යන්න බැංකුවේ මතය බැවින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

## 54 බැඳීම්

(අ) 2024 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් රු.මි. 792.4ක ප්‍රාග්ධන බැඳීමක් බැංකුව විසින් ඇති කර ගෙන තිබේ.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරි හුවමාරු ගණුදෙනු පහත පරිදි වේ.

| ඉදිරි විනිමය කොන්ත්‍රාත්තු | | 2024<br>'000 | 2023<br>'000 |
|---|---|---|---|
| ඉදිරි විනිමය විකුණුම් | ඇ.එ.ජ. ඩොලර් | 1,318,306 | 1,221,302 |
| | ජපන් යෙන් | 71,100,000 | 538,182 |
| ඉදිරි විනිමය මිලදී ගැනීම් | ඇ.එ.ජ. ඩොලර් | 373,500 | 225,000 |

## 55 මූල්‍ය වත්කම් මාරු කිරීම්

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී, මූලිකව දේශීය හා විදේශීය යන දෙවර්ග යෙන්ම පවත්නා ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් බැංකුව විසින් ගණුදෙනු වලට එළඹීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය වත්කම් මාරුවීමක් සිදු විය හැක. සටහන් 7.3.6 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, එසේ මාරුකරන ලද මූල්‍ය වත්කම් පෙර හඳුනාගත් ලෙසම හෝ බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට හඳුනා ගැනීමට හෝ සම්පූර්ණයෙන් හඳුනා නොගෙන සිටීමට සිදු විය හැක.

සම්පූර්ණයෙන් ඉවත් නොකරන ලද හෝ පහත ගණුදෙනු තුළින් මූලිකව බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමක් පවතී නම් බැංකුව මූල්‍ය වත්කම් මාරුකිරීමක් සිදුකරයි.

- ප්‍රති මිලදී ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්
- සුරැකුම්පත් ණයට දීම
- සුරැකුම්පත් ඔඩපන කිරීම

### 55.1 සම්පූර්ණයෙන් ඉවත් නොකල නමුත් මාරුකල මූල්‍ය වත්කම්

**(අ) ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්**

බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් වල කොටසක් ලෙස ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් ගණුදෙනුවල නිරතවන අතර, හිමිකාරීත්වයේ අවදානම් හා ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ බැංකුව සතුව පැවතීම හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ "ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්" යටතේ එම ප්‍රමාණය සම්පූර්ණයෙන් හඳුනාගෙන තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ. ඒ මත ගෙවිය යුතු මුදල් ප්‍රතිෂ්ඨාව සහ එහි උපචිත පොලිය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේශීය මූල්‍ය වගකීම්හි ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් ලෙස හඳුනාගෙන ඇත.

**(ආ) සුරැකුම්පත් ණයට දීම**

සුරැකුම්පත් ණය, යන්නෙන් ස්ථාපිත වෙළෙඳපොළ ව්‍යවහාර විස්තර කරන අතර එමගින්, ගාස්තුවකට යටත්ව, සුරැකුම්පත් එක් පාර්ශවයකගෙන් (ණය දීමනාකරු . ශ්‍රී ලංකා මහ බැංකුව), තවත් පාර්ශ්වයකට (ණය ගන්නා) තාවකාලිකව හුවමාරු වීම සිදුවේ. ණයගන්නා ඉල්ලූ විටදී හෝ යම් එකඟ වූ කාලසීමාව අවසානයේදී ඒවා නැවත ලබා දීමට බැදේ. මේ වන විට අධිජාතික බැදුම්කර සහ විවිධ නිකුත්කරන්නන් විසින් නිකුත් කරන ලද බැදුම්කර සඳහා භාරකරු ලෙස තෝරාගත් නිශ්කාශණ ආයතනයක් කටයුතු කරයි. නිශ්කාශණ ආයතනයේ කැමැත්ත පරිදි එම බැදුම්කර සඳහා වන ඉල්ලුම මත පදනම්ව ණය දීමට බලය පැවරෙන පරිදි බැංකුව ගිවිසුමක් අත්සන් කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ණය දීමට සම්බන්ධ නොවන බැවින් හා නිශ්කාශන ආයතන, ණයකරුවන්ට ඍජුවම ණයදෙන බැවින්, මෙම ක්‍රියාවලිය "ස්වයං බැදුම්කර ණය දීම" ලෙස හදුන්වයි. ස්වයං බැදුම්කර ණය දීමේ වැඩසටහන යටතේ බැදුම්කර සඳහා යම් ණයදීමක් සිදුකර ඇත්නම්, එක් එක් මාසය අවසානයේ භාරකරු විසින් ස්වයං බැදුම්කර ණයදීම සඳහා ගාස්තු ශ්‍රී ලංකා මහ බැංකුවට එවනු ලබයි. හිමිකාරීත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ බැංකුව සතු වීම හේතුවෙන් බැංකුව විසින් එම සුරැකුම්පත් සම්පූර්ණයෙන්ම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගැනීම තවදුරටත් සිදු කරයි. මෙම සුරැකුම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ "අනෙකුත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට වූ සුරැකුම්පත්" ලෙස ඉදිරිපත් කරයි.

**(ඇ) සුරැකුම්පත් ඔඩපන කිරීම්**

2017 ජනවාරි මාසය දක්වා විදේශිය සුරැකුම්පත් බේරුම් ක්‍රියාවලියට පහසුකම් සැපයීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35.0 ක සුරැකුම්පත් එහි ගෝලීය භාරකාර, යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කොට ඇ.එ.ජ ඩොලර් මිලියන 30.0 ක ණය පහසුකම් බැංකුව විසින් වෙනමම පවත්වා ගන්නා ගිණුමකට ලබාගන්නා ලදී. පහසු සහ කාර්යක්ෂම පියවීමක් සඳහා ණය මාර්ග පහසුකම යථාවත් කිරීමේ අදහස ඇතිව වර්තමානයේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 3.0 ක වටිනාකමින් යුත් සුරැකුම්පත් යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කර ඇත.

| | 2024<br>අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්<br>රු. '000 | 2023<br>අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්<br>රු. '000 |
|---|---|---|
| **වත්කම්** | | |
| යූරෝ ක්ලියර් බැංකුව වෙත ඔඩපන කරන ලද සුරැකුම්පත් | 877,750 | 3,749,003 |
| වත්කම් වල ධාරණ අගය | 877,750 | 3,749,003 |

## 56 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

බැංකුව, සාමාන්‍යයෙන් භාරකරුවකු ලෙස ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් හා අනෙකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදුකරනු ලබයි. බැංකුව විසින් ඉටු කරනු ලබන සැලකිය යුතු භාර ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

56.1 බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදේශ අරමුදල් යොදන සංවර්ධන ව්‍යාපෘති යටතේ විවිධ විදේශිය ණය සහ ප්‍රදාන මුදාහැරීම සහ ආපසු ගෙවීම සිදු කරනු ලැබේ. තවද ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදානයන් යටතේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් රැස්කර ප්‍රදානය කරන නියෝජිත ආයතනයන්ගේ ඉල්ලිම පරිදි එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබේ.

56.2 බැංකුව සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ) මුදල් සම්බන්ධයෙන් භාරකාරත්වය උසුලයි. පනතේ විධිවිධාන ප්‍රකාරව, දායක මුදල් ලබා ගැනීම, අධිභාර ලබාගැනීම, ආයෝජනවලින් ආදායම ලබා ගැනීම, සේ.අ.අ. අරමුදලේ ලියාපදිංචි සාමාජිකයන්ගේ ගිණුම් පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම පාලක මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන්නේය.

### 56.3 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ අරමුදල

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බලපත්‍රලාභී බැංකු ආයතන සහ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි, බැංකු ව්‍යාපාරයෙහි යෙදී සිටින සමුපකාර සමිති සඳහා විවෘතව ඇති ස්වෙච්ඡා තැන්පත් රක්‍ෂණ යෝජනා ක්‍රමයක් වන "තැන්පතු රක්‍ෂණ යෝජනා ක්‍රමය" බැංකුව විසින් පරිපාලනය කරන ලදී. පසුව, 2010 ඔක්තෝබර් 01 දින සිට, මෙම යෝජනා ක්‍රමයෙහි ඇති අරමුදල්, 1949 අංක 58 දරණ මුදල් නීති පනත යටතේ නිකුත් කළ, 2010 සැප්තැම්බර් 28 දිනැති ගැසට් අංක 1673/11 මඟින් මුදල් මණ්ඩලය විසින් පිහිට වූ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" වෙත පවරා ඇත.

ඉහත ගැසට් පත්‍රය අනුව, 2010 ඔක්තෝබර් 01 දින සිට බැංකුව විසින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය නමින් අනිවාර්ය තැන්පතු රක්ෂණ ක්‍රමයක් සහ තැන්පතු රක්ෂණ අරමුදලක් ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකා තැන්පත්කරුවන්ගේ අරමුදල් ආරක්ෂාව වෙනුවෙන් පිහිටුවා ඇත.

2013 නොවැම්බර් 22 වන දින සිට, මෙම යෝජනා ක්‍රමය "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය" ලෙස නැවත නම් කරන ලද අතර, තැන්පතු රක්ෂණ අරමුදල "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක අරමුදල" ලෙස නම් කරන ලදි.

තවද අංක 2239/52 දරණ ගැසට් පත්‍රය අනුව 2010 සැප්තැම්බර් 28 දිනැති අංක 01 දරණ (සංශෝධිත) ආරම්භක රෙගුලාසිය අවලංගු කරමින් 2021 අගෝස්තු 06 දිනැති 2021 අංක 02 දරණ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රම රෙගුලාසිය නිකුත්කොට ඇත.

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 7 (1) (ච) පනතේ විධිවිධානවලට අනුකූලව, මූල්‍ය පද්ධති ස්ථායීතාව සුරක්ෂිත කිරීමේ උපක්‍රමයක් ලෙස තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීමට බැංකුවට බලය ඇත. තවද, 2023.11.15 දින සිට 2023 අංක 17 දරණ බැංකු (විශේෂ විධි විධාන) පනත ක්‍රියාත්මක වීමත් සමඟ, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලිතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ 2021 අංක 02 දරණ රෙගුලාසි වෙනුවට 2023 අංක 01 දරණ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ විධාන නිකුත් කරන ලදී.

බැංකු පනත යටතේ බලය ලබාදෙන ලද සියලූම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා මූල්‍ය ව්‍යාපාර පනත යටතේ බලය ලබාදෙන බලපත්‍රලාභි මූල්‍ය සමාගම් මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වෙති. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දිනට මෙම යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන ගණන 62 කි. 2023 අංක 01 දරණ බැංකු (විශේෂ විධි විධාන) පනතේ 43(2) වගන්තිය ප්‍රකාරව, මෙම යෝජනා ක්‍රමය යටතේ රක්ෂණය කළ හැකි තැන්පතු ලෙස සාමාජික ආයතනවල ඉල්ලුම්, කාලීන හා ඉතුරුම් තැන්පතු වගකීම් ඇතුළත් වන අතර, එසේ රක්ෂණය කළ නොහැකි තැන්පතු ලෙස පනතේ 43(3) වගන්තියේ දක්වා ඇති පරිදි යම් පොරොන්දු නෝට්ටු, දෙමුහුන් හිමිකම් තැන්පතු වගකීම් සහ මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් ණය සාධන පත්‍ර ඇතුළත් වේ.

රු.මි. 350.20ක් වූ ස්වෙච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන හා රු.මි. 1,168.31ක් වූ වාණිජ බැංකුවල අත්හල දේපළ තුළින් කරන ලද ආයෝජන පැවරීමෙන් මෙම තැන්පතු රක්ෂණ අරමුදල 2010 ඔක්තෝබර් 1 දින පිහිටුවා ඇත. 2024 දෙසැම්බර් 31 දිනට, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ අරමුදලේ ප්‍රමාණය රු.මි. 138,551.09ක් (විගණනය නොකළ/තාවකාලික) වන අතර, අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට ඇති මූල්‍ය උපකරණ වල සංචිත අගය රු.මි 11,847.59කි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ අරමුදලේ මුළු ස්කන්ධ ශේෂය රු.මි. 150,398.67 (විගණනය නොකළ/තාවකාලික) වේ. දැනට මෙම අරමුදලෙන් තැන්පතු හිමියෙකුට ගෙවන වන්දි මුදල් ප්‍රමාණය එක් මූල්‍ය ආයතනයක් සඳහා රු. ලක්ෂ 11ක් හෝ විදේශ විනිමය තැන්පතු සඳහා ඊට සමාන මුදලකි. වන්දි ගෙවීම බැංකුවේ වගකීමක් නොවන අතර, අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන කිසිදු වගකීමකට ශ්‍රී.ලං.ම.බැ. වගකියනු නොලැබේ.

බැංකුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ පරිපාලනය හා කළමණාකරණය සඳහා වගකීව යුතු අතර, 2023 අංක 01 දරණ බැංකු (විශේෂ විධි විධාන) පනත් නියෝගය තුළින් මහ බැංකුව මෙම යෝජනා ක්‍රමයේ දෛනික පරිපාලනය හා කළමණාකරණයට අදාළ බලතල, රාජකාරි සහ කාර්යයන් තැන්පතු රක්ෂණ හා නිරාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත පවරා ඇත. මෙම යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශ වෙනම පවත්වාගෙන යනු ලබන අතර, මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශවල කොටසක් ලෙස සලකනු නොලැබේ. මෙම යෝජනා ක්‍රමයේ විගණනය භාරව විගණකාධිපති කටයුතු කරයි.

**56.4** ශ්‍රී.ලං.ම.බැ. පනතේ 87(1) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි, ශ්‍රී.ලං.ම.බැ. පාලක මණ්ඩලය වෙනුවෙන්, රජය හෝ විදේශ අනුග්‍රාහකයකු විසින් මූල්‍යනය කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් රජයේ අති විශේෂ නියෝජිතයා ලෙස ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. 2024 දෙසැම්බර් 31 දිනට, මේ ආකාරයට සහභාගීත්ව මූල්‍ය ආයතනවලට ලබා දුන් ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය රු.මි. 19,438.26කි.



# 03.

# අතිරේක තොරතුරු

206 ප්‍රාදේශීය කාර්යාල
207 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන ආයතන
214 ආයතනික තොරතුරු

# ප්‍රාදේශීය කාර්යාල



**ප්‍රාදේශීය කාර්යාලය – අනුරාධපුර**

තැ. පෙ. 02, 01 පියවර,
අනුරාධපුර
දුරකථන, 025 2222024
විද්‍යුත් ලිපිනය: roapura@cbsl.lk



**ප්‍රාදේශීය කාර්යාලය – කිළිනොච්චිය**

ප්‍රාදේශීය කාර්යාලය – කිළිනොච්චිය
අරිවියල් නගර්,
කිළිනොච්චිය.
දුරකථන, 021 2285912
විද්‍යුත් ලිපිනය – rokn@cbsl.lk





**ප්‍රාදේශීය කාර්යාලය – ත්‍රිකුණාමලය**

අංක 103,
තැපැල් කාර්යාලය පාර,
ත්‍රිකුණාමලය
දුරකථන, 026 2226965
විද්‍යුත් ලිපිනය: po-ep@cbsl.lk



**ප්‍රාදේශීය කාර්යාලය – මාතලේ**

අංක 805, ත්‍රිකුණාමල වීදිය,
මණ්දන්ඩාවල, මාතලේ.
දුරකථන, 066-2222167
විද්‍යුත් ලිපිනය: romatale@cbsl.lk



**ප්‍රාදේශීය කාර්යාලය – මාතර**

තැ.පෙ. 35,
අනගාරික ධර්මපාල මාවත, මාතර.
දුරකථන, 041 2222269
විද්‍යුත් ලිපිනය: romatara@cbsl.lk



**ප්‍රාදේශීය කාර්යාලය – නුවරඑළිය**

අංක 84, බදුල්ල පාර,
නුවරඑළිය.
දුරකථන, 052 3059002
විද්‍යුත් ලිපිනය: rone@cbsl.lk

# ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන ආයතන

## බලයලත් මූල්‍ය ආයතනවල නාමලේඛනය (2024 දෙසැම්බර් 31 දිනට)

### බලපත්‍රලාභී වාණිජ බැංකු

- අමානා බැංක් පීඑල්සී
- ඉන්දියන් ඕවර්සීස් බැන්ක්
- ඉන්දියන් බැන්ක්
- එම්සීබී බැන්ක් ලිමිටඩ්
- කාගිල්ස් බැන්ක් පීඑල්සී
- කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
- ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී
- ඩොයිෂේ බැන්ක් ඒජී
- ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
- නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
- නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී
- පබ්ලික් බැන්ක් බර්හාඩ්
- පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී
- බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ්
- මහජන බැංකුව
- යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
- ලංකා බැංකුව
- ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැන්ක්
- ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
- සම්පත් බැන්ක් පීඑල්සී
- සිටි බැන්ක් එන්ඒ
- සෙලාන් බැන්ක් පීඑල්සී
- හබීබ් බැන්ක් ලිමිටඩ්
- හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී

### බලපත්‍රලාභී විශේෂිත බැංකු

- ජාතික ඉතිරිකිරීමේ බැංකුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
- ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
- ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ්
- සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### විදේශ බැංකු වල නියෝජිත කාර්යාල

- අයිසීඅයිසීඅයි බැන්ක් ලිමිටඩ්
- එම්යූඑෆ්ජී බැන්ක් ලිමිටඩ්
- ජේපී මෝගන් චේස් බැන්ක් එන්ඒ

## මුදල් සමාගම්

- අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී
- ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ්
- ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
- ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් (අ)
- එච්එන්බී ෆිනෑන්ස් පීඑල්සී
- එල්බී ෆිනෑන්ස් පීඑල්සී (ආ)
- එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී
- එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
- එස්එම්බී ෆිනෑන්ස් පීඑල්සී
- ඒඑම්ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
- ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී
- ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී
- කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
- ඩයලොග් ෆිනෑන්ස් පීඑල්සී
- නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී (ඇ)
- පීඑම්එෆ් ෆිනෑන්ස් පීඑල්සී
- පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
- මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
- මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
- මහින්ද්‍රා අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්
- යූබී ෆිනෑන්ස් පීඑල්සී
- රිච්ඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් (ඈ)
- ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
- වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී
- සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී
- සියපත ෆිනෑන්ස් පීඑල්සී
- සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී
- සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
- සෙංකඩගල ෆිනෑන්ස් පීඑල්සී
- සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
- සීබීසී ෆිනෑන්ස් ලිමිටඩ්
- සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී (ඉ)
- ෆින්ට්‍රෙක්ස් ෆිනෑන්ස් ලිමිටඩ්



මෙහෙයුම් තොරතුරු    මූල්‍ය ප්‍රකාශන    අතිරේක තොරතුරු

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන ආයතන

## ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන

### (I) බලපත්‍රලාභී වාණිජ බැංකු

- අමානා බෑන්ක් පීඑල්සී
- එම්සීබී බෑන්ක් ලිමිටඩ්
- කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
- ඩීඑෆ්සීසී බෑන්ක් පීඑල්සී
- නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී
- නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී
- පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී
- යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
- ලංකා බැංකුව
- සම්පත් බෑන්ක් පීඑල්සී
- සෙලාන් බෑන්ක් පීඑල්සී
- හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී

### (II) බලපත්‍රලාභී විශේෂිත බැංකු

- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
- ශ්‍රී ලංකා සේවින්ග්ස් බෑන්ක් ලිමිටඩ්
- ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
- සණස ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී

### (III) මුදල් සමාගම්

- අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී
- ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ්
- ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
- ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් (අ)
- එච්එන්බී ෆිනෑන්ස් පීඑල්සී
- එල්බී ෆිනෑන්ස් පීඑල්සී (ආ)
- එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී
- එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
- එස්එම්බී ෆිනෑන්ස් පීඑල්සී
- ඒඑම්ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
- ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී
- ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී
- කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
- ඩයලොග් ෆිනෑන්ස් පීඑල්සී
- නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී (ඇ)
- පීඑම්එෆ් ෆිනෑන්ස් පීඑල්සී
- පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
- මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
- මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
- මහින්ද්‍රා අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්
- යූබී ෆිනෑන්ස් පීඑල්සී
- රිච්ඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් (ඈ)
- ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
- වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී
- සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී
- සියපත ෆිනෑන්ස් පීඑල්සී
- සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී
- සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
- සෙංකඩගල ෆිනෑන්ස් පීඑල්සී
- සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
- සීබීසී ෆිනෑන්ස් ලිමිටඩ්
- සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී (ඉ)
- ෆින්ට්‍රෙක්ස් ෆිනෑන්ස් ලිමිටඩ්

### (IV) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්

- කෝපරේටිව් ලීසිං කම්පැනි ලිමිටඩ්

## බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්

- දුම්බර මයික්‍රො ක්‍රෙඩිට් ලිමිටඩ්
- බෙරෙන්ඩිනා මයික්‍රො ඉන්වෙස්ට්මන්ට්ස් කම්පැනි ලිමිටඩ්
- ලක් ජය මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ්
- සෙජය මයික්‍රො ක්‍රෙඩිට් ලිමිටඩ්

## බලයලත් ප්‍රාථමික අලෙවිකරුවන්

### (I) බලපත්‍රලාභී වාණිජ බැංකු

- කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ප්‍රාථමික අලෙවි නියෝජිත ඒකකය)
- පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී (ප්‍රාථමික අලෙවි නියෝජිත ඒකකය)
- මහජන බැංකුව (ප්‍රාථමික අලෙවි නියෝජිත ඒකකය)
- ලංකා බැංකුව (ප්‍රාථමික අලෙවි නියෝජිත ඒකකය)
- සම්පත් බැන්ක් පීඑල්සී (ප්‍රාථමික අලෙවි නියෝජිත ඒකකය)
- සෙලාන් බැන්ක් පීඑල්සී (ප්‍රාථමික අලෙවි නියෝජිත ඒකකය)

### (II) ප්‍රාථමික අලෙවිකරණ සමාගම්

- ඇක්විටි සෙකියුරිටීස් ලිමිටඩ් (ඊ)
- එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්
- එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී (උ)
- කැපිටල් එලයන්ස් පීඑල්සී
- පර්පචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් (ඌ)
- වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ්
- ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පීඑල්සී

## බලයලත් මුදල් තැරැව්කරණ සමාගම්

- එම්වීඑස් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
- එස්එම්බී මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (එ)
- ජෝර්ජ් ස්ටුවර්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
- තැප්‍රොබේන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
- පිගට් චැප්මන් ඇන්ඩ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
- බීඑම්ආර් මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
- විජ්වින් මනි ඇන්ඩ් එක්ස්චේන්ජ් බ්‍රෝකර්ස් ලිමිටඩ්
- සෙන්ට්‍රල් ෆොරෙක්ස් ඇන්ඩ් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
- ෆස්ට් එලායන්ස් මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

*(අ) ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයෙහි ඈවර කිරීමේ කටයුතු අධිකරණයේ අධීක්ෂණයට යටත්ව සිදු කරන ලෙස කොළඹ, වාණිජ මහාධිකරණය විසින් 2023.12.15 දින නියෝග කළේය. තවද, ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ්හි ඈවරකරු ලෙස එස් ජේ එම් එස් ඇසෝසියේට්ස්, 03 වන මහල, අංක 11, කාසල් පාර, කොළඹ 04 හි ජෙරාඩ් ජීවානන්දන් ඩේවිඩ් මහතා පත් කරන ලෙසද අධිකරණය නියෝග කළේය.*

*(ආ) 2024.07.25 දින සිට බලපැවැත්වෙන පරිදි මල්ටි ෆිනෑන්ස් පීඑල්සී, එල්බී ෆිනෑන්ස් පීඑල්සී සමඟ ඒකාබද්ධ කරන ලදී.*

*(ඇ) මෙම සමාගමට නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සමඟ අනුකූල වීමට නොහැකි වීම හේතුවෙන්, 2022.08.30 දින සිට බලපැවැත්වෙන පරිදි ණය දීම් සහ තැන්පතු මත සීමා පැනවීමට, 2022.12.20 දින සිට බලපැවැත්වෙන පරිදි පොරොන්දු නෝට්ටු හරහා මහජන මුදල් රැස් කිරීම නැවැත්වීමට සහ 2023.09.13 දින සිට බලපැවැත්වෙන පරිදි මහජන මුදල් කුමන ආකාරයකින් හෝ භාර ගැනීම නැවැත්වීමට කටයුතු කර ඇත. නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී ආයතනය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන අඛණ්ඩව උල්ලංඝනය කරමින් සිටින බැවින්, මෙම පනතෙහි 37(1) වගන්තිය ප්‍රකාරව නියාමන ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.*

*(ඈ) මෙම සමාගමට නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සමඟ අනුකූල වීමට නොහැකි වීම හේතුවෙන්, 2023.10.17 දින සිට බලපැවැත්වෙන පරිදි තැන්පතු මත සීමා පනවා ඇත. ඉන් අනතුරුව, එම සමාගමට නව ප්‍රාග්ධනය යෙදවීමෙන් අනතුරුව, නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සමඟ අනුකූල වීම සැලකිල්ලට ගනිමින්, 2025.01.15 දින සිට බලපැවැත්වෙන පරිදි එම සීමා ඉවත් කරන ලදී.*

*(ඉ) මෙම සමාගමට නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සමඟ අනුකූල වීමට නොහැකි වීම හේතුවෙන්, ණය ලබා දීම, තැන්පතු භාර ගැනීම සහ උපරිම පොලී අනුපාතිකය පිරිනැමීම මත සීමා පනවා ඇත. නව තැන්පතු භාර ගැනීම 2022.08.12 වන දින සිට බලපැවැත්වෙන පරිදි අත්හිටුවා ඇත. 2023.04.10 වන දින සිට බලපැවැත්වෙන පරිදි වාණිජ පත්‍රිකා සහ ඒ හා සමාන ණය උපකරණ හරහා ණය ගැනීම් සඳහා උපරිම සීමාවන් පනවා ඇත. ඉන් අනතුරුව, එම සමාගම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා සමඟ අනුකූල වීම සැලකිල්ලට ගනිමින්, 2024.11.29 දින සිට බලපැවැත්වෙන පරිදි ණයදීම් මත පැනවූ සීමා ඉවත් කරන ලදී.*

*(ඊ) 2025.01.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඇක්විටි සෙකියුරිටීස් ලිමිටඩ් හි නම එච්එන්බී සෙකියුරිටීස් ලිමිටඩ් ලෙස වෙනස් කර ඇත.*

*(උ) 2017.07.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික වෙන්දේසි කටයුතුවලට සහභාගී වීම අත්හිටුවීමට එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී වෙත නියෝග කර ඇත. අනාරක්ෂිත ආයෝජකයෙකු විසින් මෙම සමාගම ණයහිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා වන ඉල්ලීමක් කරන ලද අතර අධිකරණය මඟින් 2022.06.17 දින ගණන් බේරා වසා දැමීම සඳහා වන නියෝගය ලබා දෙන ලදී. කෙසේ වෙතත්, ගණන් බේරා වසා දැමීම සඳහා ගොනු කල නඩුව (CHC 83/2021/CO) වෙනත් නීතිමය ක්‍රියාමාර්ග හේතුවෙන් විභාග වෙමින් පවතී.*

*(ඌ) 2017.07.06 දින සිට ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස ව්‍යාපාර කටයුතු කර ගෙන යෑම අත්හිටුවා ඇති අතර, මෙම අත්හිටුවීම 2025.07.05 දින දක්වා ක්‍රියාත්මක වේ.*

*(එ) එස්එම්බී මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ව්‍යාපාර කටයුතු 2025.02.05 දින සිට අවසන් කර ඇත.*





# විදේශ විනිමය ගනුදෙනු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබා ඇති ආයතන (2024 දෙසැම්බර් 31 දිනට)

## බලයලත් වෙළෙන්දන්ගේ ලැයිස්තුව (ADs)

### (I) බලපත්‍රලාභී වාණිජ බැංකු

- අමානා බැන්ක් පීඑල්සී
- ඉන්දියන් ඕවර්සීස් බැන්ක්
- ඉන්දියන් බැන්ක්
- එම්සීබී බැන්ක් ලිමිටඩ්
- කාගිල්ස් බැන්ක් ලිමිටඩ්
- කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
- ඩී එෆ් සී සී බැන්ක් පීඑල්සී
- ඩොයිෂ් බැන්ක් ඒජී
- ද හොංකොං ඇන්ඩ් ෂැන්ග්හයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
- නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
- නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී
- පබ්ලික් බැන්ක් බහාර්ඩ්
- පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී
- බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ්
- මහජන බැංකුව
- යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
- ලංකා බැංකුව
- ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව
- ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
- සම්පත් බැන්ක් පීඑල්සී
- සිටි බැන්ක් එන් ඒ
- සෙලාන් බැන්ක් පීඑල්සී
- හබීබ් බැන්ක් ලිමිටඩ්
- හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී

### (II) බලපත්‍රලාභී විශේෂිත බැංකු

- ජාතික ඉතිරිකිරීමේ බැංකුව
- සණස සංවර්ධන බැංකුව පී.එල්.සී

## පරිසීමිත වෙළෙන්දන්ගේ ලැයිස්තුව (RDs)

### (I) විදේශ මුදල් මිළදී ගැනීමට හා හුවමාරු කිරීමට අවසර ලබා ඇති බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන්

- අභිලාශ් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ආබ්දීන් මනි චේන්ජර්ස් (පුද්.) සමාගම
- ආරියවංස එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම
- ඉන්ටර්නැෂනල් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ඒෂියන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- කළම්බු මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01
- කළම්බු මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06
- කැපිටල් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- කේසර් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ක්‍රවුන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ග්ලෝබල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ග්ලෝබල් විලේජ් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ගෝල්ඩන් මනි චේන්ජර් (පුද්.) සමාගම
- ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - ගාල්ල
- ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - ගාල්ල කොටුව
- ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - වැලිගම
- ජුවෙල් ලංකා මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - මීගමුව
- ජෝර්ජ් මයිකල් හොල්ඩින්ස් (පුද්.) සමාගම
- ඩේටා එක්ස්චේන්ජ් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම
- තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම - කොළඹ 02 - කළම්බු සිටි සෙන්ටර්
- තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම - කොළඹ 02 - වන් ගෝල් ෆේස් සාප්පු සංකීර්ණය
- තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම - මහනුවර
- දැඩිගම ගෲප් (පුද්.) සමාගම
- දේවි ෆොරෙක්ස් (පුද්.) සමාගම
- නර්මතා ගෝල්ඩ් සෙන්ටර් (පුද්.) සමාගම - කිළිනොච්චිය
- නර්මතා ගෝල්ඩ් සෙන්ටර් (පුද්.) සමාගම - යාපනය
- නව නාතාෂා (පුද්.) සමාගම
- නිව් රීගල්ස් මනි චේන්ජ් (පුද්.) සමාගම
- පුෂ්පා මනි චේන්ජර්ස් (පුද්.) සමාගම
- ප්‍රසන්න මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01
- ප්‍රසන්න මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06
- බුලියන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම

### (I) විදේශ මුදල් මිළදී ගැනීමට හා හුවමාරු කිරීමට අවසර ලබා ඇති බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන්

- මයුරි මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- මරුති මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06
- මරුති මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - යාපනය
- මෙට්‍රො ෆොරෙක්ස් (පුද්.) සමාගම
- මිලානෝ මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- යුනික් ෆොරෙක්ස් (පුද්.) සමාගම
- රිවිඳු එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම
- රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06
- රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01
- රෝයල් මනි මාර්ට් (පුද්.) සමාගම - කොළඹ 01
- රෝයල් මනි මාර්ට් (පුද්.) සමාගම - අලුත්ගම
- රෝයල් ෆොරෙක්ස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ලංකා ෆොරෙක්ස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - ක්‍රෙස්කැට් බුල්වර්ඩ්
- වින්ඩ්සර් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- වෙස්ටෙර්න් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01
- ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06
- සිටි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- සෙන්ට්‍රල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ෂිෆාස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- හයිෆා ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (පුද්.) සමාගම

### (II) අලෙවිසැල් ඇතුළුව විදේශ මුදල් මිළදී ගැනීමට, හුවමාරු කිරීමට සහ විකිණීමට අවසර ලබා ඇති බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන්

- අරුජිනා ජුවලරි (පුද්.) සමාගම
- තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම - බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල
- රවී ෆොරෙක්ස් (පුද්.) සමාගම

### (III) විදේශ මුදල් මිළදී ගැනීමට, හුවමාරු කිරීමට සහ විකිණීමට අවසර ලබා ඇති ලියාපදිංචි මූල්‍ය සමාගම්

- එල්බී ෆිනෑන්ස් පීඑල්සී
- ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී
- ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
- සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී
- සිටිසන්ස් ඩිවලප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
- සෙංකඩගල ෆිනෑන්ස් පීඑල්සී

### (IV) විදේශ විනිමය ගනුදෙනු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබා ඇති ආයතන

- අයිටීසී රත්නදීප - කොළඹ 01
- ට්‍රින්කො බ්ලූ බයි සිනමන්
- පර්ල් සිටි හෝටල් (පුද්) සමාගම
- ෂැංග්‍රිලා හම්බන්තොට රිසෝට් ඇන්ඩ් ස්පා
- ෂැංග්‍රි-ලා හොටෙල් කළම්බු
- සිනමන් ග්‍රෑන්ඩ්
- සිනමන් බෙන්තොට බීච්
- සිනමන් බේ බේරුවල
- සිනමන් රෙඩ් කළම්බු
- සිනමන් ලො(ඩ්)ජ් හබරණ
- සිනමන් ලේක්සයිඩ්
- සිනමන් වයිල්ඩ් යාල
- සිනමන් සිටඩෙල් කැන්ඩි
- හබරණ විලේජ් බයි සිනමන්
- හික්කා ට්‍රාන්ස් බයි සිනමන්

### (V) වෙනත් ආයතන

- එම්එම්බීඑල් මනි ට්‍රාන්ස්ෆර් (පුද්.) සමාගම (මුදල් හුවමාරු සේවාවල නිරත වේ)
- ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (විදේශ විනිමයෙන් ණය ඇපකර නිකුත් කිරීමේ නිරත වේ)





ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන ආයතන

## 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝග යටතේ බලපත්‍රලාභී සේවා සපයන්නන් (2024 දෙසැම්බර් 31 දිනට)

### බලපත්‍රලාභී වාණිජ බැංකු

- අමානා බැන්ක් පීඑල්සී
- එම්සීබී බැන්ක් ලිමිටඩ්
- කාගිල්ස් බැන්ක් ලිමිටඩ්
- කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
- ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී
- ද හොංකොං ඇන්ඩ් ෂැන්ග්හයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
- නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
- නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී
- පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී
- මහජන බැංකුව
- යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
- ලංකා බැංකුව
- ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව
- ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
- සම්පත් බැන්ක් පීඑල්සී
- සෙලාන් බැනක් පීඑල්සී
- හබීබ් බැන්ක් ලිමිටඩ්
- හැටන් නැෂනල් බැංකුව පීඑල්සී

### බලපත්‍රලාභී විශේෂිත බැංකු

- ජාතික ඉතිරිකිරීමේ බැංකුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
- ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
- සණස සංවර්ධන බැංකුව පීඑල්සී

### බලපත්‍රලාභී මුදල් සමාගම්

- එල්බී ෆිනෑන්ස් පීඑල්සී
- එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී
- ඩයලොග් ෆිනෑන්ස් පීඑල්සී
- පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
- මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
- සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී
- සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
- සෙංකඩගල ෆිනෑන්ස් පීඑල්සී
- සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
- ෆින්ට්‍රෙක්ස් ෆිනෑන්ස් ලිමිටඩ්

### මූල්‍ය නොවන ආයතන

- ග්ලෝබල් පේමන්ට් ඒෂියා පැසිෆික් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
- ඩයලොග් ආසියාටා පීඑල්සී
- මොබිටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්

# ආයතනික තොරතුරු

## නම සහ ලාංඡනය

ශ්‍රී ලංකා මහ බැංකුව

## නෛතිකභාවය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ පිහිටුවන ලදි.
(2023 සැප්තැම්බර් 14 දින සිට බල පැවැත්වේ.)

## බදු ගෙවන්නන් හඳුනා ගැනීම අංකය

409035027

## සබඳතා තොරතුරු

ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 00100
ශ්‍රී ලංකාව

දුරකථන: +94 11 247 7000
ෆැක්ස්: +94 11 234 6304
විද්‍යුත් තැපැල: cbslgen@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

## SWIFT කේතය

CBCELKLX

## 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත

### නම් කරන ලද නිලධාරි

ආචාර්ය නන්දලාල් වීරසිංහ
අධිපති

### තොරතුරු නිලධාරි

නෙළුමනී දවුලගල මිය
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති
rti@cbsl.lk

## විගණක

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල

## පාලක හා මුදල් මණ්ඩල සාමාජිකයින්

### පාලක මණ්ඩලය

**සභාපති**

ආචාර්ය නන්දලාල් වීරසිංහ – අධිපති

**පත්කරන ලද සාමාජිකයින්**

නිහාල් ෆොන්සේකා මහතා
ආචාර්ය රවීන්ද්‍ර රත්නායක
අනුෂ්ක විජේසිංහ මහතා
විශ්වනාදමූර්ති ගෝවින්දසාමි මහතා
රජීව් අමරසූරිය මහතා
මනිල් ජයසිංහ මහතා

### මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය

**සභාපති**

ආචාර්ය නන්දලාල් වීරසිංහ – අධිපති

**පත් කරන ලද නිලධාරීන්**

නිහාල් ෆොන්සේකා මහතා – පත්කළ සාමාජික
ආචාර්ය රවීන්ද්‍ර රත්නායක – පත්කළ සාමාජික
අනුෂ්ක විජේසිංහ මහතා – පත්කළ සාමාජික
විශ්වනාදමූර්ති ගෝවින්දසාමි මහතා – පත්කළ සාමාජික
ආචාර්ය දුෂ්නි වීරකෝන් මිය – පත්කළ සාමාජිකාව
මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ – පත්කළ සාමාජික
රජීව් අමරසූරිය මහතා – පත්කළ සාමාජික
මනිල් ජයසිංහ මහතා – පත්කළ සාමාජික

**නියෝජ්‍ය අධිපතිවරුන්**

**නෙළුමනී දවුලගල මිය**
මිල ස්ථායිතාව භාර

**ජානක කරුණාරත්න මහතා**
මූල්‍ය පද්ධති ස්ථායිතාව භාර

## විගණන කමිටුව

මනිල් ජයසිංහ මහතා – සභාපති
ආචාර්ය රවීන්ද්‍ර රත්නායක – සාමාජික
රජීව් අමරසූරිය මහතා – සාමාජික

## මණ්ඩල අවදානම් අධීක්ෂණය කමිටුව

නිහාල් ෆොන්සේකා මහතා – සභාපති
ට්‍රෙවින් ජයසේකර මහතා – ස්වාධීන බාහිර සාමාජික
රනෙල් විජේසිංහ මහතා – ස්වාධීන බාහිර සාමාජික

## මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටුව

නිහාල් ෆොන්සේකා මහතා – සභාපති
විශ්වනාදමූර්ති ගෝවින්දසාමි මහතා – සාමාජික
මනිල් ජයසිංහ මහතා – සාමාජික
චන්ද්‍රසිරි හේවාපත්තිනි මහතා – බාහිර සාමාජික

## ආචාරධර්ම කමිටුව

අනුෂ්ක විජේසිංහ මහතා – සභාපති
ආචාර්ය රවීන්ද්‍ර රත්නායක – සාමාජික
අමල් කබ්රාල් මහතා – බාහිර සාමාජික

Produced by Smart Media,
a GHG-neutral company
since 2011

**ශ්‍රී ලංකා මහ බැංකුව**
අංක 30
ජනාධිපති මාවත
කොළඹ 00100
ශ්‍රී ලංකාව

**www.cbsl.gov.lk**

ISBN 978-624-5917-97-6

රු. 600.00

